



# කාර්ය සාධන වාර්තාව - 2015
# බස්නාහිර පළාත් සභාව









# කාර්ය සාධන වාර්තාව

# 2015

## ප්‍රධාන ලේකම් කාර්යාලය

## බස්නාහිර පළාත් සභාව

## ගරු ආණ්ඩුකාරතුමාගේ සුභාශිංසන පණිවිඩය



ශ්‍රී ලංකාව සමෘද්ධිමත් දේශයක් බවට පත්කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන්වලට අනුකූලවද බස්නාහිර පළාතේ සංවර්ධනය වෙනුවෙන්ද පළාත් සභාව විසින් 2015 වසරේ දී දියත් කරන ලද වැඩසටහන්වලට අදාලව අත්කරගත් ප්‍රගතිය පිළිබඳව එළිදැක්වෙන **බස්නාහිර පළාත් කාර්ය සාධන වාර්තාව - 2015** ග්‍රන්ථය වෙනුවෙන් සුභාසිංශන පුද කිරීමට ලැබීම ඉමහත් භාග්‍යක් සේ සලකමි.

බස්නාහිර පළාත රටෙහි වැඩිම ජනගහනය වාසය කරන පළාත මෙන්ම රටෙහි වාණිජ නගරය හා අගනගරය වශයෙන්ද වැදගත් වේ. මේ හේතු නිසාම පළාතේ සංවර්ධන අවශ්‍යතා ඉතා සංකීර්ණ ස්වභාවයක් ගනී. එම සියළු අවශ්‍යතා සලකා බලමින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා විශාල සේවාවන් ප්‍රමාණයක් සැලසීමට 2015 වසරේ දී බස්නාහිර පළාත් සභාව සමත්වී ඇත. වර්ෂය ආරම්භයේදීම විවිධ සංවර්ධන ඉලක්කයන් පිහිටුවමින් කටයුතු කළද එම ඉලක්කයන් ජයග්‍රහණය කිරීම සඳහා දැඩි අභියෝගයන්ට මුහුණ දීමට සියළු පාර්ශව එක්ව ක්‍රියා කිරීම තුළ මෙම ජයග්‍රහණ ලැබීමට හැකිවූ බව මාගේ විශ්වාසයයි.

පළාත් සභාව වශයෙන් කටයුතු කිරීමේ දී එම කාර්යයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා ලබාදුන් සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්වද, ගරු අග්‍රාමාත්‍යතුමන් ඇතුළු මැති ඇමතිවරුන්ද, සියළු නිලධාරීන්ද මෙම අවස්ථාවේ කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

පළාත් සභා සංවර්ධන ඉලක්කයන් යථාර්තයන් බවට පත්කර ගැනීම උදෙසා දැඩි කැපවීමකින් කටයුතු කළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍ය මණ්ඩලයටද, පළාත් සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු පළාත් සභා මන්ත්‍රීවරුන්ටද, ප්‍රධාන ලේකම්තුමිය හා අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු පළාත් සභාවේ සියළු නිලධාරීන්ටද මාගේ ස්තුතිය මෙයින් පිරිනමමි.

**කේ.සී. ලෝගේෂ්වරන්**
**බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර**

## ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුභාශිංසන පණිවිඩය



බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල දැක්ම සහ මෙහෙවර සාක්ෂාත්කර ගැනීම පිණිස අගයයන්, අරමුණු හා කාර්යයන් ඒකරාශීකර, වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන කාර්ය සාධන වාර්තාවේ 2015 වසර සඳහා වූ ප්‍රකාශයට පණිවිඩයක් එක් කිරීමට ලැබීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මාගේ සතුට ප්‍රකාශ කරමි.
මන්ද යත්, එක් පසෙකින් මෙය සාධාරණත්වයේ සහ විනිවිදභාවයේ කැඩපතක් වන්නා වූ ප්‍රකාශනයකි. එය බස්නාහිර පළාතේ ආයතන සම්බන්ධයෙන් මහජනතාවගේ තොරතුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු සපයයි. අනෙක් පසින්, මහජන මුදල් කාර්යක්ෂමව පරිහරණය කිරීම සම්බන්ධයෙන් සංක්ෂිප්ත විවරණයක් සපයයි. එහෙයින් මෙම ප්‍රකාශනය වාර්ෂිකව ප්‍රකාශයට පත්කිරීමට උරදුන් ප්‍රධාන ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරියෙක්ම සහ තොරතුරු සපයමින් සහයෝගය ලබාදුන් සියලුම පළාත් සභා ආයතන ප්‍රධානීන් මෙන්ම කාර්ය මණ්ඩලවල සෑම නිලධාරියෙකුම කෘතවේදීව සිහිපත් කරනු කැමැත්තෙමි.
ප්‍රාදේශීය සංවර්ධන අවශ්‍යතා වඩාත් සියුම්ව වටහා ගනිමින් සමතුලිත හා සාධාරණ සංවර්ධනයක් ඇතිකිරීම පිණිස 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එතෙක් මධ්‍යම රජයට කේන්ද්‍රගතව තිබූ බලය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදී. එහෙයින්, පළාත් සභා යටතේ සූක්ෂම සංවර්ධන උපාය මාර්ගයන් මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විය යුතුය. එසේම, එහි තිරසරභාවය සම්බන්ධයෙන්ද අපගේ අවධානය යොමුවිය යුතුව ඇත.
පළාත් සභා වෙත පැවරුණු බලය අනුව කටයුතු කිරීමේ දී, ජාතික අවශ්‍යතා සැලකිල්ලට ගැනීම ද අපේක්ෂා කෙරේ. එහෙයින්, ප්‍රතිපාදන සැලැස්වීම මෙන්ම අවශ්‍ය මාර්ගෝපදේශ සම්පාදනයෙන්ද අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු මුදල් අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු අමාත්‍යවරුන්ද, මධ්‍යම රජයේ ආයතනවල නිලධාරීන්ද ගෞරවයෙන් සිහිපත් කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.
සැලසී ඇති ප්‍රතිපාදන හා ලැබෙන මුදල් කාර්යක්ෂමව පරිහරණය කිරීම සඳහා සැලසුම් සකස් කරන, ක්‍රියාත්මක කරන සහ පසුවිපරම් කරන සියලුම මට්ටම්වල පළාත් නිලධාරීන්ටද මාගේ ප්‍රශංසාව පුදකරනු කැමැත්තෙමි.
13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නෛතික රාමුව යටතේ පළාත් සභාවේ සංවර්ධන අරමුණු උදෙසා, මධ්‍යම රජය හා පළාත් සභා අරමුදල් යටතේ ප්‍රතිපාදිත මහජන මුදල් ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමේලා කාර්යක්ෂමව මෙහෙයවීමටත්, ඉලක්ක දිනා ගැනීමටත් නිසි මගපෙන්වීම ලබාදීමටත් මෙම ධුරයේ සිටින තාක් ඇප කැපවී කටයුතු කිරීම මාගේ ද අපේක්ෂාවයි.
වාර්ෂිකව එළි දක්වන මෙම ප්‍රකාශන ප්‍රයත්නයන් අපේක්ෂිත අරමුණු හා අභිමතාර්ථ ඉටුවේවායි සුභාශිංසනය කරමි.

**ඉසුර දේවප්‍රිය**
**ප්‍රධාන අමාත්‍ය**
**බස්නාහිර පළාත**

**ගරු ප්‍රධාන ලේකම්තුමියගේ සුභාශිංසන පණිවිඩය**



බස්නාහිර පළාත ශ්‍රී ලංකාවේ භූමි වපසරිය සැලකූ කල ඉතාමත් කුඩා පළාතක් වන නමුත් ජනඝනත්වය සැලකූ විට අධිකතම ජනඝනත්වය සහිත පළාත වන අතර, අනෙකුත් පළාත් වලට සාපේක්ෂව ජාතික සංවර්ධනයට විශේෂ දායකත්වයක් ලබාදෙන, ජාතික හා අන්තර්ජාතික මට්ටමේ සුවිශේෂී ආකර්ශනයක් දිනාගත් ආර්ථික හා වානිජ කේන්ද්‍රය ලෙසද සලකනු ලැබේ.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාව වෙත පැවරී ඇති පරිපාලන කටයුතු සිදු කිරීම හා පළාතේ ජීවත්වන ජනතාවට මූල්‍ය, භෞතික, මානව සම්පත් ප්‍රශස්ත ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැලසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදා කිරීම පිණිස පිහිටුවා ඇති බස්නාහිර පළාත සභාවේ, රාජ්‍ය සේවයේ දැනට අනුමත සමස්ථ තනතුරු සංඛ්‍යාව 83,000 ක් පමණ වන අතර, අනෙකුත් පළාත් සභා රාජ්‍ය සේවාවන් සමඟ සැසඳීමේදී එය රාජ්‍ය සේවයට පමණක් දෙවනිව ඇත.

බස්නාහිර පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම අරමුණු කරගෙන 2013-2017 කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි සකස් කරන ලද මධ්‍ය කාලීන ආයෝජන වැඩසටහන තුලින් 2015 වර්ෂයේදී ව්‍යාපෘති වල ගුණාත්මක බව ඉහළ නංවමින් ආයතනික ප්‍රතිඵල රාමුවේ ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබුණු අතර මෙම වසරේදීද අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් සකස් කර ඇත.

බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විශාල සංඛ්‍යාවක් ස්ථාපිතව පවතින අතර, 2015 වර්ෂයේදී එම ආයතන හරහා සිදුවූ සේවාවන් හා එම ආයතන අත්කරගත් ප්‍රගතිය හා ආයතන කාර්යය සාධනය ඇතුලත් ***කාර්ය සාධන වාර්තාව - 2015*** ග්‍රන්ථය එළි දැක්වීමට සැරසෙන මෙම අවස්ථාවේ දී, පසුගිය වසරේදී අත්කර ගත් ප්‍රගතිය ඉදිරියේදීත් වඩ වඩාත් වැඩිදියුණු කර ගැනීමට හැකියාව, ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවායි සුබ පැතුම් පිරි නමමි.

**ජේ.එම්.සී. ජයන්ති විජේතුංග**
**ප්‍රධාන ලේකම්**
**බස්නාහිර පළාත**

# පටුන


**1.** ආණ්ඩුකාර ලේකම් කාර්යාලය 1 - 6

**2.** පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව 7 - 13

**3.** පළාත් සභා ලේකම් කාර්යාලය 14 - 21

**4.** ප්‍රධාන ලේකම් කාර්යාලය 22 - 23

4.1. පාලන අංශය 24 - 40

4.2. පිරිස් පුහුණු අංශය 41 - 58

4.3. මූල්‍ය අංශය 59 - 69

4.4. සැලසුම් අංශය 70 - 78

4.5. ඉංජිනේරු අංශය 79 - 85

4.6. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 86 - 91

4.7. අභ්‍යන්තර විගණන අංශය 92 - 93

**5.** පළාත් පාලන ආර්ථික ප්‍රවර්ධන විදුලිබල හා බලශක්ති පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය. 94 - 98

5.1. පළාත් පාලන දෙපාර්තමේන්තුව 99 -121

**6.** අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය. 122 -126

6.1. සංස්කෘතික අංශය 127 -133

6.2. ක්‍රීඩා අංශය 134 -137

6.3. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව 138 -147

**7.** කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය 148 -154

7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 155 -166

7.2. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 167 -176

7.3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව 177 -183

7.4. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 184 -194

**8.** ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය 195 -202

8.1. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 203 -205

8.2. සමූපකාර සේවක කොමිෂන් සභාව 206 -207

8.3. කර්මාන්ත දෙපාර්තමේන්තුව 208 -217

8.4. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය 218 -220

8.5. නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව 221 -223

8.6. ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 224 -227

**9.** සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශය. 228 -234

9.1. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 235 -246

9.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව 247 -252

9.3. පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව 253 -262

9.4. සමාජ සේවා දෙපාර්තමේන්තුව 263 -278

# 1

# බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

ඵලදායී පළාත් සභා පරිපාලනයට මාර්ගෝපදේශය ලබාදෙන විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම.

### 1.2 මෙහෙවර

නෛතික බලතල මත බස්නාහිර පළාත් සභා පරිපාලන ක්‍රියාවලිය සඵල සේවාලාභී සත්කාරයක් සඳහා අධීක්ෂණය, මෙහෙයවීම හා නියාමනය තුලින් තිරසාර සංවර්ධනයට දායක වීම.

### 1.3 කාර්යයන්

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය හා 1987 අංක 42 දරණ පළාත් සභා පනත හා ඒ හා සබැඳි පනත් යටතේ පැවරී ඇති ව්‍යවස්ථාපිත කටයුතු හා ආයතන සංග්‍රහයට අනුව පළාතේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් ලෙස දැරිය යුතු වගකීම් පහත දැක්වේ.

**පළාත් සභා පනතේ විධි විධාන අනුව පැවරී ඇති සුවිශේෂී කාරණා**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා ලැයිස්තුවට අදාලව සකසන පළාත් සභා ප්‍රඥප්ති සඳහා අනුඥාව ලබා දීම.
- පළාත් සභාව/ පළාත් අමාත්‍ය මණ්ඩලය/ පළාත් මන්ත්‍රිවරුන් පිළිබඳ සියළු කටයුතු
- පළාතේ පළාත් සභා අරමුදලේ කාර්යභාරය පිළිබඳව නිරන්තර සුපරීක්ෂාවෙන් සිටීම
- පළාතේ හදිසි අවස්ථා අරමුදලේ භාරකාරත්වය සහ නිසි සුපරීක්ෂාව
- වාර්ෂික මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අදාලව නිසි සොයා බැලීම හා උපදෙස් ලබා දීම.
- පළාත් සභා අරමුදලේ ගිණුම් හා සම්බන්ධයෙන් විගණනය
- විගණකාධිපති වාර්තා සම්බන්ධ සියළු කටයුතු

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ අංක 32, (1) (2) (3) වගන්ති යටතේ පහත සඳහන් විෂයන් හා පළාත් රාජ්‍ය සේවයට අදාල කටයුතු ගරු ආණ්ඩුකාරතුමාට නිල වශයෙන් පැවරේ.

- 2014.04.24 දිනැති අංක 1859/32 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමය ප්‍රකාරව පළාත් ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා අනෙකුත් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම් / උසස් කිරීම් / මාරු කිරීම් / විනය කටයුතු ඉටු කරවීම
- පළාත් රාජ්‍ය සේවයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කිරීම
- පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන්ගේ අවසාන අභියාචන බලධාරයා වශයෙන් කටයුතු කිරීම
- මෙහි ඉහත (i), (ii), (iii), (iv) විෂයයන්ට අදාල වන ආයතන සංග්‍රහයේ විධිවිධාන මෙන්ම රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා නියමයන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීම හා එපරිදි ක්‍රියාත්මක කිරීම වන්නේද යන්න සොයා බැලීම
- සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම

මේ අනුව රාජ්‍ය සේවය මගින් ඉටු කල යුතු මහජන උපයෝගීතාවයන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවය හරහා ඉටු කල යුතු බවට, පළාත් සභා පනතින්, ව්‍යවස්ථාපිත වූ උපලේඛණ ගත විෂයයන් ඉටුකරවීමේ හා ඉටුකරවීමට වගබලා ගන්නා ප්‍රධානතම විධායකයා මෙන්ම, විධායක ආයතනය වනුයේ ගරු ආණ්ඩුකාරතුමා වන අතර එම කටයුතු එතුමා වෙනුවෙන් ඉටුකරලීම පිණිස ක්‍රමවේදයන් සකස්කර මෙහෙයවීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් ඉටුකරනු ලැබේ. මේවා තව දුරටත් පහත සඳහන් පරිදි පෙළගැස්විය හැකි වේ.

- පළාත් සභා අමාත්‍ය මණ්ඩල වැඩ බැලීම සඳහා පත්කිරීම
- පළාත් සභා අමාත්‍යාංශ ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම
- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සභාපති හා සාමාජිකයින් පත්කිරීම, ඉවත්කිරීම.
- පළාත් සභා සැසිවාරයන් කැඳවීම, වාර අවසන් කිරීම.
- විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත යළි සේවයේ යෙදවීම.
- වාර්ෂික මුදල් ප්‍රකාශය නිර්දේශ කිරීම.
- වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කිරීම.
- පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- පළාත් සභා අනුමැතියෙන් පසු පරිපූරක ඇස්තමේන්තු අනුමත කිරීම.
- පළාතට අදාල ප්‍රඥප්ති සභාවට ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ කිරීම.
- පළාත් සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ප්‍රඥප්තිය සඳහා අනුඥාව ලබා දීම.
- දීප ව්‍යාප්ත සේවාවන්ගේ නිලධාරීන් අනුයුක්ත කිරීම හා ස්ථාන මාරුකිරීම්, නිදහස් කිරීම.
- දීප ව්‍යාප්ත සේවාවන්ගේ නිලධාරීන්ගේ වැඩබැලීමේ පත්වීම් සහ පාරිශ්‍රමික අනුමත කිරීම.
- පළාත් ආරක්ෂක කමිටු රැස්වීම්, කැඳවීම් වාර්තා සකස් කිරීම සහ ප්‍රගති සමාලෝචන කටයුතු.
- පළාත් අමාත්‍ය මණ්ඩලය සමඟ පවත්වනු ලබන රැස්වීම් හා තීරණ දැනුම් දීම.
- පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සමඟ පවත්වනු ලබන රැස්වීම් හා තීරණ දැනුම් දීම.
- විදේශ ගමන් සම්බන්ධ දිවයිනෙන් බැහැර යාමේ අනුමැතිය ලබා දීම.
- විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධ කටයුතු
- පළාත් රාජ්‍ය සේවයට අදාල සියලුම නිලධාරීන්ගේ, සේවකයින්ගේ ආයතන කටයුතුවලට අදාලව ආයතන අධ්‍යක්ෂ ජනරාල් ලෙස ගරු ආණ්ඩුකාරතුමා තීරණ ලබාදීම.

- මධ්‍ය රජයේ චක්‍රලේඛ පළාතට අදාල කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදිම.
- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ විනය නියෝගයන්ට එරෙහිව අභියාචනා පිළිබඳ අවසාන තීරණ ලබාදීම.
- පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ වලින් හා දෙපාර්තමේන්තු/ ආයතනවලින් ලැබෙන ලිපි, පෙත්සම් පිළිබඳ කටයුතු කිරිම.
- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ අභියාචනා, දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම .
- වෘත්තීය සමිති ඉල්ලීම් පිළිබඳ සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම හා වාර්තා නිකුත් කිරීම, ප්‍රගති සමාලෝචනය.
- විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව ලැබෙන නියෝජන සම්බන්ධව ක්‍රියාකිරීම
- රණවිරු සේවා අධිකාරිය හා සම්බන්ධ කටයුතු (රණවිරු අරමුදල තර කර ගැනීමට අවශ්‍ය සහාය පළාත් මට්ටමින් ලබා දීම)
- ඩෙංගු මර්දන, වසංගත රෝග, ජලගැලීම් වැනි හදිසි අවස්ථා පිළිබඳ හදිසි රැස්වීම් කැඳවීම් සම්බන්ධීකරණය.
- බස්නාහිර පළාතට අදාල පුවත්පත් වාර්තා සම්බන්ධ ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් සඳහා අනුමැතිය දීම.
- සියලුම නව බඳවා ගැනීම්/ පත් කිරීම් සඳහා අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථා අනුමත කිරීම.
- දීමනා ගාස්තු හා අතිරේක පාරිශ්‍රමික ගෙවීම සඳහා අනුමැතිය දීම.
- පළාත් සභා මැති ඇමතිවරු සභාපති සහ ධුරධාරීන්ගේ ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම සම්බන්ධ සියලු රාජකාරි.
- බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතනවලට අදාල විගණන විමසුම් සම්බන්ධ පසුවිපරම් කටයුතු.
- දූෂණ අක්‍රමිකතා හා වෙනත් පැමිණිලි සම්බන්ධ විමර්ශන වාර්තා කැඳවීම් හා ඉදිරි කටයුතු කිරීම.
- ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අදාල විගණන විමසුම් සම්බන්ධ ක්‍රියාකිරීම.
- සියලුම නිලධාරීන්ගේ අන්තර් පළාත් ස්ථාන මාරුවීම් සම්බන්ධ අනුමැතිය දීම පිළිබඳ කටයුතු කිරීම.
- ජනාධිපති විමර්ශන ඒකකයෙන් එවන වාර්තා සම්බන්ධ ක්‍රියාකිරීම.
- දේශපාලන පළිගැනීම් කමිටුවේ තීරණ සම්බන්ධ පසුවිපරම් කටයුතු
- වාර්ෂික ආණ්ඩුකාර සම්මේලනය සම්බන්ධ කටයුතු.

## 2. බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සංවිධාන සැලැස්ම



## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආණ්ඩුකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය) | 2 |
| 3 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. ආණ්ඩුකාරතුමා විසින් ලබා දෙන ලද අනුමැතීන්

| | විස්තර | ප්‍රමාණය |
|---|---|---|
| i. | බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම් | 16 |
| ii. | පත් කිරීම් | 10 |
| iii. | ප්‍රඥප්ති | 12 |
| iv. | දීමනා | 72 |
| v. | දිවයිනෙන් බැහැර යාම සඳහාඅනුමැතිය ලබා දීම් | 2000 |
| vi. | විනය කාර්යය සංග්‍රහය (අභියාචනා) | 82 |
| vii. | රජයේ නිලධාරීන්ගේ දුක්ගැනවිලි හා මහජන අභියාචනා | 340 |
| viii. | චක්‍රලේඛ අදාල කර ගැනීම | 90 |
| ix. | විගණන කටයුතු | 07 |
| x. | කොන්ත්‍රාත් නිලධාරී පත්වීම් අනුමත කිරීම | 408 |
| xi. | අමාත්‍ය මණ්ඩල තීරණ | 27 |
| xii. | වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීම් | 08 |

## 5. ආණ්ඩුකාර අරමුදලේ කාර්යයන්

- ගරු ආණ්ඩුකාරතුමා විසින් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා පහත පරිදි ප්‍රතිපාදන වෙන් කිරීම් 19 ක් සිදු කර ඇත. මූල්‍ය වටිනාකම රු. 2,920,000.00 කි

- බෞද්ධ සිද්ධස්ථාන හා දහම් පාසල් වැඩිදියුණු කිරීම් 19 - රු. 2,920,000.00

## 6. විශේෂ කාර්යයන්

### 6.1 රැස්වීම් හා වැඩමුළු

- වෘත්තීය ප්‍රශ්න හා විවිධ කරුණු සම්බන්ධ සාකච්ඡා 32

### 6.2 විශේෂ වැඩසටහන් හා කාර්යයන්

- ජාතික ඩෙංගු මර්දන වැඩසටහනට සමගාමීව සතියේ සෑම සිකුරාදා දිනකම ප.ව. 3.00 සිට 4.00 දක්වා අදාල නිරීක්ෂණ කටයුතු සහ පිරිසිදු කිරීමේ කටයුතු ඉටුකිරීම.

- වෙසක් පොහොය වෙනුවෙන් ධර්ම දේශනා පිංකමක් සංවිධානය කිරීම



- කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන්ගේ සංවිධායකත්වයෙන් සිංහල අළුත් අවුරුදු උත්සවයක් සංවිධානය කිරීම.



# 2

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්.

### 1.2 මෙහෙවර
පවරන ලද බලතල සීමාවන් තුළ අපක්ෂපාතීව සේවාලාභීන්ට උපරිම සේවාවක් සැලසීම හා යහපාලනය සහතික කිරීමට අවශ්‍ය වන්නා වූ නිර්මාණශීලී, කාර්යක්ෂම, විනයගරුක හා තෘප්තිමත් පරිපූර්ණ නිලධාරින්ගෙන් යුතු පළාත් රාජ්‍ය සේවාවක් නිර්මාණය කොට පවත්වාගෙන යාම.

### 1.3 කාර්යයන්
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1989 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව ස්ථාපිත වූ පළාත් සභාවේ ක්‍රියාකාරිත්වය සඳහා අදාල කරන ලද 1987 අංක 42 දරණ පළාත් සභා පනතෙහි IV වන කොටසෙහි විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ ස්වකීය බලතල බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇත. 1990 අංක 28 දරණ සභ (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 ( 2 ආ) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව සතු බලතල ප්‍රධාන ලේකම්, අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පවරා ඇත.

1987 අංක 42 දරණ පළාත් සභා පනතෙහි 33.(1) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගරු සභාපති ද ඇතුළුව සාමාජික මහතුන් සය දෙනෙකුගෙන් සමන්විත ස්වාධිනව කටයුතු කරනු ලබන කොමිෂන් සභාවක් පත් කර ඇත.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉටු කරනු ලබන කාර්යයන් අතුරින් පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම, වෙනත් පළාත්

සභාවලින් හා මධ්‍යම රජයේ ස්ථාන මාරු ලැබ පැමිණෙන නිලධාරීන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම, දෙපාර්තමේන්තු පරීක්ෂණ හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවකයින්ගේ තනතුරු වලට අදාළ බඳවා ගැනීම් හා උසස් කිරීමේ හා සේවා ව්‍යවස්ථාවන් පිළිබඳව පරිපාටි පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ දැක්වීම ඇතුළු ආයතනික කටයුතුද, මීට අමතරව මෙම සියලු කටයුතු වලට අදාළව හා විනය නියෝගවලට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා බලධාරියා වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

ඉහත කාර්යයන් මගින් බස්නාහිර පළාතේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය කිරීමට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දායක වනු ඇත.

**කාර්යයන්**

- විභාග හා සම්මුඛ පරීක්ෂණ පවත්වා නව බඳවා ගැනීම.
- සේවය ස්ථිර කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.
- උසස්වීම් ලබාදීම.
- අන්තර්ග්‍රහණය කිරීම.
- සේවයෙන් විශ්‍රාම ගැන්වීම.
- විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් සේවය මත සේවයේ යෙදවීම.
- අන්තර් පළාත් ස්ථාන මාරු මත බස්නාහිර පළාතට බඳවා ගැනීම.
- බස්නාහිර පළාතෙන් පිට පළාත් වලට ස්ථාන මාරු සිදුකිරීම.
- වෙනත් තනතුරු සඳහා සේවයන් මුදා හැරීම.
- වන්දි මණ්ඩලය මඟින් සිදු කරන වන්දි කටයුතු.
- විනය අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

## 2. සංවිධාන ව්‍යුහය




## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( III / II ශ්‍රේණිය ) | 2 |
| 3 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටි

| අනු අංකය | බඳවා ගැනීමේ පටිපාටියේ නම | අනුමත දිනය |
|---|---|---|
| 1. | බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල අදායම් පරික්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.01.02 |
| 2. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මැහුම් උපදේශිකා ( ග්‍රාම සංවර්ධන ) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය. | 2015.01.13 |
| 3. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංස්කෘතික නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.02.10 |
| 4. | බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ සහයක තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය | 2015.02.10 |
| 5. | බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිළධාරී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.02.10 |
| 6. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.03.02 |
| 7. | බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ / ක්ෂේත්‍ර කම්කරු තනතුරට සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය. | 2015.03.03 |
| 8. | බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සුබ සාධන අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.03.06 |
| 9. | බස්නාහිර පළාත් සභා කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය | 2015.03.15 |
| 10. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015..05.06 |
| 11. | බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය. | 2015.05.21 |
| 12. | බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.05.21/ 2015.09.22 |
| 13. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නොවිධිමත් අධ්‍යාපන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.06.03 |
| 14. | බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.06.09 |
| 15. | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය | 2015.08.25 |

| අනු අංකය | බඳවා ගැනීමේ පටිපාටියේ නම | අනුමත දිනය |
|---|---|---|
| 16. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නගර සැලසුම් අංශයේ විධායක සේවා ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුරට පත්කිරීමේ පටිපාටිය. | 2015.12.02 |
| 17. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය. | 2015.12.03 |
| 18. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල විධායක සේවා ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නගර නිර්මාණ ශිල්පී හා නගර නිර්මාණ ශිල්පී තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය. | 2015.12.22 |

## 5. පවත්වන ලද විභාග

## 5.1 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වන ලද විභාග

| අනු අංකය | විභාගය | පවත්වන ලද දිනය |
|---|---|---|
| 01 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ප්‍රමාණ සමීක්ෂක ( පුහුණු කිරීමේ ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 | 2015.03.01 |
| 02 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 | 2015.03.01 |
| 03 | බස්නාහිර පළාත් අදායම් දෙපාර්තමේන්තුවේ 11/11 ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරේ ස්ථිර කිරීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය 2013 (2015) | 2015.03.07 |
| 04 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලායාධිපති 11 පංතියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2014 | 2015.03.28 |
| 05 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/ සැලසුම්/ විදුලි/ යාන්ත්‍රික) නිලධාරීන් සඳහා වන පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණය 2012 (2015) | 2015.02.07 දින සිට 2015.07.11 දින දක්වා |
| 06 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සැලසුම්/ විදුලි/ යාන්ත්‍රික) නිලධාරීන් සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය 2012 (2015) | 2015.02.07 දින සිට 2015.07.11 දින දක්වා |
| 07 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලායාධිපති 111 පංතියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2014 | 2015.06.13 |

| අනු අංකය | විභාගය | පවත්වන ලද දිනය |
|---|---|---|
| 08 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 1 ශ්‍රේණියේ පරිවාස නිලධාරී තනතුරේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.06.13 |
| 09 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ 1 ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.06.13 |
| 10 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.06.20 |
| 11 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර විමර්ශන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.06.20 |
| 12 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිගණක දත්ත සටහන් ක්‍රියාකරුවන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.06.20 |
| 13 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරී / නීතිඥ 111 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.09.12 |
| 14 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ 11 පංතියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 | 2015.09.12 |
| 15 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී තනතුරේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2015 | 2015.11.28 |
| 16 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) 11 "ආ " පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2015 | 2015.12.12 |
| 17 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) 11 "අ " පන්තියේ නිලධාරීන් සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2015 | 2015.12.13 |
| 18 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මෝස්තර සම්පාදක තනතුරට අදාල පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2011 (2014) | 2015.12.13 |

## 5.2 විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද විභාග

| අනු අංකය | විභාගය | පවත්වන ලද දිනය |
|---|---|---|
| 1 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ 11 පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 (2015) | 2015.01.24 |
| 2 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ 11 පන්තියේ "ආ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 (2015) | 2015.01.25 |
| 3 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිළධාරී 111 ශ්‍රේණියේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2014 (1) (2015) | 2015.05.09 |
| 4 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමණාකරණ සහකාර 11 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2012 (1) (2015) | 2015.05.23 |
| 5 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමණාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014 (1) 2015 | 2015.09.12 |
| 6 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමණාකරණ සහකාර 111 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2011 (11) 2015 | 2015.09.19 |

## 6. ක්‍රියාකාරකම්

| | | | |
|---|---|---|---|
| 6.1 | වර්ෂය තුළ පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම් ගණන | - | 91 |
| 6.2 | පවත්වන ලද වන්දි කමිටු රැස්වීම් ගණන | - | 12 |
| 6.3 | ස්ථාන මාරුවීම් | - | 315 |
| 6.4 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | - | 325 |
| 6.5 | විනය අභියාචනා සම්බන්ධ කටයුතු | - | 83 |
| 6.6 | වන්දි කටයුතු | - | 48 |
| 6.7 | අන්තර්ග්‍රහණය කිරීම් | - | 148 |
| 6.8 | සේවය ස්ථිර කිරීම් | - | 372 |
| 6.9 | නව බඳවා ගැනීම් | - | 1261 |
| 6.10 | වැඩ බැලීමේ පත්වීම් ලබාදීම | - | 70 |
| 6.11 | කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබාදීම | - | 72 |
| 6.12 | සේවය උසස් කිරීම | - | 3200 |

# 3

# බස්නාහිර පළාත් සභා ලේකම් කාර්යාලය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

ශ්‍රී ලංකාවේ අභිමානවත් හා ආදර්ශමත් සභා ලේකම් කාර්යාලය ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම.

### 1.2 මෙහෙවර

පළාත් ව්‍යවස්ථාමය ක්‍රියාවලිය සහ ඒ හා බැඳුනු කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සේවා සහ පහසුකම් සැපයීම හා ඊට අදාළ පරිපාලන කටයුතු අපක්ෂපාතීව පවත්වාගෙන යාම.

### 1.3 කාර්යයන්

සභා ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබන බස්නාහිර පළාත් සභාවේ ව්‍යවස්ථාදායක අංශයට සම්බන්ධ කාර්යයන් හා එයට අදාල වන පරිපාලන කටයුතු පහත සඳහන් පරිදි ගොනු කර දැක්විය හැක.

- සභාවේ රැස්වීම් පැවැත්වීම, නීති ප්‍රඥප්ති සම්මත කිරීම වැනි කාර්යයන්ට අදාල ලිපි ලේඛන සකස් කොට බෙදා හැරීම, සභාවේ වාර්තා තබා ගැනීම හා අවශ්‍ය වන ලිපි ලේඛන හා පොත් පත් පවත්වාගෙන යෑම, සභාවේ කාරක සභා රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ ලිපි ලේඛන සකස් කිරීම, වාර්තා හා පොත් පත් ලේඛන ආදිය පවත්වාගෙන යෑම.
- සභාපති කාර්යාලය, නියෝජ්‍ය සභාපති කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, විපක්ෂ නායක කාර්යාලය හා විපක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය, සභා නායක හා ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය වැනි ආයතනයන්හි සම්පූර්ණ පරිපාලන කටයුතු ඉටු කිරීම.
- පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වැටුප්, දීමනා ආදිය ගෙවීම, සහායක සේවාවන් පවත්වාගෙන යාම හා ඔවුන්ගේ මහජන කාර්යයන් පහසු කරලීම සඳහා අවශ්‍ය අනෙකුත් අනුමත පහසුකම් හා සේවාවන් සැපයීම, ඒ හා සම්බන්ධ ගෙවීම් හා ගිණුම් කටයුතු පවත්වාගෙන යාම.

## 2. සංවිධාන සටහන



ආණ්ඩුකාරවර
පළාත් සභාව
අමාත්‍ය මණ්ඩලය
කාරක සභා
සභාපති
නියෝජ්‍ය සභාපති
සභා නායක
විපක්ෂ නායක
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
ප්‍රධාන ලේකම්
සභා ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
පරිපාලන නිලධාරී
හැන්සාඩ් සංස්කාරක
සම්බන්ධීකරණ නිලධාරී
ප්‍රවෘත්ති නිලධාරී
සංවර්ධන නිලධාරී
භාෂා පරිවර්තක
ප්‍රධාන කළමනාකරණ සහකාර
මූල්‍ය සහකාර
කළමණාකරන සහකාර
කළමනාකරණ සහකාර
හැන්සාඩ් වාර්තාකරුවන්
පෞද්ගලික කාර්ය මණ්ඩලය
රියදුරු
ශබ්ද විකාශන යන්ත්‍ර ක්‍රියාකරු
කාර්යාල කාර්ය සහයක
කම්කරු

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | සභා ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | ගණකාධිකාරි | ගණකාධිකාරි සේවය (111/11 ශ්‍රේණිය) | 1 |
| 3 | නීති නිලධාරී | නීති සේවය | 1 |
| 4 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 5 | භාෂා පරිවර්තක (ඉංග්‍රීසි) | භාෂා පරිවර්තක සේවය | 1 |
| 6 | හැන්සාඩ් සංස්කාරක | දෙපාර්තමේන්තුගත නිලධාරී | 2 |
| 7 | සම්බන්ධීකරණ නිලධාරී | දෙපාර්තමේන්තුගත නිලධාරී | 1 |

## 4. 2015 වර්ෂයේ සභා රැස්වීම්, කාරක සභා හා කමිටු පවත්වන ලද දිනයන්

| අනු අංකය | සභා රැස්වීම් | ගි.ක.ස | පෙත්සම් කාරක සභා | සභා කටයුතු | ප්‍රඥප්ති හා නීති කාරක සභා | ගෘහ කාරක සභා | කාර්ය පටිපාටි හා රීති කාරක සභාව | අවදි කාරක සභාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2015.01.20 | 2015.01.22 | 2015.02.09 | 2015.01.05 | 2015.02.02 | 2015.04.08 | 2015.02.06 | 2015.12.08 |
| 2 | 2015.02.02 | 2015.02.05 | 2015.03.13 | 2015.01.21 | 2015.03.03 | 2015.11.24 | 2015.03.13 | |
| 3 | 2015.02.18 | 2015.02.12 | 2015.03.20 | 2015.02.06 | 2015.04.03 | | 2015.03.20 | |
| 4 | 2015.02.24 | 2015.02.19 | 2015.03.24 | 2015.02.19 | 2015.10.03 | | 2015.06.26 | |
| 5 | 2015.03.03 | 2015.03.19 | 2015.04.24 | 2015.03.04 | | | 2015.07.02 | |
| 6 | 2015.03.17 | 2015.03.26 | 2015.04.27 | 2015.03.18 | | | 2015.11.09 | |
| 7 | 2015.04.07 | 2015.04.02 | 2015.05.08 | 2015.04.08 | | | 2015.11.13 | |
| 8 | 2015.04.28 | 2015.04.30 | 2015.05.22 | 2015.04.29 | | | 2015.11.20 | |
| 9 | 2015.05.12 | 2015.05.07 | 2015.05.25 | 2015.05.13 | | | 2015.12.04 | |
| 10 | 2015.05.26 | 2015.05.14 | 2015.06.08 | 2015.05.27 | | | 2015.12.07 | |
| 11 | 2015.06.09 | 2015.05.21 | 2015.07.06 | 2015.06.10 | | | 2015.12.08 | |
| 12 | 2015.06.23 | 2015.05.28 | 2015.07.10 | 2015.06.24 | | | 2015.12.09 | |
| 13 | 2015.07.07 | 2015.06.04 | 2015.07.10 | 2015.07.08 | | | 2015.12.11 | |

| අනු අංකය | සභා රැස්වීම් | ගි.ක.ස | පෙත්සම් කාරක සභා | සභා කටයුතු | ප්‍රඥප්ති හා නීති කාරක සභා | ගෘහ කාරක සභා | කාර්ය පටිපාටි හා රීති කාරක සභාව | අවදි කාරක සභාව |
|---|---|---|---|---|---|---|---|---|
| 14 | 2015.07.21 | 2015.06.11 | 2015.07.27 | 2015.07.22 | | | | |
| 15 | 2015.08.04 | 2015.06.18 | 2015.10.12 | 2015.08.19 | | | | |
| 16 | 2015.09.08 | 2015.06.25 | 2015.10.30 | 2015.09.09 | | | | |
| 17 | 2015.09.22 | 2015.07.02 | 2015.11.06 | 2015.09.23 | | | | |
| 18 | 2015.10.06 | 2015.10.08 | 2015.11.20 | 2015.10.07 | | | | |
| 19 | 2015.10.20 | 2015.10.15 | 2015.11.23 | 2015.10.21 | | | | |
| 20 | 2015.11.03 | 2015.11.05 | 2015.11.30 | 2015.11.04 | | | | |
| 21 | 2015.11.17 | 2015.11.12 | 2015.12.07 | 2015.11.17 | | | | |
| 22 | 2015.11.24 | 2015.11.19 | | 2015.12.02 | | | | |
| 23 | 2015.12.15 | 2015.12.03 | | 2015.12.18 | | | | |
| 24 | 2015.12.16 | | | 2015.12.23 | | | | |
| 25 | 2015.12.17 | | | 2015.12.30 | | | | |
| 26 | 2015.12.18 | | | | | | | |
| 27 | 2015.12.21 | | | | | | | |
| 28 | 2015.12.22 | | | | | | | |
| 29 | 2015.12.31 | | | | | | | |

## 5. 2016 වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීම : 2015.11.24

| දිනය | අමාත්‍යාංශය | අනුමැතිය ලද ආකාරය ඒකමතිකව / වැඩි ඡන්දයෙන් |
|---|---|---|
| 2015.12.17 | ආණ්ඩුකාරතුමා, පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - වැය ශීර්ෂය | (ඡන්ද විමසීමක් කරනු නොලබයි) |
| | බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයීය වැය ශීර්ෂ | වැඩි ඡන්දයෙන් |
| | බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයීය වැය ශීර්ෂ | වැඩි ඡන්දයෙන් |
| 2015.12.18 | බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයීය වැය ශීර්ෂ | වැඩි ඡන්දයෙන් |
| 2015.12.18 | බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයීය වැය ශීර්ෂ | වැඩි ඡන්දයෙන් |
| 2015.12.22 | බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයීය වැය ශීර්ෂ | වැඩි ඡන්දයෙන් පරාජය විය |
| 2015.12.22 | විසර්ජන ප්‍රඥප්තිය | සෞඛ්‍ය අමාත්‍යාංශයීය වැය ශීර්ෂ හැර වැඩි ඡන්දයෙන් සම්මත විය. |

| දිනය | අමාත්‍යාංශය | අනුමැතිය ලද ආකාරය ඒකමතිකව /වැඩි ඡන්දයෙන් |
|---|---|---|
| 2015.12.31 | බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයීය වැය ශීර්ෂය<br><br>විසර්ජන ප්‍රඥප්තිය | ඒකඡන්දයෙන් සම්මත විය.<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශයීය වැය ශීර්ෂය ඇතුළුව ඒකඡන්දයෙන් සම්මත විය. |

## 6. විශේෂ සංචාර

## 6.1 විදේශ සංචාර

| අනු අංකය | සංචාරය කළ රට | සහභාගීවුන්ගේ නම් | කාල සීමාව |
|---|---|---|---|
| 01 | එක්සත් රාජධානිය | එම්.ඩබ්ලිව්.එස්.කුරේ ගණකාධිකාරි | 2015.11.02 - 2015.11.14 |

## 6.2 දේශීය සංචාර

| අනු අංකය | ස්ථානය | සහභාගීවුවන්ගේ නම් | කාල සීමාව |
|---|---|---|---|
| 01 | අමායා ලේක් රිසෝට් දඹුල්ල | ගිණුම් කාරක සභාවේ ගරු කමිටු සාමාජික මන්ත්‍රීවරුන් හා නිලධාරීන් | 2015.02.26, 27, 28 |
| 02 | අමායා රිසෝට් පාසිකුඩා VI වන පළාත් සභාවේ ගරු ධූරධාරීන් හා මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන 2016 අයවැය ඇස්තමේන්තු හා සංවර්ධන සැලැස්ම සම්බන්ධව | VI වන පළාත් සභාවේ ගරු ධූරධාරීන් හා මන්ත්‍රීවරුන් | 2015.11.25, 26, 27 |

## 7. පළාත් සභාව මගින් සම්මත කළ ප්‍රඥප්ති

- 2015 අංක 01 දරණ බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තිය
- 2015 අංක 02 දරණ විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය
- 2015 අංක 03 දරණ විසර්ජන ප්‍රඥප්තිය
- 2015 අංක 04 දරණ විසර්ජන ප්‍රඥප්තිය

## 8. ගරු පළාත් සභා මැති ඇමතිවරුන් වෙත ප්‍රදානය කරන ලද වෙනත් සේවාවන්

- දුරකථන පහසුකම් ලබාදීම
- පරිගණක ණය ලබාගැනීම
- වාහන සඳහා ටයර් ණය වසරක් පාසා ලබා ගැනීම
- ඉඩමක් හෝ වාහනයක් ඇපයට තබා රු. 1,000,000/- ලබා දීම
- සෞඛ්‍ය රක්ෂණාවරණය (ජීවිත, පුද්ගල, හදිසි අනතුරු හා සෞඛ්‍ය)
- මන්ත්‍රී පවුල් රක්ෂණාවරණය
- ලිපිද්‍රව්‍ය හා ගැසට්පත්‍ර
- තැපැල් පහසුකම්

**4**

# බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පෙරට

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාතේ ජනතාවගේ ජීවන තත්වය නගාලීම සඳහාත්, පළාත් ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහාත් මෙම පළාත් සභාව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඉහළම ඵලදායකත්වයක් ලැබෙන පරිදි ඉටු කිරිමට සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ මානව සම්පත් සංවර්ධන හා මූල්‍ය සම්පත් හැසිරවීම.

ප්‍රධාන ලේකම් යටතේ බස්නාහිර පළාතේ මුදල්, ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලනය පිළිබඳ අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ. එම අමාත්‍යාංශ කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා පාලන අංශය, පිරිස් පුහුණු අංශය, මූල්‍ය අංශය, ඉංජිනේරු කාර්යාංශය හා සැලසුම් අංශය, වශයෙන් අංශ පහක්ද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවද වේ. එසේම පළාත් සභාවේ සියළු ආයතන නියාමනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක වේ. ප්‍රධාන ලේකම් බස්නාහිර පළාතේ මුදල්, ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසද, පළාත් භාණ්ඩාගාර ලේකම් ලෙසද, අමාත්‍ය මණ්ඩල ලේකම් ලෙසද කටයුතු කරනු ලැබේ. මෙයට අමතරව අනෙකුත් අමාත්‍යාංශවලට පළාත් සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම හා මග පෙන්වීම සිදුකෙරේ.

## 2. ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



# 4.1

# පාලන අංශය

## 1. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ප්‍රධාන ලේකම් | | 1 |
| 2 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 3 | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය (111 / 11 ශ්‍රේණිය) | 2 |
| 4 | නීති නිලධාරි | දෙපාර්තමේන්තුමය | 1 |
| 5 | ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ නිලධාරී හා පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 6 | පරිපාලන නිලධාරී (පාලන) | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 2. පාලන අංශයේ සංවිධාන ව්‍යුහය



## 3. කාර්ය භාරය

### 3.1 පෞද්ගලික ලිපිගොනු

ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඉංජිනේරු කාර්යාංශයේ පෞද්ගලික ලිපි ගොනු 775 ක් පාලන අංශය මගින් නඩත්තු කරනු ලැබේ. එම ලිපි ගොනුවලට අදාලව,

- වාර්ෂික කාර්ය සාධනය ඇගයීම
- වැටුප් වර්ධක ප්‍රදානය
- සේවය ස්ථිර කිරීම
- වැටුප් පරිවර්තන
- අන්තර්ග්‍රහණය කිරීම
- විශ්‍රාම ගැන්වීම් හා විශ්‍රාම වැටුප් ගොනු සැකසීම

ආදී වූ කටයුතු සියල්ල පාලන අංශය මගින් කරනු ලබයි.

### 3.2 ඉඩම් හා ගොඩනැගිලි

බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන වෙත අත්පත් කරගැනීමට යෝජිත ඉඩම් සඳහා අත්පත් යෝජනාව ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව පළාත් සභා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**2015 වර්ෂය තුළ ඉඩම් අත්පත් යෝජනා**

| | |
|---|---|
| වර්ෂය තුළ ලැබූ ඉල්ලීම් ප්‍රමාණය | 8 |
| ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින ප්‍රමාණය | 4 |
| අඩුපාඩු හේතුවෙන් හරවා යැවූ ප්‍රමාණය | 4 |

- **ගොඩනැගිලි කඩා ඉවත් කිරීම**

බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන සතු පැරණි හා ඵලදායී නොවන ගොඩනැගිලි කඩා ඉවත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.

| ඉල්ලීම යොමු කරන ලද ආයතන | ඉල්ලීම් ප්‍රමාණය | අනුමැතිය ලබා දුන් ප්‍රමාණය | ප්‍රතික්ෂේපිත ප්‍රමාණය |
|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) | 36 | 33 | 3 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.) | 2 | 2 | - |

## 3.3 විනය කටයුතු

ප්‍රධාන ලේකම් විනය බලධාරියා වශයෙන් කටයුතු කළයුතු නිලධාරීන්ගේ විනය කටයුතු සිදු කරනු ලබන අතර, පළාත් සභාවේ සේවය කරන දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධ ලිපි ලේඛණ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහිතව අදාල විනය බලධාරියා වෙත යවනු ලැබේ.

2015 වර්ෂයේ විනය කටයුතු ප්‍රගතිය

| වර්ෂය ආරම්භයේ තිබූ විනය කටයුතු (ගොනු) | වර්ෂයේ අළුතින් එකතු වූ විනය කටයුතු (ගොනු) | නිර්දේශ සහිතව විනය බලධාරියා වෙත යොමු කර ඇති ගොනු | විමර්ශන මට්ටමේ ඇති ගොනු | අවසන් තීරණය ලබා දී ඇති නමුත් මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැති ගොනු | අවසන් කර ඇති විනය ගොනු |
|---|---|---|---|---|---|
| 33 | 01 | 05 | 18 | 03 | 08 |

## 3.4 නීති කටයුතු

- ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළු බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අධිකාරි වල නීතිමය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රඥප්ති කමිටු රැස්වීම පැවැත්වීම, ප්‍රඥප්ති සම්පාදනයට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම සහ උපදෙස් ලබා දීම.
- බස්නාහිර පළාත් සභා පැමිණිලි සම්බන්ධව සහ නඩු කටයුතු සම්බන්ධව අවශ්‍ය අවස්ථාවන්හිදි අධිකරණය හමුවේ පෙනී සිටීම.
- නීතිමය ලේඛණ සැකසීම, අවශ්‍ය අවස්ථාවලදී නීති උපදෙස් ලබා දීම සහ නීති විෂය සම්බන්ධ ගොනු නිවැරදිව පවත්වා ගෙන යාම නීති විෂයට අදාලව ඉටු කරනු ලැබේ.

| අමාත්‍යාංශය | 2015 ට පෙර පැවති නඩු ගණන | 2015 වසරේ ලැබුනු නඩු ගණන | | | | | මුළු ගණන | 2015 වසරේ අවසන් වූ නඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| | | ශ්‍රේෂ්ඨාධිකරණ | අභියාචනාධිකරණ | මහාධිකරණ | දිසා අධිකරණ | සිවිල් අභියාචන නඩු | | |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 04 | 03 | 01 | - | - | - | 08 | - |
| පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශය | 01 | - | 01 | - | - | - | 02 | - |
| පළාත් ධීවර හා මාර්ග අමාත්‍යාංශය | 03 | - | - | 01 | - | - | 04 | - |
| පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 09 | - | - | - | 01 | - | 10 | - |
| ආදායම් දෙපාර්තමේන්තුව | 09 | - | - | - | 01 | - | 10 | - |
| නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව | 01 | 01 | 01 | - | - | - | 03 | - |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 32 | - | 08 | 19 | 03 | 01 | 63 | 06 |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | - | - | 02 | - | - | 02 | - |
| ආයුර්වේද කොමසාරිස් | 02 | - | - | - | - | - | 02 | - |
| එකතුව | **61** | **04** | **11** | **22** | **05** | **01** | **104** | **06** |

## ප්‍රඥප්ති සම්බන්ධ කටයුතු

2015 වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රඥප්ති කමිටුව විසින් පහත සඳහන් ප්‍රඥප්ති පිළිබඳ සාකච්ඡා අවසන් කර නිර්දේශ ලබා දී ඇත. එම ප්‍රඥප්ති සම්මත කිරීමට අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කර ඇත.

(01) 1990 අංක 06 දරණ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය.

(02) 2010 අංක 06 දරණ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියට ගෙනෙන ලද සංශෝධන.

(03) 2014 මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, නගරාධිපති, සභාපති, සභිකවරුන් සඳහා ජීවිත රක්ෂණ ක්‍රමයකට දායක මුදල් ගෙවීම පිළිබඳ ප්‍රඥප්තිය හා සමුපකාර විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ සංශෝධන.

(04) 1990 අංක 03 දරණ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති.

(05) කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ආයතන කාර්යය පටිපාටි රීති (1 කොටස).

(06) ප්‍රාදේශිය සභා සභාපතිවරුන්ට හා උප සභාපතිවරුන්ට නිවාස හා ජංගම දුරකථන පහසුකම් සලසා දීම සඳහා වු ප්‍රඥප්තිය.

තවද 2015 වර්ෂයේ සාකච්ඡාවට ගන්නා ලද 2011 අංක 04 දරණ ප්‍රඥප්තියෙන් කියවෙන 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියට ගෙනෙන ලද සංශෝධන සම්පූර්ණයෙන්ම පරිච්ඡින්න කර නව ප්‍රඥප්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් මතු වු හෙයින් ප්‍රඥප්ති කමිටුවෙන් ඉවත් කරන ලද අතර තොරතුරු තාක්ෂණ අධිකාරි ප්‍රඥප්තිය සහ 1994 අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිළිබඳ කෙටුම්පත් සාකච්ඡා කරන ලද සංශෝධන සිදු කර ඉදිරිපත් කරන ලෙස දන්වා අදාල අමාත්‍යාංශ වෙත දන්වා යවා ඇත.

## 3.5 මහජන පෙත්සම්

ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාලව ජනාධිපති කාර්යාලයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළුව රජයේ වෙනත් ආයතන, පළාත් සභාවට අයත් විවිධ ආයතන සහ මහජනතාවගෙන් ලැබෙන පෙත්සම්, පැමිණිලි සහ දුක්ගැනවිලි සම්බන්ධව විමර්ශනය කර අදාල ආයතන වෙත යොමු කරවීම සහ ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**2015 වර්ෂය තුළ විවිධ ආයතන වලින් ලද පෙත්සම්/ පැමිණිලි පිළිබඳ වාර්තාව**

| ආයතනය | ලද පැමිණිලි/ පෙත්සම් ප්‍රමාණය | පරීක්ෂණ මට්ටමේ ඇති ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය |
|---|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය | 18 | 126 | 60 |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | 09 | | |
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 08 | | |
| පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය | 04 | | |
| දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය | 04 | | |
| මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ | 20 | | |
| බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 37 | | |
| බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 15 | | |
| වෙනත් | 71 | | |
| මුළු පැමිණිලි සංඛ්‍යාව | 186 | 126 | 60 |

## 3.6 වාහන මිලදී ගැනීම

බස්නාහිර පළාත් සභාවේ සියළුම ආයතන වලින් අවශ්‍යවන්නා වූ නව වාහන මිලදී ගැනීම් සම්බන්ධයෙන් වන ඉල්ලීම් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පවතින වාහන කමිටුව වෙත යොමු කර එහි නිර්දේශ හා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් ජාතික අය වැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා යොමුකර ඉන් ලැබෙන අනුමැතිය මත වාහන මිලදී ගැනීමට ඉදිරි කටයුතු සිදු කිරීම.

| අනු අංකය | ආයතනය | වාහන වර්ගය | ප්‍රමාණය | මිලදී ගත් හෝ ප්‍රතිපාදන ලබා දුන් දිනය |
|---|---|---|---|---|
| 1 | ප්‍රධාන ලේකම් කාර්යාලය | කාර් | 2 | 2015.01.27 |
| 2 | ඉංජිනේරු කාර්යාංශය | කාර් | 3 | 2015.01.27 |
| 3 | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | කාර් | 1 | 2015.02.19 |

## 3.7 හදිසි අනතුරු වන්දි

බස්නාහිර පළාත් සභාව තුල සේවය කරන නිලධාරීන් රාජකාරී කාලය තුල යම් අනතුරකට මුහුණු දුන් විට ඊට අදාල වන්දි, වන්දි මණ්ඩලය මගින් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

වන්දි ඉල්ලීම් - 51

වන්දි මණ්ඩලය වෙත යොමු කර ඇති හදිසි අනතුරු සංඛ්‍යාව - 51

අනුමත වූ සංඛ්‍යාව - 25

## 3.8 දීමනා කමිටුව

බස්නාහිර පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වලින් ලැබෙන ඉල්ලීම්, යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම.

2015 වර්ෂයේ දීමනා කමිටුව වෙත ඉදිරිපත් වී ඇති යෝජනා පිළිබඳ වාර්තාව

| දීමනා වර්ගය | ලැබුනු ප්‍රමාණය | කමිටුව නිර්දේශ කළ ප්‍රමාණය | අනුමැතිය ලත් ප්‍රමාණය | ප්‍රතික්ෂේප ප්‍රමාණය | අවසන් පිළිතුර ලබා දීමට ඇති ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| භාෂා දීමනාව | 37 | 32 | 32 | 5 | - |
| අනෙකුත් දීමනා | 66 | 51 | 51 | 15 | - |

## 3.9 ණය මුදල්

ප්‍රධාන ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ඉංජිනේරු කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන ලබන සංවර්ධන සහකාර නිලධාරීන්ගේ ආපදා ණය, පා පැදි ණය, ණයගැති භාවයෙන් මිදීමේ ණය, උත්සව අත්තිකාරම්, විශේෂ අත්තිකාරම් හා දේපළ ණය නිලධාරීන්ගේ ඉල්ලීම අනුව ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම. ඒ අනුව 2015 වර්ෂයේදී පහත පරිදි ණය මුදල් මුදා හැරීමට කටයුතු කර ඇත.

| ණය වර්ග | පුද්ගල සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---:|---:|
| ආපදා ණය | 270 | 18169393.50 |
| පාපැදි ණය | 1 | 6000.00 |
| ණයගැති භාවයෙන් මිදීමේ ණය | 2 | 15000.00 |
| උත්සව අත්තිකාරම් | 536 | 5080000.00 |
| විශේෂ අත්තිකාරම් | 175 | 700000.00 |
| එකතුව | **984** | **23970393.50** |

මීට අමතරව බැංකු මගින් ලබාගැනීම සඳහා රු.24,914,910.00 ක අගයක් ඇති දේපළ ණය අයදුම්පත් නිර්දේශ කර යවා ඇත.

## 3.10 ප්‍රතිපාදන නිදහස් කිරීම

ප්‍රාදේශීය පරිපාලන කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය සහ අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම.

| | වැය ශීර්ෂය | වැය විෂය | වෙන් කරන ලද ප්‍රතිපාදන රු. | මාරු කිරීම් හා පවරා ගැනීමෙන් පසු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය. රු | නිදහස් කරන ලද ප්‍රතිපාදන රු. | ඉතිරි ප්‍රතිපාදන රු. |
|---|---|---|---|---|---|---|
| 01 | 109-03-02-1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,000,000.00 | 3,015,500.00 | 2,706,643.08 | 308,856.92 |
| 02 | 109-03-02-1003 | වෙනත් දීමනා | 1,500,000.00 | 1,500,000.00 | 1,495,982.00 | 4,018.00 |
| 03 | 109-003-02-1101 | ගමන් වියදම් | 1,500,000.00 | 1,634,500.00 | 1,505,483.22 | 129,016.78 |
| 04 | 109-03-02-1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්. අවශ්‍යතා | 2,000,000.00 | 2,878,000.00 | 2,878,000.00 | - |
| 05 | 109-03-02-1202 | ඉන්ධන | 1,000,000.00 | 1,041,000.00 | 905,479.50 | 135,520.50 |
| 06 | 109-03-02-1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 150,000.00 | 202,500.00 | 143,619.45 | 58,880.55 |
| 07 | 109-03-02-1402 | තැපැල් හා විදුලි සං.සේවා. | 500,000.00 | 480,000.00 | 431,739.47 | 48,260.53 |
| 08 | 109-03-02-1403 | විදුලිය හා ජලය | 400,000.00 | 500,000.00 | 340,530.92 | 159,469.08 |
| 09 | 109-03-02-1405 | වෙනත් | 1,000,000.00 | 1,400,000.00 | 1,259,410.48 | 140,589.52 |
| 10 | 109-03-02-1703 | වෙනත් | 200,000.00 | 250,000.00 | 204,624.76 | 45,375.24 |
| 11 | 109-03-02-1205 | වෙනත් | 100,000.00 | 79,000.00 | 65,599.00 | 13,401.00 |
| | | එකතුව | **11,350,000.00** | **12,980,500.00** | **11,937,111.88** | **1,043,388.12** |

## 3.11 රැස්වීම් හා උත්සව සංවිධානය

ලේකම්වරුන්ගේ සහ කළමනාකරණ කමිටු රැස්වීම් 2015.

| මාසය | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලේකම්වරුන් ගේ රැස්වීම | 2 | - | 13 | - | 19 | 30 | - | 11 | - | - | 13 | - |
| කළමනාකරණ කමිටු රැස්වීම | 12 | - | 9 | - | 18 | - | 6 | 11 | - | 5 | 2 | - |
| | 26 | - | - | - | - | - | - | - | - | - | - | - |

- 2015.02.04 දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පැවති, 67 වෙනි නිදහස් සමරු උළෙල සඳහා පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් යොමු කිරීම.
- චීනයේ සීජියැං පළාතේ ශ්‍රී ලංකා නියෝජිතවරුන්ගේ මිත්‍රත්ව හුවමාරු සහ සහයෝගීතා සමුළුව 2015 අප්‍රේල් මස 24 දින පැවැත්වීම.
- 2015.05.03 දින වෙසක් උත්සවය සැමරීම.
- ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ පළාත් ප්‍රධානීන් සමඟ සාකච්ඡා 2015.10.19 හා 2015.10.26 දිනයන්හිදී පවත්වන ලදි
- 2015.12.01 දින කෘෂිකර්ම උපදේශක වෘත්තීය ගැටලු විසඳා ගැනීම සම්බන්ධ සාකච්ඡාව පැවැත්වීම.

## 3.12 චක්‍රලේඛ

රාජ්‍ය පරිපාලන, වෙනත් අමාත්‍යාංශ හා ආයතන විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය අනුව ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර අනුමැතිය ලද පසු එම චක්‍රලේඛ අනුව කටයුතු කිරීම සඳහා බස්නාහිර පළාතේ සියලුම ආයතන දැනුවත් කිරීම හා උපදෙස් නිකුත් කිරීම සහ පළාත් සභාවට අදාල චක්‍රලේඛ නිකුත් කිරීම.

**2015 වර්ෂය තුල අදාල කරගත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු චක්‍රලේඛ.**

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| **01/2015** | 2015.01.06 | 67 වන ජාතික දින උළෙල -2015 |
| **03/2015** | 2015.01.29 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම. |
| **04/2015** | 2015.01.29 | ජනමාධ්‍යයන් වෙත ප්‍රකාශ නිකුත් කිරීම. |
| **05/2015** | 2015.02.11 | 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ දීමනා සංශෝධනය කිරීම. |

| චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| **07/2015** | 2015.03.26 | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය සංශෝධනය කිරීම - උත්සව අත්තිකාරම් |
| **09/2015** | 2015.04.17 | දේශපාලන හේතුන්මත විවිධ ගැටලුවලට මුහුණදුන් අයට සහන සැලසීම |
| **04/2009(I)** | 2015.04.22 | බර වාහන රියැදුරු බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු |
| **10/2015** | 2015.04.23 | ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම |
| **11/2015** | 2015.05.20 | රජයේ නිලධරයන්ගේ වගකීම් සහ සේවාලාභීන්ගේ අයිතිවාසිකම් |
| **12/2015** | 2015.06.01 | 2015 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබාදීම |
| **06/2014(II)** | 2015.06.03 | ව්‍යාප්ති කටයුතුවල නිරත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දීමනා |
| **15/2015** | 2015.06.23 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2016 |
| **16/2015** | 2015.06.25 | රාජ්‍ය සේවය සඳහා 2006.01.01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් ව්‍යුහය අනුව විශ්‍රාම වැටුප සංශෝධන කිරීම |
| **18/2015** | 2015.06.26 | රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම |
| **17/2015** | 2015.07.03 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2016 |
| **18/2015(I)** | 2015.07.13 | රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම |
| **19/2015** | 2015.07.29 | රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම |
| **21/2015** | 2015.08.17 | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය සංශෝධනය කිරීම උත්සව අත්තිකාරම් |
| **15/2007(III)** | 2015.09.29 | රජයේ සේවකයින් සඳහා බැංකු මඟින් දේපළ හා වාහන ණය ලබා දීම |
| **22/99(XXXI)** | 2015.10.14 | රාජ්‍ය නිලධරයන්/පළාත් රාජ්‍ය නිලධරයන්/අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම් |
| **22/2015** | 2015.11.17 | බඳවා ගැනීමේ පටිපාටිවලට ඇතුලත් කළ යුතු වෙනත් අධ්‍යාපනික සුදුසුකම් |
| **23/2015** | 2015.11.30 | ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය සැමරීම - 2015/12/09 |
| **12/2005 (V)** | 2015.11.30 | 2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධරයන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම ( අග්‍රහාර ) |
| **24/2015** | 2015.12.16 | වැඩ වසර ඇරඹීම - 2016 |
| **25/2015** | 2015.12.16 | රජයේ ගොඩනැගිලි කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2015.12.31 |
| **26/2015** | 2015.12.29 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2016 වසර |

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි.

| චක්‍රලේඛ ලිපි අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| **01/2015** | 2015.04.15 | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම<br>(යොමුව රා.ප.ච. 09/2014) |
| **04/2015** | 2015.07.06 | ලෝහෝර් ආර්යා ණය මුදලේ වාරික අය කිරීම |
| **03/2015** | 2015.07.20 | වැටුප් පිළිබඳ ගැටලු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු උපදෙස් මාලාව |
| **05/2015** | 2015.10.23 | රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාවන් |

## ස්වදේශ කටයුතු චක්‍රලේඛ

| චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| **02/2015** | 2015.04.24 | ශ්‍රී බුද්ධ වර්ෂ 2559 වෙසක් උත්සවය සැමරීම |
| **03/2015** | 2015.05.18 | ජනරජ දිනය සැමරීම. |
| **13/2015** | 2015.12.29 | ශ්‍රී ලංකාව තුළ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කිරීමේ සද්කාර්යයට කැපවෙමු. |
| **12/2015** | 2015.12.28 | 68 වන නිදහස් සමරු උළෙල -2015 |

## 2015 වර්ෂය තුල අදාල කරගත් වෙනත් චක්‍රලේඛ

| චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ වර්ගය | කාරණය |
|---|---|---|---|
| 02-13/2014 | 2014.01.29 | සෞඛ්‍ය | සෞඛ්‍ය අමාත්‍යාංශයේ කණිෂ්ඨ සේවක නිල ඇඳුම් දීමනාව |
| 02-174/2014 | 2014.12.12 | සෞඛ්‍ය | වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ 1 ශ්‍රේණියේ උසස්වීම් ලබා දීම |
| 02-59/2014 | 2014.03.13 | සෞඛ්‍ය | වෛද්‍ය කර්ම සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඇමතුම් දීමනාව සංශෝධනය කිරීම |
| 02-175/2014 | 2014.12.19 | **සෞඛ්‍ය** | 2015 අයවැය යෝජනා අනුව නිල ඇඳුම් දීමනා සංශෝධනය |
| 02-57/2015 | 2015.05.26 | සෞඛ්‍ය | සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා දීමනා ලබා දීම |
| 02-43/2015 | 2015.04.10 | **සෞඛ්‍ය** | සෞඛ්‍ය සේවයේ දීමනා සංශෝධනය කිරීම |
| 02-36/2015 | 2015.04.02 | **සෞඛ්‍ය** | වෛද්‍ය නිලධාරීන් සඳහා රාජකාරි බාධා, පැමිණි සිටිමේ හා ප්‍රවාහන දීමනා ( DAT) ගෙවීම සංශෝධනය |
| 02-78/2014 | 2014.05.09 | සෞඛ්‍ය | හෙද කාර්යය මණ්ඩල සඳහා අනතුරු දීමනාව සංශෝධනය කිරීම |
| 02-173/2014 | 2014.12.12 | සෞඛ්‍ය | හෙද නිලධාරි 1 ශ්‍රේණියට උසස් කිරීම |
| 02-65/2014 | 2014.04.03 | සෞඛ්‍ය | අතුරු වෛද්‍ය සේවාවේ දීමනා සංශෝධනය කිරීම |
| 02-78/2015 | 2015.07.13 | සෞඛ්‍ය | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන් සඳහා ඇමතුම් දීමනා ගෙවීම |
| 7/2001 (අ) | 2001.08.31 | සෞඛ්‍ය | රජයේ නිවාඩු දිනයන්හි සහ සති අන්තයෙහි සේවය වෙනුවෙන් 1/20 දීමනාව ගෙවීම - වෛද්‍ය නිලධාරීන් සඳහා |
| 02-58/2014 | 2014.03.13 | සෞඛ්‍ය | අතුරු වෛද්‍ය සේවාවේ ඇමතුම් දීමනාව සංශෝධනය කිරීම |
| 01-18/2009 | 2009.05.26 | සෞඛ්‍ය | ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්, විශේෂඥ වෛද්‍ය නිලධාරීන් හා පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගේ අතිරේක රාජකාරී සඳහා දීමනා ගෙවීම |
| 02-101/2015 | 2015.08.18 | සෞඛ්‍ය | විකිරණ ශිල්පී දීමනා |

## 3.13 බිල්පත් පියවීම.

ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාල සියළු බිල්පත් ගෙවීම් කිරීම.

බිල්පත් ගෙවීම පිලිබඳ විස්තරය.

| අනු අංකය. | බිල්පත් වර්ගය. | මසකට ලැබෙන බිල්පත් ප්‍රමාණය | මසක සාමාන්‍ය අගය. | වාර්ෂික සාමාන්‍ය අගය. |
|---|---|---|---|---|
| 01 | ස්ථාවර දුරකථන බිල්පත්. | 41 | 61972.61 | 743,671.28 |
| 02 | ජංගම දුරකථන බිල්පත්. | 10 | 14016.30 | 168,195.60 |
| 03 | අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ දුරකථන දීමනා. | 20 | 10833.33 | 130,000.00 |
| 04 | ජල බිල්පත (කාර්යාලය). | 01 | 70551.83 | 846,621.90 |
| 05 | ජල බිල්පත (මොරන්න). | 01 | 2847.39 | 34,168.63 |
| 06 | විදුලි බිල්පත (කාර්යාලය). | 01 | 1421318.05 | 17,055,816.55 |
| 07 | විදුලි බිල්පත (මොරන්න). | 01 | 24897.74 | 298,772.87 |
| 08 | වරිපනම් බදු (කාර්යාලය). | වසරකට බිල්පත් 01 | | 858,286.80 |
| 09 | වරිපනම් බදු (මොරන්න). | වසරකට බිල්පත් 01 | | 8,160.01 |
| හොරණ | 104 | 5,537,450.00 | 5,382,239.00 | 97.20% | 97.21% |
| මදුරාවල | 56 | 3,611,500.00 | 3,395,798.00 | 94.03% | 92.14% |
| බුලත්සිංහල | 42 | 3,669,000.00 | 3,546,008.00 | 96.65% | 97.62% |
| දොඩන්ගොඩ | 48 | 4,861,500.00 | 4,434,669.00 | 91.22% | 87.50% |
| බේරුවල | 73 | 11,240,000.00 | 11,046,893.00 | 98.28% | 98.22% |
| මතුගම | 65 | 6,711,000.00 | 5,855,092.00 | 87.25% | 90.31% |
| අගලවත්ත | 48 | 3,524,000.00 | 3,367,509.00 | 95.56% | 97.50% |
| වලල්ලාවිට | 36 | 3,955,000.00 | 3,782,745.00 | 95.64% | 100.00% |
| පාලින්දනුවර | 42 | 3,929,000.00 | 3,649,780.00 | 92.89% | 91.90% |
| මිල්ලනිය | 63 | 4,602,500.00 | 4,544,459.50 | 98.74% | 96.83% |
| ඉංගිරිය | 46 | 5,306,500.00 | 5,111,070.00 | 96.32% | 97.83% |
| පොදු | 42 | 8,567,000.00 | 7,224,048.00 | 84.32% | 85.24% |
| **එකතුව** | **989** | **102,760,125.00** | **96,396,914.75** | **93.81%** | **94.61%** |

## 3.4 පළාත් නිශ්චිත කාර්යය සංවර්ධන ප්‍රදාන (විදේශීය) අරමුදල

| විෂය | ව්‍යාපෘති ගණන | අනුමත මුදල රු.මි. | වැය කළ මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය | 222 | 375.88 | 332.51 | 88.46 | 88.46 |
| අධ්‍යාපන | 86 | 286.05 | 234.02 | 81.81 | 97.67 |

## 3.5 පළාත් නිශ්චිත කාර්යය සංවර්ධන ප්‍රදාන (දේශීය) අරමුදල

| අමාත්‍යාංශය | ව්‍යාපෘති ගණන | අනුමත මුදල රු.මි. | සමුච්චිත වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| පළාත් පාලන හා පළාත් පරිපාලන අමාත්‍යාංශය | 385 | 256.66 | 220.18 | 85.79 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 157 | 207.69 | 184.83 | 88.99 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 61 | 77.29 | 68.64 | 88.81 |
| අධ්‍යාපන අමාත්‍යාංශ | 301 | 228.91 | 203.71 | 88.99 |
| මාර්ග අමාත්‍යාංශය | 139 | 491.39 | 445.96 | 90.75 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 54 | 76.32 | 72.63 | 95.17 |
| **එකතුව** | **1097** | **1,338.26** | **1,195.95** | **89.37** |

## 3.6 කුඩා පාලම් හා ප්‍රාද්ශීය අසමතුලිතතාව අවම කිරීමේ වැඩසටහන

| සංරචකය | ව්‍යාපෘති ගණන | අනුමත මුදල රු.මි. | වැය කල මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| මාර්ග සංවර්ධනය | 1 | 0.39 | 0.39 | 98.83 | 100.00 |
| සමාජ සුබසාධන | 1 | 1.13 | 0.48 | 42.67 | 100.00 |
| මාර්ග සංවර්ධනය | 2 | 3.50 | 3.25 | 92.93 | 100.00 |
| සත්ව නිශ්පාදනහා සංවර්ධනය | 1 | 19.37 | 19.37 | 99.98 | 100.00 |
| ග්‍රාම සංවර්ධන | 3 | 3.58 | 3.58 | 100.00 | 100.00 |
| **එකතුව** | **8** | **27.97** | **27.07** | **97.78** | **100.00** |

## 3.7 පළාත් සංවර්ධන පොදු, උපමාන පාදක පොදු වැඩසටහන

| සංරචකය | ව්‍යාපෘති ගණන | මුළු මුදල රු.මි. | වැය කල මුදල රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| අධ්‍යාපන | 26 | 3.09 | 1.65 | 53.59 | 57.69 |
| පෙර පාසල් | 3 | 0.43 | 0.12 | 30.09 | 66.67 |
| විදුලිය | 3 | 0.13 | 0.13 | 99.98 | 100.00 |
| ග්‍රාමීය සහ කුඩා පරිමාණ කර්මාන්ත | 56 | 7.28 | 6.22 | 85.52 | 82.14 |
| සෞඛ්‍ය | 1 | 0.30 | 0.30 | 100.00 | 100.00 |
| සමාජ සුබසාධන | 26 | 2.75 | 2.10 | 76.44 | 69.23 |
| මාර්ග සංවර්ධනය | 25 | 5.44 | 3.65 | 71.14 | 66.67 |
| නිවාස හා ඉදිකිරීම් | 39 | 4.60 | 3.87 | 83.99 | 79.49 |
| ධීවර සංවර්ධනය | 1 | 0.30 | 0.29 | 99.67 | 100.00 |
| ක්‍රීඩා | 5 | 0.50 | 0.32 | 65.83 | 60.00 |
| සංස්කෘතික හා කලා | 23 | 1.94 | 1.67 | 86.41 | 82.61 |
| ග්‍රාම සංවර්ධන | 7 | 0.42 | 0.37 | 87.89 | 85.71 |
| භෝග සංවර්ධනය | 4 | 0.90 | 0.89 | 99.86 | 100.00 |
| **එකතුව** | **219** | **28.10** | **21.65** | **77.05** | **75.34** |

මුදල් මූලාශ්‍ර අනුව අරමුදල් වෙන්වීම




අංශ අනුව අරමුදල් වෙන්වීම



වැය විෂයන් අනුව අරමුදල් වෙන්වීම




දිස්ත්‍රික් අනුව අරමුදල් වෙන්වීම



# 4.5

# ඉංජිනේරු කාර්යාංශය

## 1. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (I ශ්‍රේණිය) | 1 |
| 3 | අධ්‍යක්ෂ (ගොඩනැගිලි) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (I ශ්‍රේණිය) | 1 |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය) | 1 |
| 5 | ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (III / II ශ්‍රේණිය) | 27 |
| 6 | ගණකාධිකාරී | ගණකාධිකාරී සේවය (III / IIශ්‍රේණිය) | 1 |
| 7 | වාස්තු විද්‍යාඥ | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය (III / II ශ්‍රේණිය ) | 2 |
| 8 | ප්‍රමාණ සමීක්ෂක | දෙපාර්තමේන්තුගත (III / II ශ්‍රේණිය) | 1 |
| 9 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 10 | තාක්ෂණ නිලධාරී | තාක්ෂණ සේවය (තෘතීය මට්ටම) | 21 |
| 11 | තාක්ෂණ නිලධාරී | තාක්ෂණ සේවය (තෘතීය මට්ටම) | 6 |
| 12 | සැලසුම් ශිල්පී | තාක්ෂණ සේවය | 4 |

## 2. සංවිධාන සටහන



නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
අධ්‍යක්ෂ ගොඩනැගිලි
අධ්‍යක්ෂ ඉංජිනේරු
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන නිර්මිත ඉංජිනේරු
ප්‍රධාන ඉංජිනේරු (ජල සම්පාදන හා පල්දෝරු)
ඉංජිනේරු මූලස්ථාන
ප්‍රාදේශීය ඉංජිනේරු
ඉංජිනේරු (කොන්ත්‍රාත් පරිපාලන)
ඉංජිනේරු (ව්‍යාපෘති හා කොන්ත්‍රාත් අධීක්ෂණය)
ඉංජිනේරු (තත්ව සහතික)
ඉංජිනේරු (නිර්මිත)
ඉංජිනේරු ජලසම්පාදන හා පල්දොරු
විදුලි ඉංජිනේරු
වාස්තු විද්‍යාඥ
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තාක්ෂණ නිලධාරී
තාක්ෂණ නිලධාරී
සංවර්ධන නිලධාරී
තත්ව පාලන ඒකකය
තාක්ෂණ නිලධාරී
ප්‍රමාණ සමීක්ෂක
සැලසුම් ශිල්පී
තාක්ෂණ නිලධාරී
සංවර්ධන නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සහකාර
ප්‍රධාන කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
විදුලි කාර්මික/ රියදුරු/ කාර්යාල සහායක
රියදුරු / කාර්යාල සහායක
රියදුරු කාර්යාල කාර්ය සහායක
රියදුරු කාර්යාල කාර්ය සහායක
රියදුරු කාර්යාල කාර්ය සහායක

## 3. ආයතනයේ කාර්යය භාරය

- බස්නාහිර පළාත් සභාවට අයත් පාසල් ගොඩනැගිලි නිර්මාණය, ඉදිකිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීමට අදාල සැලසුම්, ඇස්තමේන්තු, ප්‍රසම්පාදන ලියකියවිලි සැකසීම, ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය.
- බස්නාහිර පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා ඉංජිනේරුමය උපදේශන සේවා සැපයීම
- මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසැල් වල නව ගොඩනැගිලි ඉදිකිරීම හා පවත්නා ගොඩනැගිලි වලට අදාල ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු සැකසීම සහ කොන්ත්‍රාත් පරිපාලනය.
- ප්‍රාදේශීය පරිපාලනය (එනම් දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්) විසින් යොමු කරන ලබන ඉදිකිරීම් වැඩ සඳහා ඇස්තමේන්තු සැකසීම සහ කොන්ත්‍රාත් පරිපාලනය, ප්‍රාදේශීය සභා ඇතුලු පළාත් පාලන ආයතන සඳහා උපදේශන සේවා ලබා දීම.
- ගොඩනැගිලි, මාර්ග සහ සුළු වාරිමාර්ග කටයුතු සඳහා ඉදිකිරීම් ඇස්තමේන්තු සකස් කිරීමට පාදක කර ගන්නා රේට් මිල ගණන් ඇතුළත් ගාස්තු උප ලේඛණ පිලියෙළ කිරීම.
- ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාල ඇතුළු ඉංජිනේරු කාර්යාංශයේ සේවය කරන සියළුම කාර්ය මණ්ඩල ආයතනික කටයුතු සහ ඉංජිනේරු කාර්යාංශයේ වැය ශීර්ෂයට අදාල සියළුම මූල්‍ය කටයුතු

## 3.1 උපදේශන සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද රාජකාරී

- බස්නාහිර පළාත් සභාවට අයත් ගොඩනැගිලිවල ඉදිකිරීම්වලට අදාලව වාස්තු විද්‍යාත්මක සැලසුම්, නිර්මිත සැලසුම්, ජල සම්පාදන සහ පල්දෝරු සැලසුම්, විදුලි සැලසුම් පිළියෙළ කිරීම සහ ඒවා අදාල කාර්යාල වෙත ලබා දීම
- සෑම වසරකම බස්නාහිර පළාත තුළ ඉදිකිරීම් සඳහා යොදා ගනු ලබන ගාස්තු පිළිබඳ උපලේඛණ සැකසීම (BSR, HSR, ISR)
- බස්නාහිර පළාත තුළ ඉදිකරනු ලබන ව්‍යාපෘති සඳහා උපදේශන සේවා සැපයීම
- තාක්ෂණ කමිටු සඳහා විශේෂ දැනුම ඇති නිලධාරීන්ගේ සේවය ලබා දීම
- ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාල ඇස්තමේන්තු සැකසීම සහ පරීක්ෂා කිරීම
- බස්නාහිර පළාත තුල ඇති ආයතන වලට උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය පිරිවිතර ලබා දීම, විදුලි ඉදිකිරීම් වලට අදාල ඇස්තමේන්තු සැකසීම සහ සැලසුම් සැකසීම
- විදුලි/ ඉලෙක්ට්‍රොනික් උපකරණ මිලදී ගැනීම්වලට අදාලව පිරිවිතර සැකසීම
- ඉදිකිරීම් වලට අදාල වැඩබිම් අධීක්ෂණය
- ඇගයුම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගී වීම

- කාර්මික විගනන වාර්තා ඉදිරිපත් කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විශේෂිත ගැටලු නිරාකරණය
- විදේශ ආධාර ව්‍යාපෘති පරිපාලනය
- සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචන කිරීම.

## 3.2 පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන ලද රාජකාරී

- ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාල අමාත්‍යාංශ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල අතර සම්බන්ධීකරණ කටයුතු සහ ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලවල කටයුතු අධීක්ෂණය
- පාසල් ගොඩනැගිලි කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම
- කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබා දීම
- මධ්‍යම රජය ප්‍රතිපාදන සපයන ව්‍යාපෘති කළමනාකරණයට අදාල කටයුතු
- ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලින් ඉටු කරනු ලබන ඉදිකිරීම් වල ප්‍රගති වාර්තා ලබා ගැනීම, සමාලෝචනය කිරීම සහ අදාල අංශ වෙත යොමු කිරීම.
- අමතර හා බාහිර වැඩ අනුමත කිරීම හා නිර්දේශ ලබාදීම (අදාල සීමාවන් තුල).
- ජාතික පාසල්වල සහ මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය හා අදාල අනුමැතිය ලබාදීම.
- පළාත් අධ්‍යාපන කාර්යාල මගින් ගොඩනැගිලි අංශය වෙත ඉදිරිපත් කෙරෙන ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ අදාල සීමාවන් තුල අනුමත කිරීම.

### ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි හා සේවාවන් සැපයීමට අදාල පහත සඳහන් ඉංජිනේරුමය කාර්යයන්

- ශ්‍රාවස්ති පරිශ්‍රයේ ගොඩනැගිලි ඇතුළුව පළාත් සභාවට අයත් අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සහ ආයතනවලට අයත් ගොඩනැගිලි වල ඉංජිනේරුමය නඩත්තු කටයුතු වල ඇස්තමේන්තු පිළියෙල කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම, කොන්ත්‍රාත් අධීක්ෂණය හා බිල්පත් නිර්දේශ කිරීම යනාදි කටයුතු සම්බන්ධීකරණය.
- ප්‍රධාන ලේකම් කාර්යාලය ගොඩනැගිලි නඩත්තු කලමනාකරණය
- ඉදිකිරීම් සහ ප්‍රසම්පාදනය කටයුතු වලට අදාල ප්‍රතිපත්තිමය තීරණ වලට අදාල චක්‍රලේඛ සහ උපදෙස් පත්‍රිකා නිකුත් කිරීම
- ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම
- තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් ඉදිකිරීම් ප්‍රගති සමාලෝචන පද්ධති නිර්මාණය කිරීම

**පළාත් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| | 2015 අනුමත ව්‍යාපෘති ගණන | 2015 අනුමත ප්‍රතිපාදන රු. මිලියන | වියදම රු .මිලියන | 100% වැඩ අවසන් | 50% වැඩි | 50% අඩු | 0% |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | 653 | 706.62 | 607.98 | 606 | 12 | 11 | 24 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 87 | 173.22 | 86.08 | 54 | 6 | 4 | 23 |
| එකතුව | **740** | **879.84** | **694.06** | **660** | **18** | **15** | **47** |

**මධ්‍යම රජයේ ප්‍රතිපාදන හා විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| | 2015 අනුමත ව්‍යාපෘති ගණන | 2015 අනුමත ප්‍රතිපාදන රු. මිලියන | * වියදම රු.මිලියන | 100% වැඩ අවසන් | 50% වැඩි | 50% අඩු | 0% |
|---|---|---|---|---|---|---|---|
| ඉසුරු පාසල් ව්‍යාපෘතිය යටතේ අනුමත ව්‍යාපෘතිය (ISURU) | 214 | 866.49 | 228.63 | 79 | 32 | 51 | 52 |
| එකතුව | **214** | **866.49** | **228.63** | **79** | **32** | **23** | **52** |

* මෙහි වියදම ලෙස දක්වා ඇත්තේ ප්‍රාදේශීය ඉංජිනේරු විසින් සහතික කළ බිල්පත් වල වටිනාකම පමණකි.

## 3.3 ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල කාර්යය භාරය

- ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් අධ්‍යාපන කලාපය තුළ ඇති ජාතික පාසල් හා පළාත් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.
- අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල, සායන ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල පවතින පළාත් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, කර්මාන්ත දෙපාර්තුමේන්තුව හා වෙනත් පළාත් සභා ආයතන වලට අයත් ගොඩනැගිලි වල ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.
- අනුමත වූ ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුගේ මුදල් සීමාව තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් කොන්ත්‍රාත් පිරිනැමීම.
- අදාළ වැඩබිම් අධීක්ෂණය, පරීක්ෂා කිරීම් හා ගෙවීම් නිර්දේශ කිරීම.
- ජාතික පාසල් ව්‍යාපෘතිවල ඉදිකිරීම් වලට අදාළ බිල්පත්වල නිම කළ වැඩවල වටිනාකම සහතික කර, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- ජාතික පාසල් හා පළාත් පාසල් වල පැරණි අබලන් ගොඩනැගිලි කඩා ඉවත් කිරීම සඳහා තත්ත්ව වාර්තා හා තක්සේරු වටිනාකම නිර්දේශ කර බස්නාහිර පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීම.
- බස්නාහිර පළාත් සභා ආයතන වල, ප්‍රසම්පාදන අස්ථිත්වය මගින් ක්‍රියාත්මක කරනු ලබන ගොඩනැගිලි වල ඉදිකිරීම් හා අළුත්වැඩියා ව්‍යාපෘති වල ලංසු ඇගයීම වාර්තා ලබා දීම.
- කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු

## 4. විශේෂ කාර්යයන්

- "සනීපාරක්ෂාව පෙරට" යන මැයෙන් පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ජාතික වැඩසටහන - 2015 ක්‍රියාත්මක කිරීම
- "ළගම පාසල හොදම පාසල" සංකල්පය යටතේ බස්නාහිර පළාත තුල තෝරාගත් පාසල් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඉංජිනේරු කාර්යාංශයේ ඉංජිනේරුවරුන් හා තාක්ෂණ නිලධාරීන් සඳහා ජල සම්පාදන හා පල්දොරු පද්ධති පිළිබඳ එක් දින වැඩමුළුවක් පැවැත්වීම.

## 5. වියදම් ඇස්තමේන්තුව

| වැය ශීර්ෂය | විස්තරය | ඇස්තමේන්තුගත මුදල් | ප්‍රතිපාදන මාරු කිරීම | පරිපූරක ඇස්තමේන්තුව | ශුද්ධ වියදම් |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | පෞද්ගලික පඩිනඩි<br>අනෙකුත් වියදම් | 153,559,000/-<br>49,861,000/- | 2,170,000/-<br>(2,227,300/-) | 30,236,000/-<br>3,000,000/- | 184,919,449/-<br>49,063,157/- |
| මූලධන වියදම් | | 1,506,000,000/- | 57,300/- | - | 1,147,525,299/- |

# 4.6

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා බස්නාහිර පළාත් සභාව සවිබල ගැන්වීම.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත තුළ ජන ජීවිතය ඉහළ නැංවීමෙහිලා සැලසුම් කරනු ලබන ආර්ථික, සාමාජීය හා දේශපාලනික උපනතීන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වන බදු සහ වෙනත් ආදායම් රැස්කිරීම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට පැවරී ඇති මෙහෙවර වන්නේය. මෙම මෙහෙවර ඉටු කිරීමට ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය එක්සත්ව කැපවී සිටී.

### 1.3 කාර්යයන්

හිග පිරිවැටුම් බදු රැස්කිරීම, තෑගි තරග බදු, ඛනිජ බදු, අරක්කු තැබෑරුම් රේන්ද, රා තැබෑරුම් රේන්දය, රා මැදීමේ බලපත්‍ර ගාස්තු, මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු, පිටරට මත්පැන් බලපත්‍ර ගාස්තු, තැපැල් හා උසාවි කටයුතු හැරුනු විට ඇති ගිවිසුම් ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල් හා උසාවි ලේඛන මත මුද්දර ගාස්තු, මධ්‍යම රජයෙන් ලැබෙන ජාතිය ගොඩනැගීමේ බදු හා මුද්දර ගාස්තු, උකස් බලපත්‍ර ගාස්තු යන ආදායම් ඇස්තමේන්තු කිරීම හා එම ආදායම් රැස්කිරීම ද බස්නාහිර පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන සඳහා මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ආපසු පවරාදීම ප්‍රධාන කාර්යයන් වේ.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

මධ්‍යම රජයේ බලතල විමධ්‍යගත කිරීම සඳහාවූ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පිහිටුවන ලද පළාත් සභා ක්‍රමය යටතේ පළාතේ ආදායම රැස්කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව විසින් 1991.01.01 සිට පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

1991 වර්ෂයේ සිට 2010 වර්ෂය තෙක් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ශීර්ෂය වූයේ පළාත තුළ තොග හා සිල්ලර වෙළඳාම මත පිරිවැටුම් බදු අයකිරීම වේ. එහෙත් 2011 වර්ෂයේ මධ්‍යම රජයේ අයවැය මගින් පළාත් සභාවල පිරිවැටුම් බදු අයකිරීම අත්හිටුවන ලදී. මේ වනවිට දෙපාර්තමේන්තුව

රැස්කරනු ලබන ප්‍රධාන ආදායම වන්නේ 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි පළාතේ නිශ්චල දේපළ පැවරීම මත මුද්දර බදු අයකිරීම වේ. මීට අමතරව සුරාබදු බලපත්‍ර ගාස්තු, තෑගි තරඟ බදු, ඛනිජ බදු, උසාවි දඩ මුදල්, උසාවි ලේඛන මත මුද්දර ගාස්තු, උකස් බලපත්‍ර ගාස්තු, මධ්‍යම රජයෙන් ලැබෙන ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු ආදායම් රැස්කිරීම ආදි ආදායම් ශීර්ෂ 12 ක් යටතේ ආදායම් ගණන්දීම සිදුකරනු ලැබේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආදායම් කොමසාරිස් | පළාත් ආදායම් සේවය (I ශ්‍රේණිය) | 1 |
| 2 | නියෝජ්‍ය කොමසාරිස් | පළාත් ආදායම් සේවය (I ශ්‍රේණිය) | 5 |
| 3 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III / II ශ්‍රේණිය) | 1 |
| 4 | ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු/ තක්සේරුකරු | බස්නාහිර පළාත් ආදායම් සේවය (III / II ශ්‍රේණිය) | 73 |
| 5 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 01 |
| 6 | ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී/ බදු නිලධාරී | බස්නාහිර පළාත් ආදායම් සේවය | 95 |

## 4. ඉටුකරන ලද සේවාවන්

- බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සහ ඛනිජ බදු ප්‍රඥප්තිය යටතේ පළාත් සභාවට ලැබිය යුතු ආදායම් රැස්කිරීම.

    - **දෙපාර්තමේන්තුව රැස්කළ ආදායම් පිළිබඳ විස්තර**

**ඇස්තමේන්තුව හා තත්‍ය ආදායම**

| ආදායම් විෂය | | ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තුව | තත්‍ය ආදායම | අයවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 1 | රා තැබෑරුම් රේන්ද | 10.02.04.03 | 50,000,000 | 56,906,024 | 114 |
| 2 | රා මැදීමේ බලපත්‍ර ගාස්තු | 10.02.04.04 | 20,000 | 1,064,050 | - |
| 3 | මෙරට මත් පැන් බලපත්‍ර ගාස්තු | 10.02.04.05 | 270,000,000 | 656,590,095 | 243 |
| 4 | පිටරට මත්පැන් තැබෑරුම් රේන්ද | 10.02.04.06 | 8,000,000 | 8,060,748 | 101 |

| ආදායම් විෂය | | ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තුව | තත්‍ය ආදායම | අයවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 5 | තැපැල් හා උසාවි කටයුතු හැරුනු විට ඇති ගිවිසුම් ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු | 10.02.07.01 | 9,650,000,000 | 12,172,353,388 | 126 |
| 6 | උසාවි ලේඛන යටතේ මුද්දර ගාස්තු | 10.02.07.02 | 55,000,000 | 77,127,873 | 140 |
| 7 | පිරිවැටුම් බදු | 10.02.09.00 | 30,000,000 | 41,692,564 | 139 |
| 8 | තැගි තරහ බදු | 10.03.07.11 | 100,000,000 | 147,465,883 | 147 |
| 9 | ඛනිජ බදු | 20.03.02.30 | 6,000,000 | 4,391,684 | 73 |
| 10 | උසාවි දඩ | 20.03.03.01 | 760,000,000 | 746,504,805 | 98 |
| 11 | මුද්දර ගාස්තු (2011 අංක 10 දරන පළාත් සභා මුද්දර ගාස්තු මාරු කිරීමේ පනත යටතේ) | 10.02.07.00 | 5,500,000,000 | 4,550,130,219 | 83 |
| 12 | ජාතිය ගොඩ නැගීමේ බද්ද | 10.02.12.00 | 13,460,000,000 | 10,073,479,627 | 75 |
| 13 | උකස් බලපත්‍ර ගාස්තු | 10.03.07.10 | 4,000 | 3,572,043 | 89 |
| | **එකතුව** | | 29,889,024,000 | 28,539,339,003 | **95.4** |

- **රැස්කළ අතිරේක මුද්දර ගාස්තු ආදායම**

| කාර්යාලය | නිකුත් කරන ලද මත ප්‍රකාශ සංඛ්‍යාව | මත ප්‍රකාශ සඳහා 250 බැගින් අයකර ගත් ගාස්තුව | මතය ලබාදීම මගින් රැස්කළ ආදායම | ඌන මුද්දර ගාස්තු මගින් රැස්කළ ආදායම | පළාත් පාළන ආයතන තොරතුරු මගින් ලබාදුන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | A | **B** | **C** | D | **E** | **C+D+E** |
| කොළඹ | 2603 | 650750 | 179939974 | 42788335 | 775288 | 224156950 |
| මුද්දර අංශය | 3585 | 896250 | 109513080 | 61846416 | 11140121 | 183399452 |
| මහරගම | 3958 | 939500 | 100586315 | 5055261 | 8999780 | 115584814 |
| ගම්පහ | 3721 | 930250 | 66726709 | 13413295 | 2459559 | 83533534 |
| කළුතර | 756 | 189000 | 15864706 | 16402878 | 4495760 | 36953100 |
| එකතුව | 14623 | 3605750 | 472630784 | 139506185 | 27870508 | 643627850 |

**සටහන:-** ඉහත අතිරේක මුද්දර ගාස්තු රැස්කිරීම් ප්‍රමාණය ( C+D+E) 2015 තත්‍ය ආදායම තුළ ඇතුළත්ය

- **සුරාබදු බලපත්‍ර ආදායම්**




- **පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරනු ලැබූ වෙනත් ආදායම්**



- **මධ්‍යම රජයෙන් ලැබුණු ආදායම්**




- 1994 අංක 04 දරන උසාවි දඩ මුදල් සහ දඩ මුදල් පැවරීමේ ප්‍රඥප්තිය යටතේ සහ 2010 අංක 04 දරන මුද්දර ගාස්තු පැවරීම ප්‍රඥප්තිය යටතේ පළාතේ පළාත් පාලන ආයතන සඳහා මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ආපසු පැවරීම.

## 5. සේවක සුභ සාධනය

- දෙපාර්තමේන්තුවේ සේවක සුභ සාධනය වෙනුවෙන් 2015 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි දිරිදීමනා යෝජනා ක්‍රමය යටතේ රාජකාරි දිනවලදි පෙරවරු සහ පස්වරු තේ සැපයීම සිදුකරන ලදී.
- වෙසක් සහ පොසොන් උත්සවය වෙනුවෙන් ආගමික වැඩ සටහන් සංවිධානය කිරිම.
- මහරගම පිළිකා රෝහල සඳහා සෑම වර්ෂයකම මහරගම ප්‍රාදේශීය කාර්යාලය මගින් ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කිරිම.
- කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම අරඹ සිරිසුනන්ද කණිෂ්ඨ විද්‍යාලයේ සිසුන් සඳහා පොත්පත් සහ පාසල් උපකරණ ලබාදිම
- නිලධාරීන් සඳහා ණය මුදල් ලබාදිම.

## 6. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකරකම්

- බස්නාහිර පළාත තුළ නිශ්චල දේපළ පැවරීමේදී මුදල් ප්‍රඥප්තියේ 62 වගන්තියේ විධිවිධාන පරිදි එම දේපළේ වෙළඳ වටිනාකම පිළිබඳ තක්සේරුකරුගේ මතය ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කිරිම. මේ යටතේ 2015 වර්ෂය තුළ එවැනි මත ලබාදීම් 14623 ක් ලබාදෙන ලදී. ඒ යටතේ රැස්කරන ලද අතිරේක ආදායම රු. මිලියන 472කි.

- බස්නාහිර පළාතේ බඩු උකස් ගන්නන් නියාමනය කිරිම හා ප්‍රඥප්තියක් පනවා ක්‍රියාත්මක කිරීම.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

විගණකාධිපති විසින් 2010 වර්ෂය තෙක් ඉදිරිපත් කරන ලද විගණන වාර්තා සම්බන්ධයෙන් පිළිතුරු සපයා අවසන් කොට ඇත. 2015 වර්ෂය තෙක් අභ්‍යන්තර විගණනයට අදාළ පිළිතුරු සපයා ඇත.

# 4.7

# අභ්‍යන්තර විගණන අංශය

## 1. මෙහෙවර

බස්නාහිර පළාතේ පළාත් සභාවට අයත් සියළුම කළමනාකරණ ඒකකයන්හි විවිධ මට්ටම් වෙතින් ඉටු කෙරෙන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය, මැන බැලීම, ඇගයීම සහ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණත්වය ඇගයීම් තුළින් කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යෑම පිණිස රේඛීය කළමනාකරණයට සහය වීම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වේ.

## 2. අරමුණු

පළාත් මූල්‍ය රීති 82.4 සිට 82.8 දක්වා ප්‍රකාශිත කරුණු අනුව බස්නාහිර පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා උප කාර්යාල, ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති අධිකාරි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි පළාත් සභාවට අයත් නොවන පළාත් සභා රාජකාරි ඉටු කරන ආයතනවල එසේ පවරා ඇති කාර්යයන් පිළිබඳව අභ්‍යන්තර සෝදිසි ක්‍රම පිළිබඳ පරික්ෂා කිරීම, වැරදි වංචා වැලැක්වීමට අවශ්‍ය සෝදිසි විධිමත්ව, ප්‍රමාණවත්ව පවත්වාගෙන යාම හා ඒ තුළින් පළාත් සභා අරමුදලේ යෙදවුම්වල උපරිම ඵලදායිතාවය සාක්ෂාත් කරගැනීම සඳහා කළමනාකාරිත්වයට සහාය දීම අභ්‍යන්තර විගණනයේ මූලික අරමුණ වන්නේය.

## 3. ක්‍රියාකාරකම්

වරින් වර නියම කරන ලද ආයතන වලට ගොස් කළමනාකරණ හා ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් බව, නිවැරදි බව, කාර්යක්ෂම බව හා විශ්වාසනීය බව මැන බලා ඒවායෙහි යම් දෝෂ සහගත තත්ත්වයක් පවතින බව පෙනී යන්නේ නම් ඒ බව වාර්තා කිරිම හා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයේ වැරදි, වංචා වළක්වා ගැනීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරන අභ්‍යන්තර සෝදිසි වල ප්‍රමාණවත් බව මැන බලා වාර්තා කිරිම හා මීට අමතරව ගිණුම් කාරක සභා පරීක්ෂණ, පෙත්සම් පරීක්ෂණ, විශේෂ පරීක්ෂණ කටයුතු සිදු කිරිම.

- **2015 වර්ෂය තුල ක්ෂේත්‍ර පරීක්ෂණයට ලක් කළ ආයතන**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | - | 10 |
| කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල | - | 38 |
| පාසැල් | - | 49 |
| අමාත්‍යාංශ | - | 02 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාල | - | 40 |
| ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල | - | 07 |
| රෝහල් | - | 03 |
| අධිකාරීන් හා උප කාර්යාල | - | 17 |
| පරිවාස කාර්යාල | - | 12 |
| මධ්‍යම බෙහෙත් ශාලා | - | 53 |
| ආයුර්වේද රෝහල් | - | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | - | 03 |
| කර්මාන්ත දෙපා. අයත් උප කාර්යාල | - | 28 |
| පෙත්සම් පරීක්ෂණ | - | 37 |
| විශේෂ පරීක්ෂණ | - | 03 |
| ගිණුම් කාරක සභා පරීක්ෂණ | - | 02 |

මේ අනුව 2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා විගණන පරීක්ෂණ 263 ක් සිදු කිරීමට හැකි වූ අතර මීට අමතරව පෙත්සම් පරීක්ෂණ/ විශේෂ පරීක්ෂණ/ ගිණුම් කාරක සභා පරීක්ෂණ 42 ක් ද සිදුකර ඇත.

5

# බස්නාහිර පළාත් පාලන ආර්ථික ප්‍රවර්ධන විදුලිබල හා බලශක්ති පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

විශිෂ්ට ජනතා සේවයක් සලසන පළාත් රාජ්‍ය ආයතන අතර ප්‍රමුඛයා.

### 1.2 මෙහෙවර

නිපුණ හා සුහදශීලී මානව සම්පතක් තුළින් ප්‍රසාදාත්මක ජනතා සේවයක් සැලසීම.

### 1.3 කාර්යයන්

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ ආයතන කටයුතු.
- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතනවල විසර්ජන ගිණුම් අත්තිකාරම් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම හා ගිණුම් කටයුතු පිළිබඳ උපදෙස් ලබාදී මූල්‍ය පරිපාලනය.
- අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල ගැටළු විමර්ශනය කර ඒවා විසඳීමට අදාල පැහැදිලි කිරීම් ලබාදීම.
- ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- නියාමනය හා අධීක්ෂණය.
- ප්‍රගති පාලනය හා සම්බන්ධීකරණය.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන

- පළාත් පාලන දෙපාර්තමේන්තුව.
- අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය.
- ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය.
- සංචාරක මණ්ඩලය.
- පළාත් මුද්‍රණාලය.

## 3. සංවිධාන සටහන


ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
තනතුරු 01
අධ්‍යක්ෂ සැළසුම්
තනතුරු 01
ප්‍රධාන ගණකාධිකාරී
තනතුරු 01
සහකාර ලේකම්
තනතුරු 02
සහකාර අධ්‍යක්ෂ සැළසුම්
තනතුරු 03
ගණකාධිකාරී
තනතුරු 01
පරිපාලන නිලධාරී
තනතුරු 01
මූල්‍ය සහකාර
(කළ.සහ)
තනතුරු 02
ප්‍රධාන කළමනාකරණ
සහකාර - තනතුරු 01
සංවර්ධන නිලධාරීන් 22
කළමනාකරණ සහකාර
තනතුරු 20
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
තනතුරු 07
පරිගණක ක්‍රියාකරු
තනතුරු 01
පරිගණක ක්‍රියාකරු
රියදුරු
තනතුරු 09
කා.කා.ස.
තනතුරු 04
කා.කා.ස.
තනතුරු 02
කා.කා.ස.
තනතුරු 02

## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුරු | සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (1 ශ්‍රේණිය) | 1 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (1 ශ්‍රේණිය) | 1 |
| 4 | අධ්‍යක්ෂ සැලසුම් | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (1 ශ්‍රේණිය) | 1 |
| 5 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (11 / 111 ශ්‍රේණිය) | 3 |
| 6 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (11 / 111 ශ්‍රේණිය) | 1 |
| 7 | නියෝජ්‍ය සහකාර/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (11 / 111 ශ්‍රේණිය) | 4 |
| 8 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

- ඵලදායිතා සංකල්පය හඳුන්වාදීම.
- මහජන දින වැඩසටහන්.
- ජංගම සේවාවන්.
- බස්නාහිර පළාත් සභාවේ ක්‍රියාත්මක සැලැස්ම 2015.12.31 දිනට ප්‍රගතිය.

**අමාත්‍යාංශයේ විෂයයන්ට අදාලව ලබාගත් ප්‍රගතිය**

| විෂයය | අනුමත ව්‍යාපෘති ගණන | අනුමත මුදල (රු. මිලියන) | වියදම (රු. මිලියන) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| පළාත් පාලන | 520 | 299.10 | 264.48 | 88 | 95 |
| අපද්‍රව්‍ය කළමණාකරණය | 32 | 62.54 | 53.92 | 86 | 98 |
| සංචාරක | 12 | 24.54 | 24.52 | 100 | 98 |
| විදුලිබල හා බලශක්ති | 148 | 18.76 | 12.43 | 66 | 72 |
| ජලසම්පාදන හා ජලාපවහන | 57 | 18.75 | 13.74 | 73 | 75 |
| පරිසර | 31 | 9.76 | 9.55 | 98 | 100 |
| ග්‍රාම ආර්ථික | 43 | 23.58 | 21.51 | 91 | 98 |
| මිනිස්බල හා රැකීරක්ෂා | 25 | 2.87 | 2.44 | 85 | 71 |
| **මුළු එකතුව** | **868** | **459.94** | **402.61** | **88** | **90** |







**2015.12.31 වන දිනට ක්‍රියාත්මක සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය**



## 6. ඵලදායීතා කුසලතා සම්මානය ලැබී ඇත.

## 7. සේවක සුභ සාධනය.

- නිලධාරි හා සේවක පුහුණු කිරීම්
- සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම

## 8. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

| | ලැබුණු විගණන විමසුම් ප්‍රමාණය | පිළිතුරු ලියූ ප්‍රමාණය |
|---|---|---|
| විගණකාධිපති | 05 | 05 |
| අභ්‍යන්තර විගණනය | 01 | 01 |
| එකතුව | 06 | 06 |

# 5.1 බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම.

### 1.1 දැක්ම

යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත් පාලන ආයතන හා සිවිල් සමාජය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය, තාක්ෂණික, නෛතික සහය ලබාදෙමින් උපදේශනය, මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ ප්‍රජාවට යහපාලනයෙන් යුත් උසස් ජීවන තත්වයක් බිහිකරලීමට දිශාගත කිරීම.

### 1.3 කාර්යයන්

- බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලයන්හි ආයතන කටයුතු මානව සම්පත් කළමනාකරණය හා විනය කටයුතු පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම.
- බස්නාහිර පළාතේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් හඳුනාගත් යටිතල පහසුකම් සංවර්ධනය කර එමගින් මහජන අවශ්‍යතා සපුරාලිය හැකි වන පරිදි පළාත් පාලන ආයතනවලට අවශ්‍ය මූල්‍ය ආධාර සැපයීම.
- පළාත් පාලන ආයතනවලට වඩා ඵලදායී කාර්යක්ෂම සේවයක් ලබාගැනීමට හැකිවන පරිදි සැලසුම් සහගතව පුහුණු කටයුතු මෙහෙයවීම තුලින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
- පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළ අණපනත් වලින් පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාට පැවරී ඇති බලතලවලට අනුව එතුමා විසින් පවරනු ලබන අධීක්ෂණ හා පරීක්ෂණ කටයුතු ඉටුකිරීම.
- පළාතේ මහජන අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව මහජන ආයතන ආශ්‍රිතව විවිධ ප්‍රජා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පළාත් පාලන ආයතනවල යහපත් පාලනය සහතික කිරීම කරනු සඳහා උපදෙස් දීම හා මඟපෙන්වීම.

- පළාතේ පළාත් පාලන ආයතනවල ස්වකීය කටයුතු මෙහෙයවීම සඳහා විධිමත් හා සැලසුම් සහගත වැඩපිළිවෙළකට යොමුකිරීම.
- පළාත තුල යහපත් පරිසරයක් ඇති කර ඒ තුලින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති කිරීමෙහි ලා පරිසර අමාත්‍යංශය සමග එකතුවී විවිධ පරිසර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- බස්නාහිර පළාත තුල ඇති පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩල වැටුප් වියදම් වලින් සුදුසු ප්‍රමාණයක් හා ගරු මන්ත්‍රීවරුන් සඳහා වන දීමනා ප්‍රතිපූර්ණය කිරීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් පාලන ආයතන වල සෘජු අධීක්ෂණය හා පරිපාලන කටයුතු පවත්වා ගෙන යාමේ වගකීම පළාත් සභාවට පවරනු ලැබීය.

බස්නාහිර පළාතේ සංවර්ධන කාර්යයන් ඇතුළු මහජන සුභසිද්ධිය සහ සුභසාධනය වෙනුවෙන් පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පොදු උපයෝගී සේවාවන් දිස්ත්‍රික් මට්ටමින් අධීක්ෂණය කිරීම, පසුවිපරම් කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබාදීම පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. මහා නගර සභා 07 ක්, නගර සභා 14 ක් සහ ප්‍රාදේශීය සභා 27 ක් නියෝජනය කරමින් පත්වී සිටින මහජන නියෝජිතයන් 886 දෙනෙකි. පළාත් පාලන දෙපාර්තමේන්තුව සතු බලය විමධ්‍යගත කර ඉටු කරනු ලබන සේවාවන් විධිමත් හා කඩිනම් කිරීමේ අරමුණින් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල 3 ස්ථාපිත කර ඇත.

2012 - 2016 උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම යටතේ පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය, සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය, මහජන උපයෝගී සේවා සංවර්ධනය සහ පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම සඳහා වන විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටද පියවර ගෙන ඇත. ක්ෂේත්‍ර 03 ක් යටතේ පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන සේවාවන් පහත ආකාර වේ. මෙම සේවාවන් ඉටු කිරීමේ බලය 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත (252 වැඩ අධිකාරිය) 4 වන වගන්තියේද, 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත(255 අධිකාරි) 4 වන වගන්තියේද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 3 වන වගන්තියෙන්ද ඇතුලත් කර ඇත.

| | |
|---|---|
| **ඉංජිනේරු සේවාවන්** | මංමාවත් ඉදිකිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම, පළාත් පාලන ආයතන සතු ගොඩනැගිලි නඩත්තු කිරීම, ගොඩනැගිලි සැළසුම් සහ බිම් කට්ටි අනුමත කිරීම, අනවසර ඉදිකිරීම් පාලනය කිරීම, මංමාවත්, පදික වේදිකා අවහිරතා මග හැරවීමට අවශ්‍ය පියවර ගැනීම, විථි ආලෝකය සහ පානීය ජලය සැපයීම සහ ජලාපවහන පහසුකම් සැපයීම |
| **සෞඛ්‍ය සේවාවන්** | සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවාවන්ට අදාළ කසල අපහරණය, රෝග නිවාරණ සේවා පහසුකම් පවත්වා ගෙන යාම, ළමා හා |

| | මාතෘදාරකාභිවෘද්ධි මධ්‍යස්ථාන නඩත්තු කිරීම, ආයුර්වේද මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම |
|---|---|
| **මහජන උපයෝගී සේවා** | පුස්තකාල, කියවීම් ශාලා, ආදාහනාගාර සහ සුසාන භූමි නඩත්තු කිරීම, පොදු වෙළඳ පොළ, පොදු නාන ස්ථාන, ක්‍රීඩා භූමි සහ පෙර පාසල් පවත්වා ගෙන යාම. |

<u>පළාත් පාලන ආයතනවල පිහිටීම</u>

| | කොළඹ | ගම්පහ | කළුතර | එකතුව |
|---|---|---|---|---|
| මහනගර සභා | 05 | 02 | - | 07 |
| නගර සභා | 05 | 05 | 04 | 14 |
| ප්‍රාදේශිය සභා | 03 | 12 | 12 | 27 |
| එකතුව | 13 | 19 | 16 | 48 |

<u>පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ නියෝජනය</u>

| | කොළඹ | ගම්පහ | කළුතර | එකතුව |
|---|---|---|---|---|
| මහනගර සභා | 159 | 44 | - | 203 |
| නගර සභා | 70 | 47 | 38 | 155 |
| ප්‍රාදේශිය සභා | 66 | 265 | 197 | 528 |
| එකතුව | 295 | 356 | 235 | 886 |

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සියල්ලේම නිල කාලය 2015 වන විට අවසන් විය. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ මහා නගර සභාව සහ මීගමුව මහා නගර සභාව සහ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහා නගර සභාව, මොරටුව මහා නගර සභාව, කොලොන්නාව නගර සභාව, කොට්කාවත්ත මුල්ලේරියාව යන පළාත් පාලන ආයතන 07 ක නිල කාලය 2016.03.31 දින දක්වා දීර්ඝ කරන ලදී.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය.

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | පළාත් පාලන කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (1 ශ්‍රේණිය) | 1 |
| 02 | පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය) | 1 |
| 03 | පළාත් පාලන සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III /11 ශ්‍රේණිය) | 3 |
| 04 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම් ) | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (111/11 ශ්‍රේණිය) | 1 |
| 05 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | 1 |
| 06 | ඉංජිනේරු (සිවිල් ) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 4 |
| 07 | පළාත් පාලන සහකාර කොමසාරිස් (විමර්ශන) | දෙපාර්තමේන්තුමය | 1 |
| 08 | පළාත් පාලන සහකාර කොමසාරිස් (ප්‍රජා සංවර්ධන) | දෙපාර්තමේන්තුමය | 1 |
| 09 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. ඉටු කරන ලද සේවාවන්

### 4.1 පළාත් පාලන ආයතන යටිතල පහසුකම් සංවර්ධනය

- **2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

2015 වසරට අදාලව බස්නාහිර පළාත තුළ සුවිශේෂී සංවර්ධන ක්‍රියාදාමයක් ඉහත සේවාවන් ජනතාවට ලබා දීම වෙනුවෙන් සිදුවිය. බස්නාහිර පළාත් සභාව යටතේ ඇති ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත් ක්‍රීඩා හා මාර්ග අමාත්‍යාංශයන් ද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (රේඛීය) සංවර්ධන ව්‍යාපෘති සඳහා සුවිශේෂී දායකත්වයක් දක්වමින් බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අරමුදල් සපයාදීම තුළින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයට ඉමහත් රුකුලක් සපයන ලදී. ඒ අනුව ග්‍රාමීය පාලම් හා ප්‍රවේශ මාර්ග, පලාත් පාලන මාර්ග, ප්‍රජා ශාලා, කාර්යාලීය ගොඩනැගිලි, සතිපොළ ආදී යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම, සනීපාරක්ෂක සේවා පහසුකම් සංවර්ධනය, මහජන උපයෝගිතා සේවා පහසුකම් ඇතුළු පළාත් පාලන සේවාව සවිබල ගැන්වීමටද ක්‍රියාකර ඇත. එමෙන්ම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ ඉටුකර ගැනීමට එමඟින් විශාල දායකත්වයක් සැලසෙන ලදි. 2015 වර්ෂය තුළ ඉටුකරන ලද සංවර්ධන ව්‍යාපෘති සැලකිල්ලට ගැනීමේදී මහජන අවශ්‍යතා සුවිශේෂී අන්දමකට සපුරා ඇති බව කිව යුතුය.

ඒ අනුව, ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සඳහා නවීකරණය කරන ලද කාර්යාලයක් ස්ථාපිත කිරීමටත්, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව සඳහා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට 2015 වසර තුළ කටයුතු කරන ලදී.

පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මගින් හොරණ නගර සංවර්ධනය වැඩසටහන සඳහා රු.මිලියන 40 ක ප්‍රතිපාදන ලැබුණු අතර ඒ යටතේ පහත ව්‍යාපෘති 07 හොරණ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

- හොරණ මුණගම වැඩ අංගනය ඉදිකිරීම (අදියර 2කින් ක්‍රියාත්මක වේ.)
- කියවීම් හල් ඉදිකිරීම
- පොදු වැසිකිලි පද්ධතියක් ඉදිකිරිම
- කිරිහල හා කැඳහල ඉදිකිරීම
- මහජන ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරය ඉතිරි වැඩ නිමකිරීම
- හොරණ නගර සභාවේ ගල්ඒදඬුගොඩ පුස්තකාලයේ උඩුමහල ඉදිකිරීම
    - ළමා ක්‍රීඩාංගණ උපකරණ මිලදී ගැනීම හා සවි කිරීම
    - ළමා ක්‍රීඩාංගණ විදුලි අලෝක කිරීම.
    - නගර සභා භූමියේ වැසි ජලය කළමණාකරනය කිරීම
    - නගර සභා කාර්යාල භූමියේ ඉතිරි කොටසේ කුට්ටි ගල් ඇල්ලීම
    - නගර සභා කාර්යාල භූමියේ රථ ගාල් කිරීමේ ස්ථානයක් ඉදිකිරීම
    - නගර සභා ගිනි නිවීම් ඒකකයේ ගිනි භටයින්ගේ රථ ගාල් කිරීමේ ස්ථානයක් ඉදිකිරීම
    - ප්‍රධාන පෙර පාසල ඉදිරිපිට කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇල්ලීම
    - නගර සභා පුස්තකාලය ඉදිරිපිට රථ ගාල් කිරීමේ ස්ථානය ඉදිකිරීම
    - පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීම

තවද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩ පිළිවෙලෙහි එක් අදියරක් ලෙස ආයතන මඟින් නඩත්තු කළ නොහැකි, කසළ කළමනාකරණයේ යෙදවූ අබලන් වාහන නඩත්තුව සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පහත පළාත් පාලන ආයතන වෙත ප්‍රතිපාදන ලබා දෙන ලදී.

- සීතාවක නගර සභාව
- මදුරාවල ප්‍රාදේශීය සභාව
- බියගම ප්‍රාදේශීය සභාව
- මීරිගම ප්‍රාදේශීය සභාව
- අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

තවදුරටත්, අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ අරමුණින් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන අතුරින් ප්‍රාදේශීය සභා 27 ක් සඳහා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මසකට රු.ලක්ෂ 10 බැගින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින්

ලබා දෙන ලදී. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හඳුන්වා දෙන ලද මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමටද පළාත් පාලන දෙපාර්තමේන්තුව වග බලා ගන්නා ලදී.

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය - 2015.12.31**

| ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - (2015.12.31දිනට ) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **කළුතර දිස්ත්‍රික්කය** | | | **ගම්පහ දිස්ත්‍රික්කය** | | | **කොළඹ දිස්ත්‍රික්කය** | | |
| අංකය | පළාත් පාලන ආයතනය | ලබාදුන් මුළු මුදල (රු.මි.) | අංකය | පළාත් පාලන ආයතනය | ලබාදුන් මුළු මුදල (රු.මි.) | අංකය | පළාත් පාලන ආයතනය | ලබාදුන් මුළු මුදල (රු.මි.) |
| 1 | මදුරාවල ප්‍රා.ස. | 3 | 13 | දිවුලපිටිය ප්‍රා.ස. | 2 | 25 | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස. | 3 |
| 2 | පාලින්දනුවර ප්‍රා.ස. | 3 | 14 | කටාන ප්‍රා.ස. | 3 | 26 | සීතාවක ප්‍රා.ස. | 3 |
| 3 | දොඩංගොඩ ප්‍රා.ස. | 6 | 15 | අත්තනගල්ල ප්‍රා.ස. | 3 | 27 | හෝමාගම ප්‍රා.ස. | 6 |
| 4 | අගලවත්ත ප්‍රා.ස. | 6.83 | 16 | මීරිගම ප්‍රා.ස. | 3 | | එකතුව | 9.0 |
| **ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - (2015.12.31දිනට )** | | | | | | | | |
| **කළුතර දිස්ත්‍රික්කය** | | | **ගම්පහ දිස්ත්‍රික්කය** | | | | **කොළඹ දිස්ත්‍රික්කය** | |
| 5 | මතුගම | 8.84 | 17 | ගම්පහ ප්‍රා.ස. | 3 | | | |
| 6 | බණ්ඩාරගම | 3 | 18 | දොම්පෙ ප්‍රා.ස. | 2 | | | |
| 7 | බේරුවල | 3 | 19 | බියගම ප්‍රා.ස. | 7.2 | | | |
| 8 | හොරණ | 4 | 20 | ජා ඇල ප්‍රා.ස. | 4.92 | | | |
| 9 | කළුතර | 2 | 21 | මිනුවන්ගොඩ ප්‍රා.ස. | 2 | | | |
| 10 | බුලත්සිංහල | 2 | 22 | මහර ප්‍රා.ස. | 3 | | | |
| 11 | පානදුර | 2 | 23 | වත්තල ප්‍රා.ස. | 2 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 12 | වලල්ලාවිට | 5.45 | 24 | කැලණිය ප්‍රා.ස. | 2 | | |
| | එකතුව | 49.12 | | එකතුව | 37.12 | | |

ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය නංවාලීමේ අරමුණින් වෙළඳපොල ගණුදෙනු පහසු කරවීම සඳහා තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශවල සතිපොල සංවර්ධනය කරන ලදී. ඒ යටතේ පහත පළාත් පාලන ආයතන 07 හි සතිපොළ සංවර්ධනය කර ඇත.

1. සීතාවකපුර නගර සභාව
2. හෝමාගම ප්‍රාදේශීය සභාව
3. බියගම ප්‍රාදේශීය සභාව
4. ගම්පහ ප්‍රාදේශීය සභාව
5. දොම්පෙ ප්‍රාදේශීය සභාව
6. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව
7. මතුගම ප්‍රාදේශීය සභාව

2015 වර්ෂයේ අනුමත වූ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, පළාත් සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන මුදල් මූලාශ්‍ර යටතේ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මත කරන ලද අවිච්ජේද හා නව ව්‍යාපෘති ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

**බස්නාහිර පළාත් ක්‍රියාත්මක සැලැස්ම 2015.12.31 දිනට ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | අනුමත මුදල | නිමකළ ව්‍යාපෘති ගණන | ගෙවා ඇති මුදල | භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| කොළඹ | 212 | 98,947,073.00 | 197 | 87,540,821.07 | 93 | 89.0 |
| ගම්පහ | 519 | 220,650,802.84 | 484 | 192,177,445.96 | 93.8 | 87.1 |
| කළුතර | 187 | 102,268,990.62 | 187 | 99,056,600.98 | 100 | 97.00 |
| පොදු | 8 | 3,304,000.00 | 8 | 3,294,560.00 | 100 | 99.71 |
| එකතුව | 926 | 425,170,866.46 | 876 | 382,069,428.01 | 94.6 | 89.86 |

ඉහත මුදල් මූලාශ්‍ර යටතේ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද අවිච්ජේද හා නව ව්‍යාපෘති සංරචක අනුව පහත පරිදිවේ.

**2015 සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය**

| ව්‍යාපෘති වර්ගය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධනය කරන ලද ග්‍රාමීය මාර්ග | 35 (කි.මී.) |
| ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිලි | 01 |
| ඉදිකරන ලද ග්‍රාමීය පාලම් | 04 |
| නවීකරණය කරන ලද ප්‍රජා ශාලා | 19 |

| | |
|---|---|
| ඉදිකරන ලද වැසිකිළි | 05 |
| පොදු ළිං | 08 |
| පුස්තකාල | 03 |
| සතිපොල ගොඩනැගිලි ඉදිකිරීම | 07 |

**පළාත් පාලන මාර්ග සංවර්ධනය**

| ආයතනය | තාර දැමූ මාර්ග කි.මී | කාපට් කි.මී | කොන්ක්‍රීට් මාර්ග කි.මී | කොන්ක්‍රීට් කුට්ටි මාර්ග කි.මී | සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති මාර්ග කි.මී |
|---|---|---|---|---|---|
| මහ නගර සභා | 951.71 | 63.85 | 160.80 | 20.08 | 3.5 |
| නගර සභා | 531.50 | 13.35 | 75.20 | 81.95 | 18.15 |
| ප්‍රාදේශීය සභා | 2759.40 | 4.72 | 5931.20 | 499.85 | 27.35 |
| මුළු එකතුව | 4242.61 | 81.92 | 6167.20 | 601.88 | 49 |

**පොදු පහසුකම්**

| දිස්ත්‍රික්කය | මහජන උද්‍යාන | පොදු වැසිකිළි | පුස්තකාල | සුසානභූමි | ළදරු පාසල් | ආයුර්වේද බෙහෙත් ශාලා | සායන |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 16 | 139 | 56 | 121 | 128 | 60 | 92 |
| ගම්පහ | 7 | 140 | 83 | 495 | 112 | 43 | 40 |
| කළුතර | 6 | 57 | 63 | 245 | 50 | 24 | 135 |
| එකතුව | 29 | 336 | 122 | 861 | 290 | 127 | 267 |

**වෙළඳ පොළ පහසුකම්**

| දිස්ත්‍රික්කය | ප්‍රසිද්ධ වෙළඳ පොළවල් | සති පොළවල් | මාළු කඩ | මස්කඩ |
|---|---|---|---|---|
| කොළඹ | 61 | 81 | 131 | 151 |
| ගම්පහ | 37 | 63 | 173 | 108 |
| කළුතර | 18 | 39 | 118 | 58 |
| එකතුව | 116 | 179 | 421 | 317 |

**වෙනත් පහසුකම්**

| දිස්ත්‍රික්කය | වීථි ලාම්පු | පොදු ළිං | ප්‍රජාශාලා |
|---|---|---|---|
| කොළඹ | 102,465 | 430 | 153 |

| | | | |
|---|---|---|---|
| ගම්පහ | 140,465 | 1055 | 276 |
| කළුතර | 35,182 | 410 | 152 |
| එකතුව | 278,112 | 1895 | 581 |




සංවර්ධිත පාලම්

## 5. ඵලදායීතාව

යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක් යන්න දැක්ම කොටගත් මෙම දෙපාර්තමේන්තුව සිය දැක්ම කරා යන ගමනේ තවත් සන්ධිස්ථානයක් කරා 2015 වසරේ දී ළඟා විය. පසුගිය වසරේදී ස්ථාපිත කරන ලද 5S සංකල්පය තව දුරටත් ව්‍යාප්ත කිරීම තුළින් බස්නාහිර පළාත තුළ ඇති පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීමටත්, නව ක්‍රමවේද හඳුන්වාදෙමින් සඵලදායී මහජන සේවාවන් ඉටුකරලීමටත් ආයතනය සමත් විය. ඒ අනුව, පියවර කිහිපයක් ඉදිරියට යෑමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට හැකිවිය. සෙසු පළාත් පාලන ආයතන වලට ද විශාල ප්‍රගතියක් කරා යෑමට හැකිවිය.

ඒ අනුව, 2015 වසරේදී ජාතික ඵලදායී තරඟයේදී 2014 වසර සඳහා දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ දෙවන ස්ථානය පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අත් කර ගැනීම විශේෂත්වයකි.

2015 වර්ෂය තුළ පැවති ජාතික ඵලදායීතා තරඟයෙන් පළාත් පාලන ආයතන රාශියකට ජයග්‍රහණ හිමි කර ගැනීම සඳහා මඟ පෙන්වීමට පළාත් පාලන දෙපාර්තමේන්තු කටයුතු කරන ලදී. ඒ අනුව, පළාත් පාලන ආයතන කාණ්ඩය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව දෙවන ස්ථානය ද සීතාවක නගර සභාව හා මදුරාවල ප්‍රාදේශීය සභාව තෙවන ස්ථානය ද බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, මහරගම නගර සභාව, විශේෂ කුසලතා සහතික ද සීතාවක ප්‍රාදේශීය සභාව කුසලතා සහතික ද දිනා ගන්නා ලදී.

එසේම JESTECA ආයතනය මඟින් පවත්වනු ලබන 5S තරඟාවලියට ඉදිරිපත් වී දෙපාර්තමේන්තුවට පසුගිය වර්ෂයේදී කුසලතා සහතිකයක් ලබා ගැනීමට හැකි වූ බව ද සඳහන් කළ යුතුය.

විධිමත් ඵලදායිතා සැලස්මකට අනුව වසර ආරම්භයේ සිට ක්‍රියාත්මක වෙමින්, ඒ අනුව විශාල ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මේ සඳහා දෙපාර්තමේන්තුවේ ඵලදායිතා ප්‍රවර්ධන කේන්ද්‍රයක්

පිහිටුවමින් සෑම නිලධාරියෙකුටම නිවැරදි දේ නිවැරදිව ඉටු කිරීමට හුරු කිරීම ප්‍රධාන අරමුණ වී ඇත. දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් ඇපකැපවී කටයුතු කරමින් ආයතනික වගකීම මැනවින් ඉටු කර ඇත.






ඵලදායිතා සම්මාන *උළෙල*

## 6. සේවක සුභ සාධනය

2015 වර්ෂය තුල පැවත්වූ පුහුණු වැඩමුළු අතර ඵලදායිතා සංකල්පය / ISO 9002- 2014 සඳහාද පුහුණු වැඩමුළු කීපයක් පවත්වන ලද අතර ඊට අමතරව නිලධාරීන් තනි තනි වශයෙන් හා කණ්ඩායම් වශයෙන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ පුහුණු වැඩසටහන් සඳහාද, සහභාගි කරවන ලදි.

තවද වාර්ෂිකව පළාත් පාලන ආයතන අතර පැවත්වෙන කාර්ය සාධන තරගයට අදාල කාර්ය මණ්ඩලය හා විනිශ්චය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් තරගය පැවත්වීමට පෙර සිදු කිරීම තුළින් එම කාර්ය වඩා ඵලදායිව කිරීමේ හැකියාවද ලැබී ඇත.

පළාත් පාලන සේවාව අතිශය කාර්ය බහුල හා කටුක සේවාවක් බැවින් නිලධාරීන්ගේ කායික හා මානසික සුවය තුලින් වැඩ ලෝකය ජය ගැනීම යන මාතෘකාව යටතේ දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවත්වීම මඟින් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව, උක්ත සඳහන් කළ පුහුණු වැඩසටහන්, දෙපාර්තමේන්තුව යටතේ බඳවා ගත් උපාධිධාරීන්/ විමර්ශන නිලධාරීන් උදෙසා පවත්වන ලද පුහුණු වැඩසටහන්, කාර්ය සාධන මෙවලම ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්, පෙර පාසල් ගුරු, පුස්තකාලයාධිපති පුහුණුව, ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පුහුණු වැඩසටහන් ද ඇතුළුව පුහුණු වැඩසටහන් 36 ක් රු.ලක්ෂ 20 ක පළාත් සභා ප්‍රතිපාදන සහ ලක්ෂ 5 ක පළාත් පාලනය පිළිබඳව ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රතිපාදන යොදවමින් ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ තුළින් 2015 වසර තුළ පළාත් පාලන සේවාවේ නියුතු නිලධාරීන් 220 පුහුණු වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

තවද මහා නගර සභා ධාරිතා සංවර්ධනය යටතේ කොළඹ මහා නගර සභාවට රු. ලක්ෂ 05ක් සහ මීගමුව මහ නගර සභාවට රු. ලක්ෂ 05ක් ලෙස ලක්ෂ 10ක ප්‍රතිපාදන ලබා දෙන ලදි. ඒ යටතේ

මීගමුව මහා නගර සභාව භූගෝලීය තොරතුරු තාක්ෂණය මගින් දේපල තක්සේරු කිරීම (GIS) හා අන්තර්ජාලය හරහා ගෙවීම් කටයුතු සිදු කිරීමවැනි තාක්ෂණික උපක්‍රම පළාත් පාලන ආයතනවලට හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස මීගමුව මහා නගර සභාවට අවශ්‍ය දැනුවත් කිරීම් කරන ලදි.





පුහුණු වැඩසටහන්

## 7. පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති

- **පළාත් පාලන ආයතනවල ආදායම් අයකර ගැනීම වර්ධනය කිරීම විධිමත් කිරීම**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට ඔවුන් අපේක්ෂා කරන පරිදි මහජන උපයෝගි සේවා ලබා දීමට නම්, ප්‍රමාණවත් මුදලක් අවශ්‍යය වේ. ඒ සඳහා පහත සඳහන් විවිධ මාර්ගවලින් මුදල් සපයා ගැනීමට පළාත් පාලන පනත් මඟින් මෙම ආයතනවලට බලය ලබා දී ඇත.

1. වරිපනම් බදු
2. වෙළඳ බලපත්‍ර ගාස්තු, වෙළඳ බදු හා ව්‍යාපාර බදු
3. විනෝද බදු
4. මුද්දර ගාස්තු හා දඩ මුදල්
5. ඉඩම් විකිණීමේ විෂයන්ගෙන් ලැබෙන බදු
6. සේවා සැපයීම මගින් ලැබෙන මුදල්
7. වාහන බදු හා සතුන් පිළිබඳ බදු
8. කුලියට හෝ බදු දීම මගින් ලැබෙන මුදල්
9. සේවා ගාස්තුවලින් ලැබෙන මුදල්
10. ස්ථාවර හෝ කාලීන මූල්‍ය ආධාර

ආදායම් අයකිරීමේ ක්‍රියාවලිය දිරිමත් කිරීමේ අරමුණින් ප්‍රශස්ත ආකාරයට ආදායම් අයකල ආයතන කාර්ය සාධන ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ඇගයීමට ලක් කරන ලදි. එම ආයතන පහත පරිදි වේ.

**මහා නගර සභා**

1. ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව

2. ගම්පහ මහා නගර සභාව

3. කඩුවෙල මහා නගර සභාව

**නගර සභා**

1. සීතාවකපුර නගර සභාව

2. කොළොන්නාව නගර සභාව

3. ජා ඇල නගර සභාව

**ප්‍රාදේශීය සභා**

1. පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

2. දොම්පෙ ප්‍රාදේශීය සභාව

3. සීතාවක ප්‍රාදේශීය සභාව

4. අගලවත්ත ප්‍රාදේශීය සභාව

5. දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

සමස්ථ අදායම් ප්‍රතිශතය 2015 වසර තුල තවදුරටත් ඉහල නංවා ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් විවිධ උපක්‍රම භාවිතා කරන ලදි.

- පළාත් පාලන ආයතනයන්හි ව්‍යවස්ථාපිත ආදායම් විධිමත්ව එකතුකර ගැනීම සඳහා වූ නෛතික කාල රාමුව හා ක්‍රියාපටිපාටිය පිළිබඳව ආයතනවලට විධිමත්ව උපදෙස් ලබා දීම.
- දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්වරු මගින් හිඟ ආදායම් අයකිරීම සම්බන්ධයෙන් නෛතිකව වගකිව යුතු පළාත් පාලන ආයතන ලේකම්වරුන් කැඳවා මාසිකව හිඟ ආදායම් අයවීම පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- පළාත් පාලන ආයතනයන්හි නෛතිකව අය කරගත නොහැකි හිඟ ආදායම් ශේෂ කපා හැරීම සිදුකිරීම .
- රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු හිඟ වරිපනම් බදු අය කරගැනීමට මැදිහත් වීම.
- පළාත් පාලන ආයතන ලේකම්වරුන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය අනුමත කිරීමේදී ආදායම් රැස්කිරීම නිර්ණායකයක් ලෙස යොදාගැනීම.
- පළාත් පාලන කාර්ය සාධන තරඟාවලියේ දී වාර්ෂිකව හිඟ ආදායම් හා ප්‍රවර්තන ආදායම් අයකිරීමේ ප්‍රගතිය අනුව ආයතන ඇගයීමට ලක් කිරීම.
- වැඩි වශයෙන් හිඟ ආදායම් අයවීමට ඇති ආයතනයන්හි හිඟ ආදායම් අයකිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කිරීම.
- සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුතු විශේෂ කමිටුවක් මඟින් හිඟ ආදායම් අයවීම ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධව සහ නිලධාරීන් ඒ පිළිබඳව දිරිගැන්වීම සඳහා අදාළ වන ඵලදායි යෝජනා ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට පියවර ගැනීම .
- ප්‍රවර්තන හා හිඟ ආදායම් අයකිරීම සඳහා 2015 වසරේ සිට පළාත් පාලන ආයතන වෙත ඉලක්ක ලබාදීමට කටයුතු කිරීම.

මීට අමතරව හිඟ ආදායම් අය කර ගැනීම සඳහා 2015 වර්ෂයේ දී ලබා දුන් ඉලක්ක වෙත ළඟා වීම සැලකිල්ලට ගෙන 2016 වසර සඳහා ඉලක්ක ලබා දී ඇති අතර ආදායම් අයවීම 40% ට වඩා අඩු පළාත් පාලන ආයතන කැඳවා හිඟ ආදායම් අයවීම වර්ධනය කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ වන විට වැඩසටහන් 02 ක් පවත්වා ඇත.

පළාත් පාලන ආයතන වාර්ෂිකව සකස් කරනු ලබන අවසාන ගිණුම තුළින් ආයතනයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පැහැදිලි විනිශ්චයකට එලඹීමට හැකියාව ඇත. ඒ අනුව එම අවසාන ගිණුම් සැලකිල්ලට ගෙන 2015 කළමනාකරණ තරඟයේ දී 2011,2012.2013 හා 2014 වර්ෂ 4ක් සඳහා අඛණ්ඩව විගණකාධිපතිවරයා විසින් යහපත් මතයක් ප්‍රකාශ කිරීම උදෙසා කරන ලද සේවය හා උත්සාහය වෙනුවෙන් පහත පළාත් පාලන ආයතන ඇගයීමට ලක් කරන ලදී.

**කොළඹ දිස්ත්‍රික්කය**

සීතාවකපුර නගර සභාව
බොරලැස්ගමුව නගර සභාව
හෝමාගම ප්‍රාදේශීය සභාව
සීතාවක ප්‍රාදේශීය සභාව

**ගම්පහ දිස්ත්‍රික්කය**

මිනුවන්ගොඩ නගර සභාව
ජා ඇල නගර සභාව
පෑලියගොඩ නගර සභාව
වත්තල මාබෝල නගර සභාව

**කළුතර දිස්ත්‍රික්කය**

කළුතර නගර සභාව
මදුරාවෙල නගර සභාව්

- **මහජන පැමිණිලි පරික්ෂා කිරීම**

බස්නාහිර පළාත තුළ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා ද මරණයෙන් මතුවටත් සේවා සපයන ආයතන වශයෙන් පළාත් පාලන ආයතන, මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් සුවිශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. මෙම කාර්ය ඉටු කිරීමේදී සංකීර්ණ වූ නීති පද්ධතියක් තුළින් ජනතාවගේ දැවෙන අවශ්‍යතා සඳහා ක්ෂණිකවම ප්‍රතිචාර දක්වමින් ඉටුකරනු ලබන කාර්ය භාරය තුළ 100% ක්ම සියළු දෙනා වෙත නියමිත පරිදි සේවා සැපයෙන බවට සහතික විය නොහැකිය. එම ආයතනවලින් සේවාවන් ලබා ගන්නා ජනතාව ඒ පිළිබඳව අතෘප්තිමත් වන අවස්ථාවලදී හෝ පවතින නීතිය තුළ ඔවුන්ගේ අවශ්‍යතා ක්ෂණිකව සේම නිසියාකාරයෙන් ඉටු නොවීම තුළ මහජන පැමිණිලි මඟින් ඔවුන්ගේ අතෘප්තිකර භාවය ප්‍රකාශයට පත්කරයි. සෑම සතියකම බදාදා දින මහජනතාව මුණ ගැසී ඔවුන්ගේ ප්‍රශ්න සෘජුවම පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමත් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව, ජනාධිපති ලේකම් කාර්යාලය, ප්‍රධාන ලේකම් සහ රේඛීය අමාත්‍යාංශය මඟින් මහජනයා යොමු කරනු ලබන පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කරයි.

- **පළාත් පාලන ආයතන අතර කාර්ය සාධන තරඟය.**

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් කාර්ය සාධනය ඉහළ නැංවීම හා තහවුරු කිරීමේ මෙවලම හඳුන්වා දී ඇත. එහි අඩංගු නිර්ණායකයන්ට යටත්ව පළාත් පාලන ආයතන පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින්

ඇගයීමට ලක් කිරීම සිදු කෙරේ. ඒ තුළින් පළාත් පාලන ආයතන වෙත නිශ්චිත ඉලක්ක සනිටුහන් කරගැනීමට හා එම ඉලක්ක ළඟා කර ගන්නේ ද යන්න නිගමනය කිරීමටත්, අසාර්ථකත්වය තුළින් විශිෂ්ඨ ජයග්‍රහණයන් ළඟා කර ගැනීමටත්, අත්කරගත් ජයග්‍රහණ ඉස්මතු කර පෙන්වීමටත්, ජයග්‍රහණයන්ට අනුබල දෙන ප්‍රතිඵල විදහා දැක්වීමටත් හැකියාව ලැබෙනු ඇත.

මෙම වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක වන අතර 2015 වර්ෂය තුළ දී 2014 වර්ෂය පාදක කර ගනිමින් ඇගයීම සිදු කර ඇත. ඒ අනුව පළාත් මට්ටමින් මහා නගර සභා අතර ප්‍රථම ස්ථානය කඩුවෙල මහා නගර සභාවටත්, නගර සභා අතර ප්‍රථම ස්ථානය සීතාවකපුර නගර සභාවටත් ප්‍රාදේශීය සභා අතර ප්‍රථම ස්ථානය අත්තනගල්ල ප්‍රාදේශීය සභාවටත් හිමි විය. ආදායම් අය කර ගැනීම, පෙර පාසල්, පුස්තකාල, ආදාහනාගාර, නිසසල පරිසරය සඳහා ද ඇගයීම් සිදුකර ජයග්‍රාහකයන් ධෛර්යමත් කිරීම උදෙසා කුසලතා හා සහතික පත් පිරිනමනු ලැබේ. 2015 වර්ෂයේදී ජයග්‍රාහී පළාත් පාලන ආයතනවල ලේකම්වරු හා කොමසාරිස්වරු ඇතුළු කණ්ඩායමක් සඳහා නේවාසික වැඩසටහනක් කුකුළේ ගඟ ලයා නිවාඩු නිකේතනයේ දී පවත්වන ලදී.

- **පළාත් මට්ටමේ ජයග්‍රාහී ආයතන**

ජාතික ප්‍රතිපත්තිය අනුව යමින් යහ පාලනය ශක්තිමත් කිරීම උදෙසා, 2015 වසරේදී, පළාත් පාලන ආයතනවල සැබෑ වෙනසක් ඇති කිරීම තුළින් ජනතා හිතකාමී කාර්යක්ෂම සේවා සම්පාදන ආයතන බවට පත් කිරීමට සහ අනාගත අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව ඇති කිරීමේ ඉලක්ක සාක්ෂාත් කිරීම වෙනුවෙන් ඉටුකරනු ලැබූ ප්‍රයත්නය උදෙසා ඇගයීමට ලක්වූ ආයතන පහත පරිදි වේ.

**බස්නාහිර පළාතේ මහා නගර සභා අතුරින්**

1. කඩුවෙල මහා නගර සභාව
2. මීගමුව මහා නගර සභාව
3. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

**බස්නාහිර පළාතේ නගර සභා අතුරින්**

1. සීතාවකපුර නගර සභාව
2. මිනුවන්ගොඩ නගර සභාව
3. හොරණ නගර සභාව

**බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා අතුරින්**

1. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
2. දොම්පෙ ප්‍රාදේශීය සභාව
3. කැලණිය ප්‍රාදේශීය සභාව

- **දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහී ආයතන**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය අරමුණු කර ගනිමින් වාර්ෂිකව කාර්ය සාධන තරගය පැවත්වීම එක් එක් අමාත්‍යාංශ

මගින් හඳුන්වා දී ඇත. ඒ අනුව කාර්ය සාධන තරගයේ ඇගයීම, ප්‍රධාන ක්ෂේත්‍ර 04ක් යටතේ හඳුන්වා දී ඇති අතර, ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අනුව ඇගයීම සිදු කර, දිස්ත්‍රික් මට්ටමින් මහා නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වෙන වෙනම කාර්ය සාධන මෙවලමේ (PERFECT) අවසාන අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා, 2014 වසරේ දරණ ලද ප්‍රශස්ත මට්ටමේ උත්සාහය අගයමින් දිස්ත්‍රික් කුසලාන, ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා ප්‍රදානය කරන ලදි.





කළමනාකරණ තරඟ ත්‍යාග ප්‍රදානෝත්සවය

## කොළඹ දිස්ත්‍රික්කය

**මහා නගර සභා අතුරින්**

1. කඩුවෙල මහා නගර සභාව
2. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
3. මොරටුව මහා නගර සභාව

**නගර සභා අතුරින්**

1. සීතාවකපුර නගර සභාව
2. කොළොන්නාව නගර සභාව
3. කැස්බෑව නගර සභාව

**ප්‍රාදේශීය සභා අතුරින්**

1. සීතාවක ප්‍රාදේශීය සභාව
2. හෝමාගම ප්‍රාදේශීය සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

**මහා නගර සභා අතුරින්**

1. මීගමුව මහා නගර සභාව

**නගර සභා අතුරින්**

1. මීනුවන්ගොඩ නගර සභාව
2. ජා ඇල නගර සභාව
3. වත්තල මාබෝල නගර සභාව

**ප්‍රාදේශීය සභා අතුරින්**

1. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
2. දොම්පෙ ප්‍රාදේශීය සභාව
3. කැළණිය ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

**නගර සභා අතුරින්**

1. හොරණ නගර සභාව
2. පානදුර නගර සභාව
3. කළුතර නගර සභාව

**ප්‍රාදේශීය සභා අතුරින්**

1. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව
2. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව
3. මදුරාවල ප්‍රාදේශීය සභාව

- **මහජන උපයෝගිතා සේවාවන් විධිමත් කිරීම**

මිනිසා උපතේ සිට මරණය දක්වා සියළු කාර්යයන් ඉටු කිරීම මහජන උපයෝගි සේවා සැපයීම යටතේ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇත. සෞඛ්‍යාරක්ෂිත පරිසර හිතකාමී සුසාන භූමි ස්ථාපනය කිරීම හා ඒ හා බැඳුනු ආදාහනාගාර නියමිත ප්‍රමිතියෙන් පවත්වා ගෙන යාම, මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම යටතේ දේශීය ආයුර්වේද වෛද්‍ය සේවාව උදෙසා විධිමත් වූ ආයුර්වේද වෛද්‍ය බෙහෙත් ශාලා පවත්වාගෙන යාම, රටට අනාගත නියමුවන් දායාද කිරීමේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, පෙර පාසල් සේවාව විධිමත්ව පවත්වා ගෙන යාම, පාරිභෝගිකයා හා මහජනතාව මුණ ගැසෙන වාණිජ්‍ය වටිනාකමින් යුත් කේන්ද්‍රස්ථානය වන සතිපොළ සංවර්ධනය කිරීම ආදී කටයුතු මේ යටතේ සිදු කෙරේ. යහපාලනය සහතික කිරීම ප්‍රමුඛ පරාසය යටතේ පුස්තකාල සංවර්ධනය වැඩසටහන වැඩිදියුණු කිරීම උදෙසා බස්නාහිර පළාත් සභාව මගින් පහත පරිදි ප්‍රතිපාදන සපයා දෙන ලදි.

එනම්, 2015 වර්ෂයේ රු.මි.1.6 ක් ද යොදවා ඇති අතර, 2016 වර්ෂයේ යෙදවීමට අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1.7 කි.

- **පෙරපාසල්**

රටට අනාගත නියමුවන් දායාද කිරීම උදෙසා පූර්ව ළමාවිය සංවර්ධනය විධිමත් කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් අතුරින් ආදර්ශමත්, විධිමත් වඩාත් නිර්මාණශීලිව පෙර පාසල් පවත්වා ගනු ලැබූ ආයතන.

**කොළඹ දිස්ත්‍රික්කය**

1. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, නේත්‍රා පෙර පාසල
2. මහරගම නගර සභාව, මහරගම නගර සභා පෙර පාසල
3. මොරටුව මහා නගර සභාවේ, සොයිසාපුර පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. දොම්පෙ ප්‍රාදේශීය සභාවේ, කිරිදිවැල නුගේවත්ත පෙර පාසල
2. කටුනායක සීදූව නගර සභාව, ලියනගේමුල්ල පෙර පාසල
3. මීරිගම ප්‍රාදේශීය සභාව, තලහේන පෙර පාසල

**කළුතර දිස්ත්‍රික්කය**

1. මදුරාවෙල ප්‍රාදේශීය සභාව, වැලිකැටැල්ල පෙර පාසල
2. හොරණ නගර සභාව, හොරණ නගර සභා පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය
3. කළුතර නගර සභාව, කළුතර නගර සභා පෙර පාසල

- **පුස්තකාල**

**කොළඹ දිස්ත්‍රික්කය**

1. කඩුවෙල මහා නගර සභාව, අතුරුගිරිය මහජන පුස්තකාලය
2. මොරටුව මහා නගර සභාව, ජනසෙත පුස්තකාලය
3. සීතාවකපුර නගර සභාවේ, අවිස්සාවේල්ල මහජන පුස්තකාලය

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය මහජන පුස්තකාලය
2. කටුනායක සීදූව නගර සභාවේ, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලෙ අනුස්මරණ මහජන පුස්තකාලය
3. වත්තල මාබෝල නගර සභාවේ, නගර සභා පුස්තකාලය

**කළුතර දිස්ත්‍රික්කය**

1. හොරණ නගර සභාව, මහජන පුස්තකාලය
2. පානදුර නගර සභාව, මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමි අනුස්මරණ පුස්තකාලය
3. හොරණ ප්‍රාදේශීය සභාව, ඉංගිරිය මහජන පුස්තකාලය

- **ආයුර්වේද බෙහෙත් ශාලා**

පළාත් පාලන ආයතනවල කාර්ය භාරයේ එක් කොටසක් වන මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම යටතේ දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරමින් 2014 වර්ෂයේ සේවාලාභීන් වෙත විධිමත් ආයුර්වේද සේවාවක් සැපයීමට හා හොඳම ආයුර්වේද බෙහෙත් ශාලාව පවත්වා ගැනීමට ගත් උත්සාහය අගයමින් ඇගයුම් ලැබූ ආයතන.

**කොළඹ දිස්ත්‍රික්කය**

1. කොලොන්නාව නගර සභාව, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
2. දෙහිවල ගලකිස්ස මහා නගර සභාව, අත්තිඩිය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
3. සීතාවකපුර නගර සභාව, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව, උඩුගම්පොළ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
2. මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
3. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව, කොස්හේන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව

**කළුතර දිස්ත්‍රික්කය**

1. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
2. මතුගම ප්‍රාදේශීය සභාව, මතුගම ප්‍රාදේශීය සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
3. හොරණ ප්‍රාදේශිය සභාව, හොරණ ප්‍රාදේශීය සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව

**කොළඹ දිස්ත්‍රික්කය**

1. හෝමාගම ප්‍රාදේශීය සභාව, කහතුඩුව සතිපොළ
2. සීතාවකපුර නගර සභාව, පුවක්පිටිය සතිපොළ
3. සීතාවක ප්‍රාදේශීය සභාව, කහහේන සතිපොළ

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. කටුනායක සීදූව නගර සභාව, නගර සභා භූමිය සතු සතිපොළ
2. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ, කිරිබත්ගොඩ සතිපොළ

**කළුතර දිස්ත්‍රික්කය**

1. හොරණ ප්‍රාදේශීය සභාව, ඉංගිරිය සතිපොළ
2. බේරුවල ප්‍රාදේශීය සභාව, පයාගල සතිපොළ
3. පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර සතිපොළ

- **ආදාහනාගාර සහිත සුසාන භූමි**

මිනිසාගේ උපතේ සිට මරණය දක්වා සියළු කාර්යයන් ඉටු කිරීම පළාත් පාලන ආයතනවල වගකීමක් වන අතර සෞඛ්‍යාරක්ෂිත පරිසර හිතකාමී සුසාන භූමි ස්ථාපනය කිරීම හා ඒ හා බැඳුණු ආදාහනාගාරය නියමිත ප්‍රමිතියට අනුව පවත්වා ගෙන යමින් අවසන් කටයුතු ඉටු කිරීම වෙනුවෙන් හා මහඟු සේවාවක් ගෞරවාන්විතව කිරීමට ගත් උත්සාහය වෙනුවෙන් ඇගයීම් ලැබුවේ

**කොළඹ දිස්ත්‍රික්කය**

1. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව , කොහුවල නිසල අරණ සුසාන භූමිය
2. මහරගම නගර සභාව, තලපත්පිටිය සුසාන භූමිය
3. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ, උඩහමුල්ල සුසාන භූමිය

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. බියගම ප්‍රාදේශීය සභාවේ, සියඹලාපේවත්ත සුසාන භූමිය
2. මිනුවන්ගොඩ නගර සභාව, මිනුවන්ගොඩ සුසාන භූමිය
3. දිවුලපිටිය ප්‍රාදේශීය සභාව, මරදගහමුල සුසාන භූමිය

**කළුතර දිස්ත්‍රික්කය**

1. බේරුවල ප්‍රාදේශීය සභාව, අළුත්ගම සුසාන භූමිය
2. මතුගම ප්‍රාදේශීය සභාව, පාන්තිය සුසාන භූමිය
3. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, මිල්ලනිය සුසාන භූමිය

- **පළාත් පාලන සතිය**

“ ඵලදායි සේවාවක් ලබා දීම තුළින් දිවියට සවියක් ”යන තේමාව පෙරදැරි කරගෙන මහජනතාව හා උරෙන් උර ගැටෙමින් ප්‍රදේශයේ අවශ්‍යතාව මහජන සහභාගීත්වයෙන් හා රාජ්‍ය ආයතනවල සහායෙන් ඉටු කිරීමට කටයුතු කිරීම මඟින් පළාත් පාලන ආයතනයටත්, මහජනතාවටත්, රාජ්‍ය ආයතනයනුත්, බල ප්‍රදේශයේ සංවර්ධනය හා සමාජීය කටයුතුවලට ඒකාබද්ධ කිරීමේ පරමාර්ථ ඇගයීම වෙනුවෙන් ජයග්‍රාහී ආයතනයන්,

**කොළඹ දිස්ත්‍රික්කය**

- කොළොන්නාව නගර සභාව - ආදායම් ප්‍රවර්ධන දිනය
- හෝමාගම ප්‍රාදේශීය සභාව - ජංගම සේවා දිනය
- කොටිකාවත්ත මුල්ලේරියා ප්‍රාදේශීය සභාව - මහජන උපයෝගීතා දිනය
- සීතාවක ප්‍රාදේශීය සභාව - පරිසර හා රුක්රෝපණ දිනය
- සීතාවකපුර නගර සභාව - අධ්‍යාපන හා පුස්තකාල සංවර්ධන දිනය
- මහරගම නගර සභාව - ක්‍රීඩා දිනය හා ත්‍යාග හා සහතික ප්‍රදානෝත්සවය

**ගම්පහ දිස්ත්‍රික්කය**

- දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - ආදායම් ප්‍රවර්ධන දිනය
- දොම්පෙ ප්‍රාදේශීය සභාව - ජංගම සේවා දිනය
- මීනුවන්ගොඩ නගර සභාව - සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය
- පෑලියගොඩ නගර සභාව - මහජන උපයෝගීතා දිනය
- කැලණිය ප්‍රාදේශීය සභාව - පරිසර හා රුක්රෝපණ දිනය
- කටුනායක සීදූව නගර සභාව - අධ්‍යාපන හා පුස්තකාල සංවර්ධන දිනය
- ජා ඇල ප්‍රාදේශීය සභාව - ක්‍රීඩා දිනය හා ත්‍යාග හා සහතික ප්‍රදානෝත්සවය

**කළුතර දිස්ත්‍රික්කය**

- මතුගම ප්‍රාදේශීය සභාව - ආදායම් ප්‍රවර්ධන දිනය
- කළුතර නගර සභාව - ජංගම සේවා දිනය
- හොරණ නගර සභාව - සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය
- අගලවත්ත ප්‍රාදේශීය සභාව - මහජන උපයෝගීතා දිනය
- බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව - පරිසර හා රුක්රෝපණ දිනය
- පානදුර ප්‍රාදේශීය සභාව - අධ්‍යාපන හා පුස්තකාල සංවර්ධන දිනය
- දොඩංගොඩ ප්‍රාදේශීය සභාව - ක්‍රීඩා දිනය හා ත්‍යාග හා සහතික ප්‍රදානෝත්සවය

- **පුරනැගුම වැඩසටහන**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ බස්නාහිර පළාතේ ග්‍රාමීය පළාත් පාලන ආයතන 10 හි ගොඩනැගීම් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

**2015 වර්ෂය සඳහා කරන ලද ව්‍යාපෘති**

1. මීරිගම ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණය සඳහා ජල සැපයුම ලබා දීම
2. අඟලවත්ත ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය
3. අඟලවත්ත ප්‍රාදේශීය සභා කසල කළමනාකරණ මධ්‍යස්ථානය අලුත්වැඩියාව
4. මදුරාවෙල ප්‍රාදේශීය සභා ජල සැපයුම් ව්‍යාපෘතිය
5. පාලින්දනුවර ප්‍රාදේශීය සභා ජල සැපයුම් ව්‍යාපෘතිය
6. සීතාවක ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල හා පුස්තකාලය
7. බියගම ප්‍රාදේශීය සභා බහුකාර්ය ගොඩනැඟිල්ල
8. පාලින්දනුවර ප්‍රාදේශීය සභා පොදු වැසිකිළි
9. පාලින්දනුවර ප්‍රාදේශීය සභා වේ ජී.එස්.අප්පුහාමි මාවත
10. වලල්ලාවිට ප්‍රාදේශීය සභා සතිපොළ හා පොදු වැසිකිළි
11. වලල්ලාවිට ප්‍රාදේශීය සභා බහුකාර්යය ගොඩනැඟිල්ල
12. දොඩංගොඩ ප්‍රාදේශීය සභා සතිපොළ හා ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල
13. මදුරාවල ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැඟිල්ල අලුත්වැඩියාව
14. මදුරාවල ප්‍රාදේශීය සභා බහු කාර්යය ගොඩනැඟිල්ල
15. මතුගම ප්‍රාදේශීය සභා බහු කාර්යය ගොඩනැඟිල්ල, සතිපොළ හා පොදු වැසිකිළි

- **ලෝක බැංකු වැඩසටහන**

2013 දී ආරම්භ කරන ලද ලෝක බැංකු ව්‍යාපෘතිය බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ආරම්භ වූවකි. එම අමාත්‍යාංශයට වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදනවලින් 10% ක් පළාත් පාලන ආයතන සඳහා වෙන් කර දෙනු ලැබේ. ජනතාවගේ සෞඛ්‍ය තත්වය වර්ධනය කිරීම උදෙසා එම මුදල් යෙදවීමට හැකිය. ඒ අනුව 2015 වසර තුල කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා දීමට කටයුතු කරන ලදී.

පළාත තුළ හඳුනාගන්නා ලද ආයතන සඳහා අත් කරත්ත 10 ක් ද බොබ්කැට් මැෂින් 04 ක් ද, බේලින් මැෂින් 11 ක් ද සීවින් මැෂින් 05 ක් ද පහත පරිදි බෙදා දී ඇත.

**ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ බෙදා දුන් උපකරණ**

| උපකරණය | ආයතනය |
|---|---|
| අත් කරත්ත ලබාදීම | 1. සීතාවක ප්‍රාදේශීය සභාව<br>2. හෝමාගම ප්‍රාදේශීය සභාව<br>3. කොටිකාවත්ත ප්‍රාදේශීය සභාව<br>4. ජා ඇල ප්‍රාදේශීය සභාව<br>5. කැලණිය ප්‍රාදේශීය සභාව<br>6. මහර ප්‍රාදේශීය සභාව<br>7. වත්තල ප්‍රාදේශීය සභාව<br>8. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව<br>9. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව<br>10. මදුරාවෙල ප්‍රාදේශීය සභාව |
| බොබ් කැට් මැෂින් ලබාදීම | 1. සීතාවකපුර නගර සභාව<br>2. කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව<br>3. කටාන ප්‍රාදේශීය සභාව<br>4. මතුගම ප්‍රාදේශීය සභාව |
| බේලින් මැෂින් ලබාදීම | 1. සීතාවක ප්‍රාදේශීය සභාව<br>2. මොරටුව මහ නගර සභාව<br>3. මහරගම නගර සභාව<br>4. සීතාවකපුර නගර සභාව<br>5. හෝමාගම ප්‍රාදේශීය සභාව<br>6. මීරිගම ප්‍රාදේශීය සභාව<br>7. මීගමුව මහ නගර සභාව<br>8. ගම්පහ මහා නගර සභාව<br>9. බියගම ප්‍රාදේශීය සභාව<br>10. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව<br>11. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව |
| සීවින් මැෂින් ලබාදීම | 1. ජා ඇල ප්‍රාදේශීය සභාව<br>2. කටාන ප්‍රාදේශීය සභාව<br>3. හොරණ ප්‍රාදේශීය සභාව<br>4. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව<br>5. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව |

 

බේලිං මැෂින් බෙදා දීමේ වැඩසටහන

- **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණ කටයුතු විධිමත් කිරීම පිණිස කසල කළමනාකරණ කටයුතුවල නියැලෙන නිලධාරීන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් ලබා දීමත් ක්ෂේත්‍ර චාරිකා මඟින් ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමත් තුළින් විධිමත් කසළ කළමනාකරණයක් පළාත තුළ මෙම වසරේදී දක්නට ලැබිණ

පළාත තුළ පිරිසිදු පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් පළාත් පාලන ආයතන වැඩි ප්‍රමාණයක් කසළ ජනනය වන ස්ථානයේ දීම තෝරා භාර ගැනීම ආරම්භ කර තිබීම වැදගත් කොට සැලකිය හැකිය.

- **පළාත් පාලන ආයතන නෛතික වශයෙන් බලගැන්වීම.**

පළාත් රාජ්‍ය සේවය යටතේ සමස්තයක් වශයෙන් විනය ක්‍රියා පටිපාටියට අදාළ දැනුම හා අවබෝධය වර්ධනය කිරීම පිණිස "විනය කාර්ය පටිපාටියට අදාළ ප්‍රශ්නෝත්තර සංග්‍රහය" සකස් කර ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

පළාත් පාලන ආයතන තුනකට අදාලව බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය යටතේ පරීක්ෂණ කොමිෂන් සභා පත් කර ඒ යටතේ පරීක්ෂණ සිදු කිරීම.

පළාත් පාලන ආයතනය බල ප්‍රදේශයන්හි භෞතික සැළසුම්කරණය විධිමත් කිරීමට සැළසුම් ක්‍රියාවලියට අදාල චක්‍රලේඛන කිහිපයක් යටතේ උපදෙස් මාලාවන් නිකුත් කිරීම.

බස්නාහිර පළාත් මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි නගරාධිපතිවරුන්, සභාපතිවරුන් හා සභිකවරුන් සඳහා ජීවිත රක්ෂණ ක්‍රමයකට දායක මුදල් ගෙවීම පිළිබඳ ප්‍රඥප්තියක් සකස් කිරීම.

## 8. බස්නාහිර පළාත් ක්‍රියාත්මක සැලැස්ම 2015.12.31 දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන. | නිමකළ ව්‍යාපෘති ගණන. |
|---|---|---|
| කොළඹ | 212 | 197 |
| ගම්පහ | 519 | 484 |
| කළුතර | 187 | 187 |
| පොදු | 8 | 8 |
| **එකතුව** | **926** | **876** |

බස්නාහිර පළාත් ක්‍රියාත්මක සැලැස්ම 2015.12.31 දිනට ප්‍රගතිය




## 9. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

| | ලැබුණු විගණන විමසුම් ගණන | පිළිතුරු යැවූ විගණන විමසුම් ගණන | ශේෂය |
|---|---|---|---|
| අභ්‍යන්තර විගණන විමසුම් | 04 | 04 | 00 |
| විගණකාධිපති විගණන විමසුම් | 03 | 03 | 00 |

| | |
|---|---|
| **6** | # අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය |

---

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
ජනතා සුභ සිද්ධිය පිණිස තම ආයතන මෙහෙයවීමේ ගාමක බලවේගය.

### 1.2 මෙහෙවර
දැනුමින් පරිපූර්ණ පුරවැසි පිරිසක් බිහි කිරීමට නූතන ප්‍රවේශයක් තුළින් අධ්‍යාපන ක්‍රියාවලිය මෙහෙයවීමත්, පළාත් ප්‍රජාවගේ ක්‍රීඩා කෞශල්‍ය හා පෞරුෂය සංවර්ධනය කිරීමත්, දේශීය සංස්කෘතිය නඟා සිටවීම හා සාහිත්‍ය කලා කටයුතු තුළින් සමාජ සංවර්ධනයත්, මහජන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට තොරතුරු තාක්ෂණය භාවිතයත් අරමුණු කර ගනිමින් එහි සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව වැඩසටහන් සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා නියාමනය.

### 1.3 කාර්යයන්
- බස්නාහිර පළාත තුල සිසු සිසුවියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සංවිධානය, පළාත් පාසල් වල පරිපාලනය, පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.
- ක්‍රීඩා කුසලතාවයන් වැඩි දියුණු කිරීමට ප්‍රජාව සංවිධානය කිරීම, පුහුණුව හා දැනුවත් කිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා තරග සංවිධානය, මූල්‍ය පහසුකම් සැපයීම හා පාර්ශවකරුවන් ඇගයීම.
- බස්නාහිර පළාතේ නිලධාරීන් තොරතුරු තාක්ෂණයෙන් ස්වයංපෝෂිත කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය, පාසල් මට්ටමින් තොරතුරු තාක්ෂණයේ නිපුණතාවයන් ඉහළ මට්ටමකට ගෙන ඒම.
- බස්නාහිර පළාතේ ප්‍රජාව තුල සංස්කෘතික හා කලා කටයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය දායකත්වය, කලා ආයතනය සඳහා අවශ්‍ය දායකත්වය ලබා දී කලාකරුවන් දිරි ගැන්වීම, සාම්ප්‍රදායික සංස්කෘතිකාංග නව පරපුර වෙත සමීප කරවීම.

- බස්නාහිර පළාතේ යෞවන යෞවනියන් නායකත්වයෙන් පිරිපුන්, ගුණගරුක සෞඛ්‍ය සම්පන්න පිරිසක් බවට පත් කිරීමට අවශ්‍ය විවිධ ක්‍රියාමාර්ග ගැනීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

2015 වසරේ බස්නාහිර පළාත් සභාව යටතේ මෙම අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය ලෙස නම් කරන ලද අතර පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතන මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය
- බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය
- ක්‍රීඩා අංශය
    - i. බස්නාහිර පළාත් ක්‍රීඩා විද්‍යායතනය
    - ii. ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩා සංකීර්ණය

## 3. සංවිධාන සටහන


ගරු ඇමතිතුමා
ලේකම් 01
සහකාර අධ්‍යක්ෂ (දෙපා.01)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් 03
සහකාර අධ්‍යක්ෂ අධ්‍යාපන 01
සහකාර ලේකම් 03
ගණකාධිකාරී
ක්‍රීඩා අධ්‍යක්ෂ
පරිපාලන නිලධාරි 01
සංස්කෘතික නිලධාරි 52
ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් නිලධාරි 01
සංවර්ධන නිලධාරි 11
ප්‍රධාන කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරි 11
මුදල් සහකාර 01
දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි 05
ක්‍රීඩා පුහුණුකරු 14
සංවර්ධන නිලධාරි 14
ක්‍රීඩා නිලධාරි 43
කළමනාකරණ සහකාර තනතුරු 03
කළමනාකරණ සහකාර 20
කළමනාකරණ සහකාර 05 (විමර්ශන අංශය)
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර 09
කළමනාකරණ සහකාර 05
කාර්යාල කාර්ය සහායක 04
කාර්යාල කාර්ය සහායක 04
රියදුරු 08
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක 01
කම්කරු 06

## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III / II ශ්‍රේණිය) | 3 |
| 3 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය ( I ශ්‍රේණිය) | 1 |
| 4 | සහකාර අධ්‍යක්ෂ සැලසුම් | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (III / II ශ්‍රේණිය) | 7 |
| 5 | සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන) | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (III /II ශ්‍රේණිය) | 1 |
| 6 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 5. අමාත්‍යාංශ විෂය පථයට අයත් ආයතන හා අංශ සම්බන්ධීකරණය කරමින් අමාත්‍යාංශ මෙහෙවර ඉටුවන අයුරින් කටයුතු කිරීම.

**ඒ අතර,**

- අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සංගීත රසවින්දන වැඩ සටහනක් පැවැත්වීම
- අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා බණ්ඩාරවෙල ප්‍රදේශයේ දෙදින වැඩමුළුවක් පැවත්වීම.
- පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ සුහද ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම හා එහි ජයග්‍රහණය හිමි කර ගැනීම.

**එක් එක් විෂයන් යටතේ 2015 වර්ෂය තුල ව්‍යාපෘති අනුමත වී තිබූ ආකාරය**

| විෂයය | පළාත් නිශ්චිත කාර්යය සංවර්ධන ප්‍රදාන (රුපියල්) | පළාත් සංවර්ධන ප්‍රදාන (රුපියල්) | ලෝක බැංකු (රුපියල්) | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|
| අධ්‍යාපන | 210,658,103.25 | 367,381,288.58 | 336,883,125.92 | **914,922,517.75** |
| සංස්කෘතික | 5,000,000.00 | 36,954,311.00 | - | **41,954,311.00** |
| ක්‍රීඩා | 15,578,475.00 | 61,414,000.00 | - | **76,992,475.00** |
| තොරතුරු තාක්ෂණ | - | - | - | - |
| *එකතුව* | **231,236,578.25** | **465,749,599.58** | **336,883,125.92** | **1,033,869,303.75** |

### එක් එක් විෂයයන් යටතේ 2015 වර්ෂය තුල ව්‍යාපෘති අනුමත වී තිබූ ආකාරය




**6. ඵලදායිතා තරඟ සඳහා ඉදිරිපත් වී ඇත.**

**7. සේවක සුභ සාධනය යටතේ වාර්ෂික වැඩමුළු පැවැත්වීම් සිදුකරන අතර එමගින් සේවක සුභදතා වර්ධනය කිරීමට කටයුතු කිරීම.**

**8. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.**

| ආයතනය | 2015 වර්ෂයට ලැබූ විගණන විමසුම් ගණන | 2015. 12. 31 දිනට පිළිතුරු යැවූ විගණන විමසුම් ගණන | හිඟ විගණන විමසුම් විමසුම් ගණන |
|---|---|---|---|
| විගණකාධිපති | 06 | 05 | 01<br>2016.03.31 දින පිළිතුරු යවා ඇත |
| අභ්‍යන්තර විගණන (ප්‍රධාන ලේකම්) | 04 | 01 | 03<br>2016.02.29 හා 2016.03.30 යන දිනයන්හී පිළිතුරු යවා ඇත. |

# 6.1

# සංස්කෘතික අංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

අභිමානයෙන්, සංතුෂ්ටියෙන් සහ සහජීවනයෙන් දිවි ගෙවන ප්‍රජාවක්.

### 1.2 මෙහෙවර

ප්‍රජාවගේ සාමාජ හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ජාතික වශයෙන් වැදගත් සංස්කෘතික උත්සව පැවැත්වීම හා ආධාර කිරීම, පාරම්පරික සංස්කෘතිකාංග සහ උරුමයන් ඇගයීම සුරක්ෂණය හා ජනගත කිරිම, ප්‍රවීන කලාකරුවන් ඇගයීම සහ පහසුකම් සැලසීම, අංකුර කලාකරුවන් නගාසිටුවීම, ප්‍රජාව උසස් රසවින්දනයට හුරුකරවීම, සර්ව ආගමික දහම් අධ්‍යාපන ව්‍යුහය ශක්තිමත් කිරීම සහ ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වීම.

### 1.3 කාර්යයන්

- පළාත් සංස්කෘතික හා කලා අංශයේ සංවිධාන ව්‍යුහය ශක්තිමත් කිරීම හා කාර්යක්ෂම කිරීම.
- පළාත් සංස්කෘතික, කලා, ආගමික දත්ත තොරතුරු පද්ධතියක් ගොඩ නංවා පවත්වාගෙන යාම.
- පාරම්පරික, සාම්ප්‍රදායික හා නව උසස් අගයෙන් යුත් කලාවන්, කලාකරුවන්, සංවිධාන හා ආයතන දිරිගැන්වීමේ හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- දහම් අධ්‍යාපනයට, ආගමික, සංස්කෘතික සංවර්ධනයට ආධාර උපකාර වීම.
- ආගමික, සංස්කෘතික, සාහිත්‍ය හා කලා කටයුතු මගින් සමාජ සංවර්ධනයේ නිරත වූ, නිරතවන පුද්ගලයින්, ආයතන දිරිගැන්වීම, උපහාර / ආධාර පිරිනැමීම සඳහා වැඩසටහන් සකසා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ දහම් ගුරුවරුන්ගේ සුභසාධන කටයුතු නංවාලීම.
- පළාතේ නර්තන, සංගීත හා නාට්‍ය වැනි සෞන්දර්යාත්මක විෂයන්හී නියැලෙන අංකුර කලාකරුවන් දිරිගැන්වීම හා කුසලතා ඔප් නැංවීමට වැඩසටහන් සකසා ක්‍රියාත්මක කිරීම.
- සොබාදහමට අනුගත, සාමූහිකත්වය, සහජීවනය පදනම් වන, සරල ජීවන පැවත්මක අගය ජන විඥාණයෙහි තහවුරු කිරීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

| | |
|---|---|
| සංස්කෘතික නිලධාරීන් | 52 |
| සංවර්ධන නිලධාරින් | 35 |
| කළමනාකරණ සහකාර | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

සංස්කෘතික අංශය අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් කොටසකි. හොරණ කලාකෙත මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වේ.

## 3. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම් විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

- **පළාත් කලා උළෙල**

පළාත් සංගීත හා නර්තන කලායතන දිරිගැන්වීම හා පුබුදුවා ලීම, හැකියාවන් එළිදැක්වීම සාම්ප්‍රදායික ශිල්පක්‍රම වල ප්‍රශස්ත ලක්ෂණ හා හැකියාවන් අන්‍යොන්‍ය වශයෙන් ඉගෙනීම ආදී කරුණු පෙරදැරිව කලායතන අතර දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පවත්වනු ලබන තරඟාවලි හා එහිදී මතුවන ප්‍රසාංගිකත්වයෙන් අනූන කලාංග තෝරාගෙන පවත්වනු ලබන ප්‍රසංගයක් මෙම වැඩසටහනට අයත්ය. ප්‍රසංගයේදී ජයග්‍රාහී කලායතන හා ඒවායේ දරුදැරියන්ට ත්‍යාග, මුදල්, සහතිකපත්‍ර හා සමරු තිළිණ ප්‍රදානය කෙරේ. 2015 වර්ෂයේදී රු. 3,000,000/- ක මුදලක් වැය කරමින් පළාත් කලා උලෙළ පවත්වන ලදී.





- **සිසු නිපුණතා වැඩසටහනට මූල්‍යාධාර ලබා දීම.**

දහම් පාසල් සිසුන්ගේ කුසලතා ඔප්නැංවීමට සැලසුම් කර තිබෙන මෙම වැඩසටහන සඳහා එක් ශාසනාරක්ෂක බලමණ්ඩලයට රු.25,000/- බැගින් ශාසනාරක්ෂක බලමණ්ඩල 54 ක් සඳහා රුපියල් ලක්ෂ 1,350,000/ ක මුදලක් ලබා දීමට කටයුතු කරන ලදී.

- **සාහිත්‍ය, කලා වැඩමුළු හා සම්මන්ත්‍රණ**

ප්‍රවේගවත් සමාජ පසුබිමක නිරවුල් මනසක පෝෂණය සඳහා සෞන්දර්යය හා සාහිත්‍යය පසුබිම් වූ රසවින්දන වැඩසටහන් මගින් පීඩාකාරී ජන ජීවිතයට ලැබෙන පිටුවහල අනූපමේය වන අතර, ආර්ථික සමාජයීය හා සංස්කෘතික වශයෙන් හෙම්බත්ව සිටින මනසට සුව ඔසු සම්පාදනය කරයි. වියත් ප්‍රවීණ කලාකරුවන්ගේ දැනුම උපයෝගී කොටගනිමින් ආනන්දයෙන් ආරම්භව ප්‍රඥාවෙන් අවසන් වන මෙම කාර්යභාරය සඳහා විවිධ ආයතන වල විවිධ තරාතිරම් වල විවිධ වයස් මට්ටම් වල අයගේ විශාල සහභාගිත්වයක් ඇතිව සිදු කරනු ලැබීය.

- **හොරණ කලාකෙත**

ගායනය, වාදනය, නර්තනය, නාට්‍ය හා රංග කලාව, චිත්‍ර, මූර්ති ආදී විවිධ සෞන්දර්ය විෂයන් අරභයා කළුතර දිස්ත්‍රික් දරුවන්ගේ කලා හැකියාවන් මූර්තිමත් කිරීම පිණිස හොරණ කලා කෙතෙහි නොමිලයේ පාඨමාලා සමූහයක් පැවැත්වේ. මෙහි ප්‍රතිලාභී කණ්ඩායම් දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමේ තරගවලදී විවිධ අවස්ථාවන්හිදී විවිධ ජයග්‍රහණ ලබා ගනිමින් අප අමාත්‍යාංශයට ගෞරවය, කීර්තිය ලබාදී ඇත. වර්ෂ අවසානයේ පැවැත්වූ කලා උළෙල මගින් මෙම දරුවන්ගේ සහජ කුසලතා කරලියට ගෙනඑනු ලැබීය. මෙම වර්ෂයේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 750,000/- ක මුදලක් ලබා දී ඇත.

- **පොසොන් උත්සවය**

සිංහල බෞද්ධ ජනතාවට පමණක් නොව සමස්ථ ශ්‍රී ලාංකික ජනතාවට පොසොන් උත්සවයේ වටිනාකම හොඳින් දැනේ. මිහිඳු හිමියන්ගේ ආගමනයෙන් මෙරට සිදුවූ සමාජ, ආර්ථික හා දේශපාලන පරිවර්තනය එයට හේතු කාරක වෙයි. ඒ අනගි මෙහෙවර මෙනෙහි කරනු වස් හෝමාගම පොසොන් කලාපය ඉතා සාර්ථකව දින 2 ක් තුල ක්‍රියාත්මක කරනු ලැබීය. මේ සඳහා රු 400,000/- ක මුදලක් වැය කරන ලදී.

- **රාමසාන් උත්සවය**

ඉස්ලාම් බැතිමතුන් විසින් ඉක්තාර් උපවාස කාලය අවසන් කරමින් රාමසාන් උත්සවය පවත්වනු ලැබේ. බස්නාහිර පළාත තුල වෙසෙන මුස්ලිම් ජනතාවගේ සහෝදරත්වයේ දැතේ පහස ලබමින් අප සංස්කෘතික අමාත්‍යාංශය මගින් මුස්ලිම් පල්ලි වෙත රු 650,000/- ක පමණ වියදමින් රටඉඳි කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික් වල තෝරාගත් ඉස්ලාම් පල්ලි මාර්ගයෙන් මුස්ලිම් ජනතාව වෙත බෙදා දෙන ලදී.

- **දහම් පාසල් ගුරු වැඩසටහන්**

දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් දහම් අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම පිණිස දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. ඉගැන්වීමේ ක්‍රමවේද හා පරිපාලන කටයුතු පිළිබඳව දැනුවත් කිරීමත්, දහම් කථා, දහම් කවි, ගාථා නිවැරදිව හඳුනා ගැනීම මෙමගින් ඉටු කෙරේ. මේ සඳහා රු. 2,200,000/- ක මුදලක් වැය කරන ලදී.

- **සාම්ප්‍රදායික බක්මහ උළෙල**

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ශ්‍රී ලාංකික සංස්කෘතික උත්සව අතර වැදගත් තැනක් ගනී. වර්තමානයේ අභාවයට යන සංස්කෘතික අංග එකතු කර සාම්ප්‍රදායික අවුරුදු උළෙලක් කැස්බෑව ප්‍රාදේශීය කාර්යාලය මඟින් රත්තනපිටිය ආනන්ද විද්‍යාලය භූමියේදී පවත්වන ලදී.

- **සංස්කෘතික ආධාර ලබාදීම.**

සංස්කෘතික, කලා හා ආගමික කටයුතු වලින් සමාජ සංවර්ධනයේ නිරතවූ, නිරතවන පුද්ගලයින් හා ආයතන දිරිගැන්වීම, ආධාර, උපහාර පිරිනැමීම. පළාතේ සංස්කෘතික වටිනාකමින් යුත් පෙරහැර, ආගමික නායක ආදාහන උත්සව, විශේෂ උපසම්පදා හෝ වැදගත් උත්සව සඳහා ආධාර උපකාර කිරීමේ කටයුතු සඳහා රු.3,000,000/- ක මුදලක් වැය කර ඇත.

- **කලාකරු සුහද හමුව**

බස්නාහිර පළාත තුල වෙසෙන කලාව තම ජීවිකාව කොටගත් විවිධ කලා ක්ෂේත්‍රයන් පුරා පැතිරුනු කලාකරුවන් ඒකරාශී කරගනිමින් ඔවුනොවුන් තුල සාමූහිකත්වය ගොඩනැංවීම හා කලාකරුවන් දැයට කළ සේවය අගය කිරිමේ අරමුණු පෙරදැරි කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබීය. මේ සඳහා රු.1,400,000/- ක මුදලක් වැයකර ඇත.

- **ආගමික ස්ථාන සංවර්ධනය**

ආගම විසින් මිනිසාගේ හික්මීම, සංයමය හා මානසික සුවතාවය පිණිස කෙරෙන්නේ දැවැන්ත කාර්යභාරයකි. එබැවින් බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම් ආගමික ස්ථාන නවීකරණය කිරීම, සංවර්ධනය කිරීම සහ එයට අත්‍යාවශ්‍ය අංග එකතු කිරීම තුළින් ජාතික මෙහෙවරට දොරටු විවර වන අතර, ආගමික ස්ථාන මගින් පවත්වාගෙන යනු ලබන දහම් පාසැල් ගොඩනැගිලි සංවර්ධනයද මේ කාර්යභාරය හා බද්ධව පවතී.

- **කලායතන සංවර්ධනය**

බස්නාහිර පළාත තුල ලියාපදිංචි කලායතන දිරිමත් කිරීම සඳහා වාද්‍ය භාණ්ඩ හා උපකරණ ලබා දීම මෙමගින් සිදු කරයි. මෙම අනුග්‍රහය ලැබීමෙන් කලායතනවල ඉගෙනුම ලබන දරුවන්ට පහසුකම් සලසන අතරම කලායතනවලට සිසුන් යොමුවීම වර්ධනය වීමත් කලායතනයේ කටයුතු සාර්ථක කරගැනීමට අනුබල ලබාදීම හා කලායතන තරඟ සඳහා යොමුවන කලායතන සංඛ්‍යාව වර්ධනය කිරීමත් අපගේ අපේක්ෂාවයි.

- **බස්නාහිර පළාත් දහම් පාසල් ගුරුවරුන් ඇගයීමේ වැඩසටහන**

දහම් අධ්‍යාපනය හදාරන දරුවන් වෙනුවෙන් දහම් පාසල් ගුරුවරුන් සේවය කරනු ලබන්නේ ස්වේච්ඡාවෙනි. මෙම ගුරුවරුන්ගෙන් ඇතැම් අය වසර විසිපහ තිහ වැනි කාල සීමාවන් සේවය කරමින් සිටී. එහෙත් ඔවුන්ට රජයෙන් හෝ වෙනත් ආකාරයකින් වැටුපක්, වේතනයක් ගෙවනු නොලබයි. එබැවින් ඔවුන් කරන ලද සේවාව ඇගයීමට ලක්කිරීම තුලින් වඩාත් ඵලදායී ගුණාත්මක

සේවාවක් දරුවන්ට ලබාදීම හා ගුරුවරුන්ගේ සේවා තෘප්තිය වැඩි කිරීම අරමුණු කරගත් මෙම වැඩසටහන සඳහා මිලියන 02 ක මුදලක් වැයකර ඇත.

- **දහඅට සන්නි ශාන්ති කර්මය**

දේශීය ශාන්ති කර්ම විධි ජනතාව අතරින් දුරස් වන්නට ඉඩ නොදී ඔවුන් වෙත සමීප කරවීම පිණිස ඒ වෙනුවෙන් නිපුණතාවය ලද ප්‍රවීණයන් මගින් දහඅට සන්නි ශාන්ති කර්මයක් පැවත්වීම. අනාගත පරපුරට ප්‍රෞඪ අතීත උරුමය පිළිබඳ වැටහීමක් ලබා දීමත්, සම්ප්‍රදායන් පිළිබඳ දැනුවත් වීම සඳහාත් සැමට සෙත් පැතීමේ අරමුණ ඇතිව රු. 486,700/- ක මුදලක් වැයකර මෙම ශාන්ති කර්මය ගම්පහ දිස්ත්‍රික්කයේ පවත්වනු ලැබීය.




- **කෙටි නාට්‍ය වැඩමුළුව**

පිටපත් රචනය, රඟපෑම, අංග රචනය, ඇඳුම් පැළඳුම් හා පසුතල නිර්මාණ සංගීතය ආදී නාට්‍යකරණයෙහි සියලුම මූලික අනුවිෂයන් ඔස්සේ බස්නාහිර පළාත තුළ දින 07 ක නේවාසික වැඩමුළු පවත්වා ඒවාට සහභාගී වූවන් විසින් ඉදිරිපත් කරනු ලබන පිටපත් අගයා ඉන් තෝරාගත් පිටපත් ඇසුරින් රළු නිෂ්පාදන කරවා ඒවා අතරින් තෝරාගනු ලබන කෙටි නාට්‍ය 05 ක් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, විශේෂඥ උපදෙස් හා මගපෙන්වීම සිදුකර ඒවා ඇතුලත් කර කෙටි නාට්‍ය උළෙලක් පැවැත්වීමට නියමිතය. ක්ෂේත්‍රයේ ප්‍රවීණතම හා විශිෂ්ඨතම සම්පත්දායකයින් මෙම වැඩමුළු සඳහා සහභාගී කරවා ගනිමින් නාට්‍ය ක්ෂේත්‍රයට නැවුම් අදහස්, නිසි අධ්‍යයනයක් හා ඉහළ රසිකත්වයක් ඇති අංකුර නාට්‍යකරුවන් පිරිසක් බිහිකර ගැනීම මූලික අරමුණයි. මේ සඳහා රු. 1,500,000/- ක මුදලක් වැය කරන ලදී.




- **නත්තල් උත්සවය**

කිතුනු බැතිමතුන්ගේ අසමසම නායකයන්ගේ උපත සිහිකරමින් ලොවපුරා පැවැත්වෙන මෙම උත්සවය එහි මූලික අර්ථය කුළුගැන්වෙන පරිදි ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී සංවිධානය කර පැවත්වීම සඳහා රු. 150,000/- ක මුදලක් වැය කර ඇත.

- **හිටිවන කවි වැඩසටහන**

බස්නාහිර පළාත පුරා විසිරී සිටින සහජ කුසලතාවයෙන් පිරි පාසල් සිසු දරුදරියන් හඳුනාගෙන අගනුවර තරුණ කවි සමාජයේ ප්‍රවීණ කවියන් හා කිවිදියන්ගේ පුහුණු වැඩමුළු මගින් දක්ෂතාවයන්ගෙන් පිරි සිසු දරු දැරියන්ගේ කවිත්වය හා රසාස්වාදය ඔප්නංවාලමින් අවසානයේ කවි සමාජය හා ඒකාබද්ධ කිරීමත් එතුලින් ඔවුන් ඇගයීම, දිරි ගැන්වීම හා සමාජ සංස්කෘතික සම්පත් දායකයින් බවට යොමු කරගැනීම මෙමගින් බලාපොරොත්තු වේ. ප්‍රවීණයන් හා ආධුනිකයින් එක්ව කරනු ලබන හිටිවන කවි වැඩසටහනත් සහතික පත් ප්‍රධානෝත්සවයත් පවත්වන ලද අතර, එම වැඩසටහන සඳහා රු.500,000/- ක මුදලක් වැයකර ඇත.





- **පුස්තකාල සංවර්ධන වැඩසටහන**

දහම් පාසල් අධ්‍යාපනය තුළින් දරුවෙකු සුචරිතවත් කොට සමාජගත කිරීමට මනා පිටුබලයක් ලබා දේ. එසේම දරුවන් තුළ යහපත් ආකල්ප කුසලතා නිපුණතා වර්ධනය කරන අතරම ඔවුන් දහම් දැනුමෙන් පෝෂණය කිරීමට සමත් ප්‍රමුඛතම විද්‍යාස්ථානය වන්නේ දහම් පාසලයි. එයින් අනාගත සමාජයට සදාචාර සම්පන්න ගුණගරුක දරු පරපුරක් දායාද වේ. විවේක කාලය අර්ථවත්ව ගතකිරීමටත් විෂයය දැනුම හා ඉන් පරිබාහිර තොරතුරු පිළිබඳව දැනුවත් බවක් ලබා දීමට සමත් වටිනා මුද්‍රිත මාධ්‍ය වන්නේ පතපොතයි. එම නිසා දහම් පාසල් දරු දැරියන් පතපොත කියවීමට යොමුකිරීම හා ඔවුන් තුල කියවීමේ පුරුද්ද ඇතිකිරීම මෙහි අරමුණයි. මෙම වැඩසටහන පළාත තුල ක්‍රියාත්මක කිරීමට රු.1,800,000/- ක මුදලක් වෙන්කල අතර, මෙය බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර ඇත.

- **දහම් පාසල් හේවිසි කණ්ඩායම් පිහිටුවීම.**

බස්නාහිර පළාත තුල ලියාපදිංචි බෞද්ධ විහාරස්ථාන 2,265 ක් පමණ පවතී. මෙම විහාරස්ථාන ආශ්‍රිතව පැවැත්වෙන ආගමික වතාවත් (කඨින පූජෝත්සව, බෝධිපූජා පිංකම්, වාර්ෂික පෙරහැර ආදී ආගමික පූජෝත්සවයන් ) සඳහා තේවාවන් සිදු කිරීමට හේවිසි කණ්ඩායම් උපයෝගී කරගනු ලැබේ. ඒ සඳහා සැලකිය යුතු මුදලක් වැයකිරීමට එම විහාරස්ථ දායක සභාවන්ට සිදුවේ. එබැවින් බස්නාහිර පළාතේ විහාරස්ථාන මුල් කරගනිමින් හේවිසි කණ්ඩායම් පිහිටුවීමට අවශ්‍ය උපකරණ ලබාදීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබීය.





## 4. ඵලදායිතාවය

- පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය මගින් ඵලදායිතාවය සංවර්ධනය සඳහා කටයුතු කර ඇත.
- පරිගණක පුහුණුව ලබා දීම.

## 5. සේවක සුභ සාධනය

- ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 6. විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම්

2015 වසරේ ලද විගණන විමසුම් - 2

2015 වසරේ පිළිතුරු සැපයූ විගණන විමසුම් - 2

# 6.2

# ක්‍රීඩා අංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් තුලින් ජාත්‍යන්තරය ජයගත් ක්‍රීඩකයන්

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත තුල වෙසෙන ජනතාවගේ විශේෂයෙන් පළාත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා ක්‍රීඩා ක්ෂේත්‍රය හා සම්බන්ධ නිලධාරීන්ගේ සුභ සිද්ධිය පිණිස දැනුම යාවත්කාලීන කිරීම, නව පුහුණු ක්‍රමවේද හඳුන්වාදීම, පහසුකම් සැපයීම හා තරඟ සංවිධානයට අදාල ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය, සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට එම කටයුතු ඉටුකිරීම සඳහා නායකත්වය ලබාදීම හා මඟ පෙන්වීම අපගේ මෙහෙවරයි.

### 1.3 කාර්ය භාරය

- ක්‍රීඩා තරග සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- ජාතික ක්‍රීඩා උළෙලට සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට උපහාර උළෙලක් පැවැත්වීම.
- ක්‍රීඩාව දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ක්‍රීඩකයින් පුහුණු කිරීම.
- ක්‍රීඩා සමාජ ලියාපදිංචි කිරීම.
- ව්‍යාපෘති යටතේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම.
- සැමට ක්‍රීඩාව සහ සුවතාව වැඩසටහන යටතේ වැඩ සටහන් නිර්මාණය කිරීම.
- පොල්වත්ත ක්‍රීඩා විද්‍යායතනයේ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එම ආයතනය අනෙකුත් ආයතන වල අවශ්‍යතා මත ලබාදීම.
- ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනය හා එහි පිහිණුම් තටාකය පවත්වාගෙන යාම.
- බස්නාහිර පළාත තුළ සිටින ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, විනිසුරුවන් විදේශ ගත වීමේදී මුදල් ලබා දීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

බස්නාහිර පළාත් ක්‍රීඩා අංශය ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ අංශයක් ලෙස පවතී. තවද පොල්වත්තේ පිහිටි බස්නාහිර පළාත් ක්‍රීඩා විද්‍යායතනය සහ ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩා සංකීර්ණය ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්යය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| **1** | ක්‍රීඩා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය (11 ශ්‍රේණිය) | **1** |
| **2** | ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී | දෙපාර්තමේන්තුගත | **1** |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන්

- **ක්‍රීඩා තරග සංවිධානය**
  - අන්තර් ක්‍රීඩා සමාජ තරග
  - අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරග
  - අන්තර් දිස්ත්‍රික් තරග (බස්නාහිර පළාත් ක්‍රීඩා උළෙල)
  - 16 න් පහළ මලල ක්‍රීඩා තරඟ පැවැත්වීම
  - බස්නාහිර පළාත් මලල ක්‍රීඩා තරගාවලිය

- **ජාතික ක්‍රීඩා උළෙලට සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම.**
  - ආහාර, පානීය ජලය, නවාතැන් පහසුකම් සපයා දීම
  - ක්‍රීඩා ඇඳුම් ( ට්‍රැක් බොටම්, ටීෂර්ට්), සපත්තු සැපයීම
  - ක්‍රීඩා උළෙලට සහභාගී වන සෑම ක්‍රීඩකයකු හටම පෝෂණ මල්ල බැගින් ලබා දීම.

  මේ සඳහා 2015 වසර වෙනුවෙන් බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය වැය කළ මුදල රු. මි. 5.0 කට අධිකය.

- **ක්‍රීඩා උපහාර උළෙල**

  2014වර්ෂයේ ජයග්‍රහණ ලැබූ ක්‍රීඩකයන් සඳහා දුන් මුල්‍යමය තිළිණ පහත පරිදි වේ.

| ස්ථානය | 2014 සිට (රු) |
|---|---|
| 1 වන ස්ථානය | 15,000.00 |
| 2 වන ස්ථානය | 10,000.00 |
| 3 වන ස්ථානය | 5,000.00 |

මෙයට අමතරව හොඳම ක්‍රීඩකයා සඳහා රු.10,000/= ක මුදලක් ත්‍යාග වශයෙන් ලබාදුන් අතර පුහුණුකරුවන් ඇගයීම වෙනුවෙන් 2015 වර්ෂයේ දී තෝරා ගත් පුහුණුකරුවන් සඳහා රු 20000/= ක් බැගින් වු මුල්‍ය තිළිණයන් ද අන්තර් ජාතික ජයග්‍රහණ ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්හට ද විශේෂ මුල්‍ය තිළිණයන් ප්‍රදානය කරන ලදි.

- **බස්නාහිර පළාත් ක්‍රීඩා උපහාර උළෙලේ දී 2015 වසරේ කරන ලද ගෙවීම්**

| බස්නාහිර පළාත් ක්‍රීඩා උපහාර උළෙල | | |
|---|---|---|
| **විස්තරය** | **ඒකක** | **මුදල (රු)** |
| රන් පදක්කම් | 177 | 2,655,000.00 |
| රිදී පදක්කම් | 95 | 950,000.00 |
| ලෝකඩ පදක්කම් | 108 | 540,000.00 |
| දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 16 | 160,000.00 |
| සහභාගිත්වය | 248 | 744,000.00 |
| අන්තර් ජාතික ජයග්‍රහණ ලැබූ ක්‍රීඩකයින් | 34 | 1,065,000.00 |
| පුහුණුකරුවන් ඇගයීම | 10 | 200,000.00 |
| **එකතුව** | | **6,314,000.00** |

- **ව්‍යාපෘති**




- **විදේශාධාර**

බස්නාහිර පළාත තුළ පදිංචි විදේශ ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ පුහුණු කරුවන් හට මූල්‍යමය වශයෙන් ආධාර ලබාදීම මේ යටතේ ක්‍රියාත්මක වේ. මෙය ක්‍රම 2 ක් යටතේ ගෙවනු ලබයි.

| වැය ශීර්ෂය මගින් ලබාදෙන ප්‍රතිපාදන | ක්‍රීඩා අරමුදල මගින් |
|---|---|
| රු. 582,500/= | රු. 1,000,000/= |

- <u>අත්කරගත් ජයග්‍රහණයන්</u>

| තරඟය | රන් පදක්කම් | රිදී පදක්කම් | ලෝකඩ පදක්කම් |
|---|---|---|---|
| 2015 ජාතික මහා ක්‍රීඩා උළෙල සමස්ථ ශූරතාවය | 77 | 66 | 53 |

## 5. ඵලදායිතාවය

- ක්‍රීඩා අංශයේ එක් නිළධාරියකු සඳහා එක් පරිගණකයක් බැගින් ලබා දීම.
- දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරීන් සඳහා ලැප් ටොප් යන්ත්‍ර ලබා දීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය මගින් ඵලදායිතාවය සංවර්ධනය සඳහා කටයුතු කර ඇත.

## 6. සේවක සුභ සාධනය

- ක්‍රීඩා නිළධාරීන් සඳහා ශාරීරික යෝග්‍යතා වැඩසටහන් සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| | | |
|---|---|---|
| 2015 වසරේ ලද විගණන විමසුම් | - | 7 |
| 2015 වසරේ පිළිතුරු සැපයූ විගණන විමසුම් | - | 7 |

# 6.3 බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
අධ්‍යාපනය තුලින් පූර්ණ දැණුමැති සමාජයක්.

### 1.2 මෙහෙවර
නිදහස් අනිවාර්ය හා ගුණාත්මක අධ්‍යාපනයක් තුලින් පූර්ණ දැනුමැති සමාජයක් ගොඩ නැගීම සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය හා ශක්තිමත් කිරීමට සැමට සමව හා සාධාරණ වන සේ මානව භෞතික, මූල්‍ය හා තාක්ෂණ සහය ලබා දීම.

### 1.3 කාර්යයන්
පාසල් අධ්‍යාපන පද්ධතියෙන් බලාපොරොත්තු වන පරමාර්ථ හා අරමුණු ඉටු වන ආකාරයෙන් සිසුන්, විදුහල්පතිවරුන්, නිලධාරීන් හා සෙසු කාර්ය මණ්ඩලවලට අදාළ සියලු කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

- අනිවාර්ය අධ්‍යාපනයේ වයස් සීමාව ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) දක්වා සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කායික, මානසික චිත්තවේග හා සදාචාරාත්මක වර්ධනයට තුඩු දෙන වඩා පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට අවකාශ සැලසීම.
- විවිධ මට්ටම්වලින් පාසල් හැර යන්නවුන් සඳහා නොවිධිමත් අධ්‍යාපන පහසුකම් වර්ධනය කිරීම හා යාවජීව අධ්‍යාපන සංකල්පයට අදාළ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පූර්ව පාසල් අධ්‍යාපනය වඩා විධිමත් හා ඵලදායී කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ක්‍රීඩා, සෞන්දර්යාත්මක කටයුතු, ශිෂ්‍ය නායකත්වය හා සුභ සාධන ආදී විවිධ විෂය සමගාමී වැඩසටහන් හා ව්‍යාපෘතීන් මගින් පාසල් පද්ධතිය ප්‍රජාව හා සම්බන්ධ කරන අතර, මෙම අංශවල විශේෂ කුසලතා ද වර්ධනය කිරීම.
- මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා ජාතික හා පළාත් සභා අධ්‍යාපන ප්‍රතිපත්තීන් ද පළාතේ සම්පත් හා සමාජ, ආර්ථික හා සංස්කෘතික රටාවන් ද නව ප්‍රවණතා ද පදනම් කරගෙන අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම.

- එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.
- අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයෙන් ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීම හා ප්‍රතිපෝෂණය ලබාදීම

## 2. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (I ශ්‍රේණිය) | 1 |
| 2 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (I ශ්‍රේණිය) | 3 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය) | 1 |
| 4 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III / II ශ්‍රේණිය) | 3 |
| 5 | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (II ශ්‍රේණිය) | 8 |
| 6 | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (III / II ශ්‍රේණිය) | 14 |
| 7 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 3. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

- **සැලසුම් අංශය**
    - ද්වීතියික පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් දහසක් ප්‍රති නිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ පාසල් 134 ක් නම් කර ඇත.
        - මේ යටතේ තාක්ෂණික විද්‍යාගාර 129 ක් ඉදිකිරීම් අවසන් කර, පාසල් 118 සිසු අයිතියට පත්කර ඇත.
        - තාක්ෂණික විද්‍යා පීඨ 52 ක් ඉදිකිරීම් කටයුතු කර සිසු අයිතියට පත් කරමින් පවතී.
        - 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ද්වීතියික වැඩසටහන් ව්‍යාපතිය යටතේ 1C පාසල් 32 ක්, 1AB පාසල් බවට පත් කිරීමට යෝජනා වී ඇති අතර ඉන් පාසල් 17 ක් මේවන විට 1AB තත්වයට පත් කර ඇත.
    - සෞඛ්‍යමත් පාසල් ප්‍රජාවක් උදෙසා සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ බස්නාහිර පළාතේ පාසල් 180 ක් සඳහා රු.මිලියන 225 මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම .

- ළගම පාසල හොඳම පාසල ජාතික වැඩසටහන 2016 සිට ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2015 වර්ෂයේදී ආරම්භ කර ඇත.

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය (ඒ) | ව්‍යාපෘතිය (බී) | ව්‍යාපෘතිය (සී) | ව්‍යාපෘතිය (ඩී) | එකතුව |
|---|---|---|---|---|---|
| කොළඹ | 31 | 68 | 39 | 89 | 227 |
| ගම්පහ | 26 | 85 | 45 | 169 | 325 |
| කළුතර | 24 | 60 | 31 | 127 | 242 |
| එකතුව | 81 | 213 | 115 | 385 | 794 |

- සංගණන දත්ත ඇසුරින් තොරතුරු සකස් කිරීම හා අදාල පාර්ශවයන් වෙත ලබාදීම .
- 2015 වර්ෂය සඳහා පුනරාවර්තන ක්‍රියාත්මක සැලැස්ම

අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගීත්ව වර්ධනය සඳහා රුපියල් මිලියන 22 ක් සහ ද්විතියික අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා රු මිලියන 148 ක් සහ ප්‍රාථමික අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා රු.මිලියන 90 ක් වෙන් කර ඇත. මේ අනුව රුපියල් මිලියන 252 ක් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්‍රියාවලිය නැංවීම සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සහ කලාප කාර්යාල 11 සඳහා වෙන් කර ඇත.

- 2012 - 2016 ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක Transforming the School Education System as the Foundation of Knowledge Hub Project ( TSEP ) ව්‍යාපෘතිය
  - ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක පස් අවුරුදු සැලැස්ම යටතේ 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 342.56 ක් වෙන් කර ඇත. මේ යටතේ 79% ක මුල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.
  - ගුණාත්මක යෙදවුම් මුදල් පළාත් පාසල් වලට ලබා දීම. 2015 වර්ෂයේදී පාසල් වලට බෙදා දීමට අනුමත වූ මුළු මුදල රු. මිලියන 190කි.
  - බස්නාහිර පළාතේ පාසල්, කලාප කාර්යාල හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුල උපමාන පාදක ප්‍රදාන, පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන, ලෝක බැංකු ආධාර ආදී විවිධ මුදල් මූලාශ්‍ර යටතේ අනුමතව ක්‍රියාත්මක වන ව්‍යාපෘති (සැපයීම්) වල ප්‍රගතිය මාසිකව අදාල අංශ වෙත වාර්තා කිරීම.
- පාසල් වල අයවැය ඇස්තමේන්තු ප්‍රමාදයකින් තොරව අනුමත කිරීම.
- (01/2016) නව චක්‍රලේඛය ප්‍රකාරව ගුරු තුලනය කිරීමේ කටයුතු ඉටු කිරීම හා කාර්ය මණ්ඩල සමාලෝචන පිළිබඳ කටයුතු .
- පාසල් ව්‍යුහ කටයුතු.
- විදුහල්පතිවරුන් 212 දෙනෙක් සඳහා රු. 1,073,630 ක වියදමින් නේවාසික කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම .

- **සාමාන්‍ය පාලන අංශය**
  - විදුහල්පති සේවයේ උසස්වීම් සම්බන්ධ කටයුතු සිදු කිරීම
  - ගුරු ව්‍යවස්ථාවට අනුව බස්නාහිර පළාත් ගුරු සේවයේ නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම
  - ගුරු ගැටළු හඳුනාගෙන ඒවාට කඩිනම් විසඳුම් ලබාදීම සහ ගුරු සේවයේ නිලධාරීන්ගේ විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කිරීමේ කටයුතු සිදු කිරීම
  - විනය කාරණා සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබා දීම.
  - නැවත සේවයේ පිහිටුවීම හා විශ්‍රාමික ගුරුසේවයේ නිලධාරීන්ගේ ගැටළු සම්බන්ධයෙන් අප්‍රමාදව ක්‍රියා කිරීම.
  - බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප කාර්යාල වල සේවයේ නියුතු සියලුම කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු කිරීම.
  - රා.ප.ච. අංක 16/2008 චක්‍ර ලේඛය අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ හා විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත්කර වැටුප් සැකසීම
  - කාර්ය මණ්ඩලයේ පෞද්ගලික හා රාජකාරි විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු සිදු කිරීම.
  - ගුරු නිවාසවල පදිංචියට අනුමැතිය ලබාදීමේ කටයුතු.

- **සංවර්ධන අංශය**

| | විෂයය | කාර්යයන් |
|---|---|---|
| **1** | **ගණිතය** | **<u>පළාත් ගණිතාගාර සම්බන්ධ කටයුතු</u>**<br>කලාපවල ගණිත විෂයය සංවර්ධනය සඳහා මග පෙන්වීම |
| | | **<u>ඔලිම්පියාඩ් තරගාවලිය සම්බන්ධ කටයුතු</u>**<br>ජාත්‍යන්තර තරගවලින් රන් රිදී ලෝකඩ පදක්කම් හා කුසලතා සහතික දිනා ඇත. |
| | | විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන් |
| | | ජාතික මට්ටමේ තරග සඳහා සිසුන් තෝරා ගැනීම, පුහුණු කිරීම, ඉදිරිපත් කිරීම, හා ජයග්‍රාහී සිසුන් ඇගයීමට ලක් කිරීම.<br>ලබා ගත් ජයග්‍රහණ<br>සමස්ත ලංකා ගණිත නාට්‍ය තරග -<br>○ කණිෂ්ඨ — හොඳම අධ්‍යක්ෂණය<br>හොඳම රංග වස්ත්‍ර නිර්මාණය<br>හොඳම සංගීතය<br>○ ජ්‍යෙෂ්ඨ — හොඳම අධ්‍යක්ෂණය<br>තෙවන ස්ථානය - (සිංහල මාධ්‍යය) |
| | | *විශේෂ වැඩ සටහන්*<br>***"තිරසාර ගණිතාගාර සංවර්ධන වැඩසටහන"*** *පාසල් 05 ක ක්‍රියාත්මක කිරීම*<br>*අනුග්‍රහය - කොමර්ෂල් බැංකුව* |
| **2** | **විද්‍යාව** | 7 – 11 ශ්‍රේණි විද්‍යා විෂය නව විෂය නිර්දේශය හඳුන්වා දෙමින් ගුරු භවතුන් සඳහා වැඩමුළු පැවැත්වීම. |
| | | අ.පො.ස. උසස් පෙළ රසායන විද්‍යා හා ජීව විද්‍යා ගුරු භවතුන් සඳහා ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ සම්පත් දායකත්වයෙන් හා කැළණිය විශ්ව විද්‍යාලයීය සම්පත් දායකත්වයෙන් වැඩමුළු පැවැත්වීම |
| | | විද්‍යා විෂය කාර්ය පත්‍රිකා සකස් කිරීමේ වැඩමුළුවක් පවත්වා අ.පො.ස සාමාන්‍ය පෙළ ඉලක්ක කර ගනිමින් පොතක් මුද්‍රණය කර නිකුත් කිරීම |
| | | **විද්‍යා දැනුම මිනුම තරග හා ඔලිම්පියාඩ්** තරග කළාප මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් සංවිධානය කර පැවැත්වීම |
| | | පළාත් විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ 11 වන අදියර ක්‍රියාත්මක කිරීම |
| **3** | **ඉංග්‍රීසි** | අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි සාහිත්‍ය ගුරුභවතුන් නව විෂය නිර්දේශයට පුහුණු කිරීම.<br>අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි සාධන මට්ටම අඩු පාසල් දරුවන් සඳහා **'Self Learning Kit'** පොත මුද්‍රණය කිරීම.<br>**"English is easy"** නිබන්ධනය සා/පෙළ ඉලක්ක කරමින් මුද්‍රණය කිරීම.<br>ද්විභාෂා ගුරුවරුන් CLIL පිළිබඳව දැනුවත් කිරීම. |

| | විෂයය | කාර්යයන් |
|---|---|---|
| **4** | **තොරතුරු තාක්ෂණය** | 01 සිට 13 ශ්‍රේණි දක්වා තොරතුරු සන්නිවේදන විෂය ඉගෙනුම ලබන සිසුන් සහභාගි කර ගනිමින් **තොරතුරු සන්නිවේදන තාක්ෂණ දිනයක් පැවැත්වීම** හා සහතික පත් ලබා දීම |
| | | **"නව ලොවට පෙරමග"** නමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය අත්වැල මුද්‍රණය කර 6 – 9 ශ්‍රේණි සඳහා නිකුත් කිරීම.<br>විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වයෙන් විෂය සම්බන්ධ ගුරු භවතුන් සඳහා දෙදින පුහුණු වැඩ මුළුවක් පැවැත්වීම.<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියලුම අංශ ආවරණය වන පරිදි අන්තර්ජාල පහසුකම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. |
| **5** | **විශේෂ අධ්‍යාපනය** | **<u>සංඥා භාෂාව හා බ්‍රේල් පුහුණු වැඩසටහන</u>**<br>මීගොඩ සම්පත් මධ්‍යස්ථානය<br>03,27,28,29,30,31. 2015 යන දිනයන් වල පවත්වන ලදී.<br>ගුරුවරුන් 43 දෙනෙකු මේ සඳහා සහභාගී වූහ.<br>මේ සඳහා රු: 163,415.00 ක මුදලක් වැයවී ඇත. |
| | | **<u>විශේෂ අධ්‍යාපන ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණු කිරීම</u>**<br>මීගොඩ සම්පත් මධ්‍යස්ථානයේදී 2015.05,21 හා 22 යන දෙදින පවත්වන ලදී.<br>**මේ සඳහා රු: 125,644.00 ක මුදලක් වැය වී ඇත.** |
| | | **විශේෂ අධ්‍යාපන ක්‍රීඩා 2015 තරඟාවලිය පැවැත්වීම**<br>සුගතදාස ක්‍රීඩාංගනයේ දී 2015.07, 07,08,09,10 යන දින වලදී පවත්වන ලදී. |
| **6** | **නොවිධිමත් අධ්‍යාපනය** | 01. *අනිවාර්ය අධ්‍යාපන පණත යටතේ පාසල් නොයන දරුවන් පාසල්ගත කිරිම සඳහා සාක්ෂර පාඨමාලා දියත් කිරීම<br>*සාධන මට්ටමට පැමිණි දරුවන් පාසල්ගත කිරීම.<br>*මුල් ළමා විය සංවර්ධන කටයුතු නිවස පදනම් කරගෙන වැඩිහිටි පිරිස් දැනුවත් කිරීම |
| | | 02 වෘත්තීය පුහුණු පාඨමාලා දියත් කිරීම |
| | | 03 පාසල් හැර ගිය දරුවන් සඳහා පාඨමාලා දියත් කිරීම.<br>○ ආකල්ප සංවර්ධනය<br>○ පෞරුෂ සංවර්ධනය<br>○ මත්ද්‍රව්‍ය නිවාරණය |
| | | 04 පාසලෙන් වැඩ බිමට තේමාව යටතේ රැකියාවලට යොමු කිරීම |
| | | 05 බන්ධනාගාර/ විශෝධන මධ්‍යස්ථානවල වැඩ සටහන් දියත් කිරීම |

| | විෂයය | කාර්යයන් |
|---|---|---|
| **7** | අධ්‍යාපන සංවර්ධන | **2016 වර්ෂයට අදාල විධිමත් සංවර්ධන සැලැස්ම**<br>විෂයයන් මට්ටමින් ඉදිරිපත් කිරීමේ වැඩසටහන් 6ක් බප. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2015 නොවැම්බර් මස පවත්වන ලදී.<br>මේ සඳහා රු. 286,985. 50ක මුදලක් වැය වී ඇත. |
| | | <u>ප්‍රසම්පාදන හා Zero Based Budget ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම</u><br>වැඩමුළු 3ක් බප. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2015 දෙසැම්බර් මස පවත්වන ලදී.<br>මේ සඳහා රු.172,418ක මුදලක් වැය වී ඇත. |
| | | **<u>2016 විෂය මට්ටමින් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ වැඩමුළු</u>** 6ක් බප. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2015 ඔක්තෝම්බර් මස පවත්වන ලදී.<br>මේ සඳහා රු161.,600/-ක මුදලක් වැය වී ඇත. |
| | | **<u>ප්‍රතිඵල සංවර්ධනයට අදාල විදුහල්පති වැඩමුළු 8ක්</u>**<br>බප. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2015 ජූලි මස පවත්වන ලදී.<br>මේ සඳහා රු.346,179.15ක මුදලක් වැය වී ඇත. |
| | | <u>ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් **13 ක්**</u><br>බප. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2015 මැයි, ජුනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා නොවැම්බර් මස පවත්වන<br>* 6 ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් 12ක් පැවැත්වීම.<br>* සියළුම විෂයන් සඳහා විෂය උපකාරක පොත් මුද්‍රණය කර සිසුන්ට බෙදා හැරීම මේ සඳහා රු.853,718.42 ක මුදලක් වැය වී ඇත |
| **8** | බටහිර සංගීතය | <u>බටහිර සංගීත ගුරු භවතුන්ගේ වැඩමුළුව</u><br>2015.03.23 හා 24 දෙදින කොළඹ රජකීය විදුහලේදී පවත්වන ලදී. මේ සඳහා රු. 77405 /- ක මුදලක් වැය වී ඇත. |
| | | <u>බ. ප. වාදන කුසලතා තරගාවලිය</u><br>2015.10.28 හා 2015.11.02 වන දින වල කොළඹ තර්ස්ටන් විදුහලේදී පවත්වන ලදී. මේ සඳහා රු.26,813/- ක මුදලක් වැය වී ඇත. |
| | | <u>ළමුන්ගේ ප්‍රාසාංගික හැකියාව වර්ධනය කිරීමේ වැඩමුළුව</u><br>2015.09.28 දින කොළඹ සියලු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලයේදී පවත්වන ලදී .මේ සඳහා රු 14.,951.50 ක මුදලක් වැය වී ඇත. |
| **9** | තාක්ෂණ විෂයයන් (උසස් පෙළ) | **<u>අ.පො.ස(උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණය විෂයයට අදාළ ප්‍රායෝගික /ස්ථානීය පරීක්ෂණ පිළිබඳ දැනුවත් කිරිමේ වැඩමුළුව</u>**<br>**දිනය 2015.03.12 - , වැයවූ මුදල රු 38,331.29** |
| | | **<u>10/11ශ්‍රේණි තාක්ෂණ විෂයයන් සඳහා දෙවන වාර පරීක්ෂණයට අදාළ ප්‍රශ්න පත්‍ර බැංකුවක් සකස් කිරීමේ වැඩමුළුව</u>**<br>**දිනය - 2015.03.30 වැය වූ මුදල රු.38,331.29** |
| | | **තාක්ෂණ විෂයයන් සම්බන්ධ අවසාන වාර පරීක්ෂණ ප්‍රශ්ණ පත්‍ර බැංකුවක් සකස් කිරීම** |
| | | **ගෘහ ආර්ථික විද්‍යා අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ උපගුරු වැඩමුළු පැවැත්වීම** |

| | විෂයය | කාර්යයන් |
|---|---|---|
| 10 | | **2016 විශේෂිත වැඩසටහන්**<br>❖ අ.පො.ස (සා.පෙළ) කෘෂි විද්‍යාව, ගෘහ විද්‍යාව සිසුන් සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර පොත් දෙකක් සැදීම.<br>❖ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තෝරාගත් පාසල් කීපයක විදුහල්පති හා ගුරුභවතුන් පුහුණු කිරීම.<br>❖ අ.පො.ස (උ.පෙළ) නව තාක්ෂණවේදය විෂය ධාරාවේ විෂයයන්ගේ සිසු ප්‍රායෝගික හා න්‍යායික පුහුණු වැඩමුළු පැවැත්වීම. |





- **අධ්‍යාපන පරිපාලන අංශය**
  - ජාතික පාසල්වල විදුහල්පතිවරුන් අධ්‍යාපන චාරිකා සඳහා ඉල්ලුම්පත් 900ක් ඉදිරිපත් කර ඇති අතර එම ඉල්ලුම්පත් සියල්ලම අනුමත කර ඇත.
  - පාසල් සිසුන්ගේ විදේශ නිවාඩු අයදුම්පත් 1180 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.
  - පාසල් සිසුන්ගේ චාරිකාකරණය පිළිබඳ ඵලදායි ලෙසින් යොදා ගැනීමට මග පෙන්වීම සඳහා චාරිකා මාර්ගෝප සංග්‍රහයක් එළි දැක්වීම.
  - ජනාධිපති ශිෂ්‍යත්වලාභීන් 1039 දෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දීම.
  - ප්‍රඥා ජනනී ශිෂ්‍යත්වලාභීන් 272 දෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දීම.

- **මුදල් අංශය**
  - පළාත් සභා ඇස්තමේන්තු අප්‍රේල් 30 දිනට හා මධ්‍යම ඇස්තමේන්තු ජුනි 30 දිනට පෙර ලබාදී ඇත.
  - පළාත් සභා / මධ්‍යම ගිණුම් සාරාංශය සකස් කිරීම සෑම මසකම 07 දිනට පෙර හා බැංකු සැසඳුම් සකස් කිරීම සෑම මසකම 15 දිනට පෙර ලබාදී ඇත.
  - පළාත්/මධ්‍යම අග්‍රිම ගිණුම්, පොදු තැන්පත් ගිණුම් සැසදීම කටයුතු.
  - මු.රෙ.135 අනුව වර්ෂය මුල්‍ය බලතල බෙදා දී ඇත.
  - මධ්‍යම අමාත්‍යාංශ පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන ලබාදුන් විගස අදාළ අංශ අතර බෙදාහැරීම.
  - මධ්‍යම / පළාත් අමාත්‍යාංශ විසර්ජන ගිණුම 2015.03.31 දිනට ප්‍රථම සකස්කර ඉදිරිපත් කර ඇත.
  - පළාත් ප්‍රේෂණ ගිණුම සෑම මසකම අවසානයේදී සකස් කිරීම.
  - පළාත් සභා ප්‍රතිපාදන (පුනරාවර්තන හා මූලධන) මුල්‍ය ප්‍රකාශයේ සීමාවන් යටතේ කලාප අධ්‍යාපන කාර්යාල වෙත බෙදාහැරීම.

- **ගෙවීම් අංශය**

  - බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සකස් කිරීම.
  - බස්නාහිර පළාතේ මධ්‍යම හා පළාත් ප්‍රසම්පාදනවල ගෙවීම් කටයුතු කිරීම.
  - බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කටයුතු කිරීම.
  - පළාත් දෙපාර්තමේන්තුවේ වියදම් ඇස්තමේන්තුව සකස් කිරීම.
  - නොවිධිමත් අධ්‍යාපන, විශේෂ අධ්‍යාපන සේවාස්ථවලට අදාල ගිණුම් කටයුතු කිරීම.
  - පළාත් මුදල් පොත, මධ්‍යම මුදල් පොත හා ණය ලේඛන පවත්වාගෙන යාම.
  - වාර්ෂික විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම හා පොදු තැන්පත් ගිණුම් ආදී අවසන් ගිණුම් සකස් කිරීම.
  - පළාත් හා මධ්‍යම විවිධ ගෙවීම් වව්චර්පත් පරීක්ෂා කිරීම හා ගෙවීම් කටයුතු කිරීම.

## 4. ඵලදායිතාව

- කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.
- ආයතනයේ ඵලදායිතාව ඉහල නැංවීම සඳහා ක්‍රියාකාරීව දායකත්වය ලබාදීම.
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් පැවැත්වූ ඵලදායිතා තරගයේදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් විශේෂ කුසලතා සම්මානයක් දිනාගැනීම.

## 5. සේවක සුභ සාධනය

- නිලධාරීන් වෙනුවෙන් සුභ සාධක සංගමය මගින් සහනදායී මිලට ආපන ශාලාවක් පවත්වාගෙන යාම .

## 6. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- අනවශ්‍ය ලිපිගොනු , ලේඛන ඉවත් කිරීම හා ක්‍රියාකාරී ලිපිගොනු පිළිවෙලකට සැකසීම.
- ආයතනික පරිසරය S5 සංකල්පයට අනුව සැකසීම.
- සෑම නිලධාරියකු විසින්ම පිළිතුරු සපයන ලද විගණන විමසුම් වලට අදාල ප්‍රගතිය ගණනය කර වාර්තා කිරීම
- පාසල් විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කල යුතු ආකාරය පිළිබඳව අදාල කලාප, කොට්ඨාශ, සහ විදුහල්පතිවරුන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත කැඳවා හෝ අවශ්‍ය ස්ථාන කරා නිලධාරීන් යොමු කර අවශ්‍ය උපදෙස් ලබා දීම
- කලාප කාර්යාල මට්ටමින් අවශ්‍ය උපදෙස් ලබා දීම හා ප්‍රධාන ගණකාධිකාරී හරහා විමර්ශනය කිරීම

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| **2015 වර්ෂය** | **විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්** | **අභ්‍යන්තර විගණන විසින් නිකුත් කරන ලද විගණන විමසුම්** |
|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 31 | 74 |
| 2015 වර්ෂය තුල ලද මුළු විමසුම් ගණන | 42 | 68 |
| 2015 වර්ෂයේ මුළු විමසුම් | **73** | **142** |
| 2015 වර්ෂයේ අවසන් විමසුම් ගණන | **54** | **54** |
| 2015.12.31 දිනට හිඟ විමසුම් ගණන | 19 | 88 |

# 7 කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
ජනතාවාදී විශිෂ්ටතම සේවා සපයන්නා වීම.

### 1.2 මෙහෙවර
ජාතික හා පළාත් ප්‍රතිපත්ති හා සැලසුම්වලට අනුකූලව ආයතනික සේවාවන් විශිෂ්ට ලෙස ළඟා කර දීම.

### 1.3 කාර්යයන්
- කෘෂිකාර්මික අධ්‍යාපනය ප්‍රවර්ධනය සහ ව්‍යාපෘති කටයුතු, පැළෑටි ආරක්ෂණය, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන සකස් කිරීම, බෙදාහැරීම හා කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීම ඇතුළත් කෘෂිකාර්මික සංවර්ධන කටයුතු.
- බස්නාහිර පළාත් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා නව තාක්ෂණික ක්‍රම කෙරෙහි යොමු කිරීම මගින් ඵලදායී කෘෂි ව්‍යවසායකත්වයක් කෙරෙහි යොමු කරවීම, කෘෂි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය හා පළාත් රාජ්‍ය පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය මගින් ගොවිජන සංවර්ධනය සඳහා පියවර ගැනීම.
- පළාතේ සුළු වාරිමාර්ග ක්‍රම සංවර්ධනය හා නඩත්තුව සහ ජල කළමනාකරණය
- සත්ත්ව අභිජනන සේවාවන් සැපයීම, වැඩිදියුණු කළ සත්ත්ව වර්ග හා සත්ත්ව පාලන ක්‍රම හඳුන්වා දීම, සත්ත්ව නිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු රැස්කිරීම සහ බෝවන රෝග ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික හා රාජ්‍ය අංශය ඒකාබද්ධව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම තුළින් දේශීය සත්ව නිෂ්පාදනය හා පරිභෝජනය ප්‍රචලිත කිරීම.
- පළාත් සභාවෙන් පැවරී ඇති බලතල අනුව රජයේ ඉඩම් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.
- රජයේ ඉඩම්වල යටිතල පහසුකම් ප්‍රවර්ධනය හා ජනපදිකයන්ගේ ජීවන තත්වය නංවාලීම.
- රජයේ ඉඩම්වල ගැටළු විසඳීම හා ඊට අදාළ ජංගම සේවා පැවැත්වීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම.

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන යන විෂය ක්ෂේත්‍රයන් යටතේ බස්නාහිර පළාතේ සෑම ජන කොටසකගේම සමාජ, ආර්ථික ප්‍රවර්ධනයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රධාන හා අනුශාංගික ක්‍රියාකාරකම් රජයේ ජාතික ප්‍රතිපත්තියට සමගාමීව පවත්නා භෞතික, මූල්‍ය හා මානව සම්පත් මනාව මෙහෙයවමින් කළමනාකරණය කිරීම මෙම අමාත්‍යාංශයේ කාර්ය භාරය වන අතර එම කාර්ය භාරය ඉටු කිරීම සඳහා කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය යන දෙපාර්තමේන්තු ද කෘෂි සේවා අධිකාරිය ද ක්‍රියාත්මක වේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු ගණන |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 01 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( III / II ශ්‍රේණිය ) | 02 |
| 3 | සහකාර අධ්‍යක්ෂ ( සැලසුම්) | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (III / II ශ්‍රේණිය ) | 03 |
| 4 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III / II ශ්‍රේණිය) | 01 |
| 5 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 01 |

## 4. සංවිධාන සටහන


කෘෂිකර්ම අමාත්‍යාංශය
බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය
නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල ගම්පහ කොළඹ කළුතර
සහකාර පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල ගම්පහ කොළඹ කළුතර
දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කර්යාල ගම්පහ කොළඹ කළුතර
දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාලය ගම්පහ කොළඹ කළුතර
පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල හොරණ අඹේපුස්ස වල්පිට හෝමාගම බෝඹුවල
පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල හොරණ කොටදෙණියාව

## 5. ඉටු කරන ලද සේවාවන් ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

- තිරසාර සංවර්ධනය උදෙසාවන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලයෙහි **(nrg4SD)** වාර්ෂික මහා සමුළුව පැවැත්වීම

ලොව පුරා පවතින පළාත් රාජ්‍යයන් තිරසාර ලෙස සංවර්ධනය කිරීමේ මූලික පරමාර්ථයෙන් යුතුව ඒ පිළිබඳ දැනුම, හැකියාවන්, නව ප්‍රවණතා හා අත්දැකීම් පළාත් රාජ්‍යයන් අතර හුවමාරු කරගැනීම සඳහා තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලය 2002 වර්ෂයේ දී පිහිටුවා ගන්නා ලදී. බස්නාහිර පළාත් සභාව 2011 වසරේදී මෙම සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් අතර 2012 වර්ෂයේදී එහි විධායක සභාවට තේරී පත් විය.

2014 වර්ෂයේදී කොලොම්බියාවේ කාටර්හෙනා නගරයේ පැවති 12 වන වාර්ෂික මහා සමුළුවේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සමසභාපති ධූරය නිතරගයෙන්ම බස්නාහිර පළාත් සභාවට හිමි වූ අතර 2015 වර්ෂයේ දී 13 වන වාර්ෂික මහා සමුළුවේ සත්කාරකත්වය ද ශ්‍රී ලංකාවට හිමි විය.

ඒ අනුව, nrg4SD හි 13 වන වාර්ෂික මහා සමුළුව 2015 සැප්තැම්බර් මස 07 වන දින කොළඹ දී පවත්වන ලද අතර එහි මුලසුන සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සමසභාපතිත්වය දරනු ලබන බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍ය ගරු ගාමිණී තිලකසිරි මැතිතුමා විසින් ද, සංවර්ධනය වූ රටවල් සඳහා සමසභාපතිත්වය දරනු ලබන කැටලෝනියා රාජ්‍යයේ පරිසර හා තිරසාරත්වය පිළිබඳ ලේකම් පෝෂප් එන්රික් ලෙබොට් මැතිතුමා විසින් ද හොබවන ලදී.




Nrg4SD වාර්ෂික මහා සමුළුව

- **දේශගුණ විපර්යාසයන්ට අනුගත වීම හා අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව පැවැත්වීම**

තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලය හෙවත් nrg4SD හි 13 වන වාර්ෂික මහා සමුළුවට අනුගත වීම හා අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2015 සැප්තැම්බර් මස 08 හා 09 යන දිනයන්හි කොළඹ හිල්ටන් හෝටලයේ දී පවත්වන ලදී.

ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් අතර පරතරය බිම් මට්ටමින් අවම කිරීම තේමා කර ගනිමින් පැවති මෙම ජාත්‍යන්තර සමුළුවෙහි සමාරම්භක උළෙල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ දෙස් විදෙස් දේශපාලන නියෝජිතයන්, රාජ්‍ය නිලධාරීන් හා විද්වතුන්ගේ සහභාගීත්වයෙන් සැප්තැම්බර් මස 08 වන දින පවත්වන ලදී.

බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත, දේශගුණ විපර්යාසයන්ට අනුගත වීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි එහි මුල් පිටපත අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම ද මෙහි දී සිදු විය.









දේශගුණ විපර්යාසයන්ට අනුගත වීම හා අවම කිරීම පිළිබඳ මහා සමුළුව

- **කෘෂිකාර්මික තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම**

බස්නාහිර පළාත සඳහා කෘෂිකර්මාන්තයට අදාළ සැලසුම් සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකාර්මික තොරතුරු පිළිබඳ දත්තයන් වඩා නිවැරදිව හා වඩා ඵලදායී ලෙස ලබාගැනීමේ අවශ්‍යතාවයක් කාලයක් පුරාවට පැවති අතර ඒ අනුව, කෘෂිකාර්මික තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය මතුවිය.

එම අවශ්‍යතාවය යථාර්ථයක් බවට පත් කරමින් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව කෘෂිකාර්මික තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමට 2014 දී සැලසුම් සකස් කරන ලදී.

මෙම තොරතුරු අවශ්‍ය අවස්ථාවල දී ලබාගැනීමට හැකි වන පරිදි, අන්තර්ජාලය හරහා සම්බන්ධ වන යෙදවුම් මෘදුකාංගයක් වශයෙන් නිර්මාණය කරනු ලැබූ අතර ගොවියාගේ මට්ටමේ සිට පළාත් මට්ටම දක්වා සියලු තොරතුරු ඉතා කාර්යක්ෂමව හා ඵලදායීව ලබා ගැනීමට මෙමගින් හැකියාව ලැබෙනු ඇත.

- **ISO - 9001:2008 තත්ව සහතිකය පවත්වා ගෙන යාම**

මෙම අමාත්‍යාංශය සේවාලාභීන්ට ලබා දෙන ගුණාත්මක සේවාව හේතුවෙන් 2013 වසරේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ISO-9001:2008 තත්ව සහතිකය අමාත්‍යාංශය වෙත පිරිනමන ලද අතර 2015 වර්ෂයේ දී මෙම තත්ව සහතිකය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා බාහිර හා අභ්‍යන්තර විගණන පැවැත්වීම, ඒ සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු සිදු කිරීම වැනි ක්‍රියාකාරකම් අමාත්‍යාංශය මගින් සිදු කර ඇත.

- **මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වාදීම**

අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල අන්තර්ගතයන් පරිගණක ගත කිරීම සඳහා හඳුන්වා දී ඇති මානව සම්පත් කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු සඳහා ද මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වා දීමට 2015 වසරේ දී පියවර ගෙන ඇත.

- **ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.**

ඵලදායිතා නියමයන් අනුගමනය කරමින් නිරන්තරයෙන් වැඩිදියුණු වන මෙම අමාත්‍යාංශය මගින් සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ලබයි. ඒ අනුව අමාත්‍යාංශය තුළ හුවමාරු වන ලිපිගොනු සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම පිළිබඳව 2015 වසරේ දී අවධානය යොමු කරන ලදී. මෙහිදී ලිපිගොනු ක්‍රමානුකූලව හැසිරවීම සඳහා කළමනාකරණ ක්‍රමයක අවශ්‍යතාවය ඉස්මතු වූ අතර ඒ අනුව අමාත්‍යාංශය සඳහා ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් සකස් කිරීමට පියවර ගන්නා ලදී. අමාත්‍යාංශය තුළ ඇති සෑම ලිපිගොනුවක් සඳහා ම තීරු සංකේතයක් ලබාදීම මෙහිදී සිදුවන අතර එමගින් එම ලිපිගොනුව කාර්යාලය තුළ සංසරණය වන ක්‍රමය නිරීක්ෂණය කර ගත හැකි අතර යම් සේවා ක්‍රියාවලියක් තුළ සිදුවන ලිපි ප්‍රමාදයන් අවම කර ගැනීමට ද මෙමගින් හැකිවනු ඇත.

- **අමාත්‍යාංශයේ කාර්ය භාරය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.**

අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සේවාවන් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශයීය ත්‍රෛමාසික පුවත්පත මුද්‍රණය කරනු ලබන අතර එමගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මගින් සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් හා කාලීන සිදුවීම් මෙම ප්‍රකාශනයේ අන්තර්ගත ව ඇත. තවද, අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා අධිකාරිවල සේවයේ නියුතු නිලධාරීන්ගේ නිර්මාණශීලී හැකියාවන් ඔප් නැංවීමට ද මෙම ප්‍රකාශනය තුළින් ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

## 6. ඵලදායීතාවය.

“ ඵලදායීතා සංකල්පයට අදාළ වන පරිදි අමාත්‍යාංශයේ ලේඛනාගාරය වැඩිදියුණු කිරීම ” නිරන්තර වැඩිදියුණු වීම් තුළින් සේවා කාර්යක්ෂමතාව වැඩි කරගනිමින් අමාත්‍යාංශයීය සේවාවන් ප්‍රශස්ත ලෙස ඉටු කිරීමට අමාත්‍යාංශය නිරතුරුව කටයුතු කර ඇති අතර එහි එක් වැදගත් පියවරක් ලෙස 2015 වර්ෂයේ දී අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු කාර්යක්ෂම කිරීමට හා ලිපි ගොනුවල ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා ලේඛනාගාරය වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

තවද, ලිපිගොනු හා ලේඛන පහසුවෙන් සොයා ගත හැකි වන පරිදි ලේඛනාගාරය සඳහා පරිගණක මෘදුකාංගයක් සැකසීම ඉදිරියේ දී ද සිදුවෙනු ඇත.

## 7. සේවක සුභ සාධනය.

සේවක සුභ සාධනය වෙනුවෙන් අමාත්‍යාංශය තුළ සේවක සුභ සාධක සංගමයක් ස්ථාපිත කර ඇත.

- දුරකථන ණය, ක්ෂණික ණය වැනි මූල්‍ය පහසුකම් සුභ සාධක සංගමය හරහා ලබාදීම
- අමාත්‍යාංශයෙන් පරිබාහිර ආයතන වෙත ස්ථාන මාරු ලැබීමේ දී මූල්‍යාධාර හා ත්‍යාග ලබාදීම තුළින් නිලධාරීන් ඇගයීම
- ටිකට්පත් අලෙවි කිරීම මගින් සුභ සාධක සංගමයේ අරමුදල තර කරගැනීම
- 2016.01.01 දින සිට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා බදාදා සහ සිකුරාදා දිනයන්හි දී නිල ඇඳුම් ඇඳීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.
- 2015 වසරේ සිංහල අලුත් අවුරුදු උත්සවයක් පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් සිදුකර ඇත.

## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්.

- ඊ - කෘෂිකර්ම තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම.

තොරතුරු තාක්ෂණය සෑම ක්ෂේත්‍රයක් හා බද්ධව ගමන් කරන යුගයක කෘෂිකර්මාන්තය හා තොරතුරු තාක්ෂණය බද්ධ වූ අවස්ථාවක් ලෙස ඊ - කෘෂිකර්මය හඳුන්වා දිය හැක.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් මුල්වරට මෙම සංකල්පය ඉදිරිපත් කරන ලදී. සහශ්‍ර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම උදෙසා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් කෘෂිකාර්මික තොරතුරු ගෝලීය සමාජය අතර හුවමාරු කිරීම මෙමගින් සිදුකරනු ලැබේ. එමගින් ගොවියාට වෙළඳපොළ හා කාලගුණය වැනි දේ පිළිබඳ විස්තර ලබාගැනීමට හැකි වනවා මෙන් ම තම වගාවට වැළඳී ඇති රෝග, ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව ද තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාව උදා වේ.

අද වන විට ඉන්දියාව වැනි කෘෂිකාර්මික රටවල් ඊ-කෘෂිකාර්මික සංකල්පය සාර්ථකව යොදා ගනිමින් සිටී.

## 9. විගණන විමසුම් හා පිළිතුරු සැපයීම.

2015 වර්ෂයේ දී ලද රජයේ විගණන විමසුම් සංඛ්‍යාව හතරක් වන අතර එක් අභ්‍යන්තර විගණන විමසුමක් පමණක් ලැබිණි. මෙම සියලු විගණන විමසුම් සඳහා 2015 වර්ෂය තුළදීම පිළිතුරු සපයා ඇත.

# 7.1

# බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
විශිෂ්ට කෘෂිකාර්මික නිෂ්පාදනයක් හා ආහාර සුරක්ෂිතතාවයෙන් සපිරි බස්නාහිර පළාතක්.

### 1.2 මෙහෙවර
පළාතේ ජනතාවගේ කෘෂිකාර්මික දැනුම, හුරුව වැඩිදියුණු කරමින් කෘෂි යෙදවුම් හා තාක්ෂණික සේවා සැමට සාධාරණව ලබා දෙමින් ධනාත්මක ආකල්ප සංවර්ධනය කරමින් පරිසර හිතකාමී ක්‍රමවේද අනුගමනය කර පළාතේ ආහාර සුරක්ෂිතතාව හා චිරස්ථායී කෘෂිකාර්මික සංවර්ධනය කරා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධව කටයුතු කිරීම

### 1.3 කාර්යයන්
- පළාතේ බෝග නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම
- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ යෙදවුම් සුලභතාවය ඇති කිරීම
- වසවිසෙන් තොර ගුණාත්මක එළවළු පළතුරු භාවිතය ගෘහස්ථ මට්ටමින් සුලභ කිරීමට දායක වීම
- තරුණ ප්‍රජාව කෘෂිකර්මයට නැඹුරු කරවීමට කටයුතු කිරීම
- කෘෂි ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම
- පරිසර හිතකාමී වගාවට යොමු කරවීම
- පසු අස්වනු හානිය අවම කිරීම
- යහපාලනය හා ආයතනික සංවර්ධනය ඇති කිරීම

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

ශීඝ්‍ර නාගරීකරණය හා කාර්මීකරණය හේතුවෙන් දිනෙන් දින හීන වන නිෂ්පාදන සාධකයන් හා පාරිසරික ගැටළු මධ්‍යයේ බස්නාහිර පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලබයි. පළාතේ විභවයන් හඳුනා ගනිමින් වී, පලතුරු, මල් හා විසිතුරු පත්‍රික ශාක නිවෙස් බිම් සංවර්ධනය ආදී වූ විවිධ අංශයන් කෙරෙහි අවධානය යොමු කරමින් පළාතේ කෘෂිකාර්මික දියුණුව ඇති කිරීමට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කැප වී සිටී.

බස්නාහිර පළාතේ කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ගම්පහ, කොළඹ සහ කළුතර යන දිස්ත්‍රික් තුනෙහි ම නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාල තුනක් පිහිටා ඇති අතර දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 4ක් සහ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතී.

## 3. ආයතන ව්‍යුහය



## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු ගණන |
|---|---|---|---|
| 1 | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය ( I ශ්‍රේණිය ) | 1 |
| 2 | අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය( I ශ්‍රේණිය ) | 1 |
| 3 | නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය( II ශ්‍රේණිය ) | 1 |
| 4 | නියෝජ්‍ය / සහකාර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය ( III/II ශ්‍රේණිය ) | 17 |
| 5 | කථිකාචාර්ය | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය ( III/II ශ්‍රේණිය ) | 1 |
| 6 | කෘෂි ආර්ථික විද්‍යාඥ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය ( III/II ශ්‍රේණිය ) | 1 |
| 7 | විෂයානුබද්ධ විශේෂඥ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 3 |
| 8 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1 |
| 9 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 10 | කෘෂිකර්ම උපදේශක | බස්නාහිර පළාත් තාක්ෂණික සේවය (විශේෂ) | 22 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

- **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන**

| අංකය | ව්‍යාපෘති නාමය | අනුමත මුදල (රුපියල් ) | වැය කළ මුදල (රුපියල් ) | වියදම් ප්‍රතිශතය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | යාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 5,100,000 | 5,098,895.00 | 100% | 100% |
| 2 | පැරිෂුට් ක්‍රමයට වී වගාව ව්‍යාප්ත කිරීම | 2,100,000 | 2,099,905.00 | 100% | 100% |
| 3 | පාංශු ගැටළු සහිත කුඹුරු ඉඩම් වගා කිරීම | 470,000 | 469,695.00 | 100% | 100% |
| 4 | පුරන් කුඹුරු නැවත වගා කිරීම | 2,120,000 | 2,119,875.00 | 100% | 100% |
| 5 | ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය | 5,100,000 | 5,099,592.00 | 100% | 100% |
| 6 | පළතුරු ව්‍යාප්තිය ව්‍යාප්ත කිරීම | 2,000,000 | 1,998,160.00 | 100% | 100% |
| 7 | කීර වගාව ව්‍යාප්ත කිරීම | 1,000,000 | 999,476.50 | 100% | 100% |
| 8 | රත්මලාන නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් එම පරිශ්‍රයේ පවතින අලෙවි මධ්‍යස්ථානය පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි වැඩි දියුණු කිරීම. | 2,250,000 | 2,166,824.27 | 96% | 100% |

| අං ක ය | ව්‍යාපෘති නාමය | අනුමත මුදල (රුපියල් ) | වැය කළ මුදල (රුපියල් ) | වියදම් ප්‍රතිශතය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 9 | කළුතර දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම | 2,250,000 | 2,250,000.00 | 100% | 100% |
| 10 | ජනතාවගේ කෘෂිකාර්මික දැනුම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම | 500,000 | 498,271.52 | 100% | 100% |
| 11 | බස්නාහිර පළාතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා අත්දැකීම් හුවමාරු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 1,620,000 | 1,619,635.00 | 100% | 100% |
| 12 | බස්නාහිර පළාත තුළ ගුණාත්මක පැළ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ආයතන සවිබල ගැන්වීම | 1,490,000 | 1,488,302.48 | 100% | 100% |
| | එකතුව | **26,000,000** | **25,908,631.77** | **%100** | **%100** |

- **පළාත් සංවර්ධන ප්‍රදාන**

| අං කය | ව්‍යාපෘති නාමය | අනුමත මුදල (රුපියල්) | වැය කළ මුදල (රුපියල්) | වියදම් ප්‍රතිශතය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | පාසල් ගෙවතු පරිසර හිතකාමී ලෙස සංවර්ධනය කිරීම | 8,500,000.00 | 8,499,798.24 | 100% | 100% |
| 2 | ලියාපදිංචි ගොවි සංවිධාන වෙත කෘෂි උපකරණ ලබාදීම | 9,000,000.00 | 8,998,785.00 | 100% | 100% |
| 3 | කෘෂි නිෂ්පාදන ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා ගොවීන් සවිබල ගැන්වීම | 1,206,120.00 | 1,203,390.00 | 100% | 100% |
| 4 | ගෙවතු වගාකරුවන් හා කුඩා පරිමාණ පැළ නිෂ්පාදකයන් සවිබල ගැන්වීම | 1,200,000.00 | 1,199,915.00 | 100% | 100% |
| 5 | කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල සංවර්ධනය කිරීම | 8,650,000.00 | 8,637,584.50 | 100% | 100% |
| 6 | ආන්තික කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම | 921,997.00 | 921,977.00 | 100% | 100% |
| 7 | කළුතර දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම - අදියර 2 | 2,000,000.00 | 1,999,692.00 | 100% | 100% |
| 8 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව සීමිත ඉඩකඩ තුල කෘෂිකර්මාන්තය සඳහා සවිබල ගැන්වීම | 1,000,000.00 | 994,804.00 | 99% | 100% |
| 9 | වස විසෙන් තොර කාබනික ගෙවතු ආදර්ශ ඒකක පිහිටුවීම | 1,000,000.00 | 997,019.00 | 100% | 100% |
| | එකතුව | **33,478,117.00** | **33,452,964.74** | **100%** | **100%** |

- **2015 වර්ෂයේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන පුහුණු වැඩසටහන්.**

| ආයතනය | කෙටි කාලීන දින (5-1) | | මධ්‍ය කාලීන | | දිගු කාලීන (1 වසර ) | |
|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් ගණන | පුහුණු ලාභින් සංඛ්‍යාව | වැඩසටහන් ගණන | පුහුණු ලාභින් සංඛ්‍යාව | පාඨමාලා ගණන | පුහුණු ලාභින් සංඛ්‍යාව |
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - හෝමාගම | 62 | 1530 | - | - | 01 | 19 |
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය- අඹේපුස්ස | 96 | 3696 | 02 | 32 | - | - |
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - හොරණ | 58 | 1353 | 02 | 56 | - | - |
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වල්පිට | 38 | 877 | - | - | 1 | 29 |

- නිලධාරි පුහුණු - බෝඹුවල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය

| වැඩසටහන් ගණන | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 35 | 2016 |

## විශේෂ වැඩසටහන්

කෘෂිකර්මාන්තය ජනතාව අතරට ගෙන යාමේදී ඒ සඳහා විවිධ විකල්ප ක්‍රම භාවිත කරන ලදී.

- පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම





* කෘෂිකර්ම ප්‍රවර්ධන සතිය - 2015 වර්ෂයේ දී "යහපත් වගා පිළිවෙත් - සුරකියි දිවිය සැපවත් " යන ප්‍රධාන තේමාව ඔස්සේ ජනතාවගේ කෘෂිකාර්මික දැනුම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.




* කෘෂි යාන්ත්‍රිකරණයට ප්‍රජාව නැඹුරු කිරීම සඳහා බස්නාහිර පළාතේ සියළුම දිස්ත්‍රික්ක සඳහා පැල සිටුවන යන්ත්‍ර ලබා දීම (Trans planter)



* වස විසෙන් තොර කාබනික ගෙවතු ආදර්ශ ඒකක පිහිටුවීම.
* කෘෂිකාර්මික ක්ෂේත්‍රය ප්‍රවර්ධනය උදෙසා අත්දැකීම් හුවමාරු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. (චාරිකා සංවිධානය )




- අවාරය අභවරයි වැඩසටහන යටතේ ගෙවතු වගාව සඳහා බඳුන් ගත එළවළු පැළ සැපයීම.




- අඹේපුස්ස දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පටක රෝපණ ඒකකය සඳහා සූර්යය කෝෂ පද්ධතියක් ස්ථාපනය කිරීම.




- අඹේපුස්ස සංචාරක නිවාසය සාදා නිම කර ආදායම් උත්පාදනයට කටයුතු කිරීම




- කළුතර දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් හා හෙළ බොජුන් හලක් පිහිටුවීම.
- හොරණ දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයෙන් ආදායම් උත්පාදනය.
  - තාරා ඒකකයෙන් ඉවත්වන අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින් මිරිදිය මත්ස්‍ය වගාවෙන් අල්ලා ගන්නා මසුන් ආහාරයට විකිණීම.
  - අලංකාර වූ පක්ෂින් ( Ornamental Birds ) බෝ කර විකිණීම, පටක රෝපිත පැල අලෙවිය.

## පටක රෝපිත පැල නිෂ්පාදනය





## සමෝධාන ගොවිපල් - හොරණ දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානය



## අලංකාර පක්ෂීන් බෝ කිරීම





**පුහුණු ආයතනවල ගොවිපල් ආදායම් ඉලක්ක හා ආදායම්.**

| වර්ෂය | ආදායම් ඉලක්කය රු. මිලියන | ආදායම රු. මිලියන |
|---|---|---|
| 2008 | 1.9 | 2.43 |
| 2009 | 2.5 | 3.32 |
| 2010 | 3.5 | 3.39 |
| 2011 | 4.99 | 5.49 |
| 2012 | 5.0 | 4.35 |
| 2013 | 5.2 | 6.236 |
| 2014 | 6.0 | 6.84 |
| 2015 | 6.85 | 7.99 |

## 6. ඵලාදායීතාවය

2015 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියේ දී විශිෂ්ට කුසලතා සම්මානයෙන් පිදුම් ලැබූ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තව දුරටත් ඵලදායි සේවාවන් ලබා දීම පිණිස ඵලදායිතා සංකල්ප සහ න්‍යායන් මෙම දෙපාර්තමේන්තුවට අනුබද්ධ නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවලට සහ පුහුණු ආයතනය වෙත ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. ඒ අනුව ඉදිරියේදී ඵලදායීතා සංකල්පයන්ට අනුකූලව ආයතනය විසින් සකස් කරන ලද ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් [පරමාදර්ශීකරණය (benchmark) හෝ විශිෂ්ට පිළිවෙත් හුවමාරුව (Sharing best practices)] ඇගයීම සඳහා වැඩසටහනක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2015 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියේ දී විශිෂ්ට කුසලතා සම්මානයෙන් පිදුම් ලැබූ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තව දුරටත් ඵලදායි සේවාවන් ලබා දීම පිණිස ඵලදායිතා සංකල්ප සහ න්‍යායන් ව්‍යාප්ති කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබයි.

හරිත ඵලදායිතා සංකල්පයන්ට අනුකූලව හරිත කෘෂිකර්මය කෙරෙහි ගොවීන් නැඹුරු කිරීම පිණිස විශේෂ වැඩසටහනක් සකස් කර ඇත. තවද, තොරතුරු තාක්ෂණය ගොවියා වෙත යොමු කිරීම පිණිස කෘෂිකර්ම තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කර ඇති අතර E- Agriculture කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. මෙම ක්‍රියාදායමන්හි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තත්ත්වය හා ඵලදායිතාවය වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.



## 7. සේවක සුබ සාධනය

සාමාජිකයන් තුළ සහයෝගිතාවය හා අන්‍යොන්‍යාධාරය පිළිබඳ හැඟීම් වැඩි දියුණු කිරීම හා සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල යැපෙන්නන් ගේ සුබ සාධනය අරමුණු කර ගනිමින් සුබ සාධන වැඩසටහන් ක්‍රියාත්මක වේ.

එලෙස ඔවුන්ගේ සුබ සාධන අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදල් ඇති කිරීම, සාමුහිකත්වය හා අනෝන්‍යාධාර පිළිබඳ හැඟීම් ඇති කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (චාරිකා සංවිධානය කිරීම, වාර්ෂික පිරිත් දේශනා පැවැත්වීම, අවුරුදු උත්සව පැවැත්වීම සහ මංගල හා අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් මුදල් ලබා දීම) සාමාජිකයන්ට ණය මුදල් සැපයීම සහ සාමාජිකයන්ට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ නියෝජිතයකු ලෙස සුබ සාධන සංගමය කටයුතු කරනු ලබයි.





වාර්ෂික විනෝද චාරිකාව ත්‍රිකුණාමලය

## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

බස්නාහිර පළාතේ කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක තුන සඳහා වී වගාවේ යන්ත්‍ර භාවිතය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් පැවැත්වීම - වැඩසටහන් 03 ක් නිලධාරීන් 190 ක් සඳහා බෝඹුවල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ දී පවත්වන ලදි.




- එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) ජාතික වෘත්තීය සුදුසුකම් පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කළ සිසු සිසුවියන්ට ස්වර්ණ තිළිණ හා සහතික පත් ප්‍රදානය කිරීම





- බීජ පනත යටතේ රෝපණ ද්‍රව්‍යවල ලේබල් සකස් කිරීම




- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ආයතන අංශය මඟින් ලබා දෙන සේවාවන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

- විශ්‍රාම ගත් මාසයට පසු මස සිටම විශ්‍රාම වැටුප ලබා ගත හැකි පරිදි අවශ්‍ය කටයුතු සිදු කිරීම
- දෙපාර්තමේන්තු වාහන දෙපාර්තමේන්තුවේ වෙනත් ආයතන කටයුතු සඳහා තාවකාලිකව යොදා ගැනීමට අනුමැතිය කඩිනමින් ලබා දීම සඳහා නව ආකෘති පත්‍රයක් හඳුන්වා දීම. (අවස්ථා 08 ක් එක් ආකෘතියකට )

- නව පුහුණු වැඩසටහන් හඳුන්වා දීම

  වල්පිට දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානය - භූමි අලංකරණය කෙටි කාලීන පුහුණු වැඩමුළුව දින 02

  විසිතුරු පත්‍රික ශාක වගාව දින 02

  වාණිජ පිදුරු බිම් මල් නිෂ්පාදනය දින 01

- වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයට අයත් ගොවිපලේ කෘෂි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා කෘෂි උපකරණ ලබාදීම

## 9. විගණන විමසුම් හා පිළිතුරු සැපයීම

2015 වර්ෂය සඳහා රජයේ විගණන විමසුම් 05ක් පමණක් ලැබී ඇති අතර අභ්‍යන්තර විගණන විමසුම් ලැබී නොමැත. ඒවා සියල්ල සඳහාම අදාළ වර්ෂය තුළදී ම පිළිතුරු සපයා අවසන් කර ඇත.

# 7.2

# බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

තිරසාර රජයේ ඉඩම් කළමනාකරණය සඳහා වූ ප්‍රමුඛ දායකත්වය.

### 1.2 මෙහෙවර

රජයේ ඉඩම් බැහැරකිරීම, අධීක්ෂණය, සංරක්ෂණය, සංවර්ධනය සඳහා මූල්‍යමය, තාක්ෂණික හා නීතිමය සහාය ලබා දෙමින් තිරසාරව රජයේ ඉඩම් කළමනාකරණය කොට බස්නාහිර පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3 කාර්යයන්

- රජයේ ඉඩම් බැහැර කිරීම
- රජයේ ඉඩම් සංරක්ෂණය
- රජයේ ඉඩම් සංවර්ධනය
- රජයේ ඉඩම්වල පදිංචි ජනපදවාසීන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය හා ජීවන තත්ත්වය ඉහල නැංවීමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඉඩම් අධීක්ෂණය හා පසු කටයුතු
- මානව සම්පත් සංවර්ධනය
- බදු ආදායම් ලබාගැනීම හා ප්‍රවර්ධනය කිරීම

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම.

පළාත තුළ රජයේ ඉඩම් හඳුනාගැනීම සහ ඒවා සංරක්ෂණය කිරීමේ කාර්යය ඉටු කරමින් හඳුනා ගන්නා ලද රජයේ ඉඩම් වඩාත් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා බැහැර කිරීමත්, බැහැර කරන ලද ඉඩම් වල පසු කටයුතු සහ සංවර්ධන කටයුතු තහවුරු කිරීමත් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

දකුණු වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූලව පළාත් සභාව වෙත පැවරී ඇති ඉඩම් බලතල ප්‍රකාර ව පළාත තුළ රජයේ ඉඩම් කළමනාකරණය හා පරිපාලනය කිරීම සඳහා බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ස්ථාපනය කොට ඇත.

ගම්පහ, කොළඹ, කළුතර යන දිස්ත්‍රික්ක තුනකින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 කින් බස්නාහිර පළාත සමන්විත ය. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඇති සියලු රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාර ව සිදු කරනු ලබයි.

"තිරසාර රජයේ ඉඩම් කළමනාකරණය සඳහා ප්‍රමුඛ දායකත්වය සැපයීම" අප දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර එම අරමුණු ඉටු කර ගැනීම සඳහා රජයේ ඉඩම් බැහැර කිරීම, අධීක්ෂණය, සංවර්ධනය හා රජයේ ඉඩම් වල යටිතල පහසුකම් සංවර්ධනය යන කාර්යයන් ඉටුකරලීම සඳහා පළාත් ප්‍රධාන කාර්යාලය දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතළිහ සඳහා නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | පළාත් ඉඩම් කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( I ශ්‍රේණිය ) | 01 |
| 02 | නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( II ශ්‍රේණිය ) | 01 |
| 03 | සහකාර පළාත් ඉඩම් කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( III / II ශ්‍රේණිය ) | 03 |
| 04 | සහකාර පළාත් ඉඩම් කොමසාරිස් | දෙපාර්තමේන්තු (III ශ්‍රේණිය ) | 01 |
| 05 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය ( III / II ශ්‍රේණිය) | 01 |
| 06 | මිනින්දෝරු | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය ( III / II ශ්‍රේණිය ) | 09 |
| 07 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 01 |
| 08 | ජ්‍යෙෂ්ඨ ජනපද නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ ශ්‍රේණිය) | 03 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

### 4.1 සේවාවන් හා ක්‍රියාකාරකම්

- **රජයේ ඉඩම් බැහැර කිරීම**

බස්නාහිර පළාත තුළ රජයේ ඉඩම් ප්‍රධාන වශයෙන් නේවාසික, කෘෂිකාර්මික, වාණිජ හා වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා බැහැර කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා ඉඩම් හඳුනාගැනීම, මැන සලකුණු කිරීම, ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා බෙදාදීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි. ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශ තුළ ඉඩම් කච්චේරි පැවැත්වීම සහ ඊට අවශ්‍ය සහය මෙම දෙපාර්තමේන්තුව මගින් ලබාදෙයි.



ඉඩම් ගැටළු විසඳීමේ ජංගමසේවා වැඩසටහන
දොඩන්ගොඩ



ඉඩම් ගැටළු විසඳීමේ ජංගම සේවා වැඩසටහන
මීරිගම

- **රජයේ ඉඩම් සංරක්ෂණය**

රජයේ ඉඩම් හඳුනාගැනීම හා මායිම් සලකුණු කිරීම, රජයේ ඉඩම්වල රක්ෂිත හඳුනාගැනීම රජයේ රක්ෂිත ඉඩම් මැන සලකුණු කිරීම, පරිහරණ භූමි සලකුණු කිරීම හා රජයේ ඉඩම්වල භූමි සංරක්ෂණ කටයුතු සිදු කිරීම වැනි කාර්යයන් ඉටු කරයි.







ඉඩම් මැනුම් කටයුතු සිදුකරන අවස්ථාවන්

**රජයේ ඉඩම් හඳුනාගැනීම**

ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් නිලධාරීන් මගින් රජයේ ඉඩම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

- පළාත් සභා මිනින්දෝරු හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් මැන සලකුණු කිරීම මගින් ඉඩම් හඳුනාගැනීම.
- GPS උපකරණ භාවිතයෙන් අදාළ ඉඩම්වල තොරතුරු එක්රැස් කිරීම හා එම ( Tablet PC) උපකරණ භාවිතයෙන් ඉඩම් මැනුම් කටයුතු සඳහා යොදා ගැනීම.
- අනවසරකරුවන් හඳුනාගැනීම අනවසර අල්ලා ගැනීම් වැලැක්වීම හා අනවසරකරුවන්ගෙන් සන්තකය ආපසු ලබා ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරීම.

- **රජයේ ඉඩම් සංවර්ධන කටයුතු**

බැහැර කරන ලද රජයේ හිස් ඉඩම් (Raw Land) නිවාස, වාණිජ, කර්මාන්ත හා කෘෂිකාර්මික වශයෙන් තිරසාර හා ප්‍රශස්ත ඉඩම් පරිහරණ කටයුතු සඳහා යොමු කිරීම.

රජයේ ඉඩම්වල පදිංචි ජානපදිකයන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය හා ජීවන තත්ත්වය උසස්කරලීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

| මුදල් මූලාශ්‍රය | ව්‍යාපෘති ගණන | අනුමත මුදල (රු) | වැය කළ මුදල (රු) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| පළාත් සංවර්ධන ප්‍රදාන | 13 | 6,899,200.40 | 6,097,515.27 | 88% | 100% |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 06 | 5,000,000.00 | 4,710,722.30 | 94% | 100% |
| **එකතුව** | **19** | **11,899,200.40** | **10,808,237.57** | **91%** | **100%** |

පින්නවල අළුබෝගහලන්ද ජනපද මාර්ගය කොන්ක්‍රීට් කිරීම



සංවර්ධනය කිරීමට පෙර



සංවර්ධනය කිරීමට පසු



වත්තල - ෆාම්වත්ත ජනපදයේ ඇතුලත පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට්



වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉත්තැපාන මළඹේහේන ජනපදයේ පොදු මාර්ග කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරීම.

- **රජයේ ඉඩම් අධීක්ෂණය හා පසු කටයුතු**

රජයේ ඉඩම් නිසි පරිහරණයට ලක්වී තිබේද යන්න ඔප්පුවල සහ ගිවිසුම්වල රක්ෂිත වගන්ති හා කොන්දේසි ඉටුවේද යන්න මායිම් ආරවුල් විසඳීම, බදු ගෙවීම් (එලදා බදුද ඇතුළුව) නිසිපරිදි ඉටු කරනවාද යන්න, ඔප්පු අතුරු බෙදීම් කටයුතු කිරීම, වාර්ෂික බදු දී ඇති කළු ගල් ආදිය පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

- **බදු ආදායම් රැස්කිරීම**

2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බස්නාහිර පළාත තුළ රජයේ ඉඩම්වල බදු ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය

| ආදායම් විස්තරය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| ඉඩම් හා අනෙකුත් බදු කුලී | 60,760,916.20 | 77,480,370.93 | 96,879,042.79 | 79,191,570.10 | 128,190,897.27 | 132,532,958.10 |
| රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් | 1,271,322.40 | 1,050,765.00 | 567,601.76 | 401263.00 | 330,925.00 | 141,322.52 |
| මුළු ආදායම | 62,032,238.60 | 78,531,135.93 | 97,446,644.55 | 79,592833.10 | 128,521,822.27 | 132,674,280.62 |

- **මානව සම්පත් සංවර්ධනය**

බස්නාහිර පළාත් රජයේ ඉඩම් පරිපාලනය හා සම්බන්ධ වන ප්‍රාදේශීය ලේකම්වරු, සහකාර ප්‍රාදේශීය ලේකම්වරු, එම ක්ෂේත්‍ර හා සම්බන්ධ නිලධාරීන් මෙම දෙපාර්මේන්තුව මගින් පහත විෂයන් සම්බන්ධයෙන් පුහුණුවීම් සිදු කරයි.

- රජයේ ඉඩම් නීතිය
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය - eslims
- ජනපද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම





කිතුල්ගල බැහැරගත පුහුණු වැඩසටහනේ අවස්ථා

## 4.2 විශේෂ වැඩසටහන්.

- බිම්සවිය වැඩසටහන 2015 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක ක්‍රියාත්මක විය.
  - ඉංගිරිය
  - කටාන
  - මීරිගම
  - මීගමුව
  - වත්තල



- ඉඩම් ගැටළු විසඳීමේ ජංගම සේවා වැඩසටහන

| දිස්ත්‍රික්කය | ජංගම සේවා ගණන | ඉදිරිපත් වූ ගැටලු | විසඳුම් ලබාදුන් ගණන | ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබාදුන් ගණන |
|---|---|---|---|---|
| කළුතර | 11 | 573 | 517 | 56 |
| ගම්පහ | 02 | 126 | 79 | 47 |
| කොළඹ | 05 | 363 | 283 | 80 |
| **එකතුව** | **18** | **1062** | **879** | **183** |

## 5. ඵලාදායීතාවය.

මෙම දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කර ඇත.

- වැඩ ක්‍රියාවලිය.
    - වැඩ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා රජයේ ඉඩම් තොරතුරු පද්ධතිය හරහා ඉඩම් බැහැරට කටයුතු කර ඇත.
    - බස්නාහිර පළාත තුළ ඉඩම් ගැටළු විසඳීමේ ජංගම සේවා පැවැත්වීම
- කාර්යාල පරිසරය.
    - ප්‍රසන්න කාර්යාල පරිසරයක් ඇති කිරීම



ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීමේ **iv** වන අදියර ක්‍රියාත්මක කිරීම

- මානව සම්පත් සංවර්ධනය
    - දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය කාර්යක්ෂම හා මිත්‍රශීලී මහජන සේවාවක් පවත්වා ගැනීම සඳහා පුහුණුවීම් හා වැඩමුළු සඳහා යොමු කිරීම
    - අන්‍යෝන්‍ය සුහදතාව වර්ධන කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

## 6. සේවක සුභ සාධනය.

සියලු නිලධාරීන්ගේ සේවක සුභ සාධනය උදෙසා සුමිතුරු සුභ සාධක සංගමය නමින් දෙපාර්තමේන්තුව මගින් සුභ සාධක සංගමයක් පිහිටුවා ඇති අතර එම සංගමය මගින් සෑම වර්ෂයක් පාසාම සියලුම නිලධාරින්ගේ පවුල්වල සාමාජිකයන් ද සමඟ වාර්ෂික විනෝද චාරිකාව යාමට සැප්තැම්බර් මස කටයුතු කරන ලදි.

එයට අමතරව වෙසක් පොහොය නිමිති කරගනිමින් කාර්යාලය තුළ සාංඝීක දානමය පිංකමක් සිදුකිරීම හා වාර්ෂික පොළ සංවිධානය කිරීම ආදී සාමුහික ක්‍රියාකාරකම් කිහිපයක් සිදුකිරීම.



දානමය පිංකමේ අවස්ථාවක්

තවද අවමංගල්‍ය කටයුතු සඳහා මුල්‍යමය ආධාර ලබාදීම, හදිසි අවශ්‍යතා සඳහා සුළු පොළී පදනමක් මත ණය ලබාදීමට කටයුතු කිරීම වැනි සේවක සුභසාධන කටයුතු සිදු කරනු ලබයි.



වාර්ෂික විනෝද චාරිකාවේ ගමනාන්ත



වාර්ෂික පොළ

## 7. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම

- ඊ - රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ රජයේ ඉඩම් තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

මේ යටතේ ඉඩම් සංවර්ධන ආඥා පනත් දීමනා පත්‍ර, දීර්ඝ කාලීන බදු, වාර්ෂික අවසර පත්‍ර ආදි වශයෙන් වන ඉඩම් බැහැර කිරීම් රජයේ ඉඩම් තොරතුරු පද්ධතිය මගින් සිදුකරයි. කෙටි කාලයක් තුළ මහජනතාවට කාර්යක්ෂම සේවයක් ලබා දීමට ඒ හරහා හැකියාව ලැබී ඇත.




**රජයේ ඉඩම් තොරතුරු පද්ධතිය**

- නව ඉඩම් සංවර්ධන ආඥා පනත් දීමනා පත්‍ර පිළියෙළ කිරීම.
    - අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ දීමනා පත්‍ර සංඛ්‍යාව - 161
    - සකස් වී පැමිණි දීමනා පත්‍ර සංඛ්‍යාව - 88

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සකස් වී පැමිණි දීමනා පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| දොඩංගොඩ | 50 |
| හොරණ | 33 |
| බුලත්සිංහල | 03 |
| පාලින්දනුවර | 01 |
| හංවැල්ල | 01 |

- වාර්ෂික අවසර පත් නිකුත් කිරීම - **05**

- දීර්ඝ කාලීන බදු

අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ දීර්ඝ කාලීන බදු නිර්දේශ

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දීර්ඝ කාලීන බදු නිර්දේශ සංඛ්‍යාව |
|---|---|
| මීගමුව | 35 |
| කඩුවෙල | 01 |
| රත්මලාන | 01 |
| එකතුව | 37 |

2015 වර්ෂයේ රජයේ ඉඩම් තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේ ප්‍රගතිය

| **ඉඩමේ තත්ත්වය** | **ඉඩම් සංඛ්‍යාව** |
|---|---|
| මූලික දත්ත ඇතුළත් කිරීම | 14718 |
| අනුමැතිය සඳහා යොමුකළ | 2100 |
| අනුමත කිරීම | 1483 |
| ප්‍රතික්ෂේපිත ඉඩම් | 133 |
| **එකතුව** | **18434** |

## 8. විගණන විමසුම් හා පිළිතුරු සැපයීම

2015 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමුවන විගණන විමසුම් සියල්ල අවසන් කර විගණන අංශය වෙත භාර දීමට කටයුතු කර ඇත.

# 7.3

# බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

නිසි කලට ගොවිතැනට නිසි ජලය.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාතේ ජලය හා භූමි සම්පත් වලින් එහි ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබා දෙනු පිණිස, කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩි දියුණු කිරීම උදෙසා නවීන තාක්ෂණය සමඟ අනෙකුත් සම්පත් යොදා ගනිමින් සැලසුම් කිරීම, ඉදිකිරීම, නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම මගින් වාරි පද්ධතිය සංවර්ධනය කිරීම හා එහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම.

### 1.3 කාර්යයන්

වාරි පහසුකම් සපයන ලද බිම් ප්‍රමාණය වැඩි කිරීම සඳහා

- ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
- වැව් ප්‍රතිසංස්කරණය කිරීම
- අමුණු ප්‍රතිසංස්කරණය කිරීම
- නව අමුණු ඉදිකිරීම
- පැති බැමි ඉදිකිරීම
- කෘෂිකාර්මික බිම් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම .
- ට්‍රැක්ටර් පැන්නුම් ඉදිකිරීම
- කෘෂි මාර්ග ඉදිකිරීම හා සංවර්ධනය කිරීම

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය යටතේ බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබේ. බස්නාහිර පළාතේ පිහිටි සුළු වාරිමාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ, අපත ජලය බැහැර කරමින් පළාතේ ගොවි ජනතාවට වී සහ අනෙකුත් භෝග වගාවන් සඳහා වාරි ජලය ක්‍රමවත් ව ලබා දීම හා පළාතේ ගොවි

ජනතාවගේ වාරි අවශ්‍යතාවයන් උපරිම අයුරින් සපුරාලීම සඳහා කටයුතු කරන  ආයතනය ලෙස බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හැඳින්විය හැක.

## 3. සංවිධාන සටහන




## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු ගණන |
|---|---|---|---|
| 1 | වාරිමාර්ග අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය ( I ශ්‍රේණිය) | 1 |
| 2 | ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය ( III / II ශ්‍රේණිය) | 4 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය ( III / II ශ්‍රේණිය) | 1 |
| 4 | තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය ශ්‍රේණිය ( විශේෂ ) | 12 |
| 5 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 5. ඉටු කරන ලද සේවාවන් ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

- දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වාරි පහසුකම් සපයන ලද බිම් ප්‍රමාණය වැඩිකිරීම හා කෘෂි කාර්මික බිම් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම සඳහා 2015 වසර තුළදී ව්‍යාපෘති 215 ක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා රු. 69,175,708.26 ක මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබේ.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදුකරන ලද ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 03 හරහා ව්‍යාපෘති 51ක් සඳහා රු. 25,553,000.00 ක ඇස්තමේන්තු සකසා ඇත.
- විශේෂ ව්‍යාපෘති සඳහා උපදේශනය හා අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු (කොළඹ) විසින් ඉටු කරන ලද ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.

පෝරෙගෙදර බරාව කුඹුර අමුණේ ජල සොරොව්ව සාදා ගැනීම





මායා මාවත අවසාන කොටස කෘෂිමාර්ගය සංවර්ධනය කිරිම





මහල්වරාව දෙණියවල යායට ට්‍රැක්ටර් බැස්සුමක් ඉදිකිරීම





**ඇටපන්විල යාය ඇලවේලි ප්‍රතිසංස්කරණය**





දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු (ගම්පහ) විසින් ඉටු කරන ලද ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.

**නාරංවල වෙල්යායේ බටහේන ගොඩ අසළ මිල්ලගහ කුඹුරට පැති බැම්මක් ඉදිකිරීම**





ර

**නාකඳ අමුණ ඉදි කිරීම**





**මීතිරිගල කරගහහේන අමුණ ඉදි කිරීම**





**70 ඒ පහල කඳවල පහලගම ප්‍රධාන අමුණ හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය**





**දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු (කළුතර) විසින් ඉටු කරන ලද ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.**

**780 ලූල්බද්දාව දූව ඇළ සංවර්ධනය කිරීම**





**රෙමුණ වැව බෙරු ඉවත් කිරීම**





**ගොඩවෙල අමුණ ප්‍රතිසංස්කරණය**





**දන්වත්ත හීන්මුල්ල ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය**





## 6. ඵලදායීතාවය

දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව ඔප් නැංවීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් වල නිරත වීම.

- ලේඛනාගාරයේ පවතින පැරණි ලිපිගොනු වර්ග කිරීම හා අංක කිරීම.
- කාර්යාල පරිශ්‍රය වඩාත් ප්‍රසන්න අයුරින් සකස් කර ගැනීම මගින් සේවකයන් හට සිය රාජකාරි කටයුතු තෘප්තිමත් හා කාර්යක්ෂම අයුරින් ඉටුකිරීමටහැකිවීම.
- දෙපාර්තමේන්තු ඵලදායිතාව ඉහල නැංවීම සඳහා අඩුපාඩු හා වෙනස්කම් පිළිබඳ නිරතුරු රැස්වීම් පවත්වා සාකච්ඡා කිරීම.

## 7. සේවක සුබ සාධනය

දෙපාර්තමේන්තුව මගින් සේවක සුබ සාධනය වෙනුවෙන් නිරන්තරයෙන් අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් ව්‍යාපෘති ප්‍රගති පාලන මෘදුකාංගය යාවත්කාලීන කිරීම සිදු කරනු ලබන අතර එමගින් ව්‍යාපෘතිවල තොරතුරු හා ප්‍රගතිය ක්ෂණිකව ලබාගැනීමේ හැකියාව ඇත.

## 9. විගණන විමසුම් හා පිළිතුරු සැපයීම

2015 වර්ෂයේදී එක් රජයේ විගණන විමසුමක් ලද අතර එම වර්ෂයේ දීම එයට පිළිතුරු සපයන ලදී. 2015 දී අභ්‍යන්තර විගණන විමසුම් නොලද අතර අතුරු විමසුම් 15ක් ලද අතර එයින් 14කට පිළිතුරු සපයා ඇත. තවත් එක් අතුරු විගණන විමසුම් 01කට පිළිතුරු සැපයීමට ඇත.

# 7.4 බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා ලාභදායී සහ තිරසාර පශු නිෂ්පාදන කර්මාන්තයක්.

### 1.2 මෙහෙවර
ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා සත්ව සෞඛ්‍ය ඉහළ නැංවීමට සත්ව ගොවිපල වැඩිදියුණු කිරීමට සහ ගොවිපල ශක්තිමත් කිරීමට අවශ්‍ය මූල්‍ය, භෞතික හා තාක්ෂණික සේවාවන් සමාන හා සාධාරණ ලෙසට සැපයීම.

### 1.3 කාර්යයන්

- ගොවිපල සතුන්ගේ ආරය උසස් කිරීමට අවශ්‍ය කෘත්‍රිම සහ ස්වාභාවික අභිජනන කටයුතු
- ගොවිපල සතුන්ගේ සහ ගෘහාශ්‍රිත සුරතල් සතුන්ගේ සෞඛ්‍යාරක්ෂිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, සතුන්ට ප්‍රතිකාර කිරීම, රෝග වැළැක්වීමට අවශ්‍ය එන්නත් කිරීම හා රෝග විමර්ශනය.
- ගොවිපල සතුන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩි දියුණු කරන ලද තෘණ වගා ඇති කිරීම හා සාන්ද්‍ර ආහාර සැපයීම.
- සත්ව පාලන ගොවීන්ගේ, පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ සහ පාසල් හැර ගිය තරුණ තරුණියන්ගේ සත්ව පාලනය පිළිබඳ දැනුම ඉහළ නැංවීමට අවශ්‍ය කරන පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, ක්ෂේත්‍ර චාරිකා ක්‍රියාත්මක කිරීම සහ දැනුම ලබාදීමට අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපාංග සැපයීම.
- සත්ව පාලන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අදාළ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම.
- සත්ව පාලන ක්ෂේත්‍රයට අදාළ නීති හා අණ පනත් ක්‍රියාත්මක කිරීම.
- කාලීන අවශ්‍යතාවයන් අනුව පර්යේෂණ සිදු කිරීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම.

බස්නාහිර පළාතේ පශු සම්පත් කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන තාක්ෂණික මූල්‍ය හා භෞතික සේවාවන් සැපයීම සඳහා බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යංශය යටතේ බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන අධ්‍යක්ෂ කාර්යාලය රාගම වැලිසර පිහිටා ඇති අතර දිස්ත්‍රික්ක තුනෙහි පරිපාලන කටයුතු වලට සහය වීම සඳහා දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාල 03ක් ද අපේක්ෂිත ඉලක්ක සපුරා ගනු වස් පළාත තුල පශු වෛද්‍ය බල ප්‍රදේශ 32 ක් ද පිහිටුවා ඇති අතර, ඒ සෑම බල ප්‍රදේශයකම පශු වෛද්‍ය කාර්යාලයක් බැගින් ස්ථාපිත කර ඇත. මෙම සෑම කාර්යාලයක්ම ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය හා පාලනය යටතේ පවතින අතර, සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ආවරණය වන පරිදි පශු සම්පත් සම්බන්ධ මහජන සේවය හා ඍජුව සම්බන්ධ වන පශු වෛද්‍ය නිලධාරීන් 47 ක් සහ සහ සත්ව සංවර්ධන උපදේශකවරු 130 සංවර්ධන නිලධාරීන් 82 සහ අනෙකුත් කාර්යාල කටයුතු වල නිරත අනුමත සහාය කාර්ය මණ්ඩලයක් සේවා නියුක්ත ව සිටි.

## 3. ආයතන සංවිධානය




තවද, අපේක්ෂිත ඉලක්ක සපුරා ගනු වස් පළාත තුල පශු වෛද්‍ය කාර්යාල වලට අමතරව බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ කොටදෙනියාව තෘණ සම්පත් මධ්‍යස්ථානයක් සහ ඌරන්ගේ ආරය උසස් කිරීමේ කටයුතු කිරීම සඳහා සූකර කෘත්‍රිම අභිජනන මධ්‍යස්ථානයක් සහ කොටදෙනියාව සහ හොරණ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර ඇත.

## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු ගණන |
|---|---|---|---|
| 1 | පළාත් අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( I ශ්‍රේණිය) | 1 |
| 2 | අතිරේක පළාත් අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( I ශ්‍රේණිය) | 1 |
| 3 | විෂයානුබද්ධ විශේෂඥ | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( I ශ්‍රේණිය) | 1 |
| 4 | නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( II ශ්‍රේණිය) | 1 |
| 5 | මූලස්ථාන පශු වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( III / II ශ්‍රේණිය) | 1 |
| 6 | පශු වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( III / II ශ්‍රේණිය) | 44 |
| 7 | සත්ව පාලන නිලධාරි | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවා ( III / II ශ්‍රේණිය) | 3 |
| 8 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (III / II ශ්‍රේණිය) | 1 |
| 9 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 10 | සත්ව සංවර්ධන උපදේශක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය අධි ශ්‍රේණිය | 11 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

කිරි, මස් හා බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය වන පහත සදහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- සත්ව අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| | | දිස්ත්‍රික්කය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | කොළඹ | ගම්පහ | කළුතර | |
| 1 | කෘත්‍රිම සිංචන | 3858 | 14450 | 4248 | 22556 |
| 2 | දෙනුන්ගේ ගැබ් පරීක්ෂා | 1470 | 3441 | 6541 | 6514 |
| 3 | කෘත්‍රිම සිංචන පැටවුන් බිහි කිරීම | 1153 | 4255 | 1502 | 6905 |







- සත්ව සෞඛ්‍ය කටයුතු ක්ෂේත්‍රයේ දී ප්‍රතිකාර කිරීම.

| | වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කාර්යාල ප්‍රතිකාර කල කෘෂිකාර්මික සතුන් | 18525 |
| 2 | ක්ෂේත්‍රයේ ප්‍රතිකාර කල කෘෂිකාර්මික සතුන් | 14236 |
| 3 | කාර්යාල සුරතල් සතුන් | 14250 |

- වසංගත රෝග වැළැක්වීමට එන්නත් කළ සතුන් සංඛ්‍යාව

| | වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ගවයින් - කුර හා මුඛ රෝගය | 34825 |
| 2 | ඌරන් - කුර හා මුඛ රෝගය | 45589 |
| 3 | ඌරන් - ජැපනීස් එන්සෙපලයිටීස් | 5570 |
| 4 | කුකුළන් - රැනිකට් | 650213 |
| 5 | කුකුළන් - වසූරිය | 286695 |
| 6 | කුකුළන් - ගම්බෝරෝ | 590862 |

- සත්ව පෝෂණ වැඩසටහන්

| | ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පර්චස් 20 තෘණ ආදර්ශන | 96 |
| 2 | තණකොළ කපන යන්ත්‍ර ලබා දීම | 130 |
| 3 | තණකොළ කැබලි කරන යන්ත්‍ර ලබා දීම | 30 |
| 4 | ගම්බූටස් ලබා දීම | 1500 |



- සත්ව පාලන පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව

| | ව්‍යාපෘතිය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කුකුළු පාලන ගොවීන් පුහුණු | 262 |
| 02 | ගව පාලන ගොවීන් පුහුණු | 1023 |
| 03 | සූකර පාලන ගොවීන් පුහුණු | 81 |
| 04 | එළු පාලනය ගොවීන් පුහුණු | 226 |
| 05 | කිරි නිෂ්පාදන සැකසීම | 479 |
| 06 | වැඩි දියුණු කරන ලද තෘණ වගාව | 84 |



හෝමාගම කොට්ඨාසයේ කිරි ගොවීන්ට පුහුණුව ලබා දෙමින්

- **සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**
  - පළාත් නිශ්චිත අරමුදල යටතේ ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | වැය කළ මුදල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 1 | එළුවන්ගේ හා ගවයන්ගේ බුරුලු ප්‍රදාහය වැළැක්වීම | 597,973.00 | 1000 |
| 2 | කිනිතුල්ලන්ගෙන් බෝවන රුධිර ගත පරපෝෂිත රෝග වැළැක්වීම | 999,905.00 | 1000 |
| 3 | බස්නාහිර පලාත තුළ ගොවිපළ සතුන්ගේ නිරෝගීභාවය පවත්වා ගැනීමට පශු වෛද්‍ය ජංගම සායන පැවැත්වීම | 2,991,546.68 | 7500 |
| 4 | බස්නාහිර පලාත තුළ ගොවිපළ තුළ වැඩිදියුණු කරන ලද තෘණ වගා කිරීම | 993,322.64 | 60 |
| 5 | බස්නාහිර පලාත තුල එළු අභිජනන ගොවිපළ පිහිටුවීම | 1,620,706.71 | 85 |
| 6 | බස්නාහිර පලාත තුල අභිජනනය සඳහා ගොවිපළ වල ඇති කරන සතුන්ගේ ගැටළු හඳුනාගෙන ප්‍රතිකාර කිරීම | 243,560.00 | 1000 |
| 7 | සත්ව ගොවිපළවල ජීව වායු ඒකක පිහිටුවීම | 1,291,055.00 | 27 |
| 8 | කොටදෙනියාව ශීත ශුක්‍ර මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම් | 984,440.53 | |
| 9 | ඉංගිරිය පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම 2 අදියර | 6,234,876.50 | |



ඉංගිරිය පශු වෛද්‍ය කාර්යාලය

- **පළාත් සංවර්ධන අරමුදල යටතේ ඉටුකළ ව්‍යාපෘති**

| | **ව්‍යාපෘතිය** | වැය කළ මුදල | **ප්‍රතිලාභීන් ගණන** |
|---|---|---|---|
| 1 | බස්නාහිර පළාතේ ගෘහාශ්‍රිත කුකුළු පාලන ඒකක පිහිටුවීම | 4,993,710.00 | 1400 |
| 2 | බස්නාහිර පළාතේ කිරි ගව ගොවිපළ සංවර්ධනය කිරීම | 4,795,144.00 | 170 |
| 3 | බස්නාහිර පළාතේ එළු ගොවිපළ සංවර්ධනය කිරීම | 1,906,970.00 | 60 |
| 4 | බස්නාහිර පළාතේ සූකර ගොවිපළ සංවර්ධනය කිරීම | 1,539,350.00 | 32 |
| 5 | බස්නාහිර පළාතේ සත්ව පාලන කටයුතුවල නියැලි ගොවීන්ට අවශ්‍ය ආම්පන්න ලබාදීම | 9,195,000.00 | 4500 |
| | **එකතුව** | **22,430,174.00** | **6162** |



කැස්බෑව කොට්ඨාසයේ කිරි ගොවීන්ට කිරි උපකරණ ලබා දීම



මීනුවන්ගොඩ පශු වෛද්‍ය කොට්ඨාශයේ ගව නිවාස සංවර්ධනය කිරීම

 

ජීව වායු ජනකය



එළු අභිජනන ගොවිපළවල් පිහිටුවීම

- **මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක වැඩසටහන්**

| | ව්‍යාපෘතිය | වැය කළ මුදල (රුපියල්) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 1 | සත්ව අභිජනන ඒකක පිහිටුවීම | 600,000 | 25 |
| 2 | පරිසර හිතකාමී සූකර ගොවිපළ සංවර්ධනය | 3,100,000 | 52 |
| 3 | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය කිරීම | 1,700,000 | 16 |



ගව අභිජනන ගොවිපල මරදගහමුල පශු වෛද්‍ය කොට්ඨාශය

- **2015** සත්ව නිෂ්පාදනවල ප්‍රගතිය **2014** ට සාපේක්ෂව

| | 2014 | 2015 |
|---|---|---|
| කිරි ලීටර් මිලියන | 29.22 | 30.67 |
| බිත්තර මිලියන | 170 | 181.72 |
| මස් කි.ග්‍රෑ. මිලියන | 28.95 | 30.2 |









- **2015 තුළ කරන ලද විශේෂ වැඩසටහන්**

තුලිත සංවර්ධන අරමුදලින් රු.මිලියන 19 ක ප්‍රතිපාදන යටතේ බස්නාහිර පලාතේ කිරි ගොවිපළ 500 ක් සංවර්ධනය කිරීම සිදු කරන ලදි. 2015 සිට 2017 දක්වා වසර 03 ක කාලයක් තුළ අඛණ්ඩව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර එම කාලය තුල මෙම ගොවිපළවල් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව අධීක්ෂණය කරන අතර ගොවිපළ අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ගොවියාගේ සහ දෙපාර්තමේන්තුවේ 50% දායකත්වයෙන් මෙම ගොවිපළවල අඩුපාඩු සම්පූර්ණ කෙරේ.



ව්‍යාපෘතියෙන් ලබා දුන් පැටවු කොටුවක් තුළ කෘත්‍රිම සිංචනයෙන් බිහිවූ ජර්සි වසු පැටියෙක්



නිලධාරීන් පුහුණු කිරීම්



නවීන තාක්ෂණය භාවිතයෙන් පැටවුන්ට කිරි පෙවීම

## 6. ඵලදායීතාවය

ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩ සටහන් සංවිධානය කර ඇත. 2016 වසරේ ඵලදායිතා සම්මානය සඳහා අයදුම් කිරීමට කටයුතු යොදා ඇත. සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා කළමනාකරණ කමිටු රැස්වීම් මාසිකව පවත්වනු ලැබේ.

## 7. සේවක සුබ සාධනය

සේවක සුබසාධනය ඉලක්ක කර ගනිමින් සුබ සාධක සංගමයක් ක්‍රියාත්මක කර ඇත. පළාතේ සියලුම සේවකයන් නිලධාරීන් එහි සාමාජිකත්වය දරන අතර අවමංගල අවස්ථාවන් සඳහා මුදල් ලබාදීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී ණය ලබාදීම වැනි කාර්යයන් සිදු කරනු ඇත.

## 8. හඳුන්වාදී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- පශු වෛද්‍ය කාර්යාල කාර්යාලය අධීක්ෂණය කිරීමේ කටයුතු දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරීන් හට පවරා ඇත.
- සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් (අධි ශ්‍රේණිය) වෙත ව්‍යාපෘතීන්හි පසු විපරම් කටයුතු පවරා ඇත.

## 9. විගණන විමසුම් හා පිළිතුරු සැපයීම

අභ්‍යන්තර විගණන

| | | |
|---|---|---|
| නව | - | 04 |
| පසු විපරම් | - | 22 |
| එකතුව | - | 26 |

ඉන් 20කට පිළිතුරු සපයා අවසන් කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණන විමසුම් 9 ක් ලැබී ඇති අතර, ඉන් 8කට පිළිතුරු සපයා අවසන් කර ඇත.

# 8 ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

තිරසාර සංවර්ධනය කරා යන ගමනේදී බස්නාහිර පළාතේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ හා ප්‍රජා සංවර්ධනයේ නියමුවා වීම.

### 1.2 මෙහෙවර

තිරසාර සංවර්ධනයක් කරා යන ගමනනේදී, බස්නාහිර පළාත තුල මගී ප්‍රවාහනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම, පළාත් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා නඩත්තුව, සමූපකාර ව්‍යාපාරය කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් බවට පත්කිරීම, නිවාස ඉදිකිරීම හා කුලී නිවැසියන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, ග්‍රාමීය සංවිධාන ශක්තිමත් කිරීම තුළින් සවිබල ගැන්වූ ග්‍රාමීය ප්‍රජාවක් බිහිකිරීම සහ වතු හා ධීවර ප්‍රජාවගේ ආර්ථික සමාජ තත්ත්වය නංවාලීම හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

### 1.3 කාර්යයන්

- බස්නාහිර පළාත තුළ ඇති සී හා ඩී ශ්‍රේණියට අයත් මාර්ග නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම
- පළාත් පාළන ආයතන සතු මාර්ග සංවර්ධනයට අවශ්‍ය දැනුම හා තාක්ෂණික සහාය ලබා දීම සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම තුළින් ආදායම් උත්පාදනය
- බස්නාහිර පළාත තුල ලියාපදිංචි වී ඇති වාහන සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සහ මගී ප්‍රවාහනය විධිමත්ව සිදු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම.
- බස්නාහිර පළාත තුළ ගෙවල් කුලී පනත ක්‍රියාත්මක කිරීම, නිවාස සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ නිවාස සංවර්ධන අරමුදල පවත්වාගෙන යාම, අඩු ආදායම්ලාභීන් සඳහා සහ රාජ්‍ය සේවකයින් සඳහා දේශීය හා විදේශිය ආධාර මත නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස දෙපාර්තමේන්තුව මෙහෙයවීම.
- මාර්ග, ප්‍රවාහන ආදී යටිතල පහසුකම් සංවර්ධනය තුළින් වඩා හොඳ පහසුකම් භුක්ති විඳින වතු ආශ්‍රිත ජන ප්‍රජාවක් බිහි කිරීම

- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය උදෙසා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වෘත්තීය පුහුණු ආයතන මගින් ශිල්පීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ග්‍රාමීය ජනතාව ඒකරාශී කරමින් ගම් මට්ටමින් පිහිටුවා ඇති සමාජ හා සංවිධාන සවිබල ගන්වා, යටිතල පහසුකම් දියුණු කරමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ප්‍රජා පහසුකම් සංවර්ධනය කිරීම
- ධීවර ජනතාවගේ සමාජ ආර්ථික තත්වය වර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ඇතුළු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර උපකරණ ලබා දීම

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

ධීවර හා ග්‍රාම සංවර්ධන අංශයන් අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක වන අතර අනෙකුත් විෂයන් සඳහා වෙනම දෙපාර්තමේන්තු හා අධිකාරි ස්ථාපිත කර ඇත.

- සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.
- සමූපකාර සේවක කොමිෂන් සභාව.
- කර්මාන්ත දෙපාර්තමේන්තුව.
- කර්මාන්ත සංවර්ධන අධිකාරිය.
- පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය.
- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
- ව්‍යාපාර නාම ලියාපදිංචි දෙපාර්තමේන්තුව.
- නිවාස කොමසාරිස් කාර්යාලය.

## 3. සංවිධාන සටහන



අමාත්‍යාංශ ලේකම් 01
සහකාර ලේකම් (පාලන) 01
සහකාර ලේකම් (ආයතන සංවර්ධන) 01
ගණකාධිකාරී 01
සහකාර සැලසුම් අධ්‍යක්ෂ 03
ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ 01
පරිපාලන නිලධාරී
ප්‍රධාන කළමණාකරණ සහකාර 01
සංවර්ධන නිලධාරී 03
කළමණාකරණ සහකාර 07
සංවර්ධන නිලධාරී 03
කළමණාකරණ සහකාර 02
සංවර්ධන නිලධාරී 06
කළමණාකරණ සහකාර 05
ග්‍රාම සංවර්ධන නිලධාරී 40
සහකාර ග්‍රාම සංවර්ධන නිලධාරී 01
සංවර්ධන නිලධාරී 06
කළමණාකරණ සහකාර 04
ජ්‍යෙෂ්ඨ මැහුම් උපදේශිකා 03
මැහුම් උපදේශිකා 37
මූල්‍ය සහකාර 01
සංවර්ධන නිලධාරී 01
කළමණාකරණ සහකාර 07
රියදුරු 08
කා.කා.ස 04
කා.කා.ස 01
කා.කා.ස 01
කා.කා.ස 01
රියදුරු 01
කා.කා.ස 01

## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය) | 2 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III ශ්‍රේණිය) | 1 |
| 4 | සහකාර අධ්‍යක්ෂක (සැලසුම්) | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (III ශ්‍රේණිය) | 3 |
| 5 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම් විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

ධීවර හා ග්‍රාම සංවර්ධන අංශ යටතේ ඉටු කරන ලද සේවාවන් හා ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

### 5.1 ධීවර අංශය

#### ක්‍රියාත්මක වැඩසටහන්

- මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය ගොවිපළ සංවර්ධනය.
- තාක්ෂණික දැනුම, පුහුණුව හා ආම්පන්න ලබා දීම.
- ධිවර කාන්තා සවිබල ගැන්වීම.
- ධිවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම.
- ධිවර ප්‍රජාවගේ සමාජ සුබසාධනය.

මේ තුලින් විදේශ වෙළඳපල ඉලක්කකරගත් උසස් තත්ත්වයෙන් යුත් විසිතුරු මසුන් අලෙවිය තුලින් පවුල්වල ආර්ථික මට්ටම ඉහළ නැංවීමත්, විදේශ විනිමය ඉපයීමට දායකත්වය ලබාදීමත් අපේක්ෂා කෙරේ.

#### ඉටු කළ සංවර්ධන කාර්යයන් හා සේවාවන්

පළාත් මත්ස්‍ය අස්වැන්න දියුණු කිරීම හා ඒ තුළින් ධීවර පවුල්වල ආදායම් ප්‍රවර්ධනය හා සමාජ සුභසාධනය අරමුණු කරමින් 2015 වර්ෂය තුල මිලියන 16.45 වැයකර ධීවර ව්‍යාපෘති 13ක් ක්‍රියාවට නංවන ලදි.

- මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය ගොවිපොල සංවර්ධනය.
- ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම පුහුණුව හා ආම්පන්න ලබා දීම.
- ධිවර ප්‍රජාවගේ සමාජ සුභසාධනය.





කළුතර දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද විසිතුරු මත්ස්‍ය ගොවිපල කිපයක්

| වැඩසටහන | ව්‍යාපෘති ප්‍රමාණය | ප්‍රතිලාභී පවුල් ගණන | වැයකළ මුදල රු.මි. |
|---|---|---|---|
| මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය ගොවිපොල සංවර්ධනය | 06 | 220 | 7.85 |
| ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම පුහුණුව හා ආම්පන්න ලබා දීම | 05 | 280 | 5.7 |
| ධීවර ප්‍රජාවගේ සමාජ සුභ සාධනය | 02 | 2328 | 2.9 |
| එකතුව | 13 | 2828 | 16.45 |

## 5.2 ග්‍රාම සංවර්ධන අංශය

### ක්‍රියාත්මක වැඩසටහන්

- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- බහුකාර්යය ගොඩනැගිලි ඉදිකිරීම
- බස්නාහිර පළාත් අඩු ආදායම් ලබන ජනයාගේ ආර්ථික තත්වය වැඩි දියුණු කිරීම
- කාන්තාවන් සඳහා ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම
- ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා බල ගැන්වීම

### ඉටු කළ සංවර්ධන කාර්යයන් හා සේවාවන්

- බස්නාහිර පළාත තුළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් 25ක් සිටින අතර සක්‍රීය සමිති සංඛ්‍යාව 2187කි. එමෙන්ම මැහුම් උපදේශිකාවන් 18ක් හරහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 21ක ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන යටතේ මැහුම්, ගෙතුම්, අත්කම්, ගෘහ කළමනාකරණය හා රූපලාවන්‍ය පුහුණුව ලබා දී වර්ෂ අවසානයේ ප්‍රදර්ශන පවත්වා ඇත.





- ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථානවල එක් පාඨමාලාවකට සීමාවී පැවති විෂය නිර්දේශය පාඨමාලා 05ක් ලෙස වෙන් වෙන් වශයෙන් සංශෝධනය කිරීම තුළින් පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවය හා කැමැත්ත අනුව පාඨමාලා තෝරාගත හැකි අන්දමින් නවීකරණය කර ඇත.

- බස්නාහිර පළාත තුළ හඳුනාගත් ඌන සංවර්ධිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති, අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘති, ප්‍රජා ජල ව්‍යාපෘති, ප්‍රජා ශාලා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ප්‍රජා මූල සංවිධාන සවිබල ගැන්වීම යටතේ උපකරණ ලබාදී ඇත.





- බස්නාහිර පළාත තුළ ඇති සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි, එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් එක් දුර්වල ග්‍රාම සංවර්ධන සමිතිය බැගින් තෝරා ගෙන සාමාජිකයින්ගේ එකඟතාවය අනුව, ප්‍රමුඛතාවය ලබාදිය යුතු යුතු පොදු ව්‍යාපෘතියක් වෙනුවෙන් අමාත්‍යාංශය මගින් රු.20,000/-ක මුදලක් ලබා දි වඩාත් ඵලදායී හා වෙන්කළ මුදල මෙන් දෙගුණයකට වඩා වටිනාකමක් ජනිත කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

- ප්‍රාදේශීය අසමතුලිතතාවය අවම කිරීමේ වැඩසටහන යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරොන්තුඩුව ග්‍රාම සේවා වසමේ ඕකිඩ් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.





- කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 198 ඒ දඹදූරය ග්‍රාම සංවර්ධන සමිතියේ අඩු ආදායම්ලාභී සාමාජිකයින්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා කාන්තා හා ළමා පාවහන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.




- පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අද්දරගොඩ හා හැඩිගල්ල ග්‍රාම සේවා වසම් 02හි තේ පැළ තවාන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම






- සංවර්ධනය පිළිබඳ ප්‍රජාවගේ දැනුවත්භාවය පුළුල් කිරීම සඳහා සාමාජිකයින්ගේ ළමුන් සහ ග්‍රාමීය තරුණ කොටස් යොමු කරමින් පවත්වන ලද ග්‍රාම සංවර්ධන රචනා තරඟය අංශ 04ක් යටතේ පවත්වා ජයග්‍රාහකයින් සඳහා මුදල් ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කල අතර ස්ථානය ලැබූ ජයග්‍රාකයන්ගේ රචනා අඩංගු “ රචනා සොළස ග්‍රන්ථය ” එළි දැක්වීම.

- පළාත් සභා 09 හි ග්‍රාම සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් නේවාසික දෙදින අත්දැකීම් හුවමාරු වැඩසටහනක් පිළිමතලාව, ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

## 6. ඵලදායිතාවය

නිලධාරීන්ගේ ආකල්පමය සංවර්ධනය සඳහා ඒ ඒ ශ්‍රේණි සඳහා වෙන් වෙන් වශයෙන් විෂයානුබද්ධ හා ප්‍රායෝගික වශයෙන් සැකසුණු බාහිර පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි.

## 7. සේවක සුභ සාධනය

අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයේ සුභ සාධනය උදෙසා

- ක්‍රීඩා තරඟ පැවැත්වීම
- සිංහල හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම
- ඒකාකාරත්වයෙන් මිදීම සඳහා විනෝද චාරිකා සංවිධානය කිරීම
- වෙසක් පොහෝයට බත් දන්සැලක් හා පොසොන් පොහෝයට අයිස්ක්‍රීම් දන්සැලක් සංවිධානය කිරීම








## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- සංවර්ධන සැලැස්මට අනුව හඳුනාගත් ඉලක්කයන් සඳහා අරමුදල් වෙන් කිරීමට 2016 වර්ෂයේදී සැලසුම් කර ඇත. ඒ අනුව බස්නාහිර පළාත තුළ විධිමත් මාර්ග පද්ධතියක් සකස් කිරීම හා වතුයටිතල පහසුකම් සැපයීම.
- අඩු ආදායම් ලාභීන් සඳහා අවම පහසුකම් වලින් යුත් නිවාස ඉදිකිරීම සඳහා ද්‍රව්‍යාධාර ලබාදීම.
- ධීවර පවුල්වල ආර්ථික සංවර්ධනය හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම.
- ප්‍රදේශයන් අතර අසමතුලිතතාවය ඉවත් කිරීම සඳහා ග්‍රාම සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම.

## 9. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| විගණන විමසුම් | ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු සැපයූ පිළිතුරු සංඛ්‍යාව |
|---|---|---|
| අභ්‍යන්තර විගණන | 09 | 09 |

# 8.1

# බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

සමූපකාර ව්‍යාපාරයෙන් සවිබල ගැන්වුනු බස්නාහිර පළාත් ප්‍රජාවක්.

### 1.2 මෙහෙවර

සමූපකාර ව්‍යවසායන් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා පරිපාලනය සඳහා සමූපකාර ආයතන අධීක්ෂණය, විගණනය, උපදේශණය සිදු කරමින් මූල්‍ය, තාක්ෂණික, යටිතල පහසුකම් හා අධ්‍යාපන පහසුකම් සැපයීම මගින් සමූපකාර ප්‍රතිපත්ති, සාරධර්ම හා වටිනාකම් වලට අනුගතව සමූපකාරික ආයතනයන් සවිබල ගැන්වීම.

### 1.3 කාර්යභාරය

1998 අංක දරණ බස්නාහිර පළාත් සභාවේ සමූපකාර ප්‍රඥප්තියේ සඳහන් නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

- සමූපකාර සමිති ලියාපදිංචි කිරීම
- සමූපකාර සමිති සංවර්ධනය සඳහා සහය වීම
- මූල්‍ය සේවා සමූපකාර සමිති නියාමනය කිරීම
- සමූපකාර සමිති විගණනය කිරීම
- සමූපකාර සමිති පිළිබඳ පරීක්ෂණ/ විමර්ශන කිරීම
- සමූපකාර සමිති සම්බන්ධ තීරක කටයුතු
- සමූපකාර සමිති ඈවර කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම සිදු කිරීම

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

2012 බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරණ සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරණ සමූපකාර සමිති ප්‍රඥප්තිය අනුව බස්නාහිර පළාතේ සමූපකාර ව්‍යවසායන් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා පරිපාලනය, සමූපකාර ආයතන අධීක්ෂණය, විගණනය හා උපදේශනය, මූල්‍ය තාක්ෂණික හා යටිතල පහසුකම් සැපයීම, සමූපකාර අධ්‍යාපන පහසුකම් සැපයීම හා යහපාලනය යන ප්‍රමුඛ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය යටතේ කොළඹ, ගම්පහ හා කළුතර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල තුනක් සහිතව ක්‍රියාත්මක වේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | සේවාව | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | සමුපකාර සංවර්ධන කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( I ශ්‍රේණිය) | 1 |
| 2 | සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( II ශ්‍රේණිය) | 2 |
| 3 | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය) | 4 |
| 4 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (III ශ්‍රේණිය) | 1 |
| 5 | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තුමය | 4 |
| 6 | පරිපාලන නිළධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 7 | සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි | දෙපාර්තමේන්තුමය | 7 |

## 4. ඉටුකරන ලද සේවාවන්

- යම් දිස්ත්‍රික්කයක තෝරාගත් සමුපකාර සමිතියක් එක් දිනක සියළුම අංශ සමුපකාර සංවර්ධන නිලධාරීන් ලවා අධීක්ෂණය කරවීම හා එම අධීක්ෂණයෙන් හෙළිවන අඩුපාඩු එම මොහොතේම අදාල පාලනාධිකාරිය දැනුවත් කර නිවැරදි කිරීමට කටයුතු කිරීම.
- බස්නාහිර පළාත තුල ව්‍යාප්ත වී ඇති සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිවල අවධානය යොමුවිය යුතු කරුණු සමුපකාර සංවර්ධන නිලධාරීන් මඟින් ලබාගෙන එකී කරුණු සම්බන්ධයෙන් විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි පැවැත්වීම.
- දේශීය ආදායම් කොමසාරිස් හා පළාත් ආදායම් කොමසාරිස් සම්බන්ධ කරගනිමින් රඳවාගැනීමේ බද්ද හා මුද්දර බද්ද පිළිබඳව සමුපකාර සංවර්ධන නිලධාරීන් හා සමුපකාර සමිති නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි පැවැත්වීම.

## 5. ඵලදායිතාවය

සමුපකාර සංවර්ධන නිලධාරීන් විසින් අනිවාර්යෙන් මාසිකව ඉටුකල යුතු රාජකාරී කටයුතු හඳුන්වා දී එකී රාජකාරී ඉටුකිරීමේ ප්‍රගතිය දිස්ත්‍රික් සහකාර කොමසාරිස් මගින් ගෙන්වා ගැනීම මගින් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුනෙහි නිලධාරීන්ගේ රාජකාරී කටයුතු ඉටුකිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

## 6. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

වසර ගණනාවක් තුල සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සංවර්ධන, විගණන හා අනෙකුත් අංශ වශයෙන් බෙදා වෙන් කර පැවරීම තුලින් ඉටුකල යුතු සියළුම රාජකාරී කටයුතු පිලිබඳ අවබෝධයක් නොලැබීමට ප්‍රතිකර්මයක් වශයෙන් සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු තුලට සංවර්ධන, විගණන, තීරක, උසාවි, විමර්ශන හා ඇවර ආදී සියළු කටයුතු ඇතුලත් කර ඔවුන්ට එසේ රාජකාරී කටයුතු කිරීම තුලින් සියළුම අංශවල රාජකාරී සම්බන්ධයෙන් මනා දැනුමක් ලැබෙන පරිදි නිලධාරීන්ගේ ක්ෂේත්‍ර සංවිධානය 2015 වර්ෂය තුල සකස් කර 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.

# 8.2 බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

කාර්යක්ෂම සේවාවක් සඳහා කැපවූ, තෘප්තිමත් සමුපකාර සේවක ප්‍රජාවක්.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත් සමුපකාර සමිති සේවකයින්ගේ පත්කිරීම්, මාරුකිරීම්, උසස් කිරීම්, විනය කටයුතු සහ වැටුප් හා දීමනා නියම කිරීමේ කටයුතු ප්‍රශස්ත ලෙස ඉටුකිරීම සඳහා, යහපාලනය තහවුරු වන නිත්‍යානුකූල රාමුවක් තුළ ආයතනික සම්පත් සඵලදායි ලෙස මෙහෙයවීම.

### 1.3 කාර්යයන්

1994 අංක 01දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාත් සමුපකාර සමිති සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමත කිරීම හා සේවා කොන්දේසි නියම කිරිම, පළාත් සමුපකාර සමිති සේවකයන් පත් කිරීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති නිශ්චය කිරීම හා ස්ථිර කිරිම, උසස් කිරීම් අනුමත කිරීම, තනතුරු අනුමත කිරිම, පළාත් සමුපකාර සමිති සේවකයන් සම්බන්ධ තනතුරු සඳහා සුදුසුකම් හා වැටුප් පරිමාණයන් නියම කිරීම හා කලින් කලට සංශෝධනය කිරීම, පළාත් සමුපකාර සමිති සේවකයන් පත් කිරීම, උසස් කිරීම හා විනයානුකූල කටයුතුවලදී අභියාචනායතනයක් ලෙස කටයුතු කිරිම, සේවකයන්ගේ සේවය අවසන් කිරීම හා පාරිතෝෂිත ගෙවීම් පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ කාර්යයන් ඉටු කරනු ලැබේ.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 17:4 වගන්තිය යටතේ සම්පාදිත 1994 අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා සංස්ථාපනය කරනු ලැබූ ආයතනයකි. පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව විෂයභාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වන අතර, කොමිෂන් සභාව සඳහා ලේකම්වරයෙකු ද ඔහුගේ සහාය පිණිස කාර්ය මණ්ඩලයක් ද වේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II) ශ්‍රේණිය | 1 |
| 2 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකරම්, විශේෂ වැඩසටහන් හා අත්කර ගත් ජයග්‍රහණයන්

**2016** ජනවාරි මස සිට සමුපකාර සේවකයින්ගේ වැටුප් වැඩිකිරීම සඳහා 2015 වර්ෂය තුල කටයුතු කරන ලදි.

## 5. ඵලදායිතාවය

ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පවත්නා භෞතික හා මානව සම්පත් ප්‍රශස්ත අන්දමින් යොදවා ගැනීමට ක්‍රමෝපායන් සලසා ඇත. භෞතික හා මානව සම්පත්වල පවත්නා අඩුපාඩුකම් ඉදිරියේදි සම්පූර්ණ වීමෙන් පසුව, උපරිම ඵලදායිතාවයක් කරා ආයතනය ගමන් කරනු ඇත.

## 6. සේවක සුභ සාධනය

- සේවක සුභ සාධන සංගමය ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.

# 8.3

# බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

සුරක්ෂිත හා සංවර්ධිත සම්ප්‍රදායික කර්මාන්ත.

### 1.2 මෙහෙවර

පේෂ කර්මාන්ත, කුඩා කර්මාන්ත හා හස්ත කර්මාන්ත යන ක්ෂේත්‍රයන් ප්‍රශස්ත ලෙස සංවර්ධනය කිරිම හා ඉදිරි පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරිම සඳහා දෙපාර්තමේන්තුව සතු විශේෂඥ දැනුම හා කුසලතාවය සහිත මානව සම්පත්, මූල්‍ය හා භෞතික පහසුකම් යොදාගනිමින් සාම්ප්‍රදායික කර්මාන්ත ශිල්පියා වෙත අවශ්‍ය වෘත්තිය පුහුණුව, අලෙවි පහසුකම්, යහපත් කළමනාකරණ මාර්ගෝපදේශකත්වය ලබාදීම තුලින් පළාතේ තිරසාර සංවර්ධනයට දායක වීම.

### 1.3 කාර්යයන්

- පේෂ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන් ආශ්‍රිතව ගුණාත්මක නිෂ්පාදනයන් සිදු කිරිම තුලින් සම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය සුරක්ෂිත කිරිම
- සම්ප්‍රදායික කර්මාන්තයන්ට අදාල පුහුණු පාඨමාලා හා කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල් පවත්වාගෙන යාම මගින් පළාතේ පේෂ කර්මාන්ත හා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන අලෙවි කටයුතු සිදු කිරීම
- ඒකියා අවස්ථා නිර්මාණය කිරීම හා කුඩා කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ආධාර සැපයීම.
- හස්ත කර්මාන්ත හා පේෂ කර්මාන්තයන්හි නිරතව සිටින පුද්ගලයින්ගේ ඵලදායිත්වය නංවාලීම.
- පළාතේ පාසැල් හා දහම් පාසැල් වලට අවශ්‍ය පාසැල් මේස හා පුටු නිෂ්පාදනය කිරීම.
- සාම්ප්‍රදායික කර්මාන්තයන්ට සේවා සැපයීමෙහි නියුක්ත රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධිකරණය.
- සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් ඒකාබද්ධ කිරීම මගින් සංවිධාන ඇති කිරීම.
- සාම්ප්‍රදායික කර්මාන්ත හා සුළු පරිමාණ කර්මාන්තයන් ව්‍යාප්ත කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

ඵලදායි රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම උදෙසා කරන ලද ව්‍යුහාත්මක පරිපාලන වෙනසත් සමගම ඇතිවූ පළාත් සභා ක්‍රමය යටතේ පිහිටුවනු ලැබූ බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින්,

- පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත නිෂ්පාදනයන් සිදු කිරීම
- පේෂ කර්මාන්ත හස්ත කර්මාන්ත හා කුඩා කර්මාන්ත නිෂ්පාදනයන්හි අලෙවි කටයුතු සිදු කිරීම
- වෘත්තීය පුහුණු පාඨමාලාවන් පැවැත්වීම
- කර්මාන්ත ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම

යන අංශ යටතේ නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථානද අලෙවිසැල්ද පවත්වාගෙන යනු ලැබේ.

ඒ අනුව පේෂ කර්මාන්ත නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 54 ක්, දැව තාක්ෂණ නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 10 ක්, ලුහු ඉංජිනේරු නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 7 ක් , මැටි කර්මාන්ත නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 5 ක්, කොහු නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 4 ක්, සම් කර්මාන්ත නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථාන 02 ක්, මැහුම් පුහුණු මධ්‍යස්ථාන 8 ක්, පරිගණක පුහුණු මධ්‍යස්ථාන 02 ක්, විද්‍යුත් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන 3 ක්, මැණික් කැපීම පිළිබද පුහුණු මධ්‍යස්ථාන 1 ක් ද ඇතුළුව මැටි නිෂ්පාදන ප්‍රදර්ශනය සඳහා කෞතුකාගාරයක් ද පවත්වාගෙන යනු ලබයි.

මීට අමතරව කෙටිකාලීන පාඨමාලා ලෙස පාවහන් නිෂ්පාදනය, ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම, රූපලාවන්‍ය පාඨමාලා, තිර රෙදි මැසීමේ පාඨමාලා, රෙදි පින්තාරු, සාරි හැට්ට මැසීමේ පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව පූර්ණකාලීන හා කෙටිකාලීන පාඨමාලා තුලින් වර්ෂයකට පාඨමාලා අවසන් කරනු ලබන පුහුණුලාභීන් සංඛ්‍යාව 1000 ක් පමණ වේ. මොවුන්ගෙන් 75% පමණ පිරිසක් ස්වයං රැකියා ලාභීන් ලෙස කටයුතු කිරීමට පෙලඹී ඇත.

තවද ඉහත මධ්‍යස්ථානවලින් බිහිවන ස්වයංරැකියාලාභීන් සඳහා අතදීමක් ලෙසට ඔවුන් වෙත විවිධ තාක්ෂණික හා ද්‍රව්‍යමය ප්‍රතිලාභ සැපයීමට මෙම දෙපාර්තමේන්තුව ඉදිරිපත්වී ඇත.

එසේම කුඩා කර්මාන්ත විෂයන් පාසැල් සිසුන් අතර ප්‍රචලිත කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර. තාක්ෂණික විෂයන් පාසැල් විෂය නිර්දේශයට ඇතුලත් කිරීමත් සමගම සම්ප්‍රදායික කර්මාන්ත පිළිබදව පාසැල් සිසුන් දැනුවත් කිරීම සඳහා අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත, මැටි කර්මාන්ත, දැව තාක්ෂණය ආදිය සම්බන්ධයෙන් වූ උපකරණ ක්‍රියාත්මක කරවා පාසැල් තුල හා විවිධ ප්‍රදර්ශන අවස්ථාවල ප්‍රදර්ශනය කිරීම තුලින් පාසැල් සිසුන් අතර දැනුම ව්‍යාප්ත කිරීම සිදුවේ.

තවද දෙපාර්තමේන්තු නිෂ්පාදන හා බස්නාහිර පළාතේ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කයන් නියෝජනය කරමින් ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල් 13 ක් පවත්වාගෙන යනු ලබයි.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩල

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කර්මාන්ත අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( I ශ්‍රේණිය ) | 1 |
| 2 | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය ( III ශ්‍රේණිය ) | 2 |
| 3 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය ( III ශ්‍රේණිය) | 1 |
| 4 | පරිපාලන නිලධාරි | කළමණාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 5 | කර්මාන්ත ප්‍රවර්ධන නිලධාරී | දෙපාර්තමේන්තුමය ( III / II / I ශ්‍රේණිය) | 17 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කර ගත් ජයග්‍රහණයන්

### ඉටු කරන ලද සේවාවන්

- පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත නිෂ්පාදනයන් අලෙවි කර රුපියල් 116,824,902.17 ක ආදායමක් ඉපයීමට සමත් වීම.
- කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල සපයන ලද අතර රුපියල් 6,115,985.00 ක ආදායමක් උපයා දීමට සමත් වීම.
- රුපියල් මිලියන 74.0 ක පේෂ කර්මාන්ත නිෂ්පාදනයන් සිදු කිරීම.
- අධ්‍යාපන හා දහම් පාසැල් ඇණවුම් ලෙස දැව හා ලුහු කර්මාන්ත ඇතුළු කුඩා කර්මාන්ත ආශ්‍රිත රුපියල් 22,244,897.03 ක නිෂ්පාදනයන් සිදු කිරීම.
- 2015 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙතින්, දිගු කාලීන හා කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ කරන ලද පුහුණු ලාභීන් සංඛ්‍යාව 1140 ක් පමණ වේ.
- බස්නාහිර පළාතේ පාසැල් 101 ක අබලන්වූ පාසැල් උපකරණ 11888 ක් අළුත්වැඩියා කිරීම.
- පළාතේ කාර්මිකයින් 600 දෙනෙකු සඳහා දෙපාර්තමේන්තු මධ්‍යස්ථාන තුල රැකියා අවස්ථා ලබා දීම.

**පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි වටිනාකම්**




**හස්ත කර්මාන්ත ශිල්පීන් වෙතින් මිළදී ගත් භාණ්ඩ වටිනාකම රු.මි.**




## ක්‍රියාකාරකම් සහ විශේෂ වැඩසටහන්

- දින100 වැඩසටහන යටතේ පුහුණුලාභීන් 285 දෙනෙකු සඳහා රු.මි. 1.4 ක වියදමින් තිර රෙදි, රෙදි පින්තාරු, පාවහන් හා බෑග් මැසීම සම්බන්ධ පාඨමාලා පවත්වා ස්වයං රැකියා උපකරණ ලබා දී ඇත.




- රුපියල් මිලියන 5.8 ක් වැය කර කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත මධ්‍යස්ථාන 21ක් සංවර්ධනය කිරීම තුලින් පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත නිෂ්පාදන නගා සිටුවීමටත්, පුහුණුලාභීන් ආකර්ශනය කර වැඩි පිරිසක් සඳහා පුහුණුව ලබා දීමටත් කටයුතු කර ඇත.





මනාලියන් දැක්ම ප්‍රදර්ශනය


කර්මාන්ත වැඩ පුහුණු මධ්‍යස්ථානය

ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල් පාරිභෝගික ආකර්ෂණය ඇති කර අලෙවි ප්‍රවර්ධනය සිදුකිරීම සඳහා රුපියල් මි. 3.2 ක වියදමක් දැරීම.

- කුඩා කර්මාන්ත හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා රු.මි. 5.5 ක වියදමින් අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීමද, අවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීමද, සේවකයින් පුහුණු කිරීමද, තුලින් ගුණාත්මක නිෂ්පාදනයන් හා පුහුණුලාභීන් බිහි කිරීමට හා යහපත් වැඩ පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම.
- කර්මාන්තකරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.මි 1.0 ක වියදමින් අවශ්‍ය ස්වයං රැකියා උපකරණ ලබා දීමටද ප්‍රදර්ශන සඳහා අවශ්‍ය උපාංග සැකසීමද සිදු කිරීම

- පුහුණුලාභීන් සමාජගත කිරීමේ අරමුණින් රු. මි. 1.5 ක වියදමින් ස්වයං රැකියා උපකරණ ලබා දීම සහ අවශ්‍ය උත්සව සංවිධානය කිරීම
- රු.735,000 ක වියදමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සඳහා යෝග්‍ය තාක්ෂණයෙන් යුත් අත් යන්ත්‍ර හා උපාංග හඳුන්වා දීම තුලින් සේවක කාර්යක්ෂමතාවය වැඩි කිරීම ද උසස් නිමාවකින් යුත් ගුණාත්මක නිෂ්පාදන බිහි කිරීමට කටයුතු කිරීම ද සිදු කිරීම

අධ්‍යාපන හා දහම් පාසැල් ඇණවුම් වල නිෂ්පාදන වටිනාකම




- හස්තකර්මාන්ත, කුඩා කර්මාන්ත හා පේෂ කර්මාන්ත ශිල්පීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා හස්ත ප්‍රතිභා නමින් අලෙවිකුටි පහසුකම් සැපයීම සහ ව්‍යවසායකත්ව පුහුණු වැඩමුළු පැවැත්වීම.
- රු.මි. 3.0 ක වියදමින් බස්නාහිර පළාතේ පාසැල් 101 ක රු.මි. 25.88 ක් වටිනා කැඩුණු පාසැල් ලීබඩු අළුත්වැඩියා කිරීම.





**සංවර්ධන ව්‍යාපෘති සඳහා දරණ ලද වියදම්.**




- බස්නාහිර පළාතේ හස්ත කර්මාන්ත හා පේෂකර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ ඇතුලත් ප්‍රදර්ශන හා තරඟ පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් පවත්වා ඇගයීම් සිදුකර ත්‍යාග හා සහතික පත් ලබා දීම.






### අත්කර ගත් ජයග්‍රහණ

- " හස්ත 2015 " ප්‍රදර්ශනය තුලින් බස්නාහිර පළාත තුළ ඇගයීමට භාජනය කරන ලද හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ සංඛ්‍යා 1133 ක් වන අතර ඉන් 185 ක් ජාතික තලය වෙත ඉදිරිපත් කරන ලදී. එම නිර්මාණ ඇගයීමට භාජනය කර " ශිල්ප 2015 " ජාතික තරගාවලියේදී පහත සඳහන් ජයග්‍රහණ ලබා ගැනීමට බස්නාහිර පළාත සමත් විය.

| | |
|---|---|
| රජත සම්මාන | 04 |
| ප්‍රථම ස්ථාන | 08 |
| දෙවන ස්ථාන | 09 |
| තෙවන ස්ථාන | 08 |
| කුසලතා සම්මාන | 26 |
| **මුළු සම්මාන සංඛ්‍යාව** | **55** |

- එසේම "අත්පෙහෙකම්2015 " පළාත් ප්‍රදර්ශනයේදී ඉදිරිපත් කරන ලද නිර්මාණ 245 අතරින් ජයග්‍රාහකයින් 77 දෙනෙකු වටිනා මුදල් ත්‍යාග හා සහතිකපත් ලබා ගැනීමට සමත්විය. ඉන් නිර්මාණලාභීන් 10 දෙනෙකුට ජාතික සම්මාන ලබා ගැනීමට හැක වූ අතර බස්නාහිර පළාත සඳහා ස්වර්ණ සම්මානය ලබා ගැනීමට ද හැකියාව ලැබීණ.

## 5. ඵලදායිතාවය

- ඵලදායිතා කව, ආයතනයේ මෙහෙයුම් කටයුතු පදනම් කර ප්‍රති සංවිධානය කිරීම.
- ප්‍රධාන කාර්යාලයට පමණක් සීමා වී තිබූ ඵලදායිතා සංකල්පය දිස්ත්‍රික් මට්ටමින් මධ්‍යස්ථාන වෙත ද හඳුන්වා දීම.
- නිෂ්පාදන හා අලෙවි මධ්‍යස්ථාන ප්‍රමිතකරණය යටතේ මධ්‍යස්ථාන වල පවත්වාගෙන යනු ලබන ලේඛණ භාවිතය/ නිෂ්පාදන කටයුතු විධිමත් කිරීම හා පාරිභෝගික සත්කාර වැඩි කිරීම.
- බස්නාහිර පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ සේවක කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම





## 6. සේවක සුභ සාධනය

**ක්‍රියාකාරකම්**

- 2015 වර්ෂයේ නව අවුරුදු උදාව වෙනුවෙන් දෙපාර්තමේන්තු නිලධාරින්ට සෙත් පතා පිරිත් හා ධර්ම දේශනාවක් පැවැත්වීම.
- 2015 සිංහල අළුත්අවුරුද්ද වෙනුවෙන් අවුරුදු උත්සවයක් පැවැත්විම.
- පොසොන් පොහොය නිමිත්තෙන් ධර්ම දේශනාවක් පැවැත්වීම.
- නිලධාරින් විශ්‍රාම යාම, ස්ථාන මාරුවීම්, දරු උපත් හා අවමංගල්‍ය උත්සව සඳහා මූල්‍යමය ආධාර ලබා දීම.





## 7. හඳුන්වාදී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- සම්ප්‍රදායික හා කුඩාකර්මාන්ත ක්ෂේත්‍රය වෙත පුහුණුලාභීන් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් දෛනික පුහුණු දීමනාව රු.100.00 සිට 250.00 දක්වා රු. 5000.00 ක උපරිමයකට යටත්ව වැඩි කිරීම.
- මූලික පුහුණුව හා උසස් පුහුණුව ලෙස වර්ෂ දෙකක් තුල පවත්වන ලද මැහුම් පුහුණු පාඨමාලාව පුහුණු ලාභීන්ගේ කාලය අඩු කර දීම සඳහා මාස හය බැගින් වර්ෂයක් දක්වා අඩු කිරීමට කටයුතු කිරීම
- මැටි කර්මාන්ත ක්ෂේත්‍රය නිෂ්පාදනයන්හි අඩු ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ නිෂ්පාදනයන් සිදුවීම අවම කර ගැනීම සඳහා අදාල පුහුණුවීම් ලබා දීම.
- දෙපාර්තමේන්තුවට අයත් මධ්‍යස්ථාන වල කාර්මිකයින්ගේ කාර්මික වැටුප් හා දීමනා එම මධ්‍යස්ථාන අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවනු ලැබූ ක්‍රමය වෙනුවට ප්‍රධාන කාර්යාලය මගින් ඔවුන්ගේ බැංකු ගිණුම් වල ඍජුවම තැන්පත් කිරීම.
- එසේම කාර්මිකාවන් ගේ උත්සව අත්තිකාරම් මාසික වාරික, ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ ගෙවීම් කිරීම වෙනුවට ඔවුන්ගේ මාසික වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කිරීම.
- කෑලි පදනම යටතේ වැටුප් ලබන කාර්මිකාවන්ගේ වැඩ කුලී සංශෝධනය කිරීම.

- වාර්ෂික නිෂ්පාදන සැලැස්ම අනුව සෑම මධ්‍යස්ථානයක් සඳහාම ඉලක්ක ලබා දීම.
- භාණ්ඩ සමීක්ෂණ හා තොග පවත්වාගෙන යාම සම්බන්ධ විශේෂ වැඩසටහන් පවත්වා කාර්යයන් විධිමත් හා පහසු කිරීම.
- මහර ප්‍රධාන රෙදි ගබඩාව සහ ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල් පරිගණකගත කිරීම මගින් තොග පාලනය විධිමත් කිරීම
- ජේෂ කාර්මිකයින්ගේ දෛනික පැමිණීමේ දීමනාව රු. 100.00 සිට 200.00 දක්වා ඉහළ නැංවීම.

## 8. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

ලැබී ඇති අභ්‍යන්තර විගණන විමසුම් 08 ට ද රජයේ විගණන විමසුම් 07 ටද පිළිතුරු සපයා ඇත.

# 8.4

# බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

බස්නාහිර පළාතේ නීති ගරුක මෝටර් වාහන භාවිතය තහවුරු කිරීම.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාතේ ලියාපදිංචි වාහන හිමියන් වෙත වාහන භාවිතය සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සලසා දීම හා මෝටර් වාහන භාවිතයේ නීති රීති ක්‍රියාත්මක කිරීම.

### 1.3 කාර්යයන්

බස්නාහිර පළාත් මෝටර් වාහන ප්‍රඥප්තිය ප්‍රකාර,

- බස්නාහිර පළාතේ ලියාපදිංචි සියළුම මෝටර් වාහන සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීම මගින් ආදායම් රැස් කිරීම.
- වාහන වෙළඳුන් සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.
- ආගන්තුක (කානෙට්) බලපත්‍ර නිකුත් කිරීම.
- කොන්දොස්තර බලපත්‍ර නිකුත් කිරීම.
- වෙළඳ වාහනවල යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා සුදුසුකම් ලත් ගරාජ ලියාපදිංචි කිරීම හා ගරාජ නියාමනය කිරීම.

## 2. ආයතනය පිළිබඳව හැඳින්වීම

බස්නාහිර පළාත් මෝටර් වාහන ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන දෙපාර්තමේන්තුවකි. මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම ප්‍රධාන කාර්යභාරය වේ. බස්නාහිර පළාත පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 38කින් (කොළඹ හා තිඹිරිගස්යාය හැර) සහ මාළිගාවත්ත ප්‍රධාන කාර්යාලයෙන් පළාතේ ඕනෑම වාහන හිමියෙකුට ආදායම් බලපත්‍ර ලබාගැනීමේ පහසුකම සලසා ඇත. මීට අමතරව නව ලියාපදිංචි වාහනයක ප්‍රථම ආදායම් බලපත්‍රය නිකුත් කරන කවුළුවක් නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටුවා ඇත. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) අධීක්ෂණයෙන් වාහන හා බලපත්‍ර තොරතුරු සම්පූර්ණයෙන් ම පරිගණක ගතකර, ලංකා රාජ්‍ය ජාලයෙන් (LGN) අන්තර්ජාල පහසුකම් ලබාගෙන ඇති නිසා ERL වැඩසටහන යටතේ බස්නාහිර පළාතේ ලියාපදිංචි ඕනෑම වාහනයකට ආදායම්

බලපත්‍රයක් ඕනෑම බලපත්‍ර කාර්යාලයකින් ලබාගැනීමට හැකිවේ.එමෙන්ම වාහන හිමියන්ටම පැය 24 පුරා ඉ-ආදායම් බලපත්‍ර ජාලයට සම්බන්ධ වී ආදායම් බලපත්‍රය අයදුම් කිරීමට හා ණයවරපත් මගින් මුදල් ගෙවීමටත්, සති දෙකකට වලංගු බලපත්‍ර මුද්‍රිතයක් එසැණින් ලබාගැනීමට සහ බලපත්‍ර මුල් පිටපත ලේඛනගත අධිවේගී තැපෑලෙන් ලබාගැනීමටත් පහසුකම් සලසා ඇත.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංක | තනතුර | සේවාව | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් (බ.ප.) | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය) | 1 |
| 2 | පළාත් මෝටර් රථ ප්‍රවාහන සහකාර කොමසාරිස් (බ.ප.) | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය) | 1 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III ශ්‍රේණිය) | 1 |
| 4 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

- **ආදායම් බලපත්‍ර නිකුත් කිරීමෙන් පළාත් ආදායම රැස්කරදීම**

| දිස්ත්‍රික්කය/ බලපත්‍ර සංඛ්‍යාව | වාර්ෂික බලපත්‍ර ආදායම රුපියල් | දඩ ආදායම රුපියල් | බලපත්‍ර හිඟ මුදල රුපියල් | හිඟ සඳහා දඩ රුපියල් | මුළු ආදායම රුපියල් |
|---|---|---|---|---|---|
| කොළඹ 458,050 | 2,085,465,986.19 | 117,702,310.67 | 118,016,263.33 | 28,964,053.17 | 2,350,148,613.36 |
| ගම්පහ 559,643 | 1,192,833,073.00 | 74,737,391.00 | 73,407,480.00 | 18,707,603.00 | 1,359,685,547.00 |
| කළුතර 255,546 | 472,973,822.00 | 28,338,730.00 | 26,072,519.00 | 6,762,875.00 | 534,147,946.00 |
| එකතුව 1,273,239 | 3,751,272,881.19 | 220,778,431.67 | 217,496,262.33 | 54,434,531.17 | 4,243,982,106.36 |

- බස්නාහිර පළාත තුළ ගරාජ 115ක් වෙළඳ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීමට සුදුසුකම්ලත් ගරාජ ලෙස ලියාපදිංචි කිරීම.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | එකතුව |
|---|---|---|---|---|
| ගරාජ සංඛ්‍යාව | 56 | 41 | 18 | 115 |

- නිකුත්කළ කොන්දොස්තර බලපත්‍ර සංඛ්‍යාව - 149 යි.
- බස්නාහිර පළාත් මෝටර් වාහන ප්‍රඥප්තිය ප්‍රකාර එක්රැස්කළ අනෙකුත් ආදායම්

| දිස්ත්‍රික්කය | අයකරගත් මුළුමුදල රුපියල් |
|---|---|
| කොළඹ | 1,161,651,055.82 |
| ගම්පහ | 68,185.00 |
| කළුතර | 28,660.00 |
| එකතුව | 1,161,748,900.82 |

## 5. සේවක සුභසාධනය

- වාර්ෂික විනෝද චාරිකා / වාර්ෂික සුහද හමු, ආගමික වැඩසටහන් සංවිධානය.
- ආයතනයේ සුභසාධන සංගමය මගින් නිලධාරීන්ට ණය පහසුකම්, අවමංගල්‍යාධාර, ආපදා ණය ලබා දීම.

## 6. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- හිඟ වාහන ආදායම් බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා වාහන හිමියන් පෙළඹවීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- බලපත්‍රලාභියාට බලපත්‍රය තැපැල් කිරීම සඳහා Speed Post හඳුන්වා දීම තුළින්, අන්තර්ජාලයෙන් බලපත්‍ර ඉල්ලුම් කිරීම තවදුරටත් ප්‍රවර්ධනය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය.
- මෑතදී ඉ-ආදායම් බලපත්‍ර පද්ධතියට එක්වූ පළාත් සභාවන්ට සහ ඉ-ආදායම් බලපත්‍ර පද්ධතියට එක්වීමට අපේක්ෂිත පළාත් සභාවන්ට මගපෙන්වීම හා පුහුණුව ලබාදීම.
- සේවාලාභීන් රැඳී සිටින ආලින්දයේ හා බලපත්‍ර කවුළු ආශ්‍රිතව ස්ථාපිත රූපවාහිනී සඳහා Peo TV සම්බන්ධතාව ලබාදී රූපවාහිනී නැරඹීමේ පහසුකම සැලසීම.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| | විගණකාධිපති | අභ්‍යන්තර විගණන |
|---|---|---|
| ලැබුණු විගණන විමසුම් | 5 | අතුරු විගණන විමසුම් පමණි - 4 |
| පිළිතුරු යැවූ විගණන විමසුම් | 5 | අතුරු විගණන විමසුම් පමණි - 3 |

# 8.5

# බස්නාහිර පළාත් නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව

---

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

බස්නාහිර පළාත්වාසී අඩු ආදායම්ලාභී නිවාස අහිමි ජනතාවට තෘප්තිමත් පරිසරයක තමන් සතු නිවසක පදිංචි වීමට වාතාවරණය සලසා දිම.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී ජනතාවට සුදුසු නිවසක් ඉදිකර ගැනිමට හා පවතින නිවස වැඩිදියුණු කිරීම සඳහා ආධාර ලබාදිම හා 1972 අංක.07 දරණ ගෙවල්කුලී පනතේ විධි විධාන ක්‍රියාවට නැංවීමෙන් සහනය සලසාදිම.

### 1.3 කාර්යයන්.

- ගෙවල්කුලි පනතට අනුව පළාත තුළ පවත්වාගෙන යනු ලබන ගෙවල්කුලී මණ්ඩල 14 මගින් ප්‍රදේශයේ නිවාස අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පවතින ගැටලු නිරාකරණය කිරීම.
- ගෙවල්කුලී පනතේ 18 වගන්තිය ප්‍රකාර ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා පැරණි ගොඩනැගිලි කඩා දැමීමට අවසර ලබාදිම යටතේ අදාළ දේපළින් ඉවත්ව යන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමටත්, ඔවුන්ට අයිතිකරු වෙතින් වන්දි මුදල් ලබා ගැනිමටත් ගෙවල් කුලි පනතේ පවතින විධිවිධාන යටතේ අවශ්‍යකටයුතු සලසා දිම.
- ගෙවල්කුලී පනතේ 22 වැනි වගන්තිය යටතේ කුලි නිවැසියන් නෙරපීමේ පරීක්ෂණ කටයුතු හා නඩු කටයුතු සඳහා වන්දි මුදල් භාරගැනිම හා පනතට අදාළව අධීක්ෂණ කටයුතු කිරිම.
- පළාත් නිවාස සංවර්ධන අරමුදලට අදාළ ප්‍රඥප්තියට අනුව අඩු ආදායම් ලාභීන්ට නිවාස ආධාර ලබාදිම හා පසු විපරම් කිරීම.
- පළාත් සංවර්ධන වැඩසටහන / පළාත් නිශ්චිත වැඩ සටහන /උපමාන පාදක වැඩ සටහන් යටතේ අඩු ආදායම්ලාභීන්ට නිවාස තැනිම සඳහා ද්‍රව්‍ය ආධාර හා මුල්‍යාධාර සැපයිම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම.

නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් සිය මෙහෙවර ඉටු කරනු ලබයි. බස්නාහිර පළාත තුල ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ නොවිසිඳුණු නිවාස ගැටළුවට පිළියමක් ලෙස පවතින අනාරක්ෂිත අඩු පහසුකම් සහිත නිවාස ආරක්ෂාකාරී පහසුකම් සහිත නිවාස බවට පත්කිරීමට සහ නිවාස නොමැති අඩු ආදායම්ලාභීන්ට නිවාස ඉදිකිරීමට ද්‍රව්‍යාධාර මෙන්ම මුල්‍යාධාර සැපයීම මෙම දෙපාර්තමේනතුව මඟින් සිදු කරනු ලබයි. තවද 1972 අංක 07 දරණ ගෙවල් කුලී පනත මඟින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම තුලින් ගෙවල් කුලී මණ්ඩල පවත්වාගෙන යෑම, කුලී නිවැසියන් හා නිවාස හිමිකරුවන් අතර පවතින ගැටලු නිරවුල් කිරීම මඟින් සිය අරමුණු ලඟා කර ගැනීම උදෙසා නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නිවාස කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය II ශ්‍රේණිය | 1 |

## 4. ඉටු කරන ලද සේවාවන් ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්.

2015 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව මඟින් අඩු ආදායම්ලාභී ජනතාව සඳහා නිවාස සංවර්ධන අරමුදලින් නිවාස ආධාර ලෙස මූල්‍ය ආධාර සහ පළාත් සංවර්ධන, පළාත් නිශ්චිත සංවර්ධන හා උපමාන පාදක ප්‍රදාන යටතේ ද්‍රව්‍ය ආධාර පහත පරිදි ලබාදී ඇත.

**නිවාස ආධාර - 2015**

| | **කොළඹ** | **ගම්පහ** | **කළුතර** | **එකතුව** |
|---|---|---|---|---|
| නිවාස සංවර්ධන අරමුදල | 3,057,500.00 | 635,000.00 | 445,000.00 | 4,137,500.00 |
| පළාත් සංවර්ධන වැඩසටහන | 22,637,796.00 | 11,407,359.00 | 3,628,950.00 | 37,674,105.00 |
| පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන | 3,000,000.00 | 995,897.42 | 995,341.50 | 4,991,238.92 |
| උපමාන පාදක ප්‍රදාන වැඩසටහන | 976,000.00 | – | 200,000.00 | 1,176,000.00 |
| එකතුව | 29,671,296.00 | 13,038,256.42 | 5,269,291.50 | 47,978,843.92 |













## 5. ඵලදායිතාවය

ඵලදායිතා සංකල්පය යටතේ ඵලදායිතා තරඟාවලියට සහභාගී වී ඇත.

## 6. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

1990 අංක 3 දරණ බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රඥප්තියේ 07 වන වගන්තිය යටතේ කරන ලද රෙගුලාසි 2015.05.27 දින ගැසට් පත්‍රය මගින් 2015.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත.

- අළුතින් නිවසක් සෑදීම සඳහා උපරිම ආධාර මුදල රු. 100,000/- ක් දක්වාද
- පවතින නිවාස වැඩි දියුණු කිරීම සඳහා උපරිම ආධාර මුදල රු. 50,000/- දක්වාද
- වහලය සකස් කිරීම සඳහා උපරිම ආධාර මුදල රු.30,000/- දක්වාද සංශෝධනය කර ඇත.

## 7. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත.

# 8.6

# බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

බස්නාහිර පළාත තුල ව්‍යාපාර නාමයන් යටතේ පවත්වාගෙන යනු ලබන සියලු ව්‍යාපාර ලියාපදිංචි කිරීම

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත තුල ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු ගෙන යන ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම හා එසේ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අයකිරීම හා ඒ සම්බන්ධ වෙනත් කටයුතු ඉටුකිරීම තුලින් බස්නාහිර පළාත් ජනතාවට වෙළඳ හා වානිජ කටයුතු වල නිරත වීමට අවස්ථාව ලබා දීම මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

### 1.3 කාර්යයන්

- ව්‍යාපාර නාම ලියා පදිංචි කිරිම.
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිම සම්බන්ධ අවශ්‍ය වෙනස්කම් සිදු කිරිම.
- ව්‍යාපාර නාම අවලංගු කිරිම.
- ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයන්හි පිටපත් ලබා දීම.
- ව්‍යාපාරයන්හි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිම සම්බන්ධව ව්‍යාපාරික ගැටලු නිරාකරණය සඳහා උපදෙස් ලබාදීම සහ අනුශාංගික කටයුතු.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ 9 වන උපලේඛණයේ 1 වන ලැයිස්තුව අනුව ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිමේ කාර්ය භාරය පළාත් සභාවලට පැවරීමත් සමග ඒ ඒ පළාත් සභා මගින් ස්වකීය පළාත තුළ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිමේ නීතිය ක්‍රියාත්මක කිරිම විධිමත් කිරිම සඳහා සකස් කල ප්‍රඥප්ති අනුව කටයුතු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

ඒ අනුව අනුව 1990 අංක 04 දරණ බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය 1991.01.01 දින සිට ක්‍රියාත්මක කල අතර 2013.10.01 දින සිට සංශෝධිත 2011 අංක 5 දරණ බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි නව ව්‍යාපාර ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් | ශ්‍රී ලංකා පරිපාලන සේවය -11 ශ්‍රේණිය | 1 |
| 2 | පරිපාලන නිළධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

| වර්ෂය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2804 | 19 |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 35 | 11996 | 81 |
| එකතුව | 14800 | |

- රැස්කල ආදායම් විස්තර

| වර්ෂය | ප්‍රමාද ගාස්තු ආදායම රු. | ලියාපදිංචි කිරීම ආදායම රු |
|---|---|---|
| **2013** | **5,347,199** | **32,761,490** |
| **2014** | **5,970,662** | **51,576,092** |
| **2015** | **7,563,384** | **53,870,628** |




- **2015 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

| | ලියාපදිංචි කිරිමේ ආදායම රු. | ප්‍රමාද ගාස්තු ආදායම රු. | එකතුව |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 13,394,000 | 1,056,700 | 14,450,700 |
| කොළඹ | 12,370,100 | 1,665,935 | 14,036,035 |
| ගම්පහ | 19,158,838 | 3,560,159 | 22,718,997 |
| කළුතර | 8,947,690 | 1,280,587 | 10,228,277 |
| **එකතුව** | 53,870,628 | 7,563,384 | 61,434,012 |



## 5. හඳුන්වාදී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- 2011 අංක 5 දරණ බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත තරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම තුලින් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිම විධිමත් කිරීම.
- නව ප්‍රඥප්තිය යටතේ ගාස්තු සංශෝධනය කිරිම තුලින් වැඩි ආදායමක් උපයාගත හැකිවීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ග්‍රාම නිළධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මගින් ව්‍යාපාරික ප්‍රජාව ව්‍යාපාර ලියාපදිංචිය සඳහා යොමු කරවීම.
- ස්ථාන පරික්ෂා කිරිමේ වැඩසටහන් මගින් ලියා පදිංචි නොකළ ව්‍යාපාර හඳුනා ගැනිම සහ ඒවා ලියාපදිංචිය සඳහා යොමුකරවීම.
- කාර්යාලයේ හා ව්‍යාපාරික ප්‍රජාවගේ පහසුව සඳහා ප්‍රමාණවත් ඉඩකඩ හා වෙනත් පහසුකම් ඇති ගොඩනැගිල්ලක දෙපාර්මේන්තුව ස්ථාපිත කිරිම.

## 6. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම - 2015

| අනු අංකය | වර්ගය | ලද ප්‍රමාණය | පිළිතුරු සැපයූ ප්‍රමාණය | ඉතිරි විගණන විමසුම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | විගණකාධිපති විගණන විමසුම් | 02 | 02 | 00 |
| 02 | අභ්‍යන්තර විගණන විමසුම් | 03 | 03 | 00 |

# 9

# සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශය

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
සැමට සුවය හා රැකවරණ.

### 1.2 මෙහෙවර
මහජනතාව කේන්ද්‍ර කර ගත් සමීප, ගුණාත්මක, ඵලදායී හා පුළුල් මහජන ප්‍රවේශයක් සහිතව සැමට සුවය හා රැකවරණය ලබා දීම සඳහා බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන හා කාන්තා කටයුතු දෙපාර්තමේන්තුවල ප්‍රතිපත්තිමය හා නෛතික පදනම ශක්තිමත් කරමින් නවීන තාක්ෂණය මුසු කර ගත් මහජන අපේක්ෂා ඉටු කරන සේවා සම්පාදනයක් සහතික කිරීම.

### 1.3 කාර්යයන්
- රෝග ප්‍රතිකාර හා රෝග නිවාරණ අංශයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම තුළින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ව්‍යාප්ත කිරීම.
- දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ප්‍රචලිත කිරීම හා ආයතනික සේවා පුළුල් කිරීමෙන් ඖෂධ නිෂ්පාදනය හා ඖසු වගාව වැඩි දියුණු කිරීම, දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයට දේශීය හා විදේශීය ජනතාව නැඹුරු කිරීම.
- ජ්‍යෙෂ්ඨ පුරවැසින්ගේ රැකවරණය හා සුරක්ෂිතභාවය සහතික කිරීම, අයාලේ ගිය කාන්තාවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් යහපත් කාන්තාවන් ලෙස සමාජගත කිරීම හා විවිධ හේතූන් මත අසරණභාවයට පත් වූවන්ට මූල්‍යමය හා ද්‍රව්‍ය ආධාර වලින් සහන සැලසීමෙන් සමාජ සුබසාධන සේවාවන් ව්‍යාප්ත කිරීම.
- අනාතභාවයන්ට හා විවිධ අපයෝජනයන්ට ලක් වූ දරුවන් යහමගට යොමු කර ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ළමාරක්ෂක සේවාවන් ව්‍යාප්ත කිරීම.
- කාන්තාවන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම, උපදේශනය සහිත තාක්ෂණය හඳුන්වා දීම හා සවිබල ගැන්වීමට අදාළ කාර්ය ක්‍රියාත්මක කිරීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති හා අනතුරුව 2014 වසරේ මැයි මාසයේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ හයවන පළාත් සභාව යටතේ වන කාර්යයන් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ විෂයභාර අමාත්‍යතුමා හට පැවරී ඇති සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,සමාජ සුබසාධන,කාන්තා කටයුතු සහ පරිවාස හා ළමාරක්ෂක සේවා යන විෂයයන්හි අපේක්ෂිත කාර්යසාධන ප්‍රතිඵල අත්පත්කර ගනු පිණිස කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් යුක්ත පරිපාලන ව්‍යුහයක් පවත්වාගෙන යාමට අප අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය දායකත්වය සපයනු ඇත.

## 3. සංවිධාන සටහන



## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය ) | 1 |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය ) | 2 |
| 3 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (III ශ්‍රේණිය) | 3 |
| 4 | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III ශ්‍රේණිය) | 1 |
| 5 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

### 5.1 සේවාවන්

- **අඩු ආදායම්ලාභී ජනතාව ඉලක්ක කරගත් ප්‍රාථමික සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය**

ලංකාවේ සංවර්ධිතම පළාත ලෙස සැලකුවද බස්නාහිර පළාත තුළ සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් නොමැති විශාල ගෘහ ඒකක සංඛ්‍යාවක් පවතින බව හඳුනා ගෙන ඇත. බස්නාහිර පළාතේ සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් නොමැති සියළුම පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීමේ අරමුණින් යුතුව ග්‍රාමීය මෙන්ම නාගරික ජනතාව ඉලක්ක කර ගනිමින් ප්‍රාථමික සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතියක් දියත් කර ඇත. මෙහි මූලික අදියර යටතේ දිස්ත්‍රික්ක 03 හි තෝරාගත් පවුල් 1320 ක් සඳහා වැසිකිළි පහසුකම් ලබා දීමට කටයුතු කරන ලදී.

- **ඩෙංගු රෝගය හා බෝ නොවන රෝග පාලන ව්‍යාපෘතිය (“සුව සිසු”)**

විෂයයභාර ගරු අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව බස්නාහිර පළාත තුළ මනා කායික හා මානසික සෞඛ්‍යයෙන් යුතු නිරෝගී දරු පරපුරක් බිහි කිරීමේ අරමුණින් යුතුව හා දරුවන්ගේ ගෘහාශ්‍රිත සෞඛ්‍ය සුරක්ෂිත බව තහවුරු කිරීම උදෙසා පාසල් දරුවන්, ඔවුන්ගේ දෙමාපියන් හා ගුරුවරුන් සඳහා පෝෂණය, ඩෙංගු රෝගය, මත් උවදුර, ශරීර සුවතාව, යහපැවැත්ම පිළිබඳ දැනුවත් කිරීමට “සුව සිසු” ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී කළුතර දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් 4800 ක් සඳහා ක්‍රියාත්මක විය. ඉදිරියේදී අනෙකුත් දිස්ත්‍රික්ක දෙක සඳහා ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

- **කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා කාන්තා කටයුතු අංශය මගින් සිදුකරන ලද ව්‍යාපෘති**
    - **ඕකිඩ් වගා ව්‍යාපෘතිය**

ආදායම් උත්පාදන මාර්ගයකට යොමු නොවූ කාන්තාවන් ආදායම් උත්පාදන මාර්ගයකට යොමු කිරීම සඳහා ඕකිඩ් මල් වගා ව්‍යාපෘතිය දියත් කරන ලදී. මේ යටතේ කාන්තාවන් 140 ක් සඳහා ඕකිඩ් වගාව පිළිබඳ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව ඕකිඩ් පැල හා වගා ගෘහය සැලසීම සඳහා අවශ්‍ය දැල් බෙදා දීම ද සිදු කරන ලදී.




- **ස්වයං රැකියා උපකරණ ලබා දීම**

ස්වයං රැකියාවන්හි නියුතු වූවන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ස්වයං රැකියාවක් කිරීමට අපේක්ෂිත කාන්තාවන් ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා බස්නාහිර පළාතේ කාන්තාවන් සියයකට වැඩි ප්‍රමාණයකට ස්වයං රැකියා උපකරණ බෙදාදීම සිදු කරන ලදී. මෙහිදී රූපලාවන්‍ය, මැහුම්, ආහාර සකස් කිරීම යන අංශ සඳහා අවශ්‍ය උපකරණ බෙදාදීම සිදු විය.

## 5.2 විශේෂ වැඩසටහන් හා ක්‍රියාකාරකම්

- e-IMMR වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 07 ක මුදලක් වෙන් කරන ලද අතර, 2015 වසරේදී මෙම ව්‍යාපෘතියෙහි දෙවන අදියර දොම්පේ, අවිස්සාවේල්ල සහ පානදුර යන මූලික රෝහල් වල ක්‍රියාත්මක කිරීමද ආරම්භ කර ඇත. පානදුර මූලික රෝහලේ සෞඛ්‍ය දත්ත කළමනාකරණ ව්‍යාපෘතිය (HHIMS) යටතේ රෝහලේ සියලුම අංශ වල දත්තයන් පරිගණකයන් මගින් ජාලගත කිරීමේ කටයුතු සිදු කරන ලදී. මෙමගින් රෝග සත්කාරක සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක තත්ත්වයකට පත් කිරීමට හැකිවී ඇත. පළාත තුළ තිබෙන වසංගත රෝග පිළිබඳ රෝග ප්‍රවණතා කඩිනමින් දැන ගැනීම සඳහාත් මෙම දත්ත පද්ධතිය පරිගණකගත කිරීම මගින් හැකිවේ.




- **තොරතුරු තාක්ෂණය භාවිතය ඉහළ නැංවීම**

රාජ්‍ය අංශය තුළ ඉහළම තොරතුරු තාක්ෂණ භාවිතයක් ඇති ආයතනය බවට පත්වීමේ අභිලාශයෙන් යුතුව බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

දැනටමත් තොරතුරු තාක්ෂණ අංශයේ ඉදිරි පියවරයන් රාශියක් තැබීමට අමාත්‍යාංශය සමත් වී ඇත.

- **සියලුම නිලධාරීන්ට විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබා දීම**

කාර්යාලයේ සියලු නිලධාරීන්ට wpc.gov.lk ඩොමේන් පහසුකම ඔස්සේ රාජකාරීමය විද්‍යුත් මේල් ලිපිනයක් ලබා දී ඇත. එමගින් සෘජුව අනෙකුත් කාර්යාල හා අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන් අතර තාක්ෂණිකව ගොනු හුවමාරු කර ගැනීම සිදු කෙරේ. අවම කාලයක් තුළ ගොනු හා තොරතුරු හුවමාරු කර ගැනීම මෙම ක්‍රියාවලියේ අරමුණ වේ.

- **තැපැල් මෘදුකාංගය භාවිතා කිරීම**

කාර්යාලය වෙත ලැබෙන සෑම ලිපියක්ම මෘදුකාංගයක් භාවිතයෙන් නිලධාරීන් අතර බෙදා හැරීම මෙමගින් සිදුවේ. මෙම මෘදුකාංගය හඳුන්වා දීම තුළින් දෛනික තැපැල පවත්වාගෙන යාම පහසු වී ඇත. යම් ලිපියක් ලැබුණු දිනය, ලැබුණු ස්ථානය හා එයට දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගය ආදී තොරතුරු අදාල මෘදුකාංගය පරිශීලනයෙන් ක්ෂණිකව සොයා ගැනීමේ හැකියාව ඇත. මෙමගින් ගොනු පරිශීලනයෙන් තොරතුරු සෙවීමට ගතවන කාලය අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර මෙම මෘදුකාංගය ඇමතුම් දින පොතක් ලෙස භාවිතා කිරීමේ හැකියාවක් ද පවතින බැවින් අදාළ කාර්යයන් නිසි වේලාවට අතපසුවීමකින් තොරව ඉටු කිරීමේ හැකියාව ලැබේ.

- **File server**

කඩදාසි භාවිතය අවම කිරීම, ගොනු කාර්යාලය තුළ හුවමාරුවේදී ගත වන වේලාව අවම කිරීම හා කඩිනම් සේවා සැපයීම අරමුණු කර ගනිමින් ප්‍රධාන ගොනු සේවා පද්ධතියක් (File server) ස්ථාපනය කර ඇත.

## 6. ඵලදායීතාවය

**ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

අමාත්‍යාංශ දැක්ම හා මෙහෙවර ඉලක්ක කර ගනිමින් මහජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීම උදෙසා 2013 වසෙර්දී ඵලදායීතා තරඟාවලියට ඇතුළත් වෙමින් රාජ්‍ය සේවය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම තත්ත්වයකින් ලබා දීමට ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ මගින් කාර්යාල පරිශ්‍රය වඩාත් ප්‍රසන්න අයුරින් සකස් කර ගැනීමටත්, සේවකයන් හට සිය රාජකාරි කටයුතු තෘප්තිමත් හා කාර්යක්ෂම අයුරින් ඉටු කර ගැනීමටත්, අමාත්‍යාංශය වෙත පැමිණෙන සේවාලාභීන් වෙත වඩාත් සුහදශීලී කාර්යක්ෂම සේවයක් ලබා දීමටත් හැකි වී ඇත.

ඒ අනුව යමින් රාජ්‍ය සේවය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම තත්ත්වයකින් ලබා දීමට ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් 2012/2013 ජාතික ඵලදායීතා තරඟාවලියේ අන්තර් පළාත් අමාත්‍යාංශ තරඟයෙන් විශේෂ කුසලතා සම්මානය හිමි කර ගැනීමට අප අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට හැකිවිය. ඵලදායීතා ලේකම් කාර්යාලය මඟින් මෙහෙයවන ලද 2015 ඵලදායීතා සම්මාන තරඟාවලියට අයදුම් කර ඇත. මීට අමතරව 2012/2013 ජාතික ඵලදායීතා තරඟාවලියේ ප්‍රථම ස්ථානය හිමිකරගත් ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ චාරිකාවක නියැලීම සිදු විය.

## 7. සේවක සුභ සාධනය

- විවිධ විෂයය පරාස යටතේ පුහුණු වැඩසටහන් සඳහා යොමුකරමින් අවශ්‍ය පුහුණුවීම් කටයුතු සිදු කිරීම.
- සේවකයින්ගේ මානසික තෘප්තිය උදෙසා සංගීත රසාස්වාද වැඩසටහනක් පැවැත්වීම.
- ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ චාරිකාවක නියැලීම.
- ආයතනයේ නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා යෝග ව්‍යායාම පුහුණු කිරීමේ කටයුතු සිදු කෙරිණි.






## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- **යෝජිත බස්නාහිර පළාතේ 2006 අංක 03 දරණ සමාජ සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**

මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලෙඛණයේ 1 වන ලැයිස්තුවේ සමාජ සේවා හා සමාජ පුනරුත්ථාපන විෂය යටතේ බස්නාහිර පළාත තුළ පදිංචි අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය කිරීම, දිළිඳු හා අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, ජීවිකා වෘත්තියක යෙදිය නොහැකි ක්ෂය, පිළිකා, ලාදුරු, තැලසීමියා රෝගාබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර සැපයීම, කායික මානසික සහ සාමාජීය වශයෙන් ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුභ සාධනය, අබල හා සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම, අයාල ආඥා පනත යටතේ අධිකරණය මගින් යොමු කරන කාන්තාවන් රඳවා තබා ගැනීම හා පුනරුත්ථාපනය ඇතුළු සුභ සාධන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා වූ ප්‍රඥප්තියකි.

තවද මේ යටතේ බස්නාහිර පළාත තුළ සුභ සාධන සේවාවන් සලසනු ලබන ස්වේච්ඡා සංවිධාන, ආයතන හා නේවාසික නිවාස ලියාපදිංචි කිරීම හා ආයතන පරිපාලනය සංවිධානය හා ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ අධීක්ෂණයද කෙරේ.

## 9. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| | 2015 වර්ෂය සඳහා ලැබුණු විගණන විමසුම් | පිළිතුරු යැවූ විගණන විමසුම් ගණන | ඉතිරි විගණන විමසුම |
|---|---|---|---|
| ප්‍රධාන ලේකම්ගේ (අභ්‍යන්තර විගණන විමසුම්) | 02 | 02 | - |
| විගණකාධිපතිගේ විගණන විමසුම් | 05 | 04 | 01 |

# 9.1

# බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

බස්නාහිර පළාතේ යහපත් ආර්ථික සමාජයීය සහ අධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකිරීම උදෙසා සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීම.

### 1.2 මෙහෙවර

ඵලදායි, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවයෙන් යුතු සෞඛ්‍ය ප්‍රවර්ධන, රෝග නිවාරණ, රෝග ප්‍රතිකාර සහ පුනරුත්ථාපන යන සෞඛ්‍ය සේවාවන්ගේ මනා සම්බන්ධීකරණයක් තුළින් බස්නාහිර පළාතේ ජනතාවට වඩා යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ලබා කර දීම.

### 1.3 කාර්යයන්

- බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන රෝග නිවාරණ, රෝග ප්‍රතිකාර සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු වල මනා සම්බන්ධීකරණයක් ඇති කර එමඟින් පළාත තුළ ක්‍රියාත්මක වන සෞඛ්‍ය සේවාවන්ගේ උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීම.
- පළාතේ පවතින සියළුම රෝහල්, රෝග ප්‍රතිකාර සේවාවන්ගෙන් අංග සම්පූර්ණ තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල, දේශීය හා විදේශීය පුහුණු අවස්ථා, උපකරණ හා සේවාවන් වැඩි දියුණු කිරීම.
- ළදරු හා ළමා සෞඛ්‍ය කටයුතු, මාතෘ සෞඛ්‍ය කටයුතු, වෘත්තීය හා පාරිසරික සෞඛ්‍ය කටයුතු, ආහාර පාලනය පිළිබඳ සෞඛ්‍ය කටයුතු හා සනීපාරක්ෂක ආදී රෝග නිවාරණ අංශයේ මූලික කටයුතු විධිමත් හා සැලසුම් සහගත ආකාරයට පළාත තුළ ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය සංවර්ධන සැලසුම් නිර්මාණය කිරීම.
- රෝග ප්‍රතිකාර සේවාවන්ගේ හා රෝග නිවාරණ කටයුතුවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම හා ඇගයීම සඳහා ව්‍යාපෘති සකස් කිරීම.
- බස්නාහිර පළාතේ සියළුම ප්‍රජාවගේ සෞඛ්‍ය නංවාලීමට මැදිහත් වීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

බස්නාහිර පළාත තුළ රෝග නිවාරණ, රෝගී සත්කාර මෙන්ම සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු මූලිකවම සිදුකරනු ලබන්නේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගිනි. මහනගර සභා මගින් ඔවුන්ගේ නාගරික සීමාවන් තුළ පළාත් සභාවේ මඟ පෙන්වීම යටතේ සෞඛ්‍ය සේවා සැපයීම සිදුකරනු ලබයි. මීට අමතරව මෙම පළාත තුළ මධ්‍යම රජයට අයත් ශික්ෂණ රෝහල්, විශේෂිත රෝහල්, ජාතික සෞඛ්‍ය විද්‍යායතන මෙන්ම පෞද්ගලික රෝහල් විශාල සංඛ්‍යාවක් ද පිහිටා ඇත.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන අතර, ඔහුට සහය වීමට කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් පත්කර ඇත. සෞඛ්‍ය සේවාවන් සැපයීමට අමතරව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් මහ රෝහල්, මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල පරිපාලන කටයුතු සම්බන්ධීකරණය ද සිදු කරනු ලබයි.

## 3. සංවිධාන සටහන



## 4. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංක ය | තනතුර | සේවාව | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 1 |
| 2 | නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 1 |
| 3 | ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 3 |
| 4 | නියෝජ්‍ය ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 3 |
| 5 | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 2 |
| 6 | වෛද්‍ය අධිකාරි | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 8 |
| 7 | විශේෂඥ වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 154 |
| 8 | විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 13 |
| 9 | වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1686 |
| 10 | සහන සේවා වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 9 |
| 11 | දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 169 |
| 12 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය) | 1 |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය) | 1 |
| 14 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 11 |
| 15 | ජීව වෛද්‍ය ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 3 |
| 16 | සිවිල් ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 |
| 17 | යාන්ත්‍රික ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 |
| 18 | විදුලි ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 3 |
| 19 | රසායනඥ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 2 |
| 20 | කීට විද්‍යාඥ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 3 |
| 21 | පෝෂණවේදි | දෙපාර්තමේන්තු | 3 |
| 22 | ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධාරී | ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධාරී සේවය | 211 |
| 23 | පරිපාලන නිලධාරි | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 14 |
| 24 | ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය හෙද නිලධාරී | ශ්‍රී ලංකා හෙද සේවය | 6 |
| 25 | හෙද නිලධාරි - මේට්‍රන් | ශ්‍රී ලංකා හෙද සේවය | 31 |
| 26 | මහජන සෞඛ්‍ය හෙද නිලධාරි | ශ්‍රී ලංකා හෙද සේවය | 8 |
| 27 | මහජන සෞඛ්‍ය හෙද ආචාර්ය | ශ්‍රී ලංකා හෙද සේවය | 8 |
| 28 | මහජන සෞඛ්‍ය පරික්ෂක | පැරා වෛද්‍ය සේවය (විශේෂ) | 3 |
| 29 | පාසල් දන්ත චිකිත්සක | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 4 |
| 30 | කොට්ඨාශ ඖෂධවේදී | පරිපූරක වෘත්තීය වෛද්‍ය විද්‍යාඥ | 3 |
| 31 | ඖෂධවේදී (විශේෂ ශ්‍රේණිය) | පරිපූරක වෘත්තීය වෛද්‍ය විද්‍යාඥ (විශේෂ) | 4 |

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 32 | රසායනාගාර තාක්ෂණික නිලධාරී | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 4 |
| 33 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 3 |
| 34 | විකිරණ ශිල්පි | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 35 | ඖෂධ සංයෝජක | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 3 |
| 36 | භෞත චිකිත්සක | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 |
| 37 | ECG සටහන්කරු | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 2 |
| 38 | මහජන සෞඛ්‍ය පරික්ෂක | පැරා වෛද්‍ය සේවය (විශේෂ ශ්‍රේණිය) | 3 |

## 5. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහණයන්

- 2015 වසර තුල පළාත තුල කරන ලද ඉදිකිරීම්, අළුත්වැඩියාවන්, භාණ්ඩ මිලදී ගැනීම් හා විවිධ පුහුණු වැඩසටහන් සඳහා සැලසුම් සකස් කර, අනුමත කර දිස්ත්‍රික්ක අතර බෙදා හැරීම.

බස්නාහිර පළාතේ සෞඛ්‍ය ආයතන තුල 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා 96% ක මුල්‍ය ප්‍රගතියක් හා 100%ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීම සඳහා නිවැරිදි සැලසුම්කරණ ක්‍රමවේද භාවිතා කිරීම නිසා එම ඉලක්ක ජය ගැනීමට හැකි විය. මේ හේතුවෙන් පළාත සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම, ගොඩනැගිලි නවීකරණය කිරීම් හා නව ගොඩනැගිලි ඉදිකිරීම් ක්‍රියාත්මක විය.

- සේවාදායකයින්ගේ විවිධ දේශීය, විදේශීය හා සේවාස්ථ පුහුණු වැඩසටහන් කළමනාකරණය හා වෘත්තීය මට්ටම නංවාලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික්ක 3 හි මාතෘ හා ළමා සෞඛ්‍ය, වසංගත රෝග නිවාරණය හා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් සෑම කාර්තුවකටම වරක් පවත්වා ගැටළු හඳුනාගෙන ඉදිරි පියවර ගැනීම
- ජේඨිය අමාත්‍යාංශය හා පළාත් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් විවිධ දත්ත හා තොරතුරු සපයන්නෙකු ලෙස ක්‍රියා කිරීම
- පළාතේ සේවක පුරප්පාඩු හඳුනාගෙන ඒවා සපුරා ගැනීමට අදාල පියවර ගැනීම
- අවශ්‍යතා මත පරිපාලන පහසුව සහ ක්‍රියාත්මක වීමේ පහසුව අනුව සෞඛ්‍ය පරිපාලන ඒකක බෙදා වෙන් කිරීම. උදා - කොළඹ දිස්ත්‍රික්කයේ පැවති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ බෙදීම
- රෝහල්වල ඇති පරිපාලන ගැටළු සම්බන්ධයෙන් කාර්යක්ෂම විසඳුම් ලබා දීම

- පළාතේ සංවර්ධන සැලසුම් සකස් කර මුල්‍ය ප්‍රතිපාදන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, පළාත් සංවර්ධන ප්‍රදාන, සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධන හා මධ්‍යම රජයේ ප්‍රතිපාදන යන සංරචක මඟින් අනුමත කර ක්‍රියාත්මක කිරීම.
- කසල කළමනාකරණය සම්බන්ධයෙන් වැඩසටහන් මාලාවක් දියත් කිරීම

නිසි ලෙස කසල කළමණාකරණ වැඩපිළිවල යටතේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම හා සීමිත ඉඩකඩ තුළ එළවළු වගාවන් ආරම්භ කිරීම.




කසල වෙන් කිරීම සඳහා "වර්ණ බැග්" ව්‍යාපෘතිය ආරම්භ කිරීම එමඟින් සියළුම සෞඛ්‍ය ආයතන වලට මෙම සංකල්පය හඳුන්වා දීම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම

පළාතේ සියළුම සෞඛ්‍ය ආයතන (165 ) හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත **වර්ණ බැග්** නොමිලේ ලබා දීම. මෙමගින් නිසි ලෙස කසල කළමණාකරණ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම හා කාර්යාල පරිශ්‍රය පොලිතින් භාවිතයෙන් අවම කිරීම. මෙමඟින් අප අවට පරිසරය අලංකාර කිරීම.






- සෑම ආයතනයක් සඳහාම සම්පත් පියසක් නිර්මාණය කිරීම. ඒ සඳහා කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ ශ්‍රම දායකත්වය ලබා ගැනීම.






- බස්නාහිර පළාතේ ප්‍රතිචක්‍රීයකරන්නන්ගේ සංගමය සමඟ අවබෝධතා ගිවිසුමක් සකස් කිරීම හා එම ක්‍රමවේදයට අනුව මධ්‍යස්ථාන 11ක් නිර්මාණයකර කසල එකතු කිරීම හා මිලදී ගැනීම සිදු කිරීම ආරම්භ කිරීම





- අදාළ පාර්ශවයන් (ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ප්‍රතිචක්‍රීයකරන්නන්ගේ සංගමය, සියළුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්) සමඟ උද්වේශන සාකච්ඡා පැවැත්වීම.





- පළාත තුළට බලපැවැත්වෙන පරිදි කසල කළමණාකරණය සම්බන්ධ අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම (චක්‍රලේඛ අංක 01/2015, චක්‍රලේඛ අංක 02/2016)
- සායනික කසල දාහක (INCINARATORS) 05 ක් මිලදි ගැනීමට කටයුතු කිරීම.

 

- ඉ - රෝහල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා ICTA හා

 

- SLIDA ආයතනයන් සමඟ ඒකාබද්ධව නිලධාරීන් පුහුණු කිරීම

ඉ - රෝහල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ICTA ආයතනය ඉලක්ක කරගත් ආයතන 05 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් 215 ක් සඳහා පුහුණු වැඩමුළු පවත්වා එම නිලධාරීන් දැනුවත් කිරීම.

- පළාතේ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඇසේ සුද ඉවත් කිරීමේ **"අඳුරින් එළියට"** වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභීන් 5000 ක් සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ හා සිවිකාව, ඖෂධ මිලදී ගැනීම හා සායන ස්ථාන අළුත්වැඩියා කර අදාළ සායන කටයුතු ආරම්භ කිරීම.
- ඩෙංගු ඇතුළු අනිකුත් රෝග මර්දනය සඳහා ගෘහ සමීක්ෂණ කිරිමේ අරමුණින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව සේවා අවශ්‍යතාවය මත කණිෂ්ඨ කාර්ය මණ්ඩලයෙන් රෝග මර්දන සහායකයින් ලෙස අනුයුක්ත කිරීම



- ඩෙංගු රෝගීන් සිටින ප්‍රදේශ කඩිනමින් හඳුනාගැනීම කාර්යක්ෂම කිරීම සඳහා පෞද්ගලික රෝහල්වල රසායනාගාර හා එක්ව රෝගීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.



Lanka Hospitals

From Dr. Somaratne

To re.rdhs.cb@healthdept.wp.gov.lk, geethi@msn.com, info@healthdept.wp.gov.lk

Date Thu 04:19

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 10/03/16 | 558388 | Mrs.Zhong Lilong | 28 | F | 18 1/ 4 Glen Aber Place Colombo 3 | | 0766903639 0766903648 | Dengue Fever |
| | 558383 | Mr. Ajmal A. Ali | 17 | M | No-351 Warana Rd Thihariya Gampaha | | 0332279460 | Dengue Fever |
| | 556719 | Mrs. Rasika Perera | 52 | F | No-192/2 2nd Lane Egodawatta Rd Boralasgamuwa | | 0112801719 | Dengue Fever |
| | 32280 | Ms. Christina Bernadine Perera | 19 | F | No-25 Hedges Court Colombo 10 | | 0722420430 | Dengue Fever |
| | 558537 | Mrs. Yvonne Watts | 61 | F | 90-02 De Mel Rd | | 0718591870 | Dengue Fever |

- 2015 වර්ෂයේ ජලභීතිකා රෝගය වැළඳීම හේතුවෙන් මරණ 06 ක් සිදුවී ඇත. පළාත තුළ ජලභීතිකා මර්දනයට ප්‍රමුඛතාවය ලබා දෙමින් වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, ඒ යටතේ ගෘහාශ්‍රිත සුනඛයින් හා වීදි සුනඛයින් සඳහා සුනඛ වන්ද්‍යාකරණ කටයුතු විධිමත් කිරීම හා අප පළාත් සභාවට විශේෂිත ක්‍රමවේදයක් ලෙස එන්නත් කරන සියළුම සුනඛයින් හඳුනාගැනීමේ පහසුව සඳහා **රතු කරපටි** පැළඳවීම ක්‍රියාත්මක කරයි. ඒ අනුව 2015 අගෝස්තු මස සිට 2016 අගොස්තු මස දක්වා රතු කරපටියක් පැළඳීම සිදු කරනු ලබයි.





- බස්නාහිර පළාත තුළ සිටින ආබාධ සහිත පුද්ගලයින් සහ වැඩිහිටි පුද්ගලයින් මූලික රෝහල් වලින් ප්‍රතිකාර ලැබීමෙන් පසුව ඉදිරි ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යොමු කිරීම සහ සමාජගත කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස Midway Homes සංකල්පය ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ආරම්භ කර ඇත.

- පළාතේ යෞවන යෞවනියන්ගේ සෞඛ්‍ය ගැටළු, උපදේශණ කටයුතු සඳහා මූලික රෝහල්වල සායන මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම - (YHFS)
  ඒ සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ විශේෂඥ දායකත්වය මඟින් අදාල සෞඛ්‍ය කාර්යමණ්ඩල පුහුණු කිරීම හා මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමත්, එම සේවාව සඳහා අත්‍යාවශ්‍ය අය යොමු කිරීමත් සිදු කරනු ලැබේ. පළාතේ මහ රෝහල් හා සියළුම මූලික රෝහල්වල මෙම සේවාව ආරම්භකර ඇත.

- GBV වැඩසටහන
  ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා සිදුවන හිංසනය වැලැක්වීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මහ පෙන්වීම මත සෞඛ්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම හා ඒ සඳහා මැදිහත්වීම සඳහා අවශ්‍ය උපදේශණ සේවාව උපරිම රහස්‍යභාවය ආරක්ෂා කරමින් සැපයීම සඳහා විශේෂ පුහුණුව ලත් කාර්ය මණ්ඩලයකින් යුත් සායනයන් පළාතේ සෑම මහ රෝහලක් හා මූලික රෝහලකම ක්‍රියාත්මක වේ.

## 6. ඵලදායීතාවය

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 3 සහ එයට අනුයුක්ත කාර්යාල සඳහා ඵලදායීතා සංකල්පය හඳුන්වා දෙන ලදී. ඒ අනුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයන්, ඇතැම් රෝහල් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ඵලදායීතා සම්මාන දිනා ගන්නා ලද මට්ටමට පත්ව ඇති අතර, ඵලදායීතා ලේකම් කාර්යාලය මඟින් මෙහෙයවන 2015 ඵලදායීතා සම්මාන තරඟාවලියට අයදුම් කර අන්තර් දෙපාර්තමේන්තු අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයත් පානදුර මූලික රෝහලත් සමත් වී ඇත. එසේම කටුගහහේන ප්‍රාදේශීය රෝහල ද විශේෂ ඵලදායීතා ඇගයීම් සම්මානයකින් පිදුම් ලබන ලදි. එමෙන්ම කාර්යාලවල මනා පුද්ගල සම්බන්ධතාවයක් මෙන්ම මහජන සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා නව ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.





- **නිලධාරීන්ට පුහුණු වීම් ලබා දීමට කටයුතු කිරීම**

ප්‍රධාන ලේකම් කාර්යාලය, ඵලදායීතා ලේකම් කාර්යාලය හා විවිධ ආයතන මගින් පුහුණුවීම් අවස්ථා නිලධාරීන් වෙත ලබා දීම මින් නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කර ගැනීමට අවස්ථාව සලසා දීම, විශේෂයෙන්ම කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන ලද වැඩසටහන් සඳහා ඔවුන් මනා තෘප්තියකින් ඇගයීම් කිරීම





- **ඵලදායී සේවයක් ලබා දීමට ඉවහල් වන මානසික තෘප්තිය සඳහා සුදුසු කාර්යාලීය පරිසරයක් ගොඩ නැගීමට කටයුතු කිරීම**

කාර්යාලයේ බාහිර පරිසරය අලංකරණය කිරීමට හා වඩා විධිමත් කිරීමට කටයුතු කිරීම මගින් නිලධාරීන් තුළ ප්‍රියජනක මානසිකත්වයක් ගොඩ නැගීම හා එමින් ඇතිවන උත්තේජනය ඵලදායී රාජකාරී මානසිකත්වයකට ඉවහල් වීම.





## 7. සේවක සුභ සාධනය

- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ඇතුළු පළාතේ සියළුම සෞඛ්‍ය ආයතනයන්හි සේවක සුභ සාධනය සඳහා සුභ සාධක සංගම් පිහිටුවා ගෙන ඇති අතර, එමගින් අවුරුදු උත්සව, සර්වාගමික උත්සව හා ක්‍රීඩා උත්සව ආදිය සංවිධානය කරනු ලබයි. එසේම රෝහල් වල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල සේවකයින් ඇගයීම සඳහා විවිධ වැඩ සටහන් සංවිධානය කර ඇත.

මෙයට අමතරව ජීවන නිපුණතා වැඩසටහන්, ධනාත්මක චින්තන වැඩසටහන් සහ ඔවුන්ගේ රාජකාරී වලට ඍජුවම සම්බන්ධ වන කුසලතා වර්ධන වැඩසටහන්ද සංවිධානය කර ඇත.





- සර්වාගමික උත්සව පැවැත්වීම

ආයතනය තුළ සිටින නිලධාරීන් විවිධ ආගම් වලට අයත් බැවින් සියලුම ආගම් සමරා උත්සව පැවැත්වීම තුළින් නිලධාරීන් අතර අන්‍යොන්‍ය සුහදතාවය වර්ධනය කිරීම. නත්තල් ගීතිකා හා බැති ගී ගැයීම වැනි වැඩසටහන් වලදී කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින්ම සංගීතය ගායනය සිදු කරන බැවින් නිලධාරීන්ගේ දක්ෂතා හඳුනාගැනීමට හා අගය කිරීමට අවස්ථා සැලසීම හා ඔවුන්ගේ මානසික තෘප්තිය වර්ධනය වීම







- ආගමික උත්සව, අවුරුදු උත්සව, විනෝද චාරිකා හා සුභ සාධක සමිතිය මගින් සංවිධානය කරන ලැබූ නාට්‍ය දර්ශන ආදිය පැවැත්වීම.

නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් ඇති වීම හා සුහදශීලීත්වයක් ගොඩ නැගීම හා ආයතනය කෙරෙහි සාමූහික හැගීමක් ඇතිවීම ආයතනයේ ඵලදායීතාවයට ඉවහල් වීම.

- කාර්ය මණ්ඩලයේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා විවිධ විෂයයන්ට අදාල දේශණ පැවැත්වීම.

නිලධාරීන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය සම්බන්ධයෙන් හා විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාල දේශණ සංවිධානය කිරීම මගින් ආයතනය තුළ ඵලදායී සංස්කෘතියක් ගොඩ නැගීම.

උදා - මානසික සෞඛ්‍ය සම්බන්ධ දේශණ
සම්පත් පරිභෝජනය සම්බන්ධ දේශණ

- කාර්ය මණ්ඩලය සඳහා මාසික කාර්ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම මගින් සෑම විෂයයකට අදාල ගැටළු සාකච්ඡා කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම, වගකීම් පැවරීම, පසු විපරම හා නව යෝජනා විමසීම ආදී දෑ මගින් වඩා ඵලදායී රාජකාරී වටපිටාවකට යොමු වීම.

## 8. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- පළාතේ කසල කලමනාකරණය, ඩෙංගු මර්ධනය, ක්ෂය රෝග මර්ධනය, ලාදුරු මර්ධනය සහ ජලභීතිකා මර්ධනය සඳහා රෝග මර්ධන සහායකයින් පත් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරිය සමඟ රෝහල්වල ආසාදිත කසල කලමනාකරණය විධිමත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කිරීම
- අභ්‍යන්තර රෝග හා මරණ වාර්තා වඩා කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා eIMMR වැඩසටහන දියත් කිරීම
- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මඟින් පළාතේ සෞඛ්‍ය ආයතන වෙත කරනු ලබන නිල දැනුම් දීම්, නිල නිවේදන ක්ෂණිකව දැනුම් දීමේ ක්‍රමයක් ඇති කිරීම
- දත්ත කළමනාකරණ වැඩසටහනක් සකස් කිරීම මඟින් අඩු කාලයක් තුල කාර්යක්ෂම අයුරින් දත්ත විශ්ලේෂණය, සම්පිණ්ඩනය කොට ඉක්මණින් තීරණ ගැනීමේ ක්‍රමයක් ඇති කිරීම
- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට ඊ-මේල් ලිපිනයන් හඳුන්වා දීම මඟින් ඉක්මනින් ලිපි ගණුදෙනු කිරීමේ කාර්යක්ෂම ක්‍රමවේදයකට එළඹීම

## 9. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

2015 වර්ෂය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් විගණන විමසුම් 17 ක් ලැබී තිබූ අතර ඒ සියල්ලටම පිළිතුරු සපයා ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති විගණන විමසුම් 18 න් 03 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

**9.2**

# බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

බස්නාහිර පළාතේ ජනතාවට හිතායු සුඛායු දීඝායු ලබාදෙන විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම.

### 1.2 මෙහෙවර

ආයුර්වේද, යුනානි, සිද්ධ හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමයන් යොදාගෙන බස්නාහිර පළාතේ ජනතාවට යහපත් සෞඛ්‍ය තත්වයක් ලබාදීම හා එකී වෛද්‍ය ක්‍රමයන් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම

### 1.3 කාර්යයන්

- දේශිය වෛද්‍ය සේවා සපයන රෝහල්, බෙහෙත් ශාලා සහ දේශීය වෛද්‍ය ක්‍රමයන්ට අනුව රෝගීන්ට ප්‍රතිකාර කිරීම පිණිස අවශ්‍ය වෙනත් ආයතන පිහිටුවීම, එම ආයතන තුළින් ඵලදායී හා කාර්යක්ෂම දේශීය වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාම හා නියාමනය කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය අනුව පළාතේ ජනතාවගේ සෞඛ්‍ය වර්ධනය කිරීම පිණිස සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.
- රෝග සත්කාරක සේවා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- දේශීය වෛද්‍ය ආයතන වල සේවය කරන කාර්ය මණ්ඩල වලට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දීම.
- ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතු වල යෙදෙන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන, අර්ධ රාජ්‍ය ආයතන සහ රජයට සම්බන්ධ ආයතන ලියාපදිංචි කිරීම හා එම කටයුතු කරගෙන යාමේදී අදාළ ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ, ප්‍රමිතීන් හා නිර්ණායකයන් නියම කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම.
- ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම.

- ඖෂධ පැළෑටි වගා කිරීමට උනන්දු කරවීම හා ඒ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම.
- ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ඖෂධ නිෂ්පාදනාගාර පිහිටුවා පවත්වා ගෙන යාම හා දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යනු ලබන ආයතන සඳහා ඖෂධ බෙදා හැරීම.
- පළාතේ ජනතාවගේ ප්‍රජා සෞඛ්‍ය සේවාව පුළුල් කිරීම මඟින් වසංගත රෝග පාලනය කිරීම හා හදිසි ව්‍යසන අවස්ථා වලදී සේවා සැපයීම.
- ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව දේශීය වෛද්‍ය සේවාවන්ට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනයට උනන්දු කරවීම හා ඒ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම.
- ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පළාතේ දේශීය වෛද්‍ය සේවා සපයනු ලබන රාජ්‍ය හෝ නොවන ආයතන, අර්ධ රාජ්‍ය ආයතන සහ රජයට සම්බන්ධ ආයතන හා ඖෂධ නිෂ්පාදනාගාර වල කටයුතු සිදු කරන්නේ ද යන්න පරීක්ෂා කිරීම, උපදෙස් ලබා දීම හා අනුබල දීම.
- පළාතේ ජනතාවගේ සෞඛ්‍යය හා එය නංවාලීම පිණිස සලකනු ලබන දේශීය වෛද්‍ය සේවාවන්ට අදාළ තොරතුරු එක්රැස් කිරීම හා ප්‍රචලිත කිරීම.
- දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳව තොරතුරු එක් රැස් කිරීම, සංරක්ෂණය කිරීම හා වැඩි දියුණු කිරීම.
- දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පිණිස රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව සංවර්ධන කාර්යයන් සඳහා දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍ය හෝ ද්‍රව්‍ය ආධාර ලබා ගැනීම හා/හෝ තාක්ෂණ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති නිර්ණය කිරීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

පළාත් සභා ක්‍රමය ඇතිවීමත් සමඟ 1988/08/01 දින මෙම ආයුර්වේද දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටවනු ලැබීය. මෙහි ප්‍රධාන කාර්යය වන්නේ බස්නාහිර පළාතේ ජනතාවගේ සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කිරීමයි. ඒ සඳහා රෝග නිවාරණ සේවා සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සෑම වර්ෂයකම සිදු කෙරේ. මෙම දෙපාර්තමේන්තුව යටතේ පහත ආයතන පවතී.

| | |
|---|---|
| • පළාත් රෝහල් | 01 |
| • දිස්ත්‍රික් දේශීය වෛද්‍ය රෝහල් | 03 |
| • ග්‍රාමීය ආයුර්වේද රෝහල් | 05 |
| • විශේෂිත පංචකර්ම ප්‍රතිකාර මධ්‍යස්ථානය | 02 |
| • මධ්‍යම බෙහෙත් ශාලා | 18 |
| • දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන හා බහුකාර්ය චිකිත්සීය මධ්‍යස්ථාන | 02 |
| • සායන මධ්‍යස්ථාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට | 4x40=160 |

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් ආයුර්වේද කොමසාරිස් | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය (පාලන I ) | 1 |
| 2 | සහකාර/නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස් | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය (පාලන II ) | 2 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III / II ශ්‍රේණිය) | 1 |
| 4 | පළාත් රෝහල් අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය (I ශ්‍රේණිය) | 1 |
| 5 | වෛද්‍ය අධිකාරී | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 3 |
| 6 | විශේෂඥ වෛද්‍ය නිලධාරී | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 11 |
| 7 | කාර්ය භාර වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 6 |
| 8 | වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 109 |
| 9 | ප්‍රජා සෞඛ්‍ය සේවා අධීක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 01 |
| 10 | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 43 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහනයන්

- **රෝග නිවාරණ සේවාව පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම**

බස්නාහිර පළාත්වාසී ජනතාවගේ සෞඛ්‍ය තත්වය නංවාලීම තුළින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම සඳහා ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා මඟින් අභ්‍යන්තර හා බාහිර රෝගී ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

| ප්‍රතිකාර | රෝගීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | **2014** | **2015** |
| බාහිර රෝගී ප්‍රතිකාර | 845459 | 565112 |
| අභ්‍යන්තර රෝගී ප්‍රතිකාර | 3535 | 4542 |

- **විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

2015 වර්ෂයේ බෝ නොවන රෝග වලින් වැලකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශීය ආහාර ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා පාරම්පරික වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. එම වැඩසටහන් වල ප්‍රගතිය පහත දක්වා ඇත.

**ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සේවාවේ ප්‍රගතිය - 2015 (කොළඹ, ගම්පහ, කළුතර)**

| වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | මුළු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 1) **බෝනොවන රෝග වැළැක්වීම** | පාසල් දරුවන් / ගුරුවරුන් දැනුවත් කිරීම | 378 | 9351 |
| | පෙර පාසල් දරුවන් / ගුරුවරුන් දැනුවත් කිරීම | 157 | 5278 |
| | රාජ්‍ය සේවකයන් දැනුවත් කිරීම | 103 | 4468 |
| | වැඩිහිටි / කාන්තා / වෙනත් සංවිධාන | 85 | 13746 |
| 2) **යෝග වැඩසටහන්** | පාසල් / පෙර පාසල් දරුවන් / ගුරුවරුන් | 280 | 3426 |
| | රාජ්‍ය නිලධාරීන් / වැඩිහිටි / කාන්තා | 243 | |
| 3) **ඔසු උයන් කටයුතු** | පාසල් / පෙර පාසල් දරුවන් / ගුරුවරුන් රාජ්‍ය නිලධාරීන් / වෙනත් | 165 | |
| 4) **බෝනොවන රෝග වැළැක්වීම** (ඩෙංගු මර්ධන වැඩසටහන් ප්‍රධානව) | පාසල් දරුවන් / ගුරුවරුන් දැනුවත් කිරීම | 82 | 4800 |
| | පෙර පාසල් දරුවන් / ගුරුවරුන් දැනුවත් කිරීම | 8 | |
| | රාජ්‍ය සේවකයන් දැනුවත් කිරීම | 33 | |
| | වැඩිහිටි / කාන්තා / වෙනත් සංවිධාන | 66 | |
| 5) **මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන්** | අවු: 5 ට අඩු දරුවන්ගේ මව්වරු | 205 | 6700 |
| | ගර්භණී මව්වරු සඳහා | 32 | |
| 6) **සංරක්ෂණ සහා වැඩසටහන්** | පාරම්පරික වෛද්‍යවරුන් සඳහා | 115 | 976 |
| 7) **සුව පියස වැඩසටහන්** | ආයුර්වේද ස්වේච්ඡා බලකාය පුහුණු වැඩසටහන් | 172 | 589 |

| වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | මුළු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 8) ස්ථිර සායන | ග්‍රාමීය හා නාගරික ප්‍රජාව | 6311 | 48325 |
| 9) ජංගම සායන | ග්‍රාමීය හා නාගරික ප්‍රජාව | 108 | 7431 |
| 10) ජාත්‍යන්තර හා ජාතික දින වැඩසටහන් | ග්‍රාමීය හා නාගරික ප්‍රජාව | 53 | |
| 11)වෙනත් | ග්‍රාමීය හා නාගරික ප්‍රජාව | 1826 | |
| | මුළු එකතුව | **10422** | **100591** |

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර |
|---|---|---|---|
| මුළු වැඩසටහන් ගණන | **1912** | **2717** | **2673** |
| මුළු ප්‍රතිලාභීන් ගණන | **68765** | **81764** | **76798** |

### විශේෂ වැඩසටහන්

වෙනත් ක්‍රියාකාරකම්

- ඉඩම් නිරවුල් කර ගැනීම සහ අත්පත්කර ගැනීම් සිදු කිරීම
- උත්සව අවස්ථාවන් සඳහා ඔසුපැන් හා කොළකැඳ ලබාදීම
- ඔසු උයන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

## 5. ඵලදායිතාවය

- 2015 දී ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවල කාර්ය භාර වෛද්‍ය නිලධාරීන් සඳහා පූර්ණ තත්ව කළමනාකරණ දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- ප්‍රධාන කාර්යාලයේ සහ රෝහල් කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම
- විෂයානුබද්ධව කාර්ය සාධන සැලැස්ම සකස් කරමින් ස්වයං ඇගයීමට ලක් කිරීම.

## 6. සේවක සුභ සාධනය

- බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් වර්ෂ 7ක පමණ කාලයක සිට ආයතනයේ සේවය කරන සේවකයන්ගේ සුභ සාධනය සහ ජීවන තත්වය උසස් කිරීම සඳහා සුභ සාධක සංගමයක් පවත්වා ගෙන යාම.
- භෛසජ්ජකවරුන් ඩිප්ලෝමා පාඨමාලා සඳහා යොමු කිරීම

## 7. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා නව විද්‍යුත් තැපැලක් ආරම්භ කිරීම, ආයුර්වේද රෝහල් හා වෙනත් ආයතන සමඟ විද්‍යුත් තැපැල මඟින් ලිපි යැවීම
- ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීමට නව ව්‍යාපෘති සකසමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 8. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

| | සංඛ්‍යාව | පිළිතුරු සැපයීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|
| | | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
| අභ්‍යන්තර විගණන විමසුම් | 32 | 10 | 8 | 2 | 4 |
| විගණකාධිපතිගේ විගණන විමසුම් | 4 | - | 01 | 03 | - |

# 9.3 බන්ධනාගිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම
දරුවන්ගේ ලෝකයට වඩාත් හොඳ හෙට දවසක්.

### 1.2 මෙහෙවර
අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක්වූ දරුවන්ගේ කායික මානසික සහ සෞඛ්‍ය වර්ධනය සමඟ ළමා අයිතීන් සහතික වන පරිසරයක් තුළ භාරය, ආරක්ෂාව හා රැකවරණය සැලසීම පුනරුත්ථාපනය සහ අනාගත ජීවනෝපාය මාර්ග හෙළි පෙහෙළි කිරීම මෙන්ම විවිධ ආධාර හරහා පළාතේ අඩු ආදායම්ලාභී දරුවන්ගේ අධ්‍යාපනයට දිරි දීම, ප්‍රජාව දැනුවත් කිරීම සහ පරිවාස භාරයට පත් වරද කරුවන් පුනරුත්ථාපනය.

### 1.3 කාර්යයන්
- අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන්ට මානසික හා කායික රැකවරණය සැලසීම.
- ළමුන් ආයතන ගත වීම අවම කිරීම.
- ආයතන ගත වූ ළමුන් සමාජ ගත කිරීම.
- දෙපාර්තමේන්තු සැලසුම් හා කළමනාකරණ මට්ටම ඉහළ නැංවීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම
ශ්‍රී ලංකාවේ පරිවාස සේවය හා බන්ධනාගාර සේවය එක් දෙපාර්තමේන්තුවක් යටතේ 1945 මාර්තු 12 වනදා ආරම්භ විය. ඊට පෙර 1919 අවුරුද්දේ සිට අධිකරණ පද්ධතිය හරහා මෙම සේවය පවත්වාගෙන ගොස් ඇත.

පරිවාස සේවා කටයුතු බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියාත්මක වන අවධියේ මෙම දෙපාර්තමේන්තුව බන්ධනාගාර සහ පරිවාස දෙපාර්තමේන්තුව යන නමින් හඳුන්වනු ලැබීය. 1987 වර්ෂයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමගම මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු

සම්පූර්ණයෙන්ම පළාත් විෂයක් බවට පත්විය. ඒ අනුව 1990 ජනවාරි 01 වන දින සිට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පළාත් සභාව මගින් ක්‍රියාත්මක විය. ගතවූ කාලය තුළ බස්නාහිර පළාත් සභාව මෙම දෙපාර්තමේන්තුවේ දියුණුවට විශාල මෙහෙවරක් කරන ලදී. ඒ අනුව මෙම පළාතේ අඩු පහසුකම් භුක්ති විඳින දරුවන්ගේ අනාගතය යහපත් කිරීම යටතේ විවිධ ආකාරයෙන් උපකාර මෙම දෙපාර්තමේන්තුව හරහා සිදු කරමින් පවතී.

දරුවන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම රජයේ ප්‍රධාන වගකීමකි. මෙම කාර්යයේදි රජය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ යම් යම් සමාජයීය ප්‍රශ්න හේතුවෙන් දෙමව්පියන් අහිමිව අනාථ සහ අසරණභාරයට පත් වූ හා විවිධ අපයෝජකයක්ට ලක්ව අසරණවූ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්නේ කෙසේද යන්නයි. රජයේ එකී කාර්යභාරය ඉටුකරනු ලබන්නේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවයි.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය ) | 1 |
| 2 | සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III / II ශ්‍රේණිය) | 1 |
| 3 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 4 | පරිවාස නිලධාරී | දෙපාර්තමේන්තුමය (II / I ශ්‍රේණිය) | 86 |

## 4. ඉටු කරන ලද සේවාවන්

### 4.1 අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ දූ දරුවන්ගේ කායික මානසික රැකවරණය සැලසීම.

- ළමුන් සඳහා ආයතනික පහසුකම් සැලසීම.

| ආයතනය | 2015.12.31 දිනට ළමුන් සංඛ්‍යාව |
|---|---|
| සහතික කල පාසල (බාලක) මාකොළ | 71 |
| සහතික කල පාසල (බාලිකා)රම්මුතුගල | 58 |
| රැඳවුම් නිවාසය (බාලක) මාකොළ | 27 |
| රැඳවුම් නිවාසය (බාලිකා) රම්මුතුගල | 126 |
| ප්‍රජාපතී ළමුන් භාර ගැනීමේ රජයේ මධ්‍යස්ථානය පානදුර | 72 |
| ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන (120) | 3413 |
| ස්වේච්ඡා අනුමත පාසල මග්ගොන | 05 |
| ස්වේච්ඡා රැඳවුම් නිවාසය (නිසල දිය සෙවන)මීගමුව | 126 |
| ස්වේච්ඡා රැඳවුම් නිවාසය (ගැලවීමේ හමුදාව) | 21 |
| එකතුව | **3919** |

2015 වර්ෂයේ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ දරුවන් 3919 කට රැකවරණය සලසා ඇත.

- අධිකරණය මඟින් යොමු කරන ළමුන් පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීම.

| | 2015 වර්ෂය ආරම්භයේ සිටි ළමුන් සංඛ්‍යාව | 2015.12.31 දක්වා ඇතුළත් කල ළමුන් සංඛ්‍යාව | 2015 වසර තුළ පුනරුත්ථාපනය ලබා පිටවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| සහතික කල පාසල (බාලිකා) රම්මුතුගල | 35 | 43 | 20 |
| සහතික කල පාසල (බාලක) මාකොළ | 19 | 126 | 85 |
| ස්වේච්ඡා අනුමත පාසල මග්ගොන | 15 | 111 | 119 |
| | 69 | 280 | 224 |

2015 වසරේ අධිකරණය මඟින් යොමු කරන ළමුන් 224 දෙනෙක් පුනරුත්ථාපනය කර සමාජ ගත කර ඇත.

- අධිකරණය නියෝග මත ළමුන්ට තාවකාලික රැඳවුම් භාරය හා පහසුකම් ලබා දීම.

| | 2015 වර්ෂය ආරම්භයේ සිටි ළමුන් සංඛ්‍යාව | 2015.12.31දක්වා ඇතුළත් කල ළමුන් සංඛ්‍යාව | 2015 වසර තුළ පුනරුත්ථාපනය ලබා පිටවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| රැඳවුම් නිවාසය (බාලක) මාකොළ | 14 | 366 | 353 |
| රැඳවුම් නිවාසය (බාලිකා) රම්මුතුගල | 19 | 126 | 85 |
| ස්වේච්ඡා රැඳවුම් නිවාසය (නිසල දිය සෙවන) | 15 | 111 | 119 |
| ස්වේච්ඡා රැඳවුම් නිවාසය (ගැලවීමේ හමුදාව) | 43 | 189 | 192 |
| එකතුව | 91 | 792 | 749 |

2015 අධිකරණය නියෝග මත ළමුන් 792 දෙනෙක් සඳහා ආරක්ෂාව සහ පහසුකම් සලසා ඇත.

- 2015 වසරේ රජයේ ළමුන් භාර ගැනීමේ ප්‍රජාපතී මධ්‍යස්ථානය හරහා ළමුන් 85 ක් සඳහා රැකවරණය සලසා ඇත.
- 2015 වර්ෂය තුළදී රැකවරණය සලසන ලද ළමා මව්වරුන් සංඛ්‍යාව 32 කි.
- ළමුන්ගේ සුබසාධනය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් ආධාර / දීමනා ලබා දීම.

| දීමනාව | 2015 වසරේ වැය කල මුදල |
|---|---|
| සිසුමිණ ශිෂ්‍යාධාර | 6,130,007.00 |
| සුදුසු පුද්ගල ආධාර | 350,961.70 |
| පාලක පාලිකා දිරි දීමනා | 392,000.00 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යථායෝග්‍යාධාර | 4,747,247.29 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා නඩත්තු ආධාර | 15,667,189.00 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා යථායෝග්‍යාධාර | 303,917.00 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා නඩත්තු ආධාර | 820,406.00 |
| අඩු ආදායම්ලාභී දරුවන්ට පාසල් උපකරණ කට්ටල් බෙදාදීම | 2,496,501.19 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ට මැහුම් උපකරණ ලබාදීම. | 642,000.00 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථානවල අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ආධාර | 1,497,006.13 |
| **එකතුව** | **33,047,235.31** |

- ළමා වරදකරුවන් හා වින්දිතයින් වෙනුවෙන් දෙපාර්තමේන්තුව පැය 24 පුරා ක්‍රියාත්මක විශේෂ පරිවාස ඒකකයක් පවත්වාගෙන යනු ලබයි. මේ හරහා ඔවුන්ට ක්ෂණිකව අවශ්‍ය සහනයන් සැලසීම ප්‍රධාන අරමුණ වේ.

## 4.2 ළමුන් ආයතනගත වීම අවම කිරීම.

- **පරිලෝචන නියෝග යටතේ ළමුන් සමාජය තුළ රැක බලා ගැනීම.**

**පරිලෝචන නියෝගයක් යනු : -**

යම් ළමයෙකු වෙනුවෙන් භාරය හා ආරක්ෂාව සැලැස්විය යුතු යයි තීරණය කරන්නේ නම් එවැනි ළමයෙකු ඥාතියෙකු නොවන හෝ යෝග්‍ය පුද්ගලයෙකුගේ සැලකිල්ලට හා රැකවරණයට පත් කිරීමයි. මෙම කාර්ය පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

| පරිවාස කාර්යාලය | පරිලෝචන නියෝග සංඛ්‍යාව. |
|---|---|
| කොළඹ | 11 |
| බත්තරමුල්ල | 05 |
| ගල්කිස්ස | 26 |
| හෝමාගම | 14 |
| අවිස්සාවේල්ල | 155 |
| ගම්පහ | 105 |
| මීගමුව | 75 |
| පූගොඩ | 82 |
| කළුතර | 40 |
| පානදුර | 50 |
| හොරණ | 78 |
| මතුගම | 64 |
| **එකතුව** | **705** |

2015 වසරේ පරිලෝචන නියෝග යටතේ ළමුන් 705 ක් රැකවරණය ලබා ඇත.

- **පරිවාස නියෝග යටතේ ළමුන් හා වැඩිහිටියන් සමාජය තුළ තබා රැක බලා ගැනීම.**

පරිවාසිකයින් වශයෙන් ළමුන් පමණක් නොව වැඩිහිටියන්ද අධිකරණ නියෝග මත පරිවාස භාරයට පත් කරනු ලබයි.

| පරිවාස කාර්යාලය | 2015 වසරේ පරිවාසිකයින් ගණන |
|---|---|
| කොළඹ | 38 |
| බත්තරමුල්ල | - |
| ගල්කිස්ස | 10 |
| හෝමාගම | 11 |
| අවිස්සාවේල්ල | - |
| ගම්පහ | 03 |
| මීගමුව | 01 |
| පූගොඩ | - |
| කළුතර | 01 |
| පානදුර | 02 |
| හොරණ | - |
| මතුගම | 07 |
| එකතුව | 73 |

2015 වසරේ පරිවාසිකයින් වශයෙන් පුද්ගලයන් 73 ක් සඳහා රැකවරණය සලසා ඇත.

- **බස්නාහිර පළාත් අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ට අධ්‍යාපන උපකරණ කට්ටල් ලබා දීම මඟින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නංවා ලීම හා නිවාසගතවීම අවම කිරීම.**

| වර්ෂය | උපකරණ ලබාදුන් ශිෂ්‍ය සංඛ්‍යාව | ආධාර මුදලේ වටිනාකම |
|---|---|---|
| 2015 | 295 | 3500000/- |

- **බස්නාහිර පළාත් අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ට සිසුමිණ ශිෂ්‍යාධාර ලබාදීම මගින් ඔවුන් නිවාසගත කිරීම අවම කිරීම.**

| වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | ආධාර මුදලේ වටිනාකම |
|---|---|---|
| 2015 | 964 | 6130007/- |

- **ළමා අපයෝජන හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ළමුන්ට සිදුවන හානි අවම කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම.**

| දිස්ත්‍රික්කය | අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් සංඛ්‍යාව | | මත්ද්‍රව්‍ය වැළැක්වීමේ වැඩසටහන් සංඛ්‍යාව | | සහභාගීත්වය | වියදම |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014/2015 | 2014/2015 |
| කොළඹ | 6 | 6 | 6 | 10 | 3020 | 394710.00 |
| ගම්පහ | 2 | 8 | 2 | 1 | 710 | 126775.00 |
| කළුතර | 2 | 18 | 3 | 2 | 1960 | 234500.00 |
| එකතුව | 10 | 28 | 11 | 13 | 5690 | 372170.00 |

- **පවුල් ගැටුම් නිරාකරණය**

2015 වසර තුළ පරිවාස නිළධාරීන් මැදිහත් වී විසඳන ලද පවුල් ගැටුම් සංඛ්‍යාව 200කි. මේ ආකාරයට පවුල් ගැටුම් නිරාකරණය සඳහා පරිවාස නිළධාරීන් මැදිහත් වීම තුළින් පවුල් ගැටුම් හේතුවෙන් අසරණ භාවයට හා පරිවාස භාරයට පත්වීමට ඉඩ ඇති දරුවන් සංඛ්‍යාව අවම කර ගැනීම අපේක්ෂා කෙරේ.

| පරිවාස කාර්යාලය | 2015 වසරේ පරිවාස නිලධාරීන් මැදිහත් වූ පවුල් ගැටුම් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 15 |
| බත්තරමුල්ල | 12 |
| ගල්කිස්ස | 12 |
| හෝමාගම | 05 |
| අවිස්සාවේල්ල | 15 |
| ගම්පහ | 51 |
| මීගමුව | 01 |
| පූගොඩ | 13 |
| කළුතර | 41 |
| පානදුර | 10 |
| හොරණ | 20 |
| මතුගම | 05 |
| එකතුව | 200 |

- **අධිකරණයට සහාය වීම.**

ළමුන් සම්බන්ධයෙන් අධිකරණයෙන් ගනු ලබන තීරණ සඳහා පරිවාස නිලධාරින්ගේ නිර්දේශය විනිශ්චයකාරවරුන් විසින් සලකා බලනු ලැබේ. මෙහිදී අධිකරණ මඟින් ළමුන් සම්බන්ධයෙන් වඩාත් නිවැරැදි තීරණයක් ලබා දීම සඳහා පරිවාස නිලධාරීන්ගේ නිර්දේශය සලකා බැලීම වැදගත් වේ.

| පරිවාස කාර්යාලය | 2015 වසරේ පරිවාස නිලධාරීන් විසින් අධිකරණයට ඉදිරිපත් කල වාර්තා සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 445 |
| බත්තරමුල්ල | 405 |
| ගල්කිස්ස | 147 |
| හෝමාගම | 97 |
| අවිස්සාවෙල්ල | 169 |
| ගම්පහ | 527 |
| මීගමුව | 347 |
| පූගොඩ | 78 |
| කළුතර | 270 |
| පානදුර | 345 |
| හොරණ | 154 |
| මතුගම | 212 |
| එකතුව | 3196 |

## 4.3 ආයතනගත වූ ළමුන් සමාජ ගත කිරිම.

- **ආයතන ගත වූ ළමුන් දෙමාපියන්ට ඥාතීන්ට භාරකරුවන්ට භාර දීම**

අනාථ, අසරණභාවයට පත් වූ ළමුන් ආයතනගත කිරීම තාවකාලික ක්‍රියාමාර්ගයක් වන අතර ඔවුන් ආයතනගත කළ හැකි කාලය වසර 2 කි. ඉන්පසු සමාජගත කිරීමට උත්සාහ කරනු ලබන අතර, එසේ කළ නොහැකිවූ විට නැවත නිවාසයේ කාලය දීර්ඝ කිරිම සිදුකෙරේ. ආයතන තුළින් නිසි පුනරුත්ථාපනයක් ලබා ඔවුන් නැවත සමාජයට මුදා හරිනු ලබයි. 2015 වසරේ මේ ආකාරයට සමාජගත කළ ළමුන් සංඛ්‍යාව 300 කි.

- **නීත්‍යානුකූලව දරුවන් දරුකමට හදාවඩා ගැනීමට භාර දීම.**

දරුවන් නීත්‍යානුකූලව ලබා ගැනීම සඳහා 2015 වසරේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 71 කි. 2015 දක්වා ලියාපදිංචි මුළු අයදුම්කරුවන් ගණන 2313කි. මේ ආකාරයට ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා දරුවන් නීත්‍යානුකූලව අධිකරණය මාර්ගයෙන් භාර දීම සිදු කරයි. මෙමඟින් දෙමව්පියන් අහිමි දරුවන්ට ස්ථිර භාරකාරීත්වයක් යටතේ අනාගත අභිවෘද්ධිය සලසා ගැනීමට හැකියාව ලැබේ. 2015 වසර තුළ මේ ආකාරයට දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් හදාවඩා ගැනීම සඳහා ලබා දුන් දරුවන් සංඛ්‍යාව 48 දෙනෙකි.

- **රජයේ මධ්‍යස්ථාන වල ආයතන ගත ළමුන්ගේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව වැඩි දියුණු කිරීම**

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතනයන්හි පහත දැක්වෙන වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි.

- **වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශකවරුන් මගින් NVQ සහතික ලබාදීම සඳහා පවත්වන පාඨමාලා**
    - ජුකී මැෂින් පාඨමාලාව
    - වෙල්ඩින් පාඨමාලාව
- **උපදේශකවරුන් යොදවා පවත්වනු ලබන පාඨමාලා**
    - මනාලියන් හැඩගැන්වීමේ පාඨමාලාව
    - කේක් පාඨමාලාව
    - සාරි හැඩගැන්වීමේ පාඨමාලාව
    - විදුලි කාර්මික පාඨමාලා
    - පරිගණක පාඨමාලා
    - මූර්ති පාඨමාලා
    - සූප ශාස්ත්‍ර පාඨමාලා
    - බේකරි පාඨමාලා
- **ආකල්ප වර්ධනය හා රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම.**
    - දරුවන්ගේ ආකල්ප වර්ධන වැඩමුළු පැවැත්වීම.
    - රස වින්දනාත්මක වැඩ සටහන් පැවැත්වීම.

## 4.4 දෙපාර්තමේන්තු සැලසුම් හා කළමනාකරණ මට්ටම් ඉහළ නැංවීම.

2015 වසරේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ පළාත් සංවර්ධන ප්‍රදාන වැඩසටහන් යටතේ දෙපාර්තමේන්තුව මගින් පාලනය වන ළමුන් නේවාසිකව සිටින ආයතන වල සහ පරිවාස කාර්යාල වල සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම් තුළින් ආයතනගත ළමුන් සඳහා ජීවත්වීමට සුදුසු ස්ථානයක් ඇති කිරිමට පහසුකම් සලසා ඇත. 2015 වසරේ සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් වැය කිරීම් පහත පරිදි සිදුකර ළමා මිතුරු පරිසරයක් නිර්මාණය කර ඇත.

| අංශය | වැය වූ මුදල |
|---|---|
| රජයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල අළුත් වැඩියා කටයුතු සිදු කිරීම. | 15,134,758.88 |
| පරිවාස කාර්යාල වල අළුත් වැඩියා කටයුතු සිදු කිරීම. | 10,817,067.44 |
| ස්වෙච්ඡා ළමා නිවාසවල අළුත්වැඩියා කටයුතු සිදු කිරීම | 16,487,595.00 |
| යථායෝග්‍යාධාර ඉදිකිරීම් | 1,250,423.57 |
| එකතුව | **43,689,844.89** |

## 5. ඵලදායීතාවය

- **දරුවන්ගේ ආකල්ප වර්ධනය**
    - ආකල්ප වර්ධන වැඩමුළු පැවැත්වීම
    - රස වින්දනාත්මක වැඩ සටහන් පැවැත්වීම
- **සංස්කෘතික උත්සව පැවැත්වීම.**
    - අවුරුදු උත්සවය
    - පොසොන් බැති ගී ප්‍රසංගය
    - නත්තල් කැරොල් උත්සවය
- **දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීමට උත්සව සංවිධානය**
    - ලෝක ළමා දින උත්සවය
- **දරුවන්ගේ දක්ෂතා දියුණු කිරීමට මග පෙන්වීම හා ඇගයීම.**
    - නිවේදක වැඩමුළු
    - චිත්‍ර වැඩමුළු
    - යොවුන් සේනාංක පුහුණුවට යොමු කිරීම
    - ලෝක ළමා දින උළෙලට සමගාමීව තරග පිරිනැමීම

## 6. සේවක සුබ සාධනය

- **කාර්ය මණ්ඩල පුහුණු**
    - පරිගණක පුහුණුවීම් සඳහා යොමු කිරීම.
    - පරිවාස නිලධාරීන් පුහුණුවීම් සඳහා යොමු කිරීම.
    - ආයතනගත නිලධාරීන්
    - රම්මුතුගල /මාකොළ සහතික කල පාසල් හා රම්මුතුගල /මාකොළ රැඳවුම් නිවාසවල කාර්ය මණ්ඩලයට ප්‍රථම වරට පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.
- 2015 වර්ෂයේ මේ සඳහා ලිපිගොනු අල්මාරි, මේස, පුටු, පරිඝණක, මුද්‍රණ යන්ත්‍ර රාජකාරි කටයුතු පහසු කර ගැනීම සඳහා සපයා දී ඇත.
- අක්‍රියව තිබූ සුබසාධක සංගමය ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම.

## 7. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- රම්මුතුගල /මාකොළ සහතික කළ පාසැල් රැඳවුම් නිවාස දරුවන්ට සතියේ දිනවලදී ඇඳීමට වර්ණ 7 ක නිළ ඇඳුම් ලබාදීම.
- පරිවාස නිලධාරින් මගින් ප්‍රතිලාභීන්ට මුදලින් ගෙවන ලද සිසුමිණ ශිෂ්‍යාධාරය, සෘජුවම ප්‍රතිලාභ දරුවන්ගේ භාරකරුවන්ගේ බැංකු ගිණුමට බැර කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සේවක සේවිකාවන්ට ප්‍රිඩ්ස්රෝ ආයතනය මගින් පුහුණුවක් ලබාදීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථානගත දරුවන්ගේ රසවින්දනය සඳහා නරිබෑනා, තොප්පි වෙළෙන්දා නාට්‍ය රඟ දැක්වීම හා රොඩ්නි වර්ණකුල මහතා විසින් පවත්වන රස වින්දනාත්මක වැඩ සටහනට සහභාගී කරවීම.
- නෙළුම් පොකුණ රඟහලේදි දරුවන්ගේ දක්ෂතා එළිදැක්වීම සඳහා **"නෙළුම් විලේ කැකුළු පිජේ "** ප්‍රසංගය පැවැත්වීම. පුහුණු කළ දරුවන් විසින් එහි සියළුම නිවේදන කටයුතු සිදුකිරීමට කටයුතු යෙදීම

- මාකොළ රැඳවුම් නිවාසයට පරිගණක ලබාදී, පරිගණක පුහුණුව රැඳවුම් දරුවන්ට ලබාදීමට සැලැස්වීම.
- රැඳවුම් නිවාස දෙකටම රූපවාහිනී නැරඹුම් මැදිරි දෙකක් සකස් කර දීම.
- බස්නාහිර පළාතේ ළමා නිවාස ගතවීමේ අවදානම ඇති අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 3000 කට පාසල් උපකරණ කට්ටල් ලබාදීම. (පොත් බෑගය, වතුර බෝතලය, කෑම පෙට්ටිය, පැන්සල් රඳවනය හා පොත්, කටර්, මකන)
- බස්නාහිර පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන දරුවන්ට අත්‍යවශ්‍ය උපකරණ ව්‍යාපෘතියක් මගින් ලබාදීම.
- මනාලියන් දැක්මක් හා කේක් ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- 2014 අගෝස්තු මාසයේ ජුකී පාඨමාලාව ඇරඹීමෙන් පසු 2015 ජනවාරියේ වෑල්ඩින් පාඨමාලාව ආරම්භ කිරීම.
- විධිමත් නිවේදන පාඨමාලා පවත්වා දක්ෂ දරුවන්ට තිළිණ ප්‍රදානය කිරීම.
- ස්වයංරැකියා පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කළ දරුවන්ට අදාළ ස්වයංරැකියා උපකරණ කට්ටලය බැගින් ලබාදීම.
- චිත්‍ර තරගවල ජයග්‍රාහකයින්ගේ චිත්‍ර රාමු කර ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු යෙදීම.
- කාර්ය මණ්ඩලයට නිවාසයක දරුවන් සමග බුෆේ ක්‍රමයට ආහාර ගැනීම හඳුන්වාදීම.
- දරුවන්ගේ රුචිකත්වයට අනුව ආහාර වට්ටෝරු සැකසීම.
- පරිවාස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ගැන වෘත්තිකයින් දැනුවත් කිරීම.(විනිශ්චයකරුවන්, වෛද්‍යවරුන්, පොලිස් නිලධාරීන්)
- ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ නාම ලේඛන හා තොරතුරු ඇතුලත් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියක් සැකසීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන් 4000 කගේ පෞද්ගලික ලිපිගොනු දෙපාර්තමේන්තුව තුල තබාගැනීමට ක්‍රමවේදයක් සැකසීම හා එම ලිපිගොනු සැකසීම ආරම්භ කිරීම.
- අක්‍රියව පැවති වෙබ් අඩවිය වෙනුවට නව වෙබ් අඩවියක් www.probation.wp.gov.lk නමින් අරඹා යාවත්කාලීන තොරතුරු එක් කිරීම.
- ළමා මධ්‍යස්ථානවල දරුවන්ට ප්‍රිඩ්ස්රෝ ආයතනය සමග ඒකාබද්ධව නායකත්ව පුහුණු පැවැත්වීම.
- ළමා අධිකරණය, Good Nabers ආයතනය සමග එක්ව පොලිස් නිලධාරින්ට, පරිවාස නිලධාරින්ට පුහුණු වැඩ මුළුවක් පැවැත්වීම.
- දෙපාර්තමේන්තු නිලධාරින් යොදවා රම්මුතුගල, මාකොළ දරුවන්ට උපදේශනය ලබාදීම.
- රම්මුතුගල, මාකොල, ආයතනගත දරුවන් අධිකරණයට ඉදිරිපත් වන දරුවන්ට ඇඳීමට සුදුසු ඇඳුමක් නිර්මාණය කර ලබාදීම.
- ප්‍රජාපතී රජයේ ළමුන් භාරගැනීමේ මධ්‍යස්ථානයට රූපවාහිනී ලබාදීම.
- මාකොල, රම්මුතුගල, පානදුර පරිවාස කාර්යාලයේ ශ්‍රවනාගාරයට අත්‍යවශ්‍ය මල්ටි මීඩියා යන්ත්‍ර ලබාදීම.
- ළමා මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයට ප්‍රිඩ්ස්රෝ ආයතනය සමග ඒකාබද්ධව පුහුණු පාඨමාලා පවත්වා ඩිප්ලෝමා සහතික ලබාදීමට කටයුතු යෙදීම.

## 8. විගණන විමසුම්

2015 වර්ෂයේ විගණන විමසුම් 09න් 08 ක් සඳහා පිළිතුරු යවා ඇති අතර, ඉතිරි විගණන විමසුම සඳහා පිළිතුරු යැවීමට සකස් කර ඇත.

# 9.4

# බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

අවාසි සහගත ජනතාවට ස්වශක්තියෙන් යුත් තෘප්තිමත් ජීවිතයක්.

### 1.2 මෙහෙවර

බස්නාහිර පළාත් අඩු ආදායම්ලාභී අවාසි සහගත ඉලක්ක කණ්ඩායම් වල සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හරහා සැබෑ අවශ්‍යතා හා විශ්ව ශක්තීන් හඳුනාගෙන සාධනය, පුනරුත්ථාපනය, උපදේශනය, සවිබල ගැන්වීම හා සමාජ ගත කිරීම හරහා ඊට අනුකූලව ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය හරහා ඔවුන්ට යැපුම් මානසිකත්වයෙන් තොරව ස්වශක්තියෙන් ගොඩනැගීමට හැකි පසුබිම ගොඩ නැංවීම.

### 1.3 කාර්යයන්

- බස්නාහිර පළාත තුළ දිළිඳු පවුල් සඳහා මහජනාධාර, මාසික දීමනා ගෙවීම තුළින් ඔවුන් බලගැන්වීම.
- අනියම් වශයෙන් ආපදා වලට ලක් වී අනාථ භාවයට පත් වූ පවුල් වලට සහන සැලසීම හා ඔවුන් පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරීම.
- ක්ෂය රෝග, පිළිකා, තැලසීමියා හා ලාදුරු රෝගී දුගී පවුල් සඳහා ආධාර ගෙවීම් මඟින් ඔවුන් සුවපත් කිරීමට සහයවීම.
- අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා විශේෂිත ආධාර යටතේ පෝෂණ ආධාර, අධ්‍යාපන ආධාර, වෛද්‍ය ආධාර හා හදිසි සැත්කම් ආදිය සඳහා ආධාර සැපයීම
- වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් නේවාසිකව තබා ගෙන ඔවුන් රැකබලා ගන්නා ලියාපදිංචි වී සිටින ස්වේච්ඡා සංවිධාන ආයතන සඳහා සාමූහික ආධාර සහ යථායෝග්‍යාධාර ලබාදීම, එවැනි සේවා සපයන ආයතන සඳහා සාමූහික ආධාර ලබාදීම හා එම ආයතන අධීක්ෂණය කිරීම.
- සහන අපේක්ෂිත දිළිඳු, ආබාධ සහිත පුද්ගලයන්ට ඇස් කණ්ණාඩි, ශ්‍රවණ උපකරණ, රෝද පුටු, ත්‍රෛයිසිකල්, අත්වාරු, කිහිලිකරු, සුදු සැරයටි, කෘත්‍රිම අත් / පා හා අක්ෂිකාච ආදිය සැපයීම තුළින් ඔවුනට තම දෛනික කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීමට පහසු කරලීම.

- ආබාධ සහිත හා මනස සෙමෙන් වැඩෙන පුද්ගලයින් සඳහා නිවාස/ ආයතන පිහිටුවා පවත්වා ගෙනයෑම සහ ඔවුන් පුනරුත්ථාපනය, සාර්ථක කිරීමට හා සංතෘප්ත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වැඩිහිටි නිවාස/ ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යෑම සහ ඔවුන් භෞතික හා අධ්‍යාත්මික වශයෙන් පුනරුත්ථාපනය කර ඔවුන්ට සුවදායක දිවි පෙවෙතක් උරුම කරදීම.
- දෙපාර්තමේන්තුවට අයත් නොවන නිවාස හෝ ආයතන සපයන සේවය පිළිබඳ අධීක්ෂණය කිරීම.
- අයාල ආඥා පනත යටතේ අධිකරණය මඟින් යොමු කරන කාන්තාවන්ට රැකවරණය සැලසීම, වෘත්තීය හා සාරධර්ම පුහුණුව හා පුනරුත්ථාපනය කිරීම.
- බස්නාහිර පළාත් පුරවැසියන් අධ්‍යාත්මිකව සංවර්ධනය කර සමාජ ප්‍රවාහයට එක් කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම.

## 2. ආයතනය පිළිබඳ හැඳින්වීම

බස්නාහිර පළාතේ ආබාධිත හා අසරණ අවාසි සහගත ප්‍රජාවගේ ජීවන අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, ආධාර අවශ්‍ය වූවන් හඳුනා ගනිමින් එම ආධාර ලබා දීම, හදිසි වෛද්‍ය ආධාර ලබා දීම හා වෘත්තීය පුහුණුව ලබා දීම, විවිධ ආබාධිත හා මන්ද මානසික අසරණ පුද්ගලයන් රැක බලා ගැනීම, අයාල ආඥා පණත යටතේ අධිකරණ නියෝගයන් මඟින් එවනු ලබන කාන්තාවන් පුනුරුත්ථාපනය කිරීම, වයස අවුරුදු 60 ඉක්ම වූ අසරණ වැඩිහිටියන් රැක බලා ගැනීම නඩත්තු කිරීම හා මානසික සෞඛ්‍ය සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සමාජීය සේවාවන් සැපයීම ඉලක්ක කර ගත් සමාජ සේවා කාර්යයන් ඉටු කරනු ලබන ආයතනයකි.

## 3. අනුමත මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය ) | 1 |
| 2 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III/ II ශ්‍රේණිය) | 1 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III/ II ශ්‍රේණිය) | 1 |
| 4 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | 1 |
| 5 | අධිකාරීවරු ( සෙත්සෙවන / මිත් සෙවන / මෙත් සෙවන / සත් සෙවන) | දෙපාර්තමේන්තුගත | 4 |

## 4. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන් හා අත්කරගත් ජයග්‍රහනයන්

- **ආබාධිත උපකරණ සැපයීම**

| දිස්ත්‍රික්කය | රෝද පුටු | තෙසිකල් | කිහිලිකරු | අත් වාරු | වෝකර්ස් | වායු මෙට්ට | ජල මෙට්ට | කොමඩ් රෝද පුටු | බස්තම් (1) | බස්තම් (4) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 78 | 16 | 24 | 42 | 21 | 7 | 5 | 41 | 6 | 4 |
| ගම්පහ | 124 | 19 | 22 | 63 | 17 | 6 | 9 | 42 | 1 | 5 |
| කළුතර | 140 | 23 | 56 | 99 | 30 | 21 | 17 | 83 | 21 | 12 |
| එකතුව | **342** | **58** | **102** | **204** | **68** | **34** | **31** | **166** | **28** | **21** |

- **නඩත්තු ආධාර ලබා දීම**

| | ලියාපදිංචි / අපේක්ෂිත නිවාස ගණන | ලබාදුන් මුදල රු. |
|---|---|---|
| වැඩිහිටි නිවාස | 28 | 10,196,100 |
| ආබාධිත නිවාස | 23 | 15,525,371 |
| සාමූහික ආධාර | 2 | 100,000 |
| යථායෝග්‍යාධාර | 21 | 1,344,645 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 9 | 1,187250 |
| **මුළු මුදල** | | **28,353,366** |

- **ආබාධිත උපකරණ සඳහා දරණ මුළු වියදම**

| උපකරණ වර්ගය | ඇණවුම් කරන ලද ප්‍රමාණය | ඒකකයක මිල රු. | වියදම් වූ මුළු මුදල රු. |
|---|---|---|---|
| රෝද පුටු | 325 | 7,750 | 2,396,493 |
| ත්‍රෙසිකල් | 45 | 22,000 | 975,150 |
| කිහිලිකරු | 100 | 1,750 | 175,000 |
| අත්වාරු | 205 | 925 | 189,625 |
| වෝකර්ස් | 125 | 3,450 | 431,250 |
| වායු මෙට්ට | 55 | 7,750 | 426,250 |
| ජල මෙට්ට | 55 | 5,500 | 302,500 |
| කොමඩ් රෝද පුටු | 235 | 10750 | 2,526,250 |
| බස්තම් (තනි) | 15 | 950 | 14,250 |
| **එකතුව** | | | **7,436,768** |

- සැත්කම් ආධාර

| දිස්ත්‍රික්කය | පුද්ගල සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|
| කොළඹ | 38 | 1,492,800 |
| ගම්පහ | 27 | 1,147,000 |
| කළුතර | 32 | 1,309,900 |
| **එකතුව** | **97** | **3,949,700** |

- ආධාර ගෙවීම් තොරතුරු

| අනු අංකය | ආධාර වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආධාර ( රු.) |
|---|---|---|---|
| 1 | මහජනාධාර | 56639 | 174,997,600 |
| 2 | දෘශ්‍යාබාධිත මහජනාධාර | 228 | 4,216,500 |
| 3 | ලාදුරු ආධාර | 87 | 661,886 |
| 4 | පිළිකා/ තැලසීමියා | 4309 | 24,677,800 |
| 5 | ක්ෂය රෝගාධාර | 117 | 376,000 |
| 6 | ස්වයං රැකියාධාර | 27 | 263,500 |
| 7 | මූලාධාර | 355 | 917,750 |
| 8 | පෝෂණාධාර | 82 | 186,250 |
| 9 | ඖෂධාධාර | 220 | 507,000 |
| 10 | කොමඩ් සහිත වැසිකිලි ආධාර | 29 | 445,800 |
| | **එකතුව** | **62093** | **207,250,086** |

- අක්ෂිකාච ලබාදීම

| දිස්ත්‍රික්කය | පුද්ගල සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|
| කොළඹ | 32 | 440,194.70 |
| ගම්පහ | 28 | 380,159.05 |
| කළුතර | 65 | 774,003.30 |
| **එකතුව** | **125** | **1,594,357.05** |

- ඇස් කණ්නාඩි ලබා දීමේ තොරතුරු

| දිස්ත්‍රික්කය | ලබා දුන් ප්‍රමාණය |
|---|---|
| කොළඹ | 2850 |
| ගම්පහ | 3337 |
| කළුතර | 3629 |
| **එකතුව** | **9816** |

- අධ්‍යාපන ආධාර ගෙවීම් විස්තර

| දිස්ත්‍රික්කය | අධ්‍යාපන ආධාර | |
|---|---|---|
| | පුද්ගල සංඛ්‍යාව | මුදල රු. |
| කොළඹ | 1107 | 6,211,000 |
| ගම්පහ | 2195 | 12,832,500 |
| කළුතර | 2712 | 15,725,500 |
| එකතුව | 6014 | 34,769,000 |

- පළාත් සංවර්ධන ප්‍රදාන වැඩසටහන

| අනු අංකය | වැඩසටහන | වැය වූ මුදල රු. |
|---|---|---|
| 01 | මෙත්සෙවන නිවර්තන නිවාසයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 122,106.89 |
| 02 | බෙල්ලන්තර රජයේ විශේෂිත ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඕලු, නෙළුම්,මානෙල් නේවාසිකාගාරවල කැඩී ඇති වැසිකිළි අළුත්වැඩියා කිරීම | 293,584.30 |
| 03 | කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රා. ලේ. කොට්ඨාසයන්හි අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා අක්ෂි සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 299,880.00 |
| 04 | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසයේ පල්දෝරු පද්ධතිය අළුත්වැඩියා කිරීම - අදියර 2 | 253,604.50 |
| 05 | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසයේ ගජබා අංශයේ වැසිකිළි පද්ධතියේ ඉතිරි වැඩ නිම කිරීම | 515,151.00 |
| 06 | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසයේ විශාකා වාට්ටුවේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 296,399.85 |
| 07 | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසයේ ගෝතමී වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම | 1,156,957.88 |

| අනු අංකය | වැඩසටහන | වැය වූ මුදල රු. |
|---|---|---|
| 08 | මීරිගම සෙත් සෙවන රජයේ වැඩිහිටි නිවාසයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිහිටි සේවක වැසිකිළිය අළුත්වැඩියා කිරීම | 490,823.79 |
| 09 | බස්නාහිර පළාතේ ලියාපදිංචි වැඩිහිටි බල මණ්ඩල අවමංගල්‍යාධාර සමිති සඳහා උපකරණ ලබා දීම | 8,999,508.00 |
| 10 | බස්නාහිර පළාතේ සමාජ සුබසාධනය උදෙසා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් අරභයා ජීවනෝපාය සංවර්ධනය සඳහා ශිල්පීය පුහුණු වැඩසටහන් පැවැත්වීම | 474,402.00 |
| 11 | බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංස්කෘතික ප්‍රසංගයක් පැවැත්වීම | 1,499,920.00 |
| 12 | බස්නාහිර පළාතේ සමාජ සුබසාධනය උදෙසා ගැබිණි මව්වරුන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම. | 999,875.00 |
| 13 | බස්නාහිර පළාතේ සමාජ සුබසාධනය උදෙසා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමාජ සුබසාධන හා ආකල්ප සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම | 892,618.00 |

- **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන**

| අනු අංකය | වැඩසටහන | වැය වූ මුදල රු. |
|---|---|---|
| 01 | මිත් සෙවන රජයේ විශේෂිත ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ දෙමහල් ගොඩනැගිල්ලේ වැසි ජලය බැසයාමට හැකිවන පරිදි කාණු පද්ධතිය විධිමත් කිරීම හා ඉදිරිපස භූමි ප්‍රමාණයේ ගල් ඇල්ලීම | 1,524,885.11 |
| 02 | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසයේ කාර්යාලය අසල වැසිකිළි ක්‍රමවත්ව අළුත්වැඩියා කිරීම. | 106,540.00 |
| 03 | මිත් සෙවන රජයේ විශේෂිත ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පිරිමි සේවක මහතුන්/ආයතනයට පැමිණෙන අමුත්තන් සඳහා නාන කාමර, වැසිකිළි පහසුකම් සහිත විවේකාගාරයක් ඉදිකිරීම | 894,550.10 |
| 04 | මිත් සෙවන රජයේ විශේෂිත ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පවතින සියළුම කැඩී ඇති වැසිකිළි / ගලි වලවල්වල කොන්ක්‍රීට් ආවරණ ස්ලැබ් අළුත්වැඩියා කිරීම හා දැරියන් ස්නානය කරන සිමෙන්ති ජල ටැංකිය ප්‍රමාණයෙන් විශාල කර නැවත සකස් කිරීම. | 130,196.60 |
| 05 | මීරිගම මන්ද මානසික පිරිමි ළමුන් සඳහා වූ නිවාසයේ ගේට්ටුවේ සිට ප්‍රවේශ දොරටුව දක්වා කොටස ක්‍රමවත් ලෙස සකස් කිරීම. | 726,229.71 |
| 06 | මීරිගම මන්ද මානසික පිරිමි ළමුන් සඳහා වූ නිවාසයේ නේවාසිකාගාරය සඳහා පිටවීමේ හදිසි දොරටුව අළුත්වැඩියා කිරීම. | 132,644.44 |

| අනු අංකය | වැඩසටහන | වැය වූ මුදල රු. |
|---|---|---|
| 07 | මීරිගම මන්ද මානසික පිරිමි ළමුන් සඳහා වූ නිවාසයේ පැති බැම්ම ක්‍රමවත් ලෙස සකස් කිරීම | 320,168.40 |
| 08 | මීරිගම මන්ද මානසික පිරිමි ළමුන් සඳහා වූ නිවාසයේ කාණුව ක්‍රමවත් ලෙස සකස් කිරීම. | 128,212.77 |
| 09 | මීරිගම රජයේ විශේෂිත ළමා පුනරුත්ථාපන (පිරිමි) මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය ක්‍රමවත් ලෙස සකස් කිරීම. | 1,042,699.81 |
| 10 | බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වැඩිහිටි නිවාස, ආබාධිත නිවාස, දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රමිතිගත කිරීම සඳහා ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා දීම. | 1,413,980.69 |
| 11 | බස්නාහිර පළාත තුළ පිහිටි ලියාපදිංචි ආබාධිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයන් සඳහා උපකරණ ලබා දීම. | 498,449.00 |
| 12 | සමාජ සත්කාරක සතිය හා ප්‍රතිභා දිරිය පොළ පැවැත්වීම සහ වැඩිහිටි, ආබාධිත,වැන්දඹු, අඩු ආදායම්ලාභී ප්‍රජාව දැනුවත් කිරීම හා සවිබල ගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම. | 2,772,614.60 |
| 13 | කොළඹ,ගම්පහ,කළුතර දිස්ත්‍රික් 03 ආවරණය වන පරිදි ප්‍රතිභා දිරිය පොළ පැවැත්වීම. | 164,633.00 |
| 14 | බස්නාහිර පළාතේ තෝරාගත් ආබාධිත පුද්ගලයින් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ආදායම් උත්පාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 484,507.50 |

- **උපමාන පාදක ප්‍රදාන වැඩසටහන**

| අනු අංකය | වැඩසටහන | වැය වූ මුදල රු. |
|---|---|---|
| 01 | කොළඹ දිස්ත්‍රික්කයේ ගර්භණී මව්වරුන්ගේ සෞඛ්‍ය තත්වය උදෙසා අපේ සොඳුරු පවුල වැඩසටහන පැවැත්වීම (ගරු ජගත් කුමාර මැතිතුමා) | 400,000.00 |
| 02 | කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා අක්ෂි සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ගරු හෙක්ටර් බෙත්මගේ මැතිතුමා) | 809,480.00 |
| 03 | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා අක්ෂි සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ගරු උදයගම්මන්පිල මැතිතුමා) | 59,840.00 |
| 04 | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගර්භණී මාතාවන්ගේ සෞඛ්‍යය නංවාලීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම (ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා) | 99,999.50 |
| 05 | හෝමාගම ප්‍රා.ලේ.කො. යේ අංක 165/5/ඒ, හිරිපිටිය, පන්නිපිටිය පදිංචි අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයකු වන වැඩපුල් අච්චිගේ සුගතපාල මහතාගේ ආබාධිත බව අඩු කරලීම උදෙසා කෘත්‍රිම පාදයක් ලබා දීම (ගරු එස්.එම්. මර්ක්කාර් මැතිතුමා) | 14,000.00 |









- **සමාජ සත්කාරක සතිය - අතහිත ව්‍යාපෘතිය**

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දූදරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැතුම් උයන වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානය 2015 සැප්තැම්බර් 18 වන දින විවෘතකිරීම





- **සමාජ සත්කාරක සතිය - දූපුතු මාපිය සරණ ව්‍යාපෘතිය**

ගම්පහ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී අධ්‍යාපනාධාර ලබන දූදරුවන් හා අපේ සොඳුරු පවුල වැඩසටහන හා සම්බන්ධ පවුල් වල දරුවන් ඒකාබද්ධව සොඳුරු හෙටක් සිතුවම් දැක්ම හා වෘත්තීය මාර්ගෝපදේශන

වැඩසටහන 2015 සැප්තැම්බර් 19 – 20 දෙදින කළගෙඩිහේන මහා විද්‍යාලයේදී පැවැත්විණි.




- **සමාජ සත්කාරක සතිය - අසරණ සරණ ව්‍යාපෘතිය**

පාසල් දරුවන් හා ප්‍රජාව තුළ වැඩිහිටියන්ට සැලකීම, ඔවුන්ගේ දක්ෂතා හා අත්දැකීම් අනාගත පරපුරට දායාද කරනු වස් “ සඳ කිරණ ” වේදිකා නාට්‍ය 2015 සැප්තැම්බර් 19 වන දින මීරිගම යොවුන් නිකේතනයේදී එළි දැක්වීම.




- **සමාජ සත්කාරක සතිය - සුව සෙවන ව්‍යාපෘතිය**

අඩු අදායම්ලාභී ආබාධිත පුද්ගලයකු වෙත ප්‍රජාව විසින් ප්‍රජා දායකත්වයෙන් ඉදි කළ නිවස කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ , නාගමුල්ල පාරේ අංක 44/5/ඒ නිවසේ පදිංචි සුසන්ත දිසානායක මහතා වෙත 2015 සැප්තැම්බර් 21 වන දින සුබ මොහොතින් භාර දීම






- **සමාජ සත්කාරක සතිය - වැන්දඹු දිරිය මාතා ව්‍යාපෘතිය**

අඩු අදායම්ලාභී පවුල් වල තනි මව්වරුන් ආර්ථික වශයෙන් නගා සිටුවීමේ අරමුණින් කළුතර දිස්ත්‍රික්කයේ තනි මව්වරුන්ගේ අලෙවි නිෂ්පාදන ඇතුලත් නිෂ්පාදන අලෙවිපොළ 2015 සැප්තැම්බර් 23- 24 පානදුර නව නගර ශාලා භූමියේදී පැවැත්විණි.





- **සමාජ සත්කාරක සතිය - අපේ සොඳුරු පවුල ව්‍යාපෘතිය**

සමාජ ගැටලු වලට පත්වී ආර්ථික වශයෙන් දුෂ්කරතාවයන්ට පත් ව සිටින පවුල් සමාජ කථිකාවත හරහා හඳුනා ගත් පසුව ඔවුන් ඒකාබද්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. ඒ අතුරින් අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභී ආර්ථික දුෂ්කරතා වලින් පෙළෙන පවුල් ඒකක 25 ක් සමඟ 2015 සැප්තැම්බර් 26 හැඩිගල්ල රූන කන්ද පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානයේ පැවති අපේ සොඳුරු පවුල වැඩසටහන.





- **සමාජ සත්කාරක සතිය - ප්‍රතිභා දිරිය පොළ**

බස්නාහිර පළාතේ ආබාධිත, වැඩිහිටි, වැන්දඹු හා අඩු ආදායම්ලාභී ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ඇතුලත් ප්‍රතිභා දිරිය පොළ 2015 සැප්තැම්බර් 20 – 26 නුගේගොඩ ආනන්ද සමරකෝන් එළිමහන් රංග පීඨයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව පැවැත්විණි. මෙම වෙළඳපොළ සඳහා නිෂ්පාදකයන්ට අවශ්‍ය වෙළඳකුටි හා අනෙකුත් පහසුකම් නොමිලේ සපයා දෙන අතර සියලු ආදායම් ඔවුන් වෙතම ලබා දෙනු ලැබේ. නිෂ්පාදන අලෙවිකරුවන්ගේ තොරතුරු අනුව මෙවර සමස්ත ආදායම රුපියල් හත්ලක්ෂ හතලිස් හයදහසකි.

මෙම පොළට සමගාමීව නිෂ්පාදන අලෙවිකරුවන් සඳහා ගැණුම්කරුවන් හඳුන්වා දීම, ණය පහසුකම් ලබාදීම ඉලක්ක කර ගනිමින් 2015 සැප්තැම්බර් 24 – 25 දිනයන් හි නිෂ්පාදන අලෙවි ප්‍රදර්ශනයක් ද පැවැත්විණි.









- **සමාජ සත්කාරක සතිය - සුසේවාභිමානී සම්මාන උළෙළ**

බස්නාහිර පළාතේ විවිධාකාරයෙන් අනාථ අසරණභාවයට පත් වූ හා පත්වීමට ඉඩ ඇත්තාවූ ප්‍රජාව ඉන් මුදවා ගැනීමේ අරමුණෙන් විවිධ මාර්ග ඔස්සේ සිය කායික මානසික ශ්‍රමය, ධනය හා කාලය වැය කරමින් තමාගෙන් අපේක්ෂා කරනු ලබන සේවයට වඩා වැඩි සේවයක් ඉටු කළා වූ සමාජ වැඩකරුවන් හා සමාජ සේවකයන්, සමාජ ශෝධකයන්, සමාජ සංවිධාන හා සමාජ ආයතනයන්හි එම සේවය ඇගයීම සඳහා වූ සුසේවාභිමානී සම්මාන උළෙළ 2015 සැප්තැම්බර් 22 වන දින කොළඹ 07, විජේරාම මාවතේ පිහිටි ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි . මෙහිදී සම්මානලාභීන් 43 දෙනකු ඇගයීමට ලක්වී ඇත.





- **විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ සංස්කෘතික හා කලා තරඟාවලිය**

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දූදරුවනගේ කලා කුසලතා ඔප් නැංවීමේ අරමුණින් සෑම වර්ෂයකම පවත්වනු ලබන ප්‍රතිභා ප්‍රභා සංස්කෘතික හා කලා තරඟාවලිය 2015 සැප්තැම්බර් 13 වන දින රාජගිරිය ජනාධිපති විද්‍යාලයේදී පැවැත්විණි. මෙහිදී ගායනා, ගද්‍ය රචනා, නර්තන , චිත්‍ර නිර්මාණ යන අංශයෙන්ගෙන් තරඟ දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වූ අතර දිස්ත්‍රික් ජයග්‍රාහකයන් සඳහා පළාත් මට්ටමින් තරඟ පැවැත්විණි. මෙම උත්සවය සඳහා සමස්ත වියදම රු. 1365910.33 කි.









- **විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ මලල ක්‍රීඩා තරඟාවලිය**

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දූදරුවන්ගේ ක්‍රීඩා කුසලතා ඔප් නංවමින් ඔවුන් ජාතික තලයට ගෙන ඒම සඳහා සෑම වර්ෂයකම පවත්වනු ලබන මලල ක්‍රීඩා තරඟාවලිය දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ඉන් ජයගත් ජයග්‍රාහකයන් සඳහා පළාත් තරඟාවලිය 2015 නොවැම්බර් 06 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. මේ සඳහා රු. 1956800.92 ක වියදමක් දරා ඇත.









- **පළාත් වැඩිහිටි දින උත්සවය**

ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව බස්නාහිර පළාතේ වැඩිහිටියන් වෙනුවෙන් පවත්වන ලද වැඩිහිටි දින උළෙලේදී වැඩිහිටියන් පිළිබඳව සමාජ ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් වැඩිහිටි කෙටි චිත්‍රපටයක් එළි දැක්වීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් පැවැත්වූ දෙවුවර අභිමන් ජාතික තරඟාවලියේ පළාත් තරඟයේ ජයග්‍රාහකයන් ඇගයීම 2015 ඔක්තෝම්බර් 03 දින කොළඹ නව නගර ශාලාවේදී පැවැත්විණි. මේ සඳහා රු. 520658.40 ක වියදමක් දරා ඇත.







- **ගැබිණි මව්වරුන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන**

ගැබිණි මවරුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධන වෙනුවෙන් මව හා කුස තුළ වැඩෙන බිළිඳා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් පිරිපුන් දරුවකු ලෙසින් මෙලොවට දායාද කිරීමේ අරමුණින් දොඩංගොඩ, ඉංගිරිය, බුලත්සිංහල, බණ්ඩාරගම, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පවත්වන ලදී.





- **සමාජ කතිකාවත**

සමාජ ගැටලුවලට මුහුණ දී ඇති පවුල් වල එම ගැටලු සාකච්ඡාකර එම පවුල් සඳහා රාජ්‍ය මැදිහත්වීමක් ලබා දීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් පැවැත්වීම. මෙමගින් සමාජ ගැටලු වලට විසඳුම් සොයා යාමට ප්‍රායෝගික ප්‍රවේශයක් ලබා ගැනීමද අපේක්ෂිතය. 2015 වර්ෂයේ බේරුවල, මතුගම, පානදුර, හොරණ, මිල්ලනිය හා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවැත්විණි.

## 5. ඵලදායීතාවය

- 2015 පැවති ජාතික ඵලදායිතා තරඟාවලියේදී අප දෙපාර්තමේන්තුව විශේෂ කුසලතා සම්මානයෙන් ඇගයීමට ලක් විය.
- මේ වන විට දෙපාර්තමේන්තු වැඩසටහන්, උත්සව වලට සමගාමීව අංශ අතර ක්‍රමවත්ව හා විධිමත්ව ඵලදායිතා සංකල්ප යාවත්කාලීනව පවත්වනු ලබන ආකාරය පිළිබඳ කටයුතු ඉටු වෙමින් පවතී

## 6. සේවක සුබසාධනය

- අලුත් අවුරුදු උත්සව සමය සඳහා CIB ව්‍යාපාරික ආයතනය මඟින් වාරික වශයෙන් ගෙවීමේ පදනම මත ඇඳුම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.
- වාර්ෂික විනෝද චාරිකාවක් සංවිධානය කිරීම. (කිතුල්ගල)
- යුනිලීවර් ආයතනය මඟින් වියළි ආහාර හා සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදා දීම.
- කාර්ය මණ්ඩලයේ සුහදතාවය ඇති කිරීම සඳහා වෙසක් උත්සවය සඳහා කූඩු සැකසීම සහ පොසොන් උත්සවය සඳහා සව් දන්සලක් පැවැත්වීම.
- කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ උපන්දින නිමිතිකොට ගෙන කාඩ්පතක් සහ උපන්දින ත්‍යාගයක් පිරිනැමීම
- විශ්‍රාම යන නිලධාරීන්ට හා ස්ථානමාරු වීම් ලබන නිලධාරීන් සඳහා සමු ගැනීමේ සාදයක් සංවිධානය කිරීම.
- දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන හා කාර්ය මණ්ඩලය අතර සුහදතාවය හා සහයෝගීතාවය වර්ධනය කිරීම උදෙසා ක්‍රිකට් තරඟයක් පැවැත්වීම

## 7. ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

| අනු අංකය | ප්‍රතිපත්ති | ක්‍රියාකාරකම් |
|---|---|---|
| 1 | රැකවරණයට පත් කළ කාන්තාවන් සමාජ ගත කිරීම | දෙපාර්තමේන්තුව යටතේ වන ගංගොඩවිල ර.නි.නි. රැදවියන් ලෙස පුනරුත්ථාපනය වන දඬුවම් නියම නොකළ කාන්තාවන් ගරු පළාත් ඇමතිතුමන්ගේ අනුමැතිය ලබාගෙන සමාජ ගත කිරීම . |
| 2 | සමාජ ප්‍රශ්න අවම කිරීමට සමාජය දැනුවත් කිරීම | වැඩිහිටිවිය සම්බන්ධ පර්යේෂණ ග්‍රන්ථයක් වන "වියපත්භාවය හා අනාගත අභියෝගතා"මැයින් ග්‍රන්ථයක් එළිදැක්වීම. |
| 3 | පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම | බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ආධාර ලබන මහජනාධාරලාභීන්ගේ සමාජීය ආර්ථික සමාජ තත්ත්වය විමසා බැලීමටත් ලබා දෙන මහජනාධාර ඵලදායීව ඉහළ නැංවීමත් අරමුණු කරගෙන ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දායකත්වය සහිතව මීරිගම ප්‍රා.ලේ.කො. සමීක්ෂණයක් කිරීම. |
| 4 | සමාජ ප්‍රශ්න අවම කිරීම සඳහා පවුල බල ගැන්වීම | බස්නාහිර පළාතේ සමාජ ගැටළු අවම කර ගැනීමේ අරමුණින් බස්නාහිර පළාත් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස,"අපේ සොඳුරු පවුල"ව්‍යාපෘතිය හඳුන්වා අඛණ්ඩව පවත්වාගෙන යෑම. |

## 8. විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීම.

| | ලැබුණු විගණන විමසුම් | පිළිතුරු යැවූ විගණන විමසුම් |
|---|---|---|
| අභ්‍යන්තර විගණන විමසුම් | 1 | 1 |
| විගණකාධිපතිගේ විගණන විමසුම් | 3 | 3 |



# කාර්ය සාධන වාර්තාව - 2015

## ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත